**GARDEN SUPERVISOR** - Mr. R.M.J. Rajapaksha

**SENIOR HOUSEKEEPING SUPERVISOR** - Mr. M.D.E.M.N. Karunarathna

**HOUSEKEEPING SUPERVISORS** - Mr. G.R.S.K.D. Gamlath, Mr. B. D. Jagath Kumara, Mr. N.H.M. Janaka, Mr. R.P. Anura Shantha

**F & B SUPERVISORS -** Mr. N. W. M. Turin, Mr. S.J. Gamage, Mr. H.R.K.S.K. Peiris, Mr. H.R. Sherantha, Mr. D.H.R. Thushara, Mr. S.A.D.I.R. Senanayake, Mr. K.D.D.A. Pushpa Kumara, Mr. S.N. Hettiarachchi, Mr. P.G. Hettiarachchi, Mr. I.G.C. Kumara, Mr. G.T.D.T. Kumara, Mr. P.A.D.P. Panditharatne, Mrs. D.P. Chandanayake

**KITCHEN STEWARDING SUPERVISOR** - Mr. G.A. Wijesinghe

**CHEF-DE-PARTIE** - Mr. P.R. Wijesinghe, Mr. B.T.R. Hewamana, Mr. R.P. Helambage, Mr. M.W.W.M.P.C.C. Walgama

**LEADING COOKS** - Mr. A.A.D. Suranga, Mr. K.V.A. Jayawardena, Mr. R.M.M. Srimal, Mr. G.S.P. Suraweera, Mr. B.A.P. Pushpakumara, Mr. D.A.A. Amarathunga, Mr. P.D.P. Pushpakumara, Mr. M.B.A.P. Muthukumarana, Mr. R.K.A.D.T. Roshan, Mr. R.L.A.C.P. Rajakaruna

## DEPARTMENT OF LEGISLATIVE SERVICES

**DIRECTOR (LEGISLATIVE SERVICES)** - Mr. M. J. Perera

**TABLE OFFICE** - Mr. K.R. Herath (Assistant Director - Administration); Mr. H.U.P. Kumara, Mr. S.A.M. Shaheed (Principal Officer); Mrs. T.M.N.P. Tennakoon (Deputy Principal Officer); Mrs. W.S.Y. Zoysa, Mr. U.P.B.M. Undugoda, Miss D.R.K. Ranasinghe (Assistant Principal Officers); Miss E.H. Jayaweera, Mr. K.D.G.M. Krisantha (Parliamentary Officers)

**BILLS OFFICE** - Mr. W.W.N.S.C. Fernando (Assistant Director - Administration); Mrs. B.J. Abeysinghe (Principal Officers); Mrs. K.C.K. Peiris, Mrs. M.E.K.K. Fernando (Deputy Principal Officers); Miss G.K.C. Thilakarathna (Assistant Principal Officer); Mrs. D.D.S. Wasana (Parliamentary Officer)

**COMMITTEE OFFICE** - Mrs. W.A.K.C. Udapola (Assistant Director - Administration); Mrs. M.K.S.D. Alwis, (Principal Officer); Mr. D.G.M.S.M. Dehigahalanda, Mrs. W.L.S.D. de Alwis, Mrs. W.M.L.M. Weerasinghe, (Deputy Principal Officers); Mrs. G.K.S. Priyadarshani, Mrs. H.N. Fernandopulle, Mr. T.H.S.U. Thirimanna (Assistant Principal Officers)

**COMMITTEE OFFICE II** - Mr. K.P. Chandana (Assistant Director - Administration); Mrs. S.W.T.R. de Silva (Principal Officer); Mrs. R. M. S. Samanjika (Deputy Principal Officer); Mrs. W.K.A.M.M.M. Arthanayake (Parliamentary Officer)

**PUBLIC ACCOUNTS AND PUBLIC ENTERPRISES COMMITTEE OFFICE -** Mr. P.K.D.S.W. Wijegunawardhana (Assistant Director - Administration); Mrs. H.R. De Soyza, Mrs. D.C.S. Rupasinghe (Principal Officers); Mr. S.L. Wickrma, Mrs. R.A.D.N. Geyowanee (Deputy Principal Officers); Mr. J.T.L.P. Sameera (Assistant Principal Officer); Mrs. G.V.S.K. Kumari, Miss. G.D.J.D. Ayeshmanthi, Mrs. G.L.D. Fernando (Parliamentary Officers)

**PUBLIC PETITIONS COMMITTEE OFFICE -** Mrs. H.A.T.D. Hewaarachchi (Assistant Director - Administration); Mr. R.A.R.L. Ranawaka (Principal Officer); Mrs. R.P.Y.T. Warusavithana, Mr. M.R.D.T. Thilakasiri, Mrs. T.P. de Costa (Deputy Principal Officers); Ms. D.I.T. Munasinghe (Parliamentary Officer)

**MINISTERIAL CONSULTATIVE COMMITTEE OFFICE -** Mrs. C.M. Subasinghe (Assistant Director - Administration); Mrs. G.N.D. Thilakarathna (Principal Officer); Mrs. A.C.F. Nushrath (Deputy Principal Officer); Mrs. D.R.A.M.D. Sewwanthi (Assistant Principal Officer); Mrs. W.M.M. Priyadarshani, Mrs. U.D.U.T. Weerasiri (Parliamentary Officers)

**LIBRARIAN** - Mr. S.L. Siyath Ahemed

**DEPUTY LIBRARIAN** - Miss K.D.S. Wijenayake

**ASSISTANT LIBRARIANS** - Mrs. J.P.M.P. Jayasinghe, Mrs. D.G. Wasana Madushani, Mr. A.H.L.A.R. Weerasiri

**JUNIOR ASSISTANT LIBRARIANS** - Mrs. W.K.H. Jayani, Mr. S.H.M.W. Samarakoon, Mr. W.A.A. Wekkasinghe

**CHIEF RESEARCH OFFICER** - Mrs. G.R.A. Godagama

**SENIOR RESEARCH OFFICERS -** Mr. M. Ajiwadeen, Mrs. P.L.T. Erandathi

**RESEARCH OFFICERS** - Mrs. R.N.H. Wijayathilaka, Mrs. H.P.A.S. Abeykoon, Mr. V. Muralithas, Mrs. D.S.P.A.K. De Silva, Miss A.G.J. Chathurika

**ASSISTANT RESEARCH OFFICER** - Ms. G. H. M. S. S. Ananda

**CHIEF PARLIAMENTARY INTERPRETER -** Mr. C.J. Karunarathna

**DEPUTY CHIEF PARLIAMENTARY INTERPRETERS -** Mr. A.G. Mohamed Fiqrhi, Mr. A. Saravanabavanandan, Mrs. N.B.C.J. Nissanga,

**SENIOR PARLIAMENTARY INTERPRETERS -** Mr. G.F.B. Sureshwaran, Mr. P.L.P.L. Kumarasiri, Mr. P. Shanthakumar, Mr. S. Rameshkumar, Mrs. R. Vasanthi Perera, Mr. M. Ajithkumar, Mr. M.H.M. Ramis, Mrs. A.L.A.D. Thiumini, Mr. E.A. Amarasena, Mr. E.M.N.S.M. Ekanayake, Mr. M.Z.M. Azka

**PARLIAMENTARY INTERPRETERS -** Mr. B.M. Razeel, Mr. M.I.M. Fazi, Mr. C. Manimaran, Mr. P.M.A. Hussain, Mr. S. Pradeep, Mrs. K.D.M. Kumarage, Mr. M.M. Najimudeen, Mrs. A.T.A.N. Hansani

**SENIOR TRANSLATORS -** Mr. S.M. Nazeer, Mr. M.M. Haleemdeen

## DEPARTMENT OF INFORMATION SYSTEMS AND MANAGEMENT

**DIRECTOR (INFORMATION SYSTEMS AND MANAGEMENT) -** Mr. N.B.U. Nawagamuwa

**SYSTEMS ENGINEER -** Mr. C.J. Willoraarachchi

**SYSTEMS ANALYST -** Mr. M.N.C. Wickramasinghe

**COMMUNICATION / SECURITY ENGINEER -** Mr. G.N. Lakmahal

**SYSTEMS DESIGNER -**

**SYSTEMS ADMINISTRATOR -** Mr. A.S.D.M. Wickramaratne

**WEB AND NETWORK ADMINISTRATOR -** Mr. U.L. Geeganage

**SENIOR COMPUTER PROGRAMMERS-** Mr. D. Panditha, Miss P.M.M. Chandima

**COMPUTER PROGRAMMER -** Mrs. S.A.A.B. Athukorala

**SENIOR WEB EDITOR (SINHALA/ ENGLISH) -**

**SENIOR WEB EDITOR (ENGLISH/ TAMIL) -** Mr. M.N.M. Shifaq

**DEPUTY PRINCIPAL OFFICER -** Miss A.P.K.K.P. Thilakaratne

**SENIOR COMPUTER OPERATORS -** Mrs. P. Jehanya, Mr. J.S. Colambage, Mrs. K.G.S. Sewwandhi, Mr. W.H.U.D. Piyathunga, Mr. N.D.D.P. Premasiri, Mr. K.P.P.S. Romawardhana, Mrs. W.D.A. Jayarukshi, Mr. L.G. Ashiq Ali, Mr. A.R.M. Rikaz Aly, Mr. A.M. Fowsul Ameen

**SENIOR COMPUTER TECHNICIANS -** Mr. G.M.T. Perera, Mr. H.S. Sathyajith

**SENIOR TECHNICAL ASSISTANTS -** Mr. V.R.S.J. Somaratne, Mr. W.S. Suranga

## DEPARTMENT OF COMMUNICATION

**DIRECTOR (COMMUNICATION) (ACTING) -** Mr. M. J. Perera

**PUBLIC OUTREACH MANAGER** – Miss R.M.B.R. Ramanayake

**MEDIA MANAGER** – Mrs. R.M.N.P.M. Hathiyaldeniya

**PUBLIC OUTREACH OFFICERS** – Mrs. H.D.I.E. Wickramasinghe, Mr. P. Rudrakumar, Mr. M.G.D.L. Wickramasinghe, Mrs. Y.L. Rishmiya Nootan, Mr. A.S.M. Yasry

**MEDIA OFFICERS -** Mr. H.A.K.A.M. Jayalath, Mr. M. Pirassath, Mr. B.S.K. Ekanayake, Mrs. U.U.M. Perera

**MEDIA OFFICER (STILL AND VIDEO PHOTOGRAPHY) -** Mr. U.G. Nuwan Duminda

**PUBLIC OUTREACH OFFICE COORDINATORS -** Mr. A.G.P. Amarasinghe, Mr. S. Jeyaprakash

**MEDIA OFFICE COORDINATOR -** Mr. K.R.G. Jayathilaka

# පාර්ලිමේන්තු විවාද

නිල වාර්තාව

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**දසවන පාර්ලිමේන්තුව - පළමුවන සභා වාරය**

# பாராளுமன்ற விவாதங்கள்

அதிகார அறிக்கை

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்

பத்தாவது பாராளுமன்றம் - முதலாவது கூட்டத் தொடர்

# PARLIAMENTARY DEBATES

OFFICIAL REPORT

**THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**TENTH PARLIAMENT - FIRST SESSION**

**325 වන කාණ්ඩය** | **தொகுதி 325** | **VOLUME 325**

## පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2026* පෙබරවාරි *03* වන අඟහරුවාදා**

*2026 பெப்ருவரி 03, செவ்வாய்க்கிழமை*

*Tuesday, 03rd February, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m., MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත සඳහන් සන්දේශ ගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ජ්/00/7/IX/21

2026 ජනවාරි මස 30 වන දින

ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ 2026 ජනවාරි මස 28 දාතමින් කරනු ලබන ප්‍රකාශනය මඟින් ඉහත කී ආඥා පනතේ II වන කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේම වර්ෂ දෙදහස් විසිහයක් වූ ජනවාරි මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වියයුතු බව මවිසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත කී ප්‍රකාශනය කිරීමට හේතුව දිට්වා සුළිකුණාටුව හේතුවෙන් ඇති වී ඇති පසු ආපදා තත්ත්වය සලකා රටෙ යථා පැවැත්ම සුරක්ෂිත කිරීම හා මහජනතාවගේ ජීවිතයට අත්‍යාවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සඳහා බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරමින් පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

**II**

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ජ්/00/7/IX/3/01

2026 ජනවාරි මස 26 වන දින

ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමඟ කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### இருப்பாட்சியாளர்களைப் பாதுகாத்தல் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
### PROTECTION OF OCCUPANTS BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් හතරක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF THE COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 පෙබරවාරි 03 අඟහරුවාදා, එනම් අද දින අපර භාග 1.00ට කාරක සභා කාමර අංක 2 හි දී පැවැත්වීමට නියමිතව තිබූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම අද දින අපර භාග 1.30ට පවත්වන බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ජාතික විගණන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන
## தேசிய கணக்காய்வு அலுவலகத்தின் நிதிக் கூற்று
## FINANCIAL STATEMENTS OF THE NATIONAL AUDIT OFFICE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 36(1) සහ 36(3) වගන්ති ප්‍රකාරව, ජාතික විගණන කාර්යාලයේ 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන මම සභාගත කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

- Note on Supplementary Allocations from the Development Activities Programme appearing under Expenditure Head No. 240 of the Department of National Budget for the period from 01.12.2025 to 31.12.2025 in terms of Section 6(1) of the Appropriation Act, No. 3 of 2025; and
- Proclamation made and published in Gazette Extraordinary No. 2473/13 of 28th January, 2026 and Schedule thereto, by virtue of the powers vested with the President in terms of Section 2 of the Essential Public Services Act, No. 61 of 1979. - [The Hon. (Dr.) Harini Amarasuriya]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව

මෙම වාර්තා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)

Hon. Speaker, on behalf of the Chairman of the Consultative Committee on Digital Economy, I present the Report of the Ministerial Consultative Committee on Digital Economy on Regulations made by the then Minister of Technology under Section 71(1) read with Section 17(10) of the Sri Lanka Telecommunications Act, No. 25 of 1991 as amended by the Sri Lanka Telecommunications (Amendment) Acts, No. 27 of 1996 and No. 39 of 2024 regarding Telecommunications Infrastructure Sharing and published in Gazette Extraordinary No. 2396/32 of 07th August, 2024, which were referred to the Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

වාර්තාව 1

(i) 2022, 2023 හා 2024 වර්ෂ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(ii) 2023 හා 2024 වර්ෂ සඳහා ශීර්ෂය 04 - උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ කාර්ය සාධන වාර්තා;

(iii) 2022 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2022 හා 2023 වර්ෂ සඳහා අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තා;

(v) 2023 හා 2024 වර්ෂ සඳහා ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(vi) 2022 හා 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා;

(vii) 2023 හා 2024 වර්ෂ සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(viii) 2020, 2021, 2022 හා 2023 වර්ෂ සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා;

(ix) 2022 හා 2023 වර්ෂ සඳහා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තා;

(x) 2023 හා 2024 වර්ෂ සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(xi) 2023 හා 2024 වර්ෂ සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුබසාධක අරමුදලේ කාර්ය සාධන වාර්තා; සහ

(xii) 2023 හා 2024 වර්ෂ සඳහා ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා

වාර්තාව 2

(i) විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත; සහ

(ii) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තා මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කිරිබත්ගොඩ, පෙරේරා මාවත, අංක 299/4 යන ලිපිනයෙහි පදිංචි එම්.එම්.අයි.එම්. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගෝනාපීනුවල, නිග්‍රෝධ මාවත, අංක 129 ඒ යන ලිපිනයෙහි පදිංචි එස්. සඳුන් කාහිංගල මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)

ගරු කථානායකතුමනි, මතුගම, ගාමිණී මාවත, අංක 48/05 යන ලිපිනයෙහි පදිංචි නලින් දසන්ත විතාන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මහරගම, අඹගහපුර, අංක 25 යන ලිපිනයෙහි පදිංචි තරිඳු ප්‍රියංකර වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කෝට්ටේ, මිරිහාන, බුවනෙකබා මාවත, සේනාධිලංකාරගම, අංක 5 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. දසනායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

ගරු කථානායකතුමනි, බොරලැස්ගමුව, වේරහැර, ගංගාරාම පාර, පීරිස් මාවත, අංක 39/2 යන ලිපිනයෙහි පදිංචි පී.ඒ.එස්. පොන්නම්පෙරුම මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -21/2024- (2), ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### සීනි සඳහා පනවා තිබූ බද්ද අඩු කිරීම: අහිමි වූ ආදායම
### சீனிக்காக விதிக்கப்பட்டிருந்த வரியைக் குறைத்தல்: இழக்கப்பட்ட வருமானம்
### REDUCTION OF TAX IMPOSED ON SUGAR: REVENUE LOST

119/2024

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) සීනි සඳහා පනවා තිබූ බද්ද අඩු කිරීමට එවකට පැවති රජය තීරණය කරන ලද දිනය කවරේද;

(ii) එම තීරණය ගැනීමට බලපාන ලද සාධක කවරේද;

(iii) සීනි සඳහා පනවා තිබූ බද්ද අඩු කිරීමෙන් පසු ශ්‍රී ලංකාවට සීනි ආනයනය කරන ලද සමාගම් කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් තීරණය හේතුවෙන් අහිමි වූ බදු ආදායම කොපමණද;

(v) එම සීනි බදු වංචාව සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சீனிக்காக விதிக்கப்பட்டிருந்த வரியைக் குறைப்பதற்கு அப்போதைய அரசாங்கம் தீர்மானித்த திகதி யாது என்பதையும்;

(ii) அத்தீர்மானத்தை மேற்கொள்வதற்குத் தாக்கம் செலுத்திய காரணிகள் யாவை என்பதையும்;

(iii) சீனிக்காக விதிக்கப்பட்டிருந்த வரி குறைக்கப் பட்ட பின்னர், இலங்கைக்கு சீனியை இறக்குமதி செய்த நிறுவனங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி (i)இல் குறிப்பிடப்பட்டுள்ள தீர்மானத் தால் இழக்கப்பட்ட வரி வருமானம் எவ்வளவு என்பதையும்;

(v) மேற்படி சீனி வரி மோசடி தொடர்பில் இன்றளவில் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) date on which the then Government decided to reduce the tax imposed on sugar;

(ii) factors that influenced for such decision;

(iii) companies that have imported sugar into Sri Lanka after the tax that had been imposed on sugar was reduced;

(iv) tax revenue that was lost due to the decision mentioned in (i) above; and

(v) action that has been taken so far regarding the concerned fraud on the tax imposed on sugar?

(b) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2020.10.13 දිනැති අංක 2197/12 දරන ගැසට් නිවේදනය (ඇමුණුම 01) මඟින් 2020.10.14 දින සිට සීනි ආනයනය මත වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද අඩු කර ඇත.

(ii) එම තීරණය ගැනීම සම්බන්ධයෙන් එවකට ජනාධිපති ලේකම් විසින් මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලද 2020.10.13 දිනැති ලිපියට (ඇමුණුම 02) අනුව සඳහන් වනුයේ එවකට පැවැති ජීවන වියදම අඩු කිරීමේ සහනයක් ලෙස භාණ්ඩ වර්ග 4ක් සඳහා වන බදු ඉවත්

කිරීමට කටයුතු කරන ලෙසයි. ඒ අනුව, සීනි, පරිප්පු, ටින් මාළු සහ ලොකු ලූනු ආනයනය මත වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ශත 25 දක්වා - නාමික බදු අගයක් ලෙස - අඩු කිරීමට කටයුතු කර ඇත.

(iii) එම සමාගම්වල නම් ඇමුණුම 03 මඟින් දක්වා ඇත.

**ඇමුණුම 03**

1. පිරමිඩ් විල්මා පුද්ගලික සමාගම
2. පැලියගොඩ ට්‍රේඩින් කම්පැනි
3. අම්රෝ සුගර්
4. ග්ලෝබල් ට්‍රේඩින් ඇන්ඩ් කම්පැනි
5. විල්සන් ට්‍රේඩින් කම්පැනි
6. ආර්.ජී. බ්‍රදර්ස්
7. වුඩ්ලන්ඩ් ඇන්ඩ් කම්පැනි
8. කාර්ගිලිස් ෆුඩ්ස් කම්පැනි
9. වී.ඩී. හෝල්ඩින්ග්ස් ඇන්ඩ් කොමොඩිටීස්

(iv) මේ සම්බන්ධයෙන් වූ 2022 මාර්තු 23 දිනැති විගණන වාර්තාව අනුව 2020.10.14 දින සිට 2021.02.28 දින දක්වා කාලය තුළ ආනයනය කරන ලද සීනි ප්‍රමාණය (සුදු සීනි මෙට්‍රික් ටොන් 277,715 සහ දුඹුරු සීනි මෙට්‍රික් ටොන් 59,234) වන මෙට්‍රික් ටොන් 336,949 සඳහා ශත 25 බැගින් බද්දක් අය කර ගැනීම හේතුවෙන් රජයට අහිමි වූ බදු ආදායම රුපියල් බිලියන 16.76ක්.

(v) සීනි බදු අඩු කිරීම පිළිබඳව රජයේ විගණකාධිපති විසින් විශේෂ විගණන වාර්තාවක් 2022 මාර්තු මස 23 දිනයෙන් නිකුත් කරලා තිබෙනවා. ඒ විගණන වාර්තාවේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් 2022 ජූනි මස 21වන දින පැවැති පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂණයක් කරන්න මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට නියෝගයක් නිකුත් කරලා තිබෙනවා.

2022 ජූලි මස 12වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මේ පිළිබඳ විමර්ශනයක් කිරීමට පොලිස්පතිවරයා මඟින්, මුදල් අමාත්‍යාංශය විසින් භාර දීලා තිබෙනවා. ඒ පිළිබඳව පරීක්ෂා කර බලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2025 ජනවාරි 02 දිනැතිව, නැවතත් මේ පිළිබඳව වෝහාරික විගණනයක් කිරීමට විගණකාධිපති මඟින් කටයුතු කර දෙන ලෙස ඉල්ලා තිබෙනවා. (ඇමුණුම 04) ඒ අනුව මුදල් අමාත්‍යාංශය විසින් ඒ බව විගණකාධිපති වෙත 2025 ජනවාරි 21 දිනැතිව යොමු කර තිබෙනවා.

මෙයට පිළිතුරක් විධියට 2025 මාර්තු 07 දින විගණකාධිපති විසින් මේ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි තවදුරටත් පුළුල් විමර්ශනයක් සිදු කරන්න නම්, මෙම කරුණට අදාළ පාර්ශ්වයන්ගෙන් අදාළ තොරතුරු හා සාක්ෂි ලබා ගැනීමේ හැකියාවක් ජාතික විගණන කාර්යාලයට නොමැති බවත්, ඒ අදාළ තොරතුරු සහ සාක්ෂි ලබා ගැනීමේ හැකියාව තිබෙන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට බවත්, ජාතික විගණන කාර්යාලය විසින් ඉදිරිපත් කරලා තිබෙන විගණන වාර්තාව පදනම් කරගෙන ඒ පිළිබඳව ඉදිරියට කටයුතු කරන්න ඕනෑ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බවත් සඳහන් කරලා, ඒ අනුව කටයුතු කරන්න කියලා ජාතික විගණන කාර්යාලය විසින් නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දී තිබෙනවා. (ඇමුණුම 05)

ඊට අමතරව මේ සම්බන්ධයෙන් විගණන වාර්තාවෙන් පෙන්වා දී තිබෙන විධියට සීනි බදු අඩු කිරීමෙන් පසු සීනි ආනයනකරුවන් ලබා ගත්ත ලාභය මත, අදාළ තක්සේරු වර්ෂ මත පදනම්ව ඒ ආදායම තක්සේරු කරලා ආදායම් බදු අය කර ගන්න දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ වෙනකොට කටයුතු කර තිබෙනවා. (ඇමුණුම 06)

(ආ) පැන නොනඟී.

ඇමුණුම් 01, 02, 04, 05 සහ 06 **සභාගත*** කරමි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, පිළිතුරු ලබා දීම වෙනුවෙන් ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න කලින් මේ කාරණය කියන්න ඕනෑ. මට අද මේ ප්‍රශ්නය අහන්න අවස්ථාව ලැබිලා තිබෙන්නේ දෙවැනි වතාවට. ඒ, පසුගිය වතාවේ මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට කල් ගත් නිසා. මට සිදු වන අසාධාරණය ගැන මම ඔබතුමාට දිගින් දිගටම කිව්වා. මම, මගේ ප්‍රශ්න දීලා තිබෙනවා නේ. පළමු අවස්ථාවේ අහනවා කියලා මගේ අලුත් ප්‍රශ්නයක් කවදාවත් න්‍යාය පත්‍රයට එන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඔබතුමාට අද මම සාක්ෂි සහිතවයි එය ඔප්පු කරන්නේ. මගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට කල් ගත්ත නිසා දෙවැනි වතාවටයි අද එය න්‍යාය පත්‍රයට එන්නේ. ඒ විධියට ප්‍රශ්නයකට පිළිතුරු ලබා දීමට තුන් වතාවක් කල් ගන්න පුළුවන්. ගරු කථානායකතුමනි, කවදාවත් මගේ අලුත් ප්‍රශ්නයක් න්‍යාය පත්‍රයට එන්නේ නැහැ. ප්‍රශ්නවලට කල් ගන්න සාධාරණ හේතු තිබෙනවා. ඒකට අපි එකඟ වෙනවා. මම ඔබතුමාට මේ ගැන දිගින් දිගටම කියනවා. ප්‍රශ්නයකට පිළිතුරු දීමට සති දෙකක් කල් ගත්තාම සති දෙකෙන් ඒක නැවත න්‍යාය පත්‍රයට එනවා නේ, ගරු කථානායකතුමනි.

හැබැයි, එහෙම සති දෙකෙන් ඒ ප්‍රශ්නය එනකම් මගේ අලුත් ප්‍රශ්නයක් න්‍යාය පත්‍රයට එන්නේ නැහැ. මේක manually කරන්නේ. ඒකයි එහෙම වෙන්නේ. ගරු කථානායකතුමනි, මේක ආණ්ඩු ගණනාවකදීම තිබුණු තනතුරක්. හැම ආණ්ඩුවක්ම අයින් වුණාම කේළාම් කියනවා. මේ ආණ්ඩුව ගියාට පසුවත් කේළාම් කියාවි, ඔයගොල්ලන්ට විරුද්ධව. ඒ වනතුරු ඉන්න වෙනවා. ඒකට සාධාරණයක් කරන්න කියා මම ඉල්ලීමක් කරනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඇත්තටම ඔබතුමා මෙම ප්‍රශ්නයට සාධනීය පිළිතුරක් ලබා දුන්නා. හැබැයි, කනගාටුවට කාරණයක් තිබෙනවා. ඒ කියන්නේ, ඒ කාලයේ පැවැති ආණ්ඩු විසින් ගත් තීන්දු තමයි ඔබතුමා කියාගෙන කියාගෙන ගියේ. 2025 මාර්තු දක්වා ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ - හොරකම සිද්ධ කළාය කියන - එවකට හිටපු ආණ්ඩු විසින් ක්‍රියාත්මක කරපු වැඩ පිළිවෙළ.

මේ අමාත්‍යාංශයේ රේඛීය ඇමතිතුමා හැටියට ඉන්නේ වසන්ත සමරසිංහ ඇමතිතුමා. එතුමන්ලා ළඟ තිබුණා, file එකක්. නමුත්,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චමින්ද විජේසිරි මහතා]

ඒ file එකේ තිබුණේ මේවා නොවෙයි. ගරු කථානායකතුමනි, මම අහන්නේ මේකයි. මේ තිබෙන්නේ පසුගිය ආණ්ඩුව ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළ. හැබැයි, ඔබ බලයට ආවාට පසුව මේ සීනි බදු වංචාවට අදාළ උදවිය කනෙන් අල්ලා හිරේ දමන්න අවශ්‍ය සාක්ෂි එක්ක තොරතුරු තිබුණා, වසන්ත සමරසිංහ ඇමතිතුමා ළඟ. නමුත් ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඒවා කිව්වේ නැහැ. මම මේ ප්‍රශ්නයේ (iv) වන කොටසින් අසා තිබෙන්නේ, "ඉහත (i)හි සඳහන් තීරණය හේතුවෙන් අහිමි වූ බදු ආදායම කොපමණද?" කියන එකයි. ඊළඟට, (v) වන කොටසින් අසා තිබෙන්නේ "සීනි බදු වංචාව සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?" කියලායි. මේ වනවිට ක්‍රියාමාර්ග ගන්නේ ඔබතුමන්ලා නේ. මොකද, ඔබතුමන්ලා නේ දැන් ආණ්ඩු බලයේ ඉන්නේ. ඔබට ලෙහෙසියි. මම අහන්නේ වසන්ත සමරසිංහ ඇමතිතුමාගේ file එකේ ඇත්තටම ඒවා නැද්ද කියායි. පසුගිය කාලයේ ඒ ආණ්ඩුව කරපු ඒවා නිසා අල්ලා ගන්න බැරි වෙන්න ඇති නේ.

ඔබතුමන්ලා සීනි බදු වංචාව පිළිබඳව බොහෝ දේවල් එළියේදී කිව්වා. හැබැයි, අපි දැක්කේ ඒවා අර file එක අනුව සාක්ෂි ඇතුව කිව්වාය කියලා තමයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, "සීනි බදු වංචාව" කියන කාරණය ඔබට බලයට එන්න ගොඩක්ම හේතු වෙච්ච කාරණයක්. මේකට අපට පිළිතුරක් දෙන්න. මේ පිළිතුර සම්බන්ධයෙන් අපට සෑහීමකට පත් වෙන්න බැහැ. මොකද, ඒවා ඒ කාලයේ කරපු දේවල් නේ. ඔබතුමන්ලා ආණ්ඩු බලයට ආවාට පසුව ඔබතුමන්ලාගේ ඒ double cab එකේ පිටුපස තිබුණු file එක වැහිලාද කියා මා අහන්න කැමැතියි. එහෙම නැත්නම් ඒ file එකට අනුව තොරතුරු හොයා ගෙන නිසි දඬුවම් ලබා දෙනවාද, එම හොරකම, වංචාව අනාවරණය කර ගැනීමට ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියාත් මා අහන්න කැමැතියි.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු මන්ත්‍රීතුමනි, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. මේ කරුණු විතරක් නොවෙයි, ඒ සියලු කරුණු සම්බන්ධයෙන් මේ වෙනකොට විමර්ශන පැවැත්වෙමින් තිබෙනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුව උපදෙස් දීලා තිබෙන විධියට, වෝහාරික විගණනයක් කරන්න අවශ්‍ය සහයෝගය ඒ පැත්තෙන් ලබා දෙයි. ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරි කටයුතු සිදු කරගෙන යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
වෝහාරික විගණනයක් කරනවා නම්, ඒ සම්බන්ධයෙන් වන ක්‍රියා පටිපාටිය දැන් පටන් අරගෙන තිබෙන්න එපා යැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. හැබැයි ඒ කාරණය සාධාරණ වෙන්නේ නැහැ. මොකද මා ළඟ තිබෙනවා ගරු කථානායකතුමනි, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එවපු ලියුමත්, ජාතික විගණන කාර්යාලය එවපු ලියුමත්. මේ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් නැහැ, ඒ නිසා සාක්ෂිකරුවන් ගෙන්වලා විමර්ශනය කරන්න විධියක් නැහැ, මේ සම්බන්ධයෙන් අවශ්‍ය සාක්ෂි නැහැ කියලා එහි කියනවා. එතකොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් මේ විගණනය කරන්න බැහැ කියලා පිළිගෙන තිබෙනවා. ජාතික විගණන කාර්යාලය එවපු ලියුමේත් තිබෙනවා, මේ විගණනය කරන්න බැහැ කියලා. මම මේ ලිපි **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, උදාහරණයක් හැටියට ගල් අඟුරු ප්‍රශ්නය ගත්තොත්, ඒක ඒ ටෙන්ඩර් මණ්ඩලයට දැම්මා. දැන් මේ සීනි බදු වංචාවේදීත් ඒක සිදු කළේ නිලධාරින් කියලා, නිලධාරින්ගේ පැත්තට ඒක දමනවාද? ඇත්තටම මේ හොරකම, වංචාව පිළිබඳව කරන වැඩ පිළිවෙළ මොකක්ද? මොකද, දැන් මේක පැහැදිලිව ඔප්පු වෙලා තිබෙනවා. මේක තමුන්නාන්සේලා බලය ලබා ගැනීම වෙනුවෙන් කළ බොරුවක්ද? එහෙම නොවෙයි නම්, ඔබතුමන්ලාත් මේ හොරු ආරක්ෂා කර ගැනීම වෙනුවෙන්, හොරුත් එක්ක එකතු වෙලා මේ හොරකමම නැවත කරන්න යන කටයුත්තක් තමයි මේ කරන්නේ කියන චෝදනාව මම කරනවා.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා මේ පිළිබඳව වැඩිදුර පැහැදිලි කිරීමක් කරයි, ගරු කථානායකතුමනි.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සීනි බදු වංචාව සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කරලා පවත්වාගෙන ගියා. ඒ පිළිබඳව තොරතුරු විගණකාධිපති වෙතින් ලබා ගත්තා. ඉන් පසුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳව නීතිපති වෙත කරුණු වාර්තා කිරීමෙන් පසුව නීතිපතිවරයා උපදෙස් දීලා තිබෙනවා, එම ලිපි ගොනුව පිළිබඳව තවදුරටත් විමර්ශන කටයුතු සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට භාර දෙන්න කියලා. ඒ අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඒ සම්බන්ධව විමර්ශනයක් දැනට සිදු කරමින් පවතිනවා.

## 2020-2025 දක්වා නොබෙදූ පාසල් පෙළ පොත්: මූල්‍යමය වටිනාකම
### 2020-2025 வரை விநியோகிக்கப்படாத பாடநூல்கள்: நிதிசார் பெறுமதி
### UNDISTRIBUTED TEXTBOOKS FROM 2020-2025: FINANCIAL VALUE

207/2024

**3.** **ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹா)
(The Hon. Nalin Bandara Jayamaha)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(ii) වර්ෂ 2020 සිට 2025 දක්වා පාසැල්වල හා මධ්‍යස්ථානවල ඉතිරිව තිබූ, නොබෙදූ පාසැල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව සහ නැවත භාවිත කළ හැකිව තිබූ පාසැල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පාසැල් පෙළ පොත්වල මූල්‍යමය වටිනාකම කොපමණද;

(iv) පාසැල් පෙළ පොත් භාවිතය අවම මට්ටමක පැවති, 2021 වර්ෂයේ පාසැල් පෙළ පොත් මුද්‍රණය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) පාසැල් පෙළ පොත් නියමිත වේලාවට ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கல்வி வெளியீட்டுத் திணைக்களத்தைத் தாபித்ததன் நோக்கங்கள் யாவை என்பதையும்;

(ii) 2020ஆம் ஆண்டு தொடக்கம் 2025ஆம் ஆண்டு வரை பாடசாலைகளிலும், மத்திய நிலையங் களிலும் விநியோகிக்கப்படாமல் எஞ்சியிருந்த பாடசாலைப் பாடநூல் பிரதிகளின் எண்ணிக்கை மற்றும் மீண்டும் பயன்படுத்தக்கூடிய நிலையில் காணப்பட்ட பாடசாலைப் பாடநூல் பிரதிகளின் எண்ணிக்கை என்பன ஆண்டுவாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iii) மேற்படி பாடசாலை பாடநூல்களின் நிதிசார் பெறுமதி எவ்வளவு என்பதையும்;

(iv) பாடசாலை பாடநூல்களின் பயன்பாடு குறைந் தளவில் காணப்பட்ட, 2021ஆம் ஆண்டு அவற்றை அச்சிடுவதற்காகச் செலவிடப்பட்ட நிதி எவ்வளவு என்பதையும்;

(v) உரிய காலத்தில் பாடசாலை பாடநூல்களை வழங்குவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the objectives behind the establishment of the Department of Educational Publications;

(ii) number of the undistributed copies of school textbooks remaining in schools and centres and the number of copies of school textbooks that could have been reused, separately, in each of the years from 2020 to 2025;

(iii) financial value of those school textbooks;

(iv) amount spent on printing school textbooks in the year 2021, when the use of school textbooks was at a minimum level; and

(v) measures that will be taken to distribute school textbooks in time?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

- මූලික, ද්විතීයික හා උසස් අධ්‍යාපනයේ භාවිතය සඳහා සම්මත පාඩම් පොත් පරිවර්තනය කිරීම, ප්‍රසිද්ධ කිරීම, බෙදා හැරීම හා විකිණීම, ප්‍රකාශන හිමිකම් මිලයට ගැනීම.
- අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පාඩම් පොත්, ශබ්ද කෝෂ, කෝෂ ග්‍රන්ථ හා වෙනත් පොත් නිෂ්පාදනය, ප්‍රසිද්ධ කිරීම, බෙදා හැරීම හා විකිණීම. (මෙහි පොත් නිෂ්පාදනය යටතේ පෙළ පොත් ලිවීම, සංස්කරණය හා මුද්‍රණය කිරීම දක්වා වූ කාර්යයන් ආවරණය වේ.
- ශික්ෂණාධාර, ශ්‍රව්‍ය දෘශ්‍ය හා වෙනත් උපකරණ නිෂ්පාදනය, බෙදා හැරීම හා විකිණීම.
- කියවන ද්‍රව්‍ය නිෂ්පාදනය උනන්දු කිරීම.

(ii) 2020 වර්ෂයේ නැවත භාවිත කළ හැකිව තිබූ පාසැල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව 1,312,442යි. 2021 වර්ෂයේ නැවත භාවිත කළ හැකිව තිබූ පාසැල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව 1,563,147යි.

ගරු කථානායකතුමනි, මේ විධියට 2022, 2023, 2024 හා 2025 වර්ෂවලට අදාළව පාසල්වල ඉතිරිව තිබූ පොත්, නැවත භාවිත කළ හැකිව තිබූ පොත් සහ මධ්‍යස්ථානවල ඉතිරි වෙලා තිබෙන පොත් සංඛ්‍යාව පිළිබඳ විස්තර වගු අංක 01 මඟින් දක්වා තිබෙනවා. ඒ විස්තර මම **සභාගත*** කරනවා.

(iii) මෙම ප්‍රශ්නයට අදාළවත් සවිස්තරව එක් එක් වර්ෂයේ, එක් එක් ස්ථානයේ තිබෙන පොත් පිළිබඳ විස්තර වගු අංක 02 සහ 03 යටතේ ඉදිරිපත් කර තිබෙනවා. එම විස්තරත් මම **සභාගත*** කරනවා.

2020, 2021 හා 2022 වර්ෂවලදී පෙළ පොත් ඇණවුම් කිරීම සඳහා දත්ත පද්ධතියක් නොතිබුණි. පාසල් වෙත ලබා දුන් ඇණවුම් ලේඛනයක් මඟින් පෙළ පොත් ඇණවුම ලබාගෙන ඇත. පාසල්වල හා මධ්‍යස්ථානවල

***පිළිතුර අවසානයේ පළ කර ඇත.***
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

ඉතිරිව තිබූ පොත් සංඛ්‍යාව වෙනම ලේඛනගත කර නොමැති බැවින් එම ප්‍රමාණ හා මූල්‍ය වටිනාකම ගණනය කළ නොහැක. 2023-2025 දක්වා පෙළ පොත් ඇණවුම ලබා ගැනීම දත්ත පද්ධතියක් මඟින් සිදු කළ බැවින් එම ගණනය සිදු කර ඇත.

(iv) 2021 වර්ෂයට අදාළව 2020දී පාසල් පෙළ පොත් මුද්‍රණයට වැය කළ මුදල - රු. 5,072,715,535.00

2022 වර්ෂයට අදාළව 2021දී පාසල් පෙළ පොත් මුද්‍රණයට වැය කළ මුදල - රු. 3,146,662,105.00

(v) ඔව්.

- වර්ෂය ආරම්භයේදීම ඉදිරි වර්ෂය සඳහා පෙළ පොත් අවශ්‍යතාව හඳුන්වා දී ඇති පෙළ පොත් ඇණවුම් කිරීමේ පරිගණක දත්ත පද්ධතිය හරහා ලබා ගැනීම.
- එම දත්ත පද්ධතිය අනුව හා දැනට ගබඩාවල පවතින ඉතිරි පෙළ පොත් ප්‍රමාණය අළෙවි අවශ්‍යතාව හා ආපදා තත්ත්ව වැනි අවශ්‍යතා සඳහා අවශ්‍ය විය හැකි ප්‍රමාණයන් අනුව ඉදිරි වර්ෂයට මුද්‍රණය කළ යුතු පෙළ පොත් ප්‍රමාණය තීරණය කිරීම.
- ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන අතර, පෙළ පොත් බෙදාහැරීම දක්වා ගත වන කාලය සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන කාල රාමුව සකසා ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
- පෙළ පොත් මුද්‍රණය රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය හරහා සිදු කරන අතර, එම ක්‍රියාවලියේදී මුලින්ම පාසල්වලට බෙදා දිය යුතු පෙළ පොත් හඳුනාගෙන ප්‍රමුඛතාව අනුව මුද්‍රණය කිරීමට යොමු කිරීම.
- පෙළ පොත් බෙදා හැරීමේ කාර්යය කඩිනම් කිරීම සඳහා ප්‍රසම්පාදනය මඟින් ප්‍රවාහන ආයතනයක් තෝරාගෙන උපරිම ලොරි රථ ප්‍රමාණයක් යොදවා ගැනීම හා බෙදා හැරීම් කාර්යය කාර්යක්ෂම කිරීම සඳහා අමතර සේවකයන් තාවකාලිකව බඳවාගෙන සේවයට යෙදවීම.
- ගබඩාවට පෙළ පොත් ලැබෙන ආකාරය අනුව බෙදාහැරීම සඳහා සැලසුම් සකස් කර බෙදාහැරීම් කටයුතු කඩිනම් කිරීම.

(ආ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද වගු:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட அட்டவணைகள்:*
** Tables tabled:*

වගු අංක 01:

| වර්ෂය | පාසල්වල ඉතිරිව තිබූ පොත් | නැවත භාවිත කළ හැකිව තිබූ පොත් | මධ්‍යස්ථානවල ඉතිරි පොත් |
|---|---|---|---|
| 2025 | 1,522,198 | 10,044,650 | 655,319 |
| 2024 | 3,329,771 | 8,197,690 | 1,035,487 |
| 2023 | 5,787,647 | 6,360,358 | 1,778,913 |
| 2022 | 4,026,069 | 8,324,763 | 1,827,435 |

වගු අංක 02:

| වර්ෂය | පාසල්වල ඉතිරිව තිබූ පොත් (රු.) | නැවත භාවිත කළ හැකිව තිබූ පොත් (රු.) | මධ්‍යස්ථානවල ඉතිරි පොත් (රු.) |
|---|---|---|---|
| 2025 | 644,206,808.67 | 4,790,591,475.44 | 246,049,440.29 |
| 2024 | 1,227,170,229.06 | 3,175,058,790.04 | 390,775,809.25 |
| 2023 | 2,572,799,763.75 | 2,878,483,710.25 | 770,200,291.53 |

වගු අංක 03:

| | |
|---|---|
| 2022 | 409,740,002.13 |
| 2021 | 116,002,559.00 |
| 2020 | 123,063,522.00 |

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අගමැතිතුමියනි, පසුගිය කාලයේ මේ පෙළ පොත් පිළිබඳවත්, මොඩියුල පිළිබඳවත් බරපතළ විධියට සාකච්ඡා කළා. අපට ලැබී තිබෙන තොරතුරු අනුව මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා මේ පෙළ පොත් එක්ක ඉදිරිපත් කරපු මොඩියුල සියල්ලක්ම ඉවත් කර තිබෙනවා. එතකොට ඒ ඉවත් කරපු මොඩියුලවලට කොච්චර මුදලක් වැය වෙලා තිබෙනවාද? එම මොඩියුල සඳහා මුදල් වැය කිරීම අපතේ යෑමක්, නාස්තියක්. ඒ වාගේම, ඒක එක පැත්තකින් දූෂණයක් විධියටත් පෙන්වන්න පුළුවන්. එතකොට මේ සම්බන්ධයෙන් වග කිව යුත්තේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවද? එහෙම නැත්නම් වෙනත් පුද්ගලයෝ ද? ඒ මොඩියුල සඳහා වියදම් වෙච්ච මුදල රුපියල් කෝටි 5 ද, 10 ද කියලා අපි හරියටම දන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් එක එක සංඛ්‍යාලේඛන කියැවෙනවා. ඒ පාඩුව අය කර ගැනීමට ඔබතුමියලා අමාත්‍යාංශය විධියට යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, පෙළ පොත් සහ මොඩියුල කියන්නේ දෙකක් නේ. මුද්‍රණය කරපු පෙළ පොත් බෙදා හැරලායි තිබෙන්නේ. යෝජිත ප්‍රතිසංස්කරණවල 6 ශ්‍රේණියේ පළමුවෙනි වාරයේ මොඩියුල තමයි print කරලා තිබෙන්නේ. අපි ඒවා සිල්ලම ප්‍රතික්ෂේප කරලාත් නැහැ, අයින් කරලාත් නැහැ. 6 ශ්‍රේණියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 2027දී ක්‍රියාත්මක කිරීමට යෝජිතයි. 2027දී ක්‍රියාත්මක කරන කොට ඒවා භාවිත කරන්න අපි සැලසුම් කරලා තිබෙනවා. ඒ අනුව මේ වෙලාවේ ඒවා අයින් කරලාවත්, පාඩුවක් වන විධියට කිසිම තීරණයක් අරගෙනවත් නැහැ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මගේ ඒ අතුරු ප්‍රශ්නයට උත්තරය හම්බ වුණේ නැහැ. මම ඇහුවේ ඉවත් කළ මොඩියුලවලින් කොච්චර පාඩුවක් වෙලා තිබෙනවාද කියලායි, ගරු ඇමතිතුමියනි. පළමුවෙනි අතුරු ප්‍රශ්නයෙන් අහපු ඒ කාරණය මට මුලින්ම පැහැදිලි කරලා දෙන්න.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඒවා අයින් කරලා නැති නිසා පාඩුවක් වෙලා නැහැ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
එතකොට, මොඩියුල එකක්වත් ඉවත් කරලා නැද්ද, ගරු ඇමතිතුමියනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
නැහැ, මගේ කලින් ප්‍රශ්නයට උත්තරය ආවේ නැහැ, ගරු කථානායකතුමනි. පළමුවෙනි අතුරු ප්‍රශ්නයෙන් මම ඇහුවේ, මොඩියුල ඉවත් කරලා තිබෙනවාද කියලා. එකක්වත් ඉවත් කරලා නැද්ද, පාඩුවක් වෙලාම නැද්ද, ගරු ඇමතිතුමියනි?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඔබතුමාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයට මම පිළිතුරු දුන්නා. අපි තාම කිසිම මොඩියුලයක් ඉවත් කරලා නැහැ. අපි 2027දී 6වන ශ්‍රේණියට අදාළ ප්‍රතිසංස්කරණ ආරම්භ කරනවා. එහිදී ඒ මොඩියුල පාවිච්චි කරන්න අපි සැලසුම් කරගෙන යනවා. එක් මොඩියුලයක තිබුණු ඒ කාරණය correct කරන්න ගත යුතු පියවර මොනවාද කියන එකත් අපි තීරණය කරලා තිබෙනවා. මොඩියුල ඉවත් කරලා නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, පිටු ගලවන එකට, කොළ ඉරන එකට ඉවත් කරනවාද, එහෙම නැත්නම් කියන්නේ මොකක්ද කියලා මට පැහැදිලි නැහැ. ඒ නිසා මම දන්නේ නැහැ, ඒකට කියන නම මොකක්ද කියලා. ඉවත් කළත්, පාවිච්චි නොකළත් ඒ දෙකම ඉවත් කළා හා සමානයි.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. 6වන ශ්‍රේණියට මොඩියුලත් නැහැ, පෙළ පොතුත් නැහැ. 6වන ශ්‍රේණියේ ළමයින්ට මොඩියුලත් නැහැ, පෙළ පොතුත් නැහැ; මෙලෝ දෙයක් නැහැ. 6වන ශ්‍රේණියේ ළමයින්ට දැන් පාරේ යන්නත් බැරි තත්ත්වයක් ඇවිල්ලා තිබෙන්නේ, අර මොකක්දෝ කෙහෙල්මලක් දාපු නිසා. ඒ නිසා 6වන ශ්‍රේණියේ ළමයින්ට ඔබතුමියලා ක්ෂණිකව දෙන විසඳුම මොකක්ද? අඩුම ගණනේ ගිය අවුරුද්දේ පෙළ පොත හෝ දෙන්න කටයුතු කරනවාද? 6වන ශ්‍රේණියේ ළමයින්ට දෙන්න කටයුතු කරන පෙළ පොත එන්නේ කවදාද? ඒක දෙවැනි වාරයේවත් දෙනවාද? ඒක මේ පෙළ පොතමද? එහෙම නැත්නම්, ඒ හැර වෙන පෙළ පොත් තිබේද? එහෙම නැත්නම්, පිටුව ගලවපු පරණ පෙළ පොත දෙනවාද? මේ ආදි වශයෙන්, 6වන ශ්‍රේණියේ ළමයින්ට වෙන දේ පිළිබඳව ඔබතුමිය පොඩ්ඩක් පැහැදිලි කරන්න.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, මා දන්නා විධියට නම් 6වන ශ්‍රේණියේ ළමයින්ට පාරේ බැහැලා යන්න බැරි කිසිම ප්‍රශ්නයක් නැහැ. මොකද, 6වන ශ්‍රේණියේ ළමයි කිසිම වැරැද්දක් කරලා නැහැ. පාරේ බැහැලා යන්න බැරි මෙතුමන්ලාටයි. මෙතුමන්ලා කරපු ඒ හානිය නිසා, දැන් පාරේ බැහැලා යන්න බැරි කාටද කියලා මුළු රටම දන්නවා. 6වන ශ්‍රේණියේ ළමයින්ට නම් කිසිම ප්‍රශ්නයක් නැහැ. 6වන ශ්‍රේණියේ ළමයින්ට පාරේ බැහැලා යන්න බැරි කිසිම ප්‍රශ්නයක් නැහැ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, print කරලා ගබඩාවල තිබෙන 6වන ශ්‍රේණියේ පෙළ පොත් අපි මේ වන කොට බෙදන්න පටන් අරගෙන තිබෙනවා. පෙබරවාරි මාසයේ මැද විතර වන කොට සියලු පෙළ පොත් බෙදන්න අපි සූදානම් කරලා තිබෙනවා. ඒ අතරතුර ගුරුවරුන් ඉගැන්වීමේ කටයුත්ත ආරම්භ කරලා තිබෙනවා. මොකද, පෙළ පොත්වල තිබෙන්නේ පරණ syllabus එක නිසා, ගුරුවරුන්ට ඒවා ඉගැන්වීමේ හැකියාව තිබෙනවා. ඒ නිසා ඒ දරුවන්ට පන්ති කාමරය තුළදී සිද්ධ විය යුතු දේ සිද්ධ වෙමින් යනවා. ඒ නිසා ඒ දරුවන්ට අසාධාරණයක් නොවී මේ අවුරුද්ද තුළ ඔවුන්ගේ අධ්‍යයන කටයුතු කරන්න පුළුවන් වන ලෙසට අපි වග බලා ගන්නවා. අපි ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගන්නවා.

## වව්නතිව් ප්‍රා.ලේ. කොට්ඨාසය: පානීය ජල පහසුකම්
### வவுணதீவு பிரதேச செயலாளர் பிரிவு: குடிநீர் வசதிகள்
### VAVUNATIVU DS DIVISION: DRINKING WATER FACILITIES

345/2024

4. **ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනෛ බටහිර, වවුනතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනෛයිඅරුප්පාන්, පන්සේනෛයි, වාදක්කල්මඩු, පාවට්කොඩිසේනෛයි, උන්නිච්චෛයි සහ නෙඩියමඩු වැනි ප්‍රදේශවලට මේ වනතෙක් පානීය ජල පහසුකම් ලබා දී නොමැති බවත්;

(ii) උන්නිච්චෛයි සිට විවිධ ප්‍රදේශ වෙත පානීය ජලය ගෙන ගිය ද, උන්නිච්චෛයි ප්‍රදේශයේ පදිංචිකරුවන්ට පානීය ජලය ලබා දී නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එසේ නම්, ඉහත (i)හි සඳහන් ප්‍රදේශවලට පානීය ජල පහසුකම් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එම ප්‍රදේශවලට පානීය ජල පහසුකම් ලබා දෙන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தில் மண்முனை மேற்கு, வவுணதீவு பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட பனையறுப்பான், பன்சேனை, வாதக்கல்மடு, பாவற்கொடிசேனை, உன்னிச்சை மற்றும் நெடியமடு போன்ற பிரதேசங்களுக்கு இதுவரை குடிநீர் வசதிகள் வழங்கப்படவில்லை என்பதையும்;

(ii) உன்னிச்சையிலிருந்து பல்வேறு பிரதேசங் களுக்கு குடிநீர் கொண்டு செல்லப்பட்ட போதிலும், உன்னிச்சை மக்களுக்கு குடிநீர் வழங்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) ஆமெனில், மேற்படி (i)இல் குறிப்பிடப்பட்டுள்ள பிரதேசங்களுக்கு குடிநீர் வசதிகளை வழங்கு வதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(ii) அப்பிரதேசங்களுக்கு குடிநீர் வசதிகள் வழங்கப்படும் காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Is he aware that -

(i) drinking water facilities have not yet been provided to areas such as Panayaruppan, Pansenai, Vadakkalmadu, Pawatkodichchenai, Unnichchai and Nediyamadhu in Vavunativu Divisional Secretary's Division within Manmunai West of the Batticaloa District; and

(ii) residents of the Unnichchai area have not been provided with drinking water, although drinking water has been supplied from Unnichchai to various areas?

(b) Will he inform this House -

(i) if so, whether steps will be taken to provide drinking water facilities to the areas mentioned in (i) above; and

(ii) the dates when drinking water facilities will be made available to the aforesaid areas?

**(c)** If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)
- දැනට නෙඩියමඩු ගම්මානය තුළ සියයට 90ක් ජලනළ පහසුකම් ආවරණය කර ඇති අතර, ජල සම්බන්ධතා 206ක සංඛ්‍යාවක් ලබා දී ඇත. අනෙකුත් අය විසින් ඉල්ලීම් ඉදිරිපත් කර නොමැත.
- උන්නිච්චෙයි ගම්මානය තුළ සියයට 50ක ජල නළ පහසුකම් ආවරණය කර ඇති අතර, ජල සම්බන්ධතා 217ක සංඛ්‍යාවක් ලබා දී ඇත. ඉතිරි ප්‍රදේශ උස් බිම් සහිත ප්‍රදේශ වේ. එම නිසා එකී ප්‍රදේශ දැනට පවතින බෙදාහැරීම් නළ පද්ධතියෙන් ආවරණය කිරීමට නොහැකි වී ඇත.
- පනෙයියරුප්පාන්, පන්චේනෙයි, වාදක්කල්මඩු, පාවක්කොඩිචේනෙයි යන ප්‍රදේශවල දැනට පවතින නළ දීර්ඝ කිරීම තුළින් අවපීඩන තත්ත්වය හේතුවෙන් ජල සම්බන්ධතා ලබා දීමට නොහැකි වේ.

(ii) Raw water (අමු ජලය) උන්නිච්චෙයි වාරිමාර්ග වැව මඟින් ලබාගෙන අනෙකුත් ප්‍රදේශ සඳහා පානීය ජලය සපයනු ලබයි. නමුත්, උන්නිච්චෙයි ප්‍රදේශය සඳහා ව්‍යාපෘති ආරම්භයේදී ජල නළ පහසුකම් ලබා දී නොමැත. නමුත්, දැනට උන්නිච්චෙයි ප්‍රදේශයේ සියයට 50ක් ආවරණය වී ඇති අතර, ජල නළ සම්බන්ධතා 217ක් පමණ ලබා දී ඇත. ඉතිරි ප්‍රදේශ උස් බිම් වන අතර, දැනට පවතින බෙදාහැරීම් නළ පද්ධතිය මඟින් ආවරණය කිරීමට නොහැකි වී ඇත.

(ආ) (i) මෙම ප්‍රදේශවල ජල නළ දීර්ඝ කිරීම සඳහා දැනට පියවර ගෙන ඇත. Package plants ඉදිකිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති අතර, සැලසුම් හා ක්‍රම සම්පාදන කටයුතු සිදු වෙමින් පවතී. මෙමඟින් මෙම ප්‍රදේශවලට පානීය ජලය ලබා දීම සිදු කළ හැකිය.

(ii) 2026 නොවැම්බර් මස මෙම ව්‍යාපෘතිය අවසන් වීමට නියමිත අතර, ඉන් අනතුරුව උන්නිච්චෙයි ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතාව සපුරාලිය හැකි බව වැඩිදුරටත් දන්වා සිටිමි.

(ඇ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சர் அவர்களுக்கு இந்தத் தகவல்களை வழங்கியவர்கள் தொடர்பில் எனக்குச் சந்தேகமொன்று எழுகின்றது. ஏனெனில், கௌரவ அமைச்சர் அவர்கள் உன்னிச்சைப் பிரதேசத்தில் 50 சதவீதத்துக்கும் அதிகமானவர்களுக்கு குடிநீர் வழங்கப்பட்டு இருப்பதாகக் கூறுகின்ற அதேநேரம், வழங்கப்பட்ட water connectionsஇன் எண்ணிக்கை 217 எனச் சொல்கின்றார். நான் கேள்வி கேட்டது, வவுணதீவு பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட உன்னிச்சை, பனையறுப்பான், வாதக்கல்மடு, பன்சேனை, பாவற்கொடிசேனை, நெடியமடு, ஆயத்தியமலை போன்ற பல பிரதேசங்கள் தொடர்பில்தான். கௌரவ அமைச்சர் அவர்கள் சொல்கிறார், 200 pipeline அங்கே கொடுக்கப்பட்டு இருக்கின்றது, 200 pipeline இங்கே கொடுக்கப்பட்டு இருக்கின்றது என்று.

கௌரவ அமைச்சர் அவர்களே, package system ஒன்றை ஏற்பாடுசெய்து, அதனூடாக குடிநீர் வழங்கப்போவதாக நீங்கள் சொல்கிறீர்கள். நீங்கள் ஆட்சிக்கு வந்து கிட்டத்தட்ட ஒரு வருடமும் நான்கு மாதங்களும் ஆகிவிட்டன. இந்தக் காலப்பகுதிக்குள் இரண்டு வரவு செலவுத்திட்டங்கள்

சமர்ப்பிக்கப்பட்டு முன்மொழிவுகளும் முன்வைக்கப்பட்டு இருக்கின்றன. எனினும், மேற்குறித்த பிரதேசங்களுக்கு குடிநீர் வழங்குவதற்கு உங்களுடைய அரசாங்கத்திடம் எந்தவொரு திட்டமுன்மொழிவும் இல்லை. எதிர்காலத்தில் செய்வோமெனச் சொல்கிறீர்கள்.

கடந்த காலத்தில் மணலாறு - வெலிஓயா பிரதேசங்களில் சட்டவிரோதமாகக் குடியேற்றப்பட்ட பெரும்பான்மை சமூகத்தினருக்கு தண்ணீர் வழங்குவதற்கு 23,000 மில்லியன் ரூபாயை வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கியிருக்கிறீர்கள். பெரும்பான்மையின சிங்கள மக்களுக்கு தண்ணீர் வழங்குவதற்கு உங்களிடம் காசு இருக்கிறது. வவுணதீவு பிரதேச செயலாளர் பிரிவிலுள்ள மக்களுக்கு குடிநீர் வழங்குவதற்கு உங்களிடம் காசும் இல்லை; திட்டமும் இல்லை. இது எந்த வகையில் நியாயம்? எனக் கேட்கின்றேன். கிவுல் ஓயா திட்டத்தினூடாக 4,000 விவசாயிகளுக்குத் தண்ணீர் வழங்கப் போவதாகச் சொல்கிறீர்கள். மேற்குறிப்பிட்ட பிரதேசங்களில் 10,000-15,000 பேருக்கு குடிநீர் வழங்குவதற்கு, நீங்கள் ஒதுக்கியிருக்கும் 23,000 மில்லியன் ரூபாயில் 10 சதவீதம் இருந்தால் போதும். இது எந்த வகையில் நியாயம் என்பதை விளங்கப்படுத்துங்கள்!

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, සියයට 50ක් කියලා මම කිව්වේ, සියලු ප්‍රදේශවලින් සියයට 50ක් නොවෙයි. නිශ්චිතව මේ පිළිතුරේ තිබුණා, නෙඩියමඩු ගම්මානය තුළ සියයට 90ක් ජල නළ පහසුකම් ආවරණය කර තිබෙන බව. සම්බන්ධතා 206යි. උන්නිච්චෙයි ගම්මානය තුළ සියයට 50ක් ජල නළ පහසුකම් ආවරණය කරලා තිබෙනවා. සම්බන්ධතා 217යි. පනෙයියරුප්පාන්, පන්චේනෙයි, වාදක්කල්මඩු, පාවක්කොඩිචේනෙයි ප්‍රදේශවලට දැනට වතුර දීලා නැහැ. එතුමා කියන්නේ අපි මොකුත් කරලා නැහැ කියලා. නමුත් මේ package plant එක හදන්න රුපියල් මිලියන 30ක් වෙන් කරලා ටෙන්ඩර් එක ප්‍රදානය කරලා තිබෙනවා, 2025.09.17වෙනි දා. ඉතිරි කටයුතුවල ජල ගබඩා ටැංකිය, පොම්පාගාරය ඉදි කිරීම හා අදාළ සිවිල් කටයුතුවලට අදාළ ප්‍රසම්පාදන - procurement - වැඩ කටයුතු සිද්ධ වෙමින් තිබෙනවා. ඒ වාගේම තමයි පොම්ප සවි කිරීම සහ ඉතිරි වැඩකටයුතු. ඒකයි මම පිළිතුරු දුන්නේ, 2026 නොවැම්බර් මස වෙනකොට මේ ව්‍යාපෘතිය අවසන්වීමට නියමිතයි කියලා. මොකද, මෙතැන 1,000 cubic metre package plant එකක් ඉදි කරන්නට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් තිබෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ சபாநாயகர் அவர்களே, மட்டக்களப்பு மாவட்டத்துக்கு விஜயமொன்றை மேற்கொள்ளுமாறு நான் கௌரவ அமைச்சர் அவர்களை அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். நான் இந்தப் பாராளுமன்றத்தில் பல சந்தர்ப்பங்களில் குடிநீர் வழங்குவது தொடர்பில் பேசியிருக்கிறேன். ஏனெனில், குடிநீர் என்பது மனிதனுடைய ஓர் அடிப்படைத் தேவை! கௌரவ அமைச்சர் அவர்களே, உன்னிச்சைப் பிரதேசம் தொடர்பில் உங்களுக்கு வழங்கப் பட்டிருக்கின்ற தகவல் தவறானது. உன்னிச்சைப் பிரதேசத்தில் 50 சதவீதத்துக்கும் அதிகமான இடங்களுக்கு குடிநீர் வழங்கியிருப்பதாகவும் 217 connections கொடுத்திருப்ப தாகவும் நீங்கள் சொல்கிறீர்கள். அது தொடர்பில் நான் இங்கு விவாதிக்க விரும்பவில்லை. ஆனால், ஏறாவூர்பற்று, பட்டிப்பளை, போரதீவுபற்று - காக்காச்சிவட்டை எனப் பல பிரதேசங்களுக்கு குடிநீர் வழங்குவதற்கான திட்டங்களைக் காணமுடியவில்லை. We cannot even see on the horizon a proper plan to provide drinking water to these families.

என்னுடைய அன்பான வேண்டுகோள் என்னவெனில், நீங்கள் எங்களுடைய மாவட்டத்துக்கு விஜயமொன்றை மேற்கொண்டு, இவ்விடயத்துடன் தொடர்புடைய உங்களுடைய officersஐ அழைத்துப் பேசுங்கள் என்பதுதான். சில இடங்களுக்கு அம்பாறை மாவட்டத்தினூடாக தண்ணீர் வழங்க வேண்டுமெனச் சொல்கிறார்கள். இன்னும் சில இடங்கள் நீங்கள் குறிப்பிட்டது போன்று உயரம் அதிகம். எனவே, எல்லா இடங்களுக்கும் பொருந்தக்கூடிய வகையில், வெவ்வேறு package model ஒன்றைச் செய்ய வேண்டும் அல்லது community water supply serviceஐ செய்து, அதை பிரதேச சபையிடம் ஒப்படைக்க வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய கேள்வி என்னவென்றால், கிவுல்ஓயா திட்டத்தினூடாக 4,000 பேருக்கு தண்ணீர் கொடுப்பதற்கு 23,000 மில்லியன் ரூபாயை உங்களால் ஒதுக்க முடியுமென்றால், மட்டக்களப்பில் இருக்கின்ற மக்களுக்கு குடிநீர் வழங்குவதற்கு நிதி ஒதுக்க ஏன் முடியாது என்பதுதான். ஓர் அடிப்படைத் தேவையாக இருக்கின்ற குடிநீரை எங்களுடைய மக்களுக்கு வழங்குவதற்கு உங்களிடம் நிதி இல்லை.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ප්‍රශ්නය අහලා අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

உங்களுடைய பிரதேச அபிவிருத்திக் குழுவின் தலைவர் இங்கு இருக்கிறார். அவர் போகும் இடங்களிலெல்லாம் இலங்கை தமிழரசுக் கட்சி பற்றி பேசுகின்றார். அவருடைய குடும்பத்தைச் சேர்ந்தவருடைய ஊழல் பற்றி நாங்கள் பேச வரவில்லை. அவர்தான் உங்களுடன் பேச வேண்டும். கிவுல்ஓயா திட்டத்துக்கு நிதி ஒதுக்க முடியுமான அரசாங்கத்துக்கு, ஏன் உன்னிச்சை, வாதாக்கல்மடு பிரதேசங்களில் community water supply projectஐ மேற்கொள்வதற்கு நிதி ஒதுக்க முடியாது? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නය පැහැදිලියි. එතුමා අහන්නේ උන්නිච්චෙයි ගැන. නමුත් කියන්නේ කිවුල්ඔය ගැන. කිවුල්ඔයට රුපියල් මිලියන 23,000ක් වෙන් කරලා නැහැ. කිවුල්ඔය ජලාශය හදන එකේ එක කොටසක් පමණයි පානීය ජලය ලබා දීම. අනික් ඒවා කෘෂිකාර්මික කටයුතු සහ අනෙකුත් කටයුතු සඳහා. මේ කියන ප්‍රදේශයට ඇත්තටම ජලය ගන්න අපට තිබෙන්නේ වාලච්චේන ජල සම්පාදන ව්‍යාපෘතිය. වාලච්චේන ව්‍යාපෘතියට වතුර ගන්න තිබෙන්නේ රුගම් කිතුල් ජලාශ ව්‍යාපෘතියෙන්. නමුත් රුගම් ජලාශයෙන් දැනට වතුර ගන්න බැහැ. ඒකට මුන්දෙනිආරු ජල ව්‍යාපෘතිය එන්න ඕනෑ. *[බාධා කිරීමක්]* නැහැ, මුන්දෙනිආරු සඳහා preliminary designs කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ඒකට අදාළ මුදල් වෙන් කරලා තිබෙනවා. මුන්දෙනිආරු ව්‍යාපෘතියට අදාළ මූලික කටයුතු ආරම්භ කරලා

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

තිබෙනවා. ඊට පසුව තමයි ඒ අදාළ funding agency එකත් එක්ක අපට ගිවිසුමට යන්න වෙන්නේ.

මුන්දෙනිආරු ජලාශ ව්‍යාපෘතියට අදාළ මූලික කටයුතු අපි ආරම්භ කළා, ගරු කථානායකතුමනි. ඒවා කාලයක් තිස්සේ නතර වෙලායි තිබුණේ. නමුත් දැන් ආරම්භ කර තිබෙනවා. ඒ ව්‍යාපෘතිය කල් යන නිසා තමයි මෙතැන 1,000 cubic metre package plant එකක් හදන්නේ. මුන්දෙනිආරු ව්‍යාපෘතිය තවදුරටත් කල් ගියොත්, - මොකද, ඒකට අවුරුදු දෙක තුනක් යනවා. ජලාශයක් නිකම් ඉදි කරන්න බැහැ නේ. ජලාශ දෙකක් ඉදි කරන්න තිබෙනවා. අපි තවත් 1,000 cubic metre package plant එකක් ඉදි කරන්න සැලසුම් කර තිබෙනවා, අපේ වාලච්චේන mega project එකෙන් වතුර එනතුරු. ඒකට උත්තරයක් විධියට තමයි අපි මුදල් වෙන් කරලා තිබෙන්නේ. අපි ඒක මේ නොවැම්බර් මාසයේ අවසන් කරන්න නියමිතයි.

## තිරප්පනේ "සේනකපුර යාය" අමුණ: විස්තර

### திரப்பனை 'சேனக்கபுர யாய' அணைக்கட்டு: விபரம்

### "SENAKAPURA YAYA" ANICUT IN THIRAPPANE: DETAILS

563/2025

**5. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තිරප්පනේ, මීවැල්ලෑව, 'සේනකපුර යාය' නමින් අමුණක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) එම අමුණ ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම අමුණ තුළින් ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අමුණ මඟින් ජලය ලබා දෙන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එම අමුණ හේතුවෙන් මේ වනවිට කුඹුරුවලට වැලි පිරීම හේතුවෙන් ගොවීන් දුෂ්කරතාවයට පත්වී සිටින බව දන්නේද;

(vi) එසේ නම්, එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுரம் மாவட்டத்தில், திரப்பனை, மீவெல் லேவ, 'சேனக்கபுர யாய' எனும் பெயரில் ஓர் அணைக்கட்டு நிர்மாணிக்கப்பட்டு உள்ள மையை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி அணைக்கட்டை நிர்மாணிப்பதற்குச் செலவிடப்பட்ட தொகை எவ்வளவு என்ப தையும்;

(iii) இந்த அணைக்கட்டின்மூலம் பயன்பெறும் விவசாயக் குடும்பங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) மேற்குறிப்பிட்ட அணைக்கட்டின்மூலம் நீர் பாய்ச்சப்படும் வயற்காணிகளின் அளவு யாது என்பதையும்;

(v) மேற்படி அணைக்கட்டு காரணமாக இன்றளவில் வயற்காணிகளில் மணல் நிரம்புவதால் விவசாயிகள் அசௌகரியங்களுக்கு முகங் கொடுத்துள்ளமையை அறிவாரா என்பதையும்;

(vi) ஆமெனில், மேற்படி பிரச்சினையைத் தீர்ப்ப தற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that an anicut named "Senakapura Yaya" has been constructed at Meewellawa, Thirappane in the Anuradhapura District;

(ii) the amount spent on the construction of the aforementioned anicut;

(iii) the number of farming families benefiting from the said anicut;

(iv) the extent of paddy land irrigated by the said anicut;

(v) whether he is aware that farmers are facing difficulties as paddy fields are getting filled with sand due to the anicut; and

(vi) if so, the measures that will be taken to resolve the said problem?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මීවැල්ලෑව ග්‍රාම නිලධාරි වසමේ සේනපුර අමුණ නමින් අමුණක් ඉදි කර ඇත.

(ii) අමුණ ඉදිකිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ,

| | |
|---|---|
| 2023 වර්ෂයේ | රු. 9,412,772.14 ක්ද, |
| 2024 වර්ෂයේ | රු. 23,020,600.34 ක්ද, |

වැය කර ඇති මුළු මුදල රු. 32,433,372.48කි.

(iii) අමුණ තුළින් ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව 70ක් පමණ වේ.

(iv) අමුණ මඟින් ජලය සැපයෙන කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 120 පමණ වේ.

(v) ඔව්.

(vi) පුවත් පත් වාර්තාවක පළ වූ මෙම කරුණ සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්, ප්‍රාදේශීය ඉංජිනේරු හා තාක්ෂණ නිලධාරි විසින් සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙම අමුණේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගෙන එන ලද වැලි, කුඹුරු අසල ගොඩ ගසා තිබූ අතර වර්ෂාව සමඟ එම වැලි ගොඩවල් ඒ අසල ඇති ලියද්දකට ගසා ගොස් ඇති බව තහවුරු කර ඇත. එම වැලි මේ වන විට ඉවත් කර ඇති අතර, අමුණ ඉදිකිරීම හේතුවෙන් වැලි පිරී කුඹුරුවලට හානි නොවන බව තහවුරු වී ඇත. මෙම ඉදිකිරීමෙන් පසු කුඹුරුවලට හානි නොවන බව අමුණ අවට කුඹුරු වගා කරනු ලබන ගොවීන් විසින් ලිඛිතව ප්‍රකාශ ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මෙය හොඳ ව්‍යාපෘතියක්. නමුත්, ගොවි සංවිධාන දෙකක් අතර මේ පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන විධියට, මේ අමුණෙන් ඵල ප්‍රයෝජන ගන්නා ගොවි සංවිධානයේ කට්ටිය මේකට කැමතියි. ඒ වාගේම, ඒරු වැව සම්බන්ධව ගොවි සංවිධානයේ කට්ටිය විරෝධතාව පළ කරන්නේ ඒ අයගේ කුඹුරුවලට ජල ගැලීම් සිද්ධ වෙනවා කියන කාරණය නිසායි. දැනට එය සැහෙන දුරට පියවා ගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම මේ කන්නය වෙනකොටත් සමස්තයක් විධියට රටම මුහුණ දුන්න කාරණයේ දී මේ ගොවි සංවිධාන දෙකේම කුඹුරුවලට නැවත වැලි ගහලා තිබෙනවා. ඒ නිසා එය නැවත මතු වෙනවා. දැන්නම් ඒ කට්ටිය පිළිගෙන තිබෙනවා, මේක සමස්තයක් විධියට වෙච්ච කාරණයක් කියලා. නමුත්, යට තිබුණු ප්‍රශ්නයක් එක්ක නැවතත් ඒ කාරණය මතු වෙමින් තිබෙනවා. ඒ නිසා මේ කියන කාරණය පිළිබඳව ප්‍රායෝගිකව නැවත සොයා බැලීමක් කරනවා නම් හොඳයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ කන්නයේ ඒ ගොවි සංවිධානවල ජනතාවගෙන් කුඹුරුවලට වැලි ගහලා තිබෙන, 'පූර්ණ හානි' කියලා හඳුනා ගත් පිරිසකට යම් කිසි ප්‍රමාණයකට වන්දියක් දීලා තිබෙනවා. අර්ධ හානි කියලා හඳුනා ගත් අයගෙත් සමහර තැන්වල ලියැදි පිටින්ම වැලි ගහලා යට වෙලා තිබෙනවා. ඒවා දාලා තිබෙන්නේ අර්ධ හානි විධියටයි. මේ අයටත් පූර්ණ හානි සිද්ධ වෙලා තිබෙනවා. ඒ අය නැවතත් ඒ වැලි අයින් කරන්න පිරිවැයක් දරලා තිබෙනවා. මම හිතන විධියට පූර්ණ හානි සිදු වෙච්ච අයට වැඩිය අර්ධ හානි සිදු වෙච්ච අය විශාල පිරිවැයක් දරමින් ඒ කටයුතු කරමින් ඉන්නවා. ඒ අයට වන්දි ලබා දීම ඔබතුමන්ලා ප්‍රතික්ෂේප කරලා තිබෙනවා, "අර්ධ හානිවලට වන්දි ලබා දෙන්නේ නැහැ" කියලා. මේක සාධාරණ නොවන බව තමයි ගොවි සංවිධාන නිලධාරි මහත්වරු වාගේම ගොවීන් අද මැසිවිලි නඟන්නේ. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමන්ලා පරීක්ෂණයක් පවත්වා අර්ධ හානි සම්බන්ධයෙන් පුරෝකථනයක් කරලා, ඒ කියන්නේ අර්ධ හානි කියන කාරණය පිළිබඳ හරි අවබෝධයක් ලබා දීලා, මේ නිසා ගොවීන්ට වෙච්ච අසාධාරණයට, නැත්නම් වෙච්ච හානියට වන්දි පූර්ණයක් කරන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද කියන එක දැන ගැනීමට කැමැතියි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, අමුණට අදාළව ගත්තොත් වජිර ගොවි මහත්මා, සුසන්ත විජේරත්න ගොවි මහත්මා, රත්නපාල ගොවි මහත්මා, නිර්මන් විජේරත්න ගොවි මහත්මා ඇතුළු කණ්ඩායමෙන් වෙන වෙනම පෞද්ගලික මට්ටමෙනුත් මම තොරතුරු ලබා ගත්තා. මේ ගොවි ජනතාව ඒ අමුණට අදාළ කාරණය සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කළා. ඒ අමුණ සම්බන්ධයෙන් වෙනත් ගැටලු තිබෙනවා නම් කෘෂිකර්ම කමිටුවේ සාකච්ඡා කරලා, සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කරලා ඊට අදාළව නිර්දේශයන් එවනවා නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විධියට අපට මැදිහත් වෙන්න පුළුවන්කම තිබෙනවා.

ඊළඟට, වන්දි සම්බන්ධ කාරණය ගත්තොත්, ඇත්තටම මීට පෙර වන්දි ලබා දුන්නේ භෝග හයකට පමණයි. හැබැයි, මෙවර අපි ආණ්ඩුව විධියට එළවලු භෝග සියල්ල, කෙසෙල්, අන්නාසි, පැණි කොමඩු ඇතුළු පලතුරු වර්ග වාගේම කලින් කියපු භෝග 6 සහ සත්තුන්ට වුණු හානි සම්බන්ධව තීන්දුවක් ගත්තා. ඒ වාගේම තමයි වන්දි මුදලත් වැඩි කළා. කලින් වන්දි ගෙවපු ක්‍රමයට ගෙව්වා නම් අක්කරයකට - පැළ ගොයම හානි වෙච්ච නිසා - වී ගොවියාට ලැබෙන්නේ රුපියල් 16,000යි.

හැබැයි, ගොවියාට මෙවර රුපියල් 60,000ක් හම්බ වෙනවා. අපි නිලධාරීන්ට පැහැදිලිවම උපදෙස් ලබා දුන්නේ, ගොවියාට මෙම වන්දි මුදල් ලබා නොදෙන තැනට අදාළව හේතු හොයනවා වෙනුවට, ලබා දීමට අදාළ හේතු එකතු කරමින් එම වන්දි මුදල් ලබා දෙන තැනට අදාළ කාරණා ටික සම්පූර්ණ කර දෙන්න කියලායි. ඒ අනුව ඒ එවපු හැම ඉල්ලීමකටම අදාළව වන්දි මුදල් ලබා දෙනවා. ඒ සඳහා මුදල් වෙන් වෙලායි තිබෙන්නේ. මේ වනකොට සියයට 90කට විතර වන්දි ලබා දීලා අවසන්. ඉතුරු ටිකත් අපි ලබා දෙනවා. ඒ තත්ත්වය තුළ තවමත් වන්දි නොලැබුණු තැන්වලට ඊට අදාළව ලැබිලා තිබෙන මුදල් නිදහස් කරන්න පුළුවන්. ඊළඟට, අර්ධ හානි සිදු වෙලා තිබෙන වගාවන් සම්බන්ධව ගොවි ජනතාව එවා තිබෙන ඉල්ලීම්වලට අදාළවත් අපි ඉදිරි ක්‍රියාමාර්ග ගන්නවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියන ආකාරයට නම්, වන්දි ලබා දීමේ ගැටලුවකුත් නැහැ. නමුත් ගිය කන්නයේ ඉඳලාම වන්දි ලබා දීම ක්‍රියාත්මක වෙලා නැහැ. අර්ධ හානි සම්බන්ධයෙන් නම් මේ වන විට කිසිදු ක්‍රියාමාර්ගයක් අරගෙන ක්‍රියාත්මක වීමේ තත්ත්වයක්වත් පෙනෙන්න නැහැ. ඒ වාගේම ගොවි මහත්වරුන්ට පොහොර සහනාධාරයේ දෙවන කොටසත් තවම ලැබෙන්නේ නැහැ. අනුරාධපුරය ගත්තාම, හෙක්ටෙයාර 80,000කට විතර අදාළව තවම එම වන්දි මුදල් ලැබිලා නැහැ. හෙක්ටෙයාර 10,000කට වාගේ එහි පළමුවැනි කොටසවත් තවම ලැබිලා නැහැ. ගංවතුරත් එක්කම මේ ප්‍රදේශය ඇතුළු අනෙකුත් ප්‍රදේශ විශාල ප්‍රමාණයක කුඹුරුවලට කොළ කහවීමේ රෝගයක් ව්‍යාප්ත වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමා දැනුවත් වෙලා ඇති. තවම ඒ රෝගය හඳුනාගෙන නැහැ. ඒක දිලීරයක් ද, කෘමි උවදුරක් ද, නැත්නම් පසේ යම් ප්‍රශ්නයක් ද කියන එක පිළිබඳව තවම පරීක්ෂණයක් කරලා, හරි නිගමනයක් ඇතුව ගොවීන්ට නිසි උපදේශයක් ලබා දීලා නැහැ, මේකට ගත යුතු ක්‍රියාමාර්ගය මොකක්ද කියලා. ගංවතුර නිසාම සිදු වුණු දෙයක් තමයි, කොළ කහවන රෝගයත්. ඒ ප්‍රශ්නයට මේ රටේ සමස්ත ගොවි ජනතාවම මුහුණ දෙමින් ඉන්නේ. ඒක නිසා අස්වැන්නට කොපමණ ප්‍රමාණයකින් හානි වෙයිද, අස්වැන්නට කොච්චර

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

බලපෑමක් වෙයිද, කොතරම් ප්‍රමාණයකින් අස්වැන්න බාල වෙයිද කියලා තේරුම් ගන්න බැරිවයි ගොවීන් ඉන්නේ. එම නිසා ඔබතුමන්ලා මේ කොළ කහවන රෝගය පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවාද? මේ නිසා අස්වැන්නේ යම් බාල වීමක් වුණොත් ඒ අයට යම්කිසි සහනාධාරයක් ලබා දෙන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද? ඔබතුමන්ලා මේ දේවල් වචනයට විතරක් සීමා නොකර ප්‍රායෝගිකව ඉෂ්ට කරලා දෙන්න. ඒ වාගේම ඔබතුමා කිව්වා, අනෙකුත් භෝගවලට වන්දි ලබා දීමත් ක්‍රියාත්මක කරනවා කියලා. හැබැයි, බඩඉරිඟු ඇතුළු අනෙකුත් භෝගවලට කිසිම වන්දි ලබා දීමක් මෙතෙක් ක්‍රියාත්මක වෙලා නැහැ.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ප්‍රායෝගික තත්ත්වය තමයි මම කිව්වේ, ගරු මන්ත්‍රීතුමා. මේ වනකොට එළවලු ඇතුළු භෝගවලට වන්දි මුදල් සියයට 90කට වැඩිය ගෙවා අවසානයි. අනෙක් අයට සම්පූර්ණයෙන් මුදල් නිදහස් කරලා තිබෙන්නේ. ඒ සඳහා මුදල් තිබෙනවා. දිස්ත්‍රික් ලේකම්වරුන්ට ඒ මුදල් එවලා තිබෙන්නේ. ඒ වාගේම සතුන්ට හානි වෙලා තිබෙනවා නම් ඒ සඳහාත් අපි මුදල් ලබා දෙනවා. හරකෙක් මැරුණා නම් රුපියල් ලක්ෂ 2ක් ලබා දෙනවා. හරක් 5ක් නම් රුපියල් ලක්ෂ 10ක් ලබා දෙනවා. එළුවෙකුට රුපියල් 20,000ක් ලබා දෙනවා. ඌරෙකුට රුපියල් 20,000ක් ලබා දෙනවා. කුකුළෙකු සඳහාත් අපි මුදල් දෙනවා. මීට කලින් මෙහෙම දීලා නැහැ. මේ මුදල් නිදහස් කරලා තිබෙන්නේ. දිස්ත්‍රික් ලේකම්වරුන්ට මේ මුදල් එවලා තිබෙන්නේ. අනෙකුත් වන්දි ලබා දීම සඳහාත් සම්පූර්ණයෙන්ම මුදල් එවලා තිබෙන්නේ. ඒ හින්දා ඒවා ගැන ගැටලුවක් තබාගන්න අවශ්‍ය නැහැ.

ඒ වාගේම පොහොර සහනාධාරය ගත්තොත්, ඒ සඳහා අවශ්‍ය මුදලුත් සම්පූර්ණයෙන්ම නිදහස් කරලා තිබෙන්නේ. මේ වනකොට පළමුවැනි මුරේ පොහොර සහනාධාරයෙන් සියයට 95කට වැඩිය දීලා තිබෙනවා; ගිණුම්ගත කරලා තිබෙනවා. දැන් ඉතිරි මුදල් ටිකත් ගිණුම්ගත කරගෙන යනවා. එම නිසා ගොවි ජනතාව කලබල වෙන්න අවශ්‍ය නැහැ. ගොවි ජනතාවට අවශ්‍ය පොහොර සහනාධාරය අනිවාර්යයෙන්ම ලැබෙනවා.

මුලින්ම, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් ගත්තොත්, ඒ නිලධාරීන් හාරදහස් ගණනකගේ පුරප්පාඩු තිබෙනවා. එම නිසා ඉන්න අයට වැඩ ගොඩක් වැඩි වුණා; වන්දි ලබා දීම ආදී කටයුතු ගොඩක් වැඩි වුණා. එවැනි තත්ත්වයන් ඇතුළේ තමයි නිලධාරීන් නිවාඩු නොතකා වැඩ කළේ. එහෙම වැඩ කරපු තත්ත්වය අනුව තමයි අපි මේ පිළිබඳව විග්‍රහ කරගන්න ඕනෑකම තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා කොළ කහවීමේ රෝගය ගැන. ඇත්තටම ගොයමට මේ රෝගය ව්‍යාප්ත වෙලා තිබෙනවා. ඒක අපි පිළිගන්න කාරණයක්. මේ වනකොට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය ඒ සඳහා යොමු වෙලා තිබෙනවා. AI මහත්වරුන් ඇතුළු අපේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මේ වනකොට ඊට අදාළ කටයුතුවලට නිසියාකාරව මැදිහත් වෙමින් ඉන්නවා. කොහොම නමුත්, කිසියම් කාරණාවක් නිසා ගොවි ජනතාව නැවත වතාවක් ආපදාවකට ලක් වුණොත්, හානියක් වුණොත් ඒ ගොවි ජනතාව අපි තනි කරන්නේ නැහැ. රජය විධියට; වගකිව යුතු පිරිසක් විධියට; ආණ්ඩුවක් විධියට අපි ගොවි ජනතාව වෙනුවෙන් අනිවාර්යයෙන්ම මැදිහත් වනවා. අපි ගොවියා අතරමං කරන්නේ නැහැ.

ඔබතුමා වන්දි ගැනත් කිව්වා. අපි ආණ්ඩුව භාර ගන්නකොට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ඊට කලින් තිබුණු යල කන්නයේ වන්දි ගෙවා තිබුණේ නැහැ. අපි ආණ්ඩුව භාරගෙන පළමුවෙන්ම කළේ ඒ නොගෙවපු වන්දි මුදල් ගෙවපු එකයි. ඉතිහාසයේ පළමුවැනි වතාවට මහ කන්නයේ අවස්ථා දෙකකදී වගාවන්ට හානි වුණා. ඒ අවස්ථා දෙකෙන් පළමුවැනි වතාවේ සිදු වූ හානියට අදාළ වන්දි මහ කන්නය ගත වෙන්න කලින් අපි ගෙවලා ඉවර කළා. ඒ ගැන ගොවියෝ දන්නවා. ඊළඟට, නැවත වගාවන්ට හානි වුණා. යල කන්නය ලබන්න කලින් ඒ හානිය සඳහාත් අපි වන්දි ගෙව්වා. මෙහෙම වුණේ ඉතිහාසයේ පළමුවැනි වතාවටයි. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මේකට සාක්ෂි දරනවා. ඒ ගොවි ජනතාවට අදාළ වන්දි මුදල් අපි නිසියාකාරව ලබා දීලා තිබෙනවා.

ගොවීන්ට මේ කාරණය මම නැවතත් කියන්න ඕනෑ. වන්දි ලබා ගැනීමට සුදුසුකම් ලබන සියලු ගොවි ජනතාවට වන්දි මුදල් ලැබෙනවා. අදාළ වන්දි මුදල් නොලැබුණු තව සුළු පිරිසක් ඉන්නවා. ඒ අයටත් ඒ වන්දි මුදල් අනිවාර්යයෙන්ම ලැබෙනවා. ඒ වාගේම පොහොර සහනාධාරය ලබා ගැනීම සඳහා සුදුසුකම් තිබෙන සියලු ගොවි ජනතාවට නියත වශයෙන්ම ඒ මුදලුත් ලැබෙනවා කියන කාරණය මේ වෙලාවේ මම සහතික කර ප්‍රකාශ කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -627/2025- (1), ගරු කිංස් නෙල්සන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## රජයේ ඉහළ තනතුරු දරන නිලධාරීන්ට නිකුත් කරන ලද වාහන බලපත්‍ර: විස්තර
### உயர் பதவிகளிலுள்ள அரச உத்தியோகத்தர்களுக்கு வழங்கப்படும் வாகன அனுமதிப்பத்திரங்கள்: விபரம்
### VEHICLE PERMIT ISSUED TO HIGH-RANKING GOVERNMENT OFFICIALS: DETAILS

662/2025

**7. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රජයේ ඉහළ තනතුරු දරන නිලධාරීන් විශ්‍රාම යන අවස්ථාවේදී, ඔවුන්ට සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම වර්ෂයේ සිට මේ දක්වා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම බලපත්‍ර ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත සඳහන් බලපත්‍ර මේ වන විටත් ලබා දෙන්නේද;

(ii) නොඑසේ නම්, බලපත්‍ර ලබා දීම නවත්වන ලද වර්ෂය කවරේද;

(iii) එම බලපත්‍ර ලබා දීම නැවැත්වීමට හේතු කවරේද;

(iv) එම බලපත්‍ර ලබා දීම නැවත ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(v) එම බලපත්‍ර ලබා දීම නැවැත්වීම හේතුවෙන් බලපත්‍ර හිමි නොවූ විශ්‍රාමිකයන්ට එම බලපත්‍ර ලබා දෙන්නේද;

(vi) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உயர் பதவிகளிலுள்ள அரச உத்தியோகத்தர்கள் ஓய்வுபெற்றுச் செல்லும்போது அவர்களுக்குச் சலுகை அடிப்படையில் மோட்டார் வாகன அனுமதிப்பத்திரங்களை வழங்கும் திட்டம் ஆரம்பிக்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;

(ii) மேற்படி ஆண்டு முதல் இற்றைவரை வழங்கப் பட்டுள்ள அனுமதிப்பதிரங்களின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்ப தையும்;

(iii) மேற்படி அனுமதிப்பத்திரங்களைப் பெறுவதற் குத் தகுதிபெறும் பதவிகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்குறிப்பிட்ட அனுமதிப்பத்திரங்கள் தற் போதும் வழங்கப்படுகின்றனவா என்பதையும்;

(ii) இன்றேல், அனுமதிப்பத்திரங்களை வழங்கும் நடவடிக்கை நிறுத்தப்பட்ட ஆண்டு யாது என்பதையும்;

(iii) மேற்படி அனுமதிப்பத்திரங்களை வழங்கும் நடவடிக்கை நிறுத்தப்பட்டமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி அனுமதிப்பத்திரங்களை வழங்கும் நடவடிக்கை மீள ஆரம்பிக்கப்படும் திகதி யாது என்பதையும்;

(v) மேற்படி அனுமதிப்பத்திரங்களை வழங்கும் நடவடிக்கை நிறுத்தப்பட்டமையால் அனுமதிப் பத்திரங்கள் கிடைக்கப்பெறாத ஓய்வூதியதாரர் களுக்கு அந்த அனுமதிப்பத்திரங்கள் வழங்கப் படுமா என்பதையும்;

(vi) அவ்வாறெனில், அது தொடர்பில் மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) year in which the scheme was introduced for granting motor vehicle permits to high-ranking government officials on a concessional basis upon their retirement;

(ii) number of vehicle permits issued each year since then, separately; and

(iii) designations eligible for obtaining the said permits?

(b) Will he also inform this House -

(i) whether the permits mentioned above are still being issued;

(ii) if not, the year in which the issuance of permits was suspended;

(iii) the reasons for suspending the issuance of the said permits;

(iv) the date on which the process of issuing the said permits will be resumed;

(v) whether permits will be issued to pensioners who did not receive permits due to the suspension in the issuance of them; and

(vi) if so, the measures that will be taken in that regard?

(c) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2000 ජුනි මස 05වන දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99හි (I) වන සංශෝධනය.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ තොරතුරු 2015 වසර සිට පරිගණකගත කර ඇති බැවින්, ඒ අනුව ඒ ඒ වසරේදී නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණ පහත පරිදි වේ.

| වර්ෂය | බලපත්‍ර ප්‍රමාණය |
|---|---|
| 2015 | 167 |
| 2016 | 226 |
| 2017 | 260 |
| 2018 | 380 |
| 2019 | 490 |
| 2020 | 392 |
| 2021 | 342 |
| 2022 | 154 |
| 2023 | 385 |
| 2024 | 729 |
| 2025 | 563 |

(iii) 1999 ඔක්තෝබර් 08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99හි ඇතුළත් තනතුරු සහ එම චක්‍රලේඛයට කලින් කලට සිදු කරන ලද සංශෝධන මඟින් ඇතුළත් කරන ලද තනතුරු දරනු ලබන්නන් මෙම බලපත්‍රය සඳහා සුදුසුකම් ලබයි.

[ගරු නිශාන්ත ජයවීර මහතා]

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ සහනදායී මෝටර් රථ බලපත්‍ර සඳහා සුදුසුකම් ලබන තනතුරු කලින් කලට සංශෝධනය කරනු ලබයි. ඒ අනුව, එසේ සංශෝධනය කරන ලද චක්‍රලේඛ අංක සහ එම සංශෝධිත දින පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| 01 | 22/99 - (V) - 2015.03.31 | 02 | 22/99 - (VII &VIII) - 2025.09.30 |
| 03 | 22/99 - (X) - 2007.08.08 | 04 | 22/99 - (XIII) - 2010.01.28 |
| 05 | 22/99 - (XVIII) - 2011.06.28 | 06 | 22/99 - (XIX) - 2011.10.12 |
| 07 | 22/99 - (XXI) - 2012.01.20 | 08 | 22/99 - (XXII) - 2012.01.20 |
| 09 | 22/99 - (XXIII) - 2012.02.21 | 10 | 22/99 - (XXIV) - 2012.03.19 |
| 11 | 22/99 - (XXV) - 2012.05.10 | 12 | 22/99 - (XXVI) - 2012.12.18 |
| 13 | 22/99 - (XXVIII) - 2013.03.12 | 14 | 22/99 - (XXX)) - 2014.11.17 |
| 15 | 22/99 - (XXXI) - 2015.10.14 | 16 | 22/99 - (XXXIV) - 2017.11.17 |

(ආ) (i) ඔව්.

(ii) ඉහත (i) අනුව අදාළ නොවේ.

(iii) ඉහත (i) අනුව අදාළ නොවේ.

(iv) ඉහත (i) අනුව අදාළ නොවේ.

(v) ඉහත (i) අනුව අදාළ නොවේ.

(vi) ඉහත (i) අනුව අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. පසුගිය කාල වකවානුවේ රාජ්‍ය සේවකයින්ට, විශේෂයෙන්ම රජයේ ඉහළ තනතුරු දරන නිලධාරින්ට ඔබතුමා සඳහන් කළ වර්ෂ අනුව ගත්තාම එක් වර්ෂයකදී උපරිම වශයෙන් ලබා දී තිබෙන්නේ වාහන පර්මිට් 729යි. දැනටමත් මේ සඳහා සුදුසුකම් ලබන රජයේ නිලධාරින් 20,000කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. ඒ වාගේම දැනට මේ ප්‍රමාණයෙන් 1,900ක විතර ප්‍රමාණයක් තමයි විශ්‍රාම ගිහින් ඉන්නේ. මේ අයට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මොකද, ඔවුන්ට තමන් වැඩ කරන කාල වකවානුව තුළ දෙවරක් පමණයි මෙහෙම පර්මිට් එකක් ලබා ගන්න හැකියාව තිබෙන්නේ. අවුරුදු ගණනක් සේවය කරලා දැනට 1,900ක් විශ්‍රාම ගිහිල්ලා තිබෙනවා. මම ඔබතුමාගෙන් අහන්න කැමතියි, මූලික පියවරක් විධියට ප්‍රමුඛතා ලේඛනයක් අනුව වැඩ කරනවා නම්, මේ විශ්‍රාම ගිහිල්ලා ඉන්න 1,900ටවත් පළමුවෙන් පර්මිට් ලබා දීම පටන් ගන්න පුළුවන්ද කියලා. අඩුම තරමින් මාසයකට පර්මිට් 100 ගණනේ ඔබතුමන්ලා ලබා දුන්නොත් සෑහෙන කාලයක් මේක පවත්වාගෙන ගිහිල්ලා මේ එන pressure එක වාගේම අපේ රටින් පිටතට යන ඩොලර් ප්‍රමාණය අඩු කරන්න පුළුවන් වෙනවා.

දෙවැනි කාරණය මේකයි. පිට රටවල ඉන්න තමන්ගේ නෑදැයින්, දූලා පුතාලා හරහා ඩොලර් පිට රටට යවන්නේ නැතුව වාහන ගෙන්වා ගන්න පුළුවන් අය විශාල පිරිසක් ඉන්නවා. ජනාධිපතිතුමා මැතිවරණ කාලයේදී කිව්වා, මේ පර්මිට් අහෝසි කරන්නේ නැහැ කියලා. හැබැයි, එතුමා මේ සභාවට ඇවිල්ලා පසුගිය අය වැය කථාවේදී කිව්වා, දැන් පර්මිට් ඉවරයි කියලා. ඒ නිසා මම අහන්න කැමතියි, පළමුවෙන් මේ 1,900ට සහ පසුව අනෙක් 20,000ට පර්මිට් ලබා දීමට වැඩ පිළිවෙළක් ඔබතුමන්ලා සතුව තිබෙනවාද කියලා. මොකක්ද ඔබතුමා මේකට දෙන පිළිතුර?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කරපු කරුණුවල වැරදි කරුණු දෙකක් තිබුණා. මම ඒවා නිවැරදි කරන්නම්. ඒ සඳහා සුදුසුකම් ලැබූ රජයේ නිලධාරින් 20,000කට වැඩි ප්‍රමාණයක් නැහැ. 20,000කට වැඩි ප්‍රමාණයක් ඉන්නේ සාමාන්‍ය පර්මිට් එක ලබන අය. ඔබතුමා අහන ප්‍රශ්නයේ තිබෙන්නේ විශ්‍රාම ගැනීමේදී ගන්න පර්මිට් එක ගැන. විශ්‍රාම ගැනීමේදී ගන්න පර්මිට් එක දෙවරක් දෙනවා කියලා ඔබතුමා කිව්වා. නැහැ, එක වතාවයි දෙන්නේ, එක නිලධාරියෙකුට. ඒ නිලධාරියා ඒ සඳහා සුදුසුකම් ලබන නිලධාරියෙකු වෙන්නත් ඕනෑ. ඒ නිලධාරියාට එකවරයි පර්මිට් එක ලැබෙන්නේ. ඔබතුමා කිව්වා වාගේ මේ යටතට එන්නේ සීමිත ප්‍රමාණයක් තමයි. නමුත්, මෙහිදී ලබා දෙන තීරු බදු සහනය කොටස් තුනක් යටතේ ලබා දෙනවා. පළමුවැනි කාණ්ඩයට මිලියන 120ක සහනයක් ලබා දෙනවා. දෙවැනි කාණ්ඩයට මිලියන 160ක සහ තුන්වැනි කාණ්ඩයට මිලියන 220ක සහනයක් ලබා දෙනවා. එවැනි විශාල තීරු බදු සහනයක් ලබා දෙනවා.

ගරු කථානායකතුමනි, අපි කවුරුත් දන්නවා, අපේ රජය බලයට පත් වනකොට කඩා වැටුණු, බිඳ වැටුණු ආර්ථිකයක් සහිත රටක් තමයි භාර ගත්තේ කියලා. මේ රටේ ආර්ථිකය ක්‍රමානුකූලව ස්ථාවර කරලා, යම් මට්ටමකට ගෙනැල්ලා දැන් රට විධිමත් විධියට ගොඩනඟාගෙන යනවා. ඒ අතරතුර අපි නොහිතපු විධියට සුළි කුණාටුවක් ආවා. ඒ වෙනුවෙන් රුපියල් බිලියන 500ක් රජය විධියට අපට පිටින් ණය ගන්නේ නැතුව යොදවන්න වුණා.

මෙන්න මේ කරුණු කාරණා නිසා අපි පිළිගන්නවා, මෙය විශ්‍රාම යෑමේදී නිලධාරියෙකුට ලැබෙන හිමිකමක් කියලා. රජය විධියට අපි දැන් සාකච්ඡා පවත්වමින් යනවා, ඒ නිලධාරින් වෙනුවෙන් කරන්න පුළුවන් මොකක්ද කියන එක සම්බන්ධයෙන්. ඒක තමයි මට ඔබතුමා අහපු පළමුවන අතුරු ප්‍රශ්නයට දෙන්න තිබෙන පිළිතුර.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම හිතන විධියට, ඔබතුමා නියෝජ්‍ය මුදල් ඇමතිතුමා විධියට නේ වැඩ කරන්නේ. මම දන්නේ නැහැ, කඩා වැටුණු ආර්ථිකයක් කොහෙන්ද ඔබතුමන්ලාට හම්බ වුණේ කියලා. මොකද, සියයට 5ක ආර්ථික වර්ධනයක් තිබියදී තමයි ඔබතුමන්ලාට රට භාර දුන්නේ. ඒ වාගේම, ඒ වෙලාවේදී ඩොලර් බිලියන 6ක foreign reserves තිබුණා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් ඒකම කියනවා කියලායි මට තේරෙන්නේ. මොකද, තිබුණු ප්‍රමාණයටත් වඩා දැන් විදේශ සංචිත අඩු වෙලා තිබෙන්නේ.

ඊළඟට මම මේ කාරණයත් අහන්න කැමැතියි. විශේෂයෙන්ම 2020-2024 කාලය තුළ විශ්‍රාම ගත් අය සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා, මේ වාගේම. මොකද, ඒ අයගේ විශ්‍රාම

වැටුප වැඩි වෙන්නේත් නැහැ. ඒ අය අවුරුදු ගණනක් වැඩ කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒගොල්ලන් කොවිඩ් වසංගත කාලයේදී විශාල කැප කිරීමක් කරමින් සේවය කළා. දැන් වෙලා තිබෙන්නේ මේකයි. ඔවුන්ගේ විශ්‍රාම වැටුප 2024න් පසුව විශ්‍රාම ගත් අයගේ විශ්‍රාම වැටුපට වඩා රුපියල් 80,000ක විතර විශාල ප්‍රමාණයකින් අඩු වෙලා තිබෙනවා. මම අහන්න කැමැතියි, 2020-2024 වර්ෂ තුළ විශ්‍රාම ගත්ත අය සම්බන්ධව මේ තිබෙන අර්බුදය සම්බන්ධයෙන් මොකක්ද කරන්නේ කියන එක ගැන. ඒ අය මේ රට වෙනුවෙන් විශාල කැප කිරීමක් කරපු අය. ඒ වාගේම, ඒ අය 2020 අවුරුද්දේ ඉඳලා 2022 අවුරුද්ද වෙනකම් සමහර වෙලාවට තමන්ගේ ජීවිත පවා පරදුවට තියලා මේ කොවිඩ්-19 අර්බුදයත් එක්ක විශාල වැඩ කොටසක් කළා. ඔබතුමන්ලා 2020-2024 වර්ෂ තුළ විශ්‍රාම ගත්ත ඒ පිරිසගේ විශ්‍රාම වැටුප් වැඩි කිරීම සම්බන්ධව, නැත්නම් ඒ අයගේ මේ ප්‍රශ්නය විසඳීම සඳහා මොකක් හරි වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවාද, නැත්නම් ඒ සම්බන්ධයෙන් ගන්න හදන පියවර මොකක්ද කියලා මම අහන්න කැමැතියි.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා යොමු කරන ප්‍රශ්නය මුල් ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමා මුල් ප්‍රශ්නයෙන් අහන්නේ වාහන පර්මිට් සම්බන්ධව නේ. එතකොට දැන් මේ වෙනත් ප්‍රශ්නයක් නේ අහන්නේ. ඒ නිසා මේ ප්‍රශ්නය, ඔබතුමා අහපු මුල් ප්‍රශ්නයට අදාළ වෙන්නේ නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විදේශ සංචිත සම්බන්ධවත් කාරණයක් කිව්වා. අපේ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6ක් නොවෙයි, ඩොලර් බිලියන 6.8ක් දක්වා ඉහළ නංවා තිබෙනවා, පසුගිය දෙසැම්බර් 31වන දා වනකොට. ඔබතුමා අහන ප්‍රශ්නය පර්මිට් සම්බන්ධ කාරණයක් නොවන හින්දා ඒකට උත්තරයක් දෙන්න අදාළත්වයක් නැහැ.

## ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ කාර්ය මණ්ඩලය: දීමනා
## ஸ்ரீ லங்கன் விமான சேவை நிறுவனத்தின் பணியாட்டொகுதி: கொடுப்பனவுகள்
## STAFF OF SRILANKAN AIRLINES: ALLOWANCES PAID

1263/2025

**8. ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ කාර්ය මණ්ඩලයට මේ වනවිට ගෙවන දීමනා වර්ග කවරේද;

(ii) එම එක් එක් දීමනා වර්ගය අනුව ගෙවන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදේශ ගුවන් ගමන් වාරවලදී කාර්ය මණ්ඩලයට නවාතැන් සඳහා දීමනා ගෙවන්නේද;

(iv) එම නවාතැන් දීමනා වර්ග කවරේද;

(v) ඊට අදාළ මුදල කොපමණද;

(vi) ගුවන් ගමන අතරතුරදී, කාර්ය මණ්ඩලයට ආහාර ලබා දෙන්නේද;

(vii) නොඑසේ නම්, ඒ සඳහා දීමනාවක් ලබා දෙන්නේද;

(viii) එසේ නම්, එම දීමනාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියෙකු නොමැතිව එහි පරිපාලන කටයුතු සිදු කරනු ලබන ආකාරය කවරේද;

(ii) ඊට අදාළ වගකීම් දරන්නේ කවුරුන් විසින්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஸ்ரீ லங்கன் விமான சேவை நிறுவனத்தின் பணியாட்டொகுதிக்கு இன்றளவில் செலுத்தப் படும் கொடுப்பனவு வகைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு கொடுப்பனவு வகையின் பிரகாரம் செலுத்தப்படும் தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) வெளிநாட்டு விமானப் பயணங்களின்போது பணியாட்டொகுதிக்குத் தங்குமிடங்களுக்கான கொடுப்பனவுகள் செலுத்தப்படுகின்றனவா என்பதையும்;

(iv) மேற்படி தங்குமிடக் கொடுப்பனவு வகைகள் யாவை என்பதையும்;

(v) அதற்குரிய தொகை யாது என்பதையும்;

(vi) விமானப் பயணங்களின்போது பணியாட் டொகுதிக்கு உணவு வழங்கப்படுகின்றதா என்பதையும்;

(vii) இன்றேல், அதற்காகக் கொடுப்பனவொன்று செலுத்தப்படுகின்றதா என்பதையும்;

(viii) ஆமெனில், அக்கொடுப்பனவு எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி நிறுவனத்தில் பிரதம நிறைவேற்று அலுவலரொருவரின்றி அதன் நிருவாக நடவடிக்கைகள் எவ்வாறு மேற்கொள்ளப்படு கின்றது என்பதையும்;

(ii) அதற்குரிய பொறுப்புகளை ஏற்கின்றவர்கள் யாவர் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) the types of allowances that are currently paid to the staff of SriLankan Airlines;

(ii) the amounts that are paid for each type of allowance, separately;

(iii) whether accommodation allowances are paid to crew members on overseas trips;

(iv) the types of the said accommodation allowances;

(v) the amount of money relating to that;

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

(vi) whether meals are provided to crew members during flights;

(vii) if not, whether an allowance is paid for the same; and

(viii) if so, the amount of the said allowance?

(b) Will he also inform this House -

(i) the manner in which the administrative affairs of the said company are being carried out without a Chief Executive Officer; and

(ii) the name of the person who is responsible for the same?

(c) If not, why?

**ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Janitha Ruwan Kodithuwakku - Deputy Minister of Ports and Civil Aviation)

ගරු කථානායකතුමනි, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන දීමනා වර්ග පිළිබඳ විස්තර ඇමුණුමෙහි දක්වා ඇත.

(ii) එක් එක් දීමනා වර්ග සඳහා අදාළ වන මුදල් ප්‍රමාණයත් ඇමුණුමෙහි දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(iii) ගුවන් යානා කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ට අතරමැදි ගමනාන්තවලදී නවාතැන් පහසුකම් සපයන බැවින් ඔවුන්ට නවාතැන් දීමනා ලබා දෙන්නේ නැත.

(iv) නවාතැන් දීමනා නොගෙවනු ලැබේ.

(v) මුදලක් වැය නොවේ.

(vi) ඔව්.

(vii) ගුවන් යානය තුළ ගත කරන කාලය සඳහා ආහාරපාන දීමනාවක් ගෙවනු නොලැබේ.

(viii) මුදලක් වැය නොවේ.

(ආ) (i) වැඩබලන ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කර තිබේ.

(ii) වැඩබලන ප්‍රධාන විධායක නිලධාරි යසන්ත දිසානායක මහතා.

(ඇ) අදාළ නොවේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙම විධායක නිලධාරියා පත් කර තිබෙනවා කිව්වාට තවම පත් කර නැහැ. දැන් newspaper advertisement එකක් දමා තිබෙනවා. දැන් සභාපතිත් ගුවන් සේවා සමාගමට ඇතිලි ගහන්නේ නැහැ. සභාපතිත් පැත්තකට වෙලා සිටියදී තමයි මේ වැඩේ සිදු වෙන්නේ.

ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි තනතුරට පැපුවා නිව්ගිනියා ගුවන් සේවයේ කටයුතු කරපු ප්‍රධාන විධායක නිලධාරිතුමා ඉල්ලුම් කර තිබුණා, පළමුවෙන්ම ඔයගොල්ලන් දමපු newspaper advertisement එකට අනුව. නමුත්, ඒකට interview එකක්වත් කැඳවන්නේ නැතුව ඔහුව ප්‍රතික්ෂේප කළා. දැන් ආපසු newspaper advertisement එකක් දමා තිබෙනවා, විධායක නිලධාරියෙක් බඳවා ගැනීමට. හැබැයි, තව වනතුරු විධායක නිලධාරියෙක් බඳවා ගෙන නැහැ. ඒක තමයි මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. දැන් ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, කෙනෙක් බඳවා ගත්තා කියලා. නමුත් මම දැන් ගුවන් සමාගමේ අපේ union එකෙන් ඒ ගැන ඇහුවාම කිව්වේ, තවම විධායක නිලධාරියෙක් බඳවා ගෙන නැහැ කියන එකයි.

**ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හරි. තවම විධායක නිලධාරියෙක් බඳවා ගෙන නැහැ. ඒක නිසා තමයි අපි ඇතුළේ ඉන්න කෙනෙක් වැඩබලන විධායක නිලධාරියෙක් හැටියට පත් කර තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඔව්, අපි පසුගිය අවුරුද්දේ advertise කළා, විධායක නිලධාරියෙක් බඳවා ගන්න. නමුත් ආයතනයේ තිබෙන මූල්‍යමය සහ පරිපාලනමය තත්ත්වයට ගැළපෙන විධායක නිලධාරියෙක් ලැබුණේ නැහැ, පසුගිය අවුරුද්ද ඇතුළත. *[බාධා කිරීමක්]* එහෙම ගැළපෙනවාද, නැද්ද කියලා අපට තීරණය කරන්න බැහැ, මන්ත්‍රීතුමා. ඒකට තමයි අපි interview board එකක් පත් කරන්නේ. එම board එකෙන් තමයි තීරණය කරන්නේ එම නිලධාරියා ගැළපෙනවාද, නැද්ද කියලා. ඒක නිසා අපි නැවත වාරයක් advertise කර තිබෙනවා, විධායක නිලධාරියෙක් පත් කර ගන්න. දැනට 200දෙනෙක් අපට applications යොමු කර තිබෙනවා. ඒකෙන් 75දෙනෙක් shortlist කර තිබෙනවා. ඒ 75දෙනාගෙන් කෙනෙකු විධායක නිලධාරියා හැටියට පත් කර ගන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය පළමුවැනි අතුරු ප්‍රශ්නය තුළම තිබෙනවා. මේ තනතුර සඳහා කෙනෙක් ආවා, ගරු කථානායකතුමනි. පැපුවා නිව්ගිනියාවල සිටි කෙනා ආවා. නමුත්, ඔහු බඳවා ගත්තේ නැහැ. ඔයගොල්ලන්ට හරියන්නේ නැති නිසා ගත්තේ නැතුව ඇති. ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, තවම කෙනෙක් බඳවා ගෙන නැහැ. නමුත්, ඔයගොල්ලන් කිව්වේ එහෙම නොවෙයි නේ.

අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා විපක්ෂයේ ඉන්නකොට කිව්වා, මත්තල ගුවන් තොටුපොළට ගුවන් යානයක් ගොඩබාන එක news එකක් නොවෙයි, දුම්රිය ස්ථානයකට ගුවන් යානයක් ගොඩබෑවොත් ඒක නම් news එකක් කියලා. අද වෙනකොට ගුවන් තොටුපොළ හදලාත් ඉවරයි. හැබැයි, ඒ වුණාට විධායක නිලධාරියෙක් පත් කර ගන්න බැරි ආණ්ඩුවක් නේ තිබෙන්නේ.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. දැන් cabin crew එකට flight එකේ යනකොට කෑමත් දෙනවා, ඊට අමතරව දීමනාවකුත් දෙනවා. හැබැයි, Ground Handling එකේ බඩු පටවන ළමයින්ට මීට කලින් sandwich එකක් එක්ක දීපු තේ එකත් දැන් නතර කරලා තිබෙනවා. හැබැයි, cabin crew එකට flight එකේ යනකොටත් දීමනාවක් දෙනවා, කෑමත් දීලා, ඊට අමතරව දීමනාවකුත් දෙනවා. ඒ, ජනාධිපතිතුමාගේ පුතා ඉන්න නිසාද කියන්න මම දන්නේ නැහැ. කොහොම වුණත්, cabin crew එකට flight එකේ යනකොට දීමනාවක් දෙනවා; කෑමත් දෙනවා. Flight එක නතර කළාට පස්සේ බැහැලා යනකොට දීමනාවක් දෙන්න ඕනෑ. ඒක අපි පිළිගන්නවා. හැබැයි, cabin crew එකට ඒ දෙකම දෙනවා.

**ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන තොරතුරු වැරදියි. Cabin crew එකට ගුවන් ගමන් වාරය අතරතුරදී කෑම ලබා දෙන නිසා දීමනාවක් ලබා දෙන්නේ නැහැ. හැබැයි, එළියට ගියාට පස්සේ ඒගොල්ලන්ට නවාතැන් සඳහා සහ ආහාර සඳහා දීමනාවක් ලබා දෙනවා. ඒ හැර දීමනාවක් ලබා දෙන්නේ නැහැ. ඉදිරියට එවැනි දීමනාවක් ලබා දෙන්න බලාපොරොත්තුවකුත් නැහැ. ඒක තමයි ඔබතුමා අහපු කාරණයට උත්තරය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 -1716/2025- (1), ගරු ආර්.ජී. විජේරත්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## මහනුවර, දෙල්තොට මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය: ගොඩනැඟිලි අවශ්‍යතා
## கண்டி, தெல்தோட்டை முஸ்லிம் மத்திய மகா வித்தியாலயம்: கட்டிடங்களுக்கான தேவைப்பாடு
### DELTOTA MUSLIM CENTAL COLLAGE, KANDY: REQUIREMENT FOR SCHOOL BUILDINGS

1795/2025

**10. ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලයේ සිසුන්ගේ අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාමට ඉඩකඩ හා පන්ති කාමර පහසුකම් ප්‍රමාණවත් නොවන බව දන්නේද;

(ii) නව පන්ති කාමර අටක අවශ්‍යතාවක් ඇති අතර ඒ සඳහා ලබා දෙන විසඳුම කවරේද;

(iii) 2026 අය වැය මඟින් ඉහත පාසලේ ගොඩනැඟිලි අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දෙන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மத்திய மாகாணத்தில், கண்டி மாவட்டத்தில் தெல்தோட்டை முஸ்லிம் மத்திய மகா வித்தியாலயத்தில் மாணவர்களின் கல்வி நடவடிக்கைகளை முன்னெடுப்பதற்காக இட வசதிகள் மற்றும் வகுப்பறை வசதிகள் போதுமானதாக இல்லை என்பதை அறிவாரா;

(ii) எட்டுப் புதிய வகுப்பறைகளின் தேவைப்பாடு காணப்படுவதோடு, அதற்காக வழங்கப்படும் தீர்வு யாது;

(iii) 2026 வரவு செலவுத் திட்டத்தின்மூலம் மேற்படி பாடசாலையின் கட்டிடத் தேவைகளைப் பூர்த்தி செய்வதற்காகப் போதுமான ஒதுக்கீடுகள் வழங்கப்படுமா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House whether -

(i) she is aware that the classroom and space facilities of the Deltota Muslim Central College in the Kandy District, Central Province are not sufficient to sustain the educational activities of the students;

(ii) she accepts that there is a requirement for eight new classrooms and the solutions that will be provided to address the said issue; and

(iii) the 2026 Budget will provide sufficient provisions to meet the building requirements of the said school?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) හඳුනාගෙන තිබේ.

(ii) "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ මහනුවර, දෙල්තොට මුස්ලිම් විද්‍යාලයේ තෙමහල් ගොඩනැඟිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. එම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන සීමා වීම නිසා ඉදිකිරීමට හැකි වූයේ බිම් මහල පමණි. බිම් මහලේ පන්ති කාමර 04ම මේ වනවිට භාවිතයට ගනු ලැබේ. ඉතුරු මහල් දෙක තුළ පන්ති කාමර 08ක් ඉදිකිරීමට යෝජිතව පවතී. ඒ සඳහා දළ ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 55කි.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

(iii) "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ එම ගොඩනැඟිල්ලේ ඉතුරු කොටස නිම කිරීම සඳහා මෙම වසරේ ප්‍රතිපාදන ඉල්ලුම්කොට ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මම මේ ප්‍රශ්නය යොමු කළේ, "දිට්වා" සුළි කුණාටුවට පෙර, ගරු අග්‍රාමාත්‍යතුමියනි.

සුළි කුණාටුවෙන් පසුව දෙල්තොට මුස්ලිම් විද්‍යාලයට යාබදව තිබෙන පියසේනපුර විශාල නාය යෑමක් සිදු වුණා. එම නාය යෑමත් එක්ක දැන් දෙල්තොට මුස්ලිම් විද්‍යාලයේ ක්‍රීඩා පිටිය, ඒත් එක්කම ප්‍රාථමික අංශයේ ගොඩනැඟිලි, ඒ වාගේම ඉස්පිරිතාලය ළඟ තිබෙන ගෙවල් හයක් අනතුරුදායක තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් 150ක් විතර මේ වාගේ අවදානම් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක එක පාසලක් විතරයි. නමුත් තිබෙන ප්‍රශ්නය තමයි, තවම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ නිලධාරින් පැමිණිලාත් නැති එක. මේ ගැන අවධානය යොමු කරන්න කියලා අපි විටින් විට ඉල්ලුවාට කිසි දෙයක් වෙන්නේ නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමියනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ ගොඩනැඟිලි අංශයේ ඉංජිනේරුවරු හෝ යවලා, එහෙම නැත්නම් එම ඉංජිනේරුවරු එක්ක NBRI එකේ කට්ටිය සම්බන්ධ කරලා එම ගොඩනැඟිලිවල තත්ත්වය පරීක්ෂා කරන්න. මොකද, එම අනතුරුදායක ගොඩනැඟිලිවල දැනටත් ළමයින්ට ඉගෙන ගැනීමේ කටයුතු කරන්න වෙලා තිබෙනවා. ඒ වාගේ තත්ත්වයක් තුළ අපට සිදු වනවා ඉල්ලීමක් කරන්න, අඩුම වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ගොඩනැඟිලි අංශයේ ඉංජිනේරු මහත්වරු යවලා යම් නිරීක්ෂණයක් කරලා, එම ගොඩනැඟිලි පාවිච්චි කරන්න පුළුවන්ද, බැරිද කියලා ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, "දිට්වා" සුළි කුණාටුවට පස්සේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශයෙන් එම ප්‍රදේශවලට ගිහිල්ලා පාසල් පිළිබඳව අධීක්ෂණයක් කළා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ පාසල සම්බන්ධව ඔවුන්ගේ නිර්දේශය වුණේ මොකක්ද කියලා මම තොරතුරු හරියටම හොයන්න ඕනෑ. නමුත්, ඉංජිනේරු අංශයෙන් ගත්ත තොරතුරු NBRI එකෙනුත් තහවුරු කරලා තමයි අපි ගත යුතු ක්‍රියාමාර්ග ගන්නේ. අපි ඒ සඳහා වැඩ පිළිවෙළක් යොදා තිබෙන්නේ. ඉංජිනේරු අංශයෙන් කරන ඒ assessment එකත්, NBRI එකෙන් කරන assessment එකත් දෙකම සලකා බලා තමයි අපි කටයුතු කරන්නේ. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ විධියට "දිට්වා" සුළි කුණාටුවෙන් පාසල් ගණනාවකට හානි වී තිබෙනවා. සමහර පාසැල්වලට අර්ධ හානි සිදුව තිබෙනවා. අපට ඒවා ප්‍රතිසංස්කරණය කරලා එතැනම පවත්වා ගෙන යන්න පුළුවන්. හැබැයි, සමහර ගොඩනැඟිලි එම ස්ථානවලින් අයින් කරන්න සිදු වනවා. එවැනි පාසැල් අප හඳුනාගෙන තිබෙනවා. ඒ කටයුතු මේ වෙලාවේ අමාත්‍යාංශය සැලසුම් කරගෙනයි යන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම අතුරු ප්‍රශ්නය අහන්නේ ගම්පොළ කලාප අධ්‍යාපන කාර්යාලයට අදාළවයි. මේ ගම්පොල කලාප අධ්‍යාපන කාර්යාලය යටතේ තිබෙන බෙරවිල, පටිතලාව සහ බරණගල වැනි ප්‍රදේශවල තිබෙන පාසල් සම්පූර්ණයෙන් වසා දමා තිබෙනවා. ඒවා වසා දමා යාබද පාසල්වලට ළමයි ඇතුළත් කරන්න සැලසුම් කර තිබෙනවා. ඒ අස්සේ, පරගල පාසලේ ළමයින්ට බෞද්ධ විහාරයක දාන ශාලාවේ ඉඩකඩ ලබා දුන්නාට, එතැන පරිසරය හොඳ නැහැ, කරන්න අමාරුයි, ඉඩකඩ මදි. ඉතින්, ඒ ගැනත් යම් අවධානයක් යොමු වන්නට ඕනෑ. ඒත් එක්කම මුස්ලිම් පාසල් අතර ආඩියාකඩවත, අල්-හික්මා පාසල සම්පූර්ණයෙන්ම නාය යෑමේ තර්ජනයට යටත් වෙලා කිසිම ගොඩනැඟිල්ලක් පාවිච්චියට ගන්න බැහැ. ඒ පිළිබඳව අපි සාකච්ඡාවක් කැඳෙව්වාට, එම සාකච්ඡාවේදී අන්තිමට තීරණය වෙලා තිබෙන්නේ ක්‍රීඩා පිටියේ තාවකාලික ගොඩනැඟිලි හැදීමේදී UNICEF එකෙන් මුදල් අරගෙන කරනවාය කියලා. UNICEF එක කරන වැඩේ තමයි නිතර නිතර Zoom meetings පවත්වන එක. දැන් මාස 3ක් ගත වෙලා ඉවරයි. නමුත් කිසිම දෙයක් වෙලා නැහැ. අඩුම වශයෙන් UNICEF එකට කථා කර මේ tender procedures පොඩ්ඩක් ඉක්මන් කරලා හරි තාවකාලික ගොඩනැඟිලි හදලා ඒ ළමයින්ට ඉඩකඩ ලබා දීමේ වැඩ පිළිවෙළ සම්පූර්ණ කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒත් එක්කම කහටපිටිය, අල්-මිනා විද්‍යාලයේ primary section එක පාවිච්චි කරන්න බැහැ. ඒ primary section එක දැන් ගම්පොල ජාතික පාසලේ primary section එකට ගෙන ගිහින් තාවකාලිකව තබා ගත්තාට, මෙතැන දානපතියෝ ඉදිරිපත් වෙලා ගොඩනැඟිල්ලක් හදන්න මුදල් දෙනවාය කියලා කිව්වාම ඒකට Provincial Council එක තවම අනුමැතිය දීලා නැහැ. රාමසාන් උත්සව කාලයේ පාසල් වසා තිබෙන නිසා ඒ කාලය තුළ ඒ තාවකාලික ගොඩනැඟිලි හදලා ඉවර කරන්න පුළුවන්. පළාත් අධ්‍යාපන නිලධාරින් මේකට අනුමැතිය ලබා දුන්නොත් ඒකත් අපට ඉක්මනට කරගන්න පුළුවන්. මේ වාගේ දීර්ඝ ප්‍රශ්න රාශියක් තිබෙනවා මුස්ලිම්, සිංහල, දෙමළ පාසල් ඇතුළුව ගම්පොල කලාප අධ්‍යාපන කාර්යාලය යටතේ තිබෙන පාසල්වලට. ඉතින්, ඔබතුමිය සාකච්ඡාවක් කැඳවලා, නැත්නම් අදාළ පළාත් සභාවේ නිලධාරින්ට කියලා හෝ මේ පිළිබඳව විසඳුමක් ඉදිරිපත් කරන්න. පළාත් සභා මැතිවරණය පවත්වා නැති නිසා පළාත් අධ්‍යාපන ඇමතිවරුනුත් නැහැ. ආණ්ඩුකාරවරුන්ට තමයි ඔක්කොම කටයුතු කරන්න වෙලා තිබෙන්නේ. ඒ නිසා ඉක්මනින් පළාත් සභා මැතිවරණය පවත්වන්න. මැතිවරණය පැවැත්වුවොත් මේ ප්‍රශ්නවලට ලෙහෙසියෙන් විසඳුම් ලබාගන්න පුළුවන්. මේ ඔක්කොම දැන් පාර්ලිමේන්තුවේ කථා කරන්න සිදුවෙලා තිබෙනවා. මේවා පළාත් සභාවල කථා කරන්න ඕනෑ දේවල්.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒ තොරතුරු පිළිබඳව මම සොයා බලන්නම්. අපට සැලසුම් තිබෙනවා. සමහර ඒවාට අපට මේ වෙලාවේ තාවකාලික විසඳුම් තමයි දෙන්න වෙලා තිබෙන්නේ. නමුත්, හැම පාසලක් පිළිබඳවම අපි අධීක්ෂණය කර, assessment එකක් කර, සැලසුම් සකස් කර තිබෙනවා. ඒවා හරියට ක්‍රියාත්මක වෙනවාද, නැද්ද කියන නිශ්චිත තොරතුරු එතුමා මට ලබා දුන්නොත් මම ඒවා පිළිබඳව සොයා බලන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## 2018 වසරේ සිට විදේශගත වූ ශ්‍රමිකයන්: ප්‍රේෂණ
## 2018 முதல் புலம்பெயர்ந்த தொழிலாளர்கள் : அனுப்பிய பணம்
## WORKERS MIGRATED FROM 2018: REMITTANCES

21/2024

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Hesha Withanage Ankumbura Arachchi)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරකඅමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2018 වර්ෂයේ සිට මේ දක්වා රැකියා සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් විදේශගත වූ රටවල් කවරේද;

(iii) එම කාල සීමාව තුළ විදේශගත ශ්‍රමිකයන්ගෙන් ලැබුණු මුළු විදේශ විනිමය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන්ගේ සුභසාධනය සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2018ஆம் ஆண்டு தொடக்கம் இதுவரை வேலை வாய்ப்புகளுக்காக வெளிநாடுகளுக்குச் சென்றுள்ள இலங்கை ஊழியர்களின் எண்ணிக்கை ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) இவர்கள் சென்றுள்ள நாடுகள் யாவை என்பதையும்;

(iii) மேற்படி காலப்பகுதியில் அவ்வாறு வெளிநாடு களுக்குச் சென்ற ஊழியர்களிடமிருந்து கிடைக் கப்பெற்ற அந்நியச்செலாவணியின் மொத்தப் பெறுமதி ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iv) அவர்களின் நலனோம்புகை தொடர்பில் இன்றளவில் மேற்கொள்ளப்பட்டுள்ள மற்றும் எதிர்காலத்தில் மேற்கொள்ளப்படும் நடவடிக் கைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House the -

(i) number of Sri Lankan workers who migrated for employment from the year 2018 up to now, separately in each year;

(ii) names of the countries to which they went;

(iii) total amount of foreign exchange received from migrant workers during that period in respect of each year, separately; and

(iv) courses of action that have already been taken and will be taken in the future for their welfare, separately?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2018 වර්ෂයේ සිට එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වූ ශ්‍රමික සංඛ්‍යාව පහත පරිදි වේ.

| වසර | විදේශගත වූ ශ්‍රමිකයින් සංඛ්‍යාව |
|---|---|
| 2018 | 211,234 |
| 2019 | 203,085 |
| 2020 | 53,698 |
| 2021 | 122,905 |
| 2022 | 310,948 |
| 2023 | 297,585 |
| 2024 | 314,676 |
| 2025 | 311,125 |
| මුළු එකතුව | 1,825,256 |

(ii) ඇමුණුම 01 යටතේ දක්වා ඇත. ඇමුණුම සභාගත කරමි**.

(iii)

| වසර | ප්‍රේෂණ ප්‍රමාණය ඇ.ඩො.මි. |
|---|---|
| 2018 | 7,000.10 |
| 2019 | 6,717.10 |
| 2020 | 7,103.90 |
| 2021 | 5,491.00 |
| 2022 | 3,789.40 |
| 2023 | 5,969.60 |
| 2024 | 6,575.40 |
| 2025 | 8,070.00 |

(iv)

- විගමනික ශ්‍රමිකයන්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය (5 වසර - රු.25,000 / අපොස (සා.පෙළ) - රු. 30,000 / අපොස (උ.පෙළ) - රු.40,000)

මෙම ප්‍රතිලාභ ලබාදීම සඳහා පහත නිර්ණායක සලකා බලනු ලැබේ.

- කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශගතව සිටින හෝ නැවත ලංකාවට පැමිණ ඇති ශ්‍රමිකයින්ගේ දූ දරුවකු විය යුතුය.

---

** * පුස්තකාලයේ තබා ඇත.*
** * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** * Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

- පහ වසර ශිෂ්‍යත්වය සඳහා එම වර්ෂයට අදාළ දිස්ත්‍රික් කඩඉම් ලකුණු මට්ටම ලබා සමත් වී තිබිය යුතුය.
- අපොස (සාමාන්‍ය පෙළ) විභාගය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වයට හිමිකම් ලැබීමට අවම වශයෙන් ගණිත විෂය ඇතුළුව විෂයන් 06ක් සමත් විය යුතු අතර, විෂයන් 03ක් සඳහා සම්මාන සාමර්ථ සහිතව උසස් පෙළ හදාරමින් සිටිය යුතුය.
- අපොස (උසස් පෙළ) සම්බන්ධයෙන් ශිෂ්‍යත්වයට හිමිකම් ලැබීමට විභාගය සමත් වී රජයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික විශ්වවිද්‍යාලයක පූර්ණ කාලීන උපාධි පාඨමාලාවක් හෝ ජාතික කාර්මික විද්‍යාලයක හෝ වෙනත් රජයේ අධ්‍යාපන ආයතනයක වසර 2කට වැඩි කාලයක් සඳහා වූ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරමින් සිටිය යුතුය.

  මෙම ශිෂ්‍යත්ව ප්‍රදාන වැඩසටහන යටතේ 1996 වසරේ සිට 2025.12.31 දක්වා ශිෂ්‍යත්වලාභීන් 58,467 දෙනෙකු සඳහා රුපියල් මිලියන 1,262.17ක මුදලක් ප්‍රදානය කර ඇත.

- විදේශගතව සිටින විගමනික ශ්‍රමිකයින්ගේ දූ දරුවන් සඳහා සහ විදේශගතව සිට ශ්‍රී ලංකාවට පැමිණ වසර 05ක් ඇතුළත අයදුම් කරන විගමනික ශ්‍රමිකයින්ගේ දූ දරුවන් සඳහා රුපියල් 10,000ක් වටිනා පාසල් උපකරණ කට්ටල ලබාදීම. 2025.12.31 වන විට පාසල් උපකරණ කට්ටල 6,734ක් ලබාදී ඇති අතර, ඒ සඳහා රුපියල් මිලියන 72.147ක මුදලක් වැය වී ඇත.
- විවිධ හේතූන් මත රක්ෂණාවරණය යටතේ හිමිකම් නොලැබෙන විගමනික ශ්‍රමිකයින් සඳහා සේවක සුබසාධක අරමුදල මඟින් එම අරමුදල් කමිටුවේ තීරණය මත වෛද්‍ය ප්‍රතිකාර සඳහා රුපියල් 150,000ක උපරිමයකට යටත්ව මූල්‍යාධාර ලබාදීම සිදු කරන අතර, මරණයකදී රුපියල් 300,000ක් ලබාදීම සිදු කෙරේ.
- කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියාවක් සඳහා විදේශගත වන ශ්‍රමිකයන්හට නොමිලේ ලබාදෙන දේශීය රක්ෂණාවරණය යටතේ රක්ෂණ වන්දි ලබාදීම.
- කාර්යාංශයේ ලියාපදිංචි වී ප්‍රථම වරට ගෘහස්ථ අංශයේ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රමික කාන්තාවන්ගේ පවුල් සඳහා රුපියල් 10,000ක් වටිනා සතොස වවුචර්පත් ලබාදීම.
- විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල විශේෂ අවශ්‍යතා ඇති දූ දරුවන්ගේ ප්‍රතිකාර සඳහා මූල්‍යමය ආධාර ලබාදීම හා සමස්ත ලංකා මට්ටමින්, ජාත්‍යන්තර මට්ටමින් විශේෂ දක්ෂතා ඇති දරුවන් සඳහා එම දක්ෂතා වැඩිදියුණු කර ගැනීමට අවශ්‍යතාව අනුව මූල්‍යමය ආධාර ලබාදීම.

  (මෙහිදී ඉදිරිපත් වන ඉල්ලීම් (සෘජුව / ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් / කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාල) පිළිබඳව සලකා බලා සනාථ කිරීම් අදාළ පාර්ශ්ව මඟින් සිදු කර ගැනීමෙන් පසු කාර්යාංශ සභාපති වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනා ඇතුළත් වාර්තාවකට අනුව මූල්‍ය ප්‍රදානයන් සිදු කරනු ලැබේ. 2025 වසර සඳහා දැනට දරුවන් 92ක් සඳහා මිලියන 2.532ක් ප්‍රදානය කර ඇත.)

- විදේශ රැකියාවක නියුක්තව සිටියදී අනතුරක් හේතුවෙන් පූර්ණ-ස්ථිර ආබාධිත තත්ත්වයට පත්වන, නිවසක් නොමැති ලංකාවට පැමිණි (සියයට 65ක ඉපැයීම් හැකියාවක් නොමැති) ශ්‍රමිකයින්ට ඔවුන්ගේ ඉඩමක නිවසක් සාදා දීම.

  2024 වසරේ රුපියල් මිලියන 01 බැගින් වටිනාකම් සහිත නිවාස ව්‍යාපෘති 04ක් අදාළ ශ්‍රමිකයින් වෙත ලබාදී ඇත.

  වර්තමානයේදී රුපියල් මිලියන 01කින් නිවසක් සාදා දීම අපහසු බැවින්, 2025 වර්ෂයේ සිට එම මුදල රුපියල් මිලියන 02ක් දක්වා ඉහළ නංවා ඇත. තවත් පූර්ණ ආබාධිත ශ්‍රමිකයින් 07 දෙනෙකු සඳහා මේ වන විට නිවාස ඉල්ලුම් කර ඇති අතර, එම නිවාස සාදාදීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

- විදේශගත පවුල්වල සාමාජිකයින්ට පළාත් මට්ටමින් වෛද්‍ය කඳවුරු පැවැත්වීම.

  2025 වසරට එක් පළාතකට එක් වෛද්‍ය කඳවුර බැගින් වෛද්‍ය කඳවුරු 8ක් පවත්වා ඇති අතර, විදේශගතව සිටින හා නැවත පැමිණි විගමනික ශ්‍රමිකයන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා අවශ්‍ය වෛද්‍ය ආධාර ලබාදීමට එමඟින් කටයුතු කර ඇත.

- විදේශගත ශ්‍රමිකයින්ගේ හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට ඖෂධ හා පෝෂ්‍යදායී ආහාර ලබා දීම.

  මෙහිදී ඉදිරිපත් වන ඉල්ලීම් පිළිබඳව සලකා බලා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා සහ ලේඛන විශ්ලේෂණය කර මූල්‍ය සහන ලබාදීම සිදු කරනු ලැබේ.

  2025 වසර සඳහා මේ වන විට රුපියල් මිලියන 4.251ක් පුද්ගලයින් 81ක් වෙත මූල්‍ය සහන ලෙස ප්‍රදානය කර තිබේ.

- විදේශ රැකියාවල නියුතු ශ්‍රමිකයින්ගේ පවුල්වල සිදුවන හදිසි ආපදා තත්ත්වයන් සඳහා මූල්‍යමය ආධාර ලබා දීම.

  - ප්‍රධාන අදියර 03ක් යටතේ ක්‍රියාත්මක කරයි.

  1. හදිසි මූල්‍ය සහන - හදිසි ආපදාවක් හේතුවෙන් යම් බලපෑමක් ඇති වී ඇති ශ්‍රමික පවුල් සඳහා වියළි ආහාර ලබා ගැනීමට රුපියල් 15,000ක මූල්‍ය සහනයක් ලබා දීම.
  2. ස්වාභාවික හදිසි ආපදාවක් හේතුවෙන් නිවසට සිදුවන යම් භෞතික හානියක් සඳහා රුපියල් 50,000කට යටත්ව මූල්‍යාධාරයක් ලබා දීම. (හානිපූර්ණය සඳහා)
  3. තවදුරටත් හානිපූර්ණය සඳහා මූල්‍ය සහන ලබා දීම. (මේ සඳහා විධිමත් ලෙස ලංකාවට මුදල් ප්‍රේෂණය කර ඇති ප්‍රමාණය සලකා බැලේ.) මේ යටතේ මේ වන විට පුද්ගලයින් 195ක් සඳහා රුපියල් මිලියන 3.27ක මූල්‍ය ප්‍රදානයක් සිදු කර ඇත. (2026 වසර සඳහා නව ක්‍රමවේදයක් යටතේ මෙම ප්‍රතිලාභ ලබාදීම පුළුල් කිරීමට යෝජනා කර ඇත.)

- ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඒකාබද්ධව විදේශ සේවා නියුක්තිකයන් සඳහා දායකත්ව විගමනික ශ්‍රමික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.
- විදේශ රැකියාවල නියුතු ශ්‍රමිකයින්ගේ දූ දරුවන් වැඩි වශයෙන් සිටින ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි පාසල්හි විදුහල්පතිවරුන්ගෙන් හෝ සංවර්ධන නිලධාරීන්ගෙන් හෝ ලැබෙන ඉල්ලීම් සලකා බලා රුපියල් ලක්ෂ 10ක වටිනාකමින් යුත් අවශ්‍යතාවක් සම්පූර්ණ කර දීම. (CSR Project)
- විදේශගතව සිට ලංකාවට පැමිණි විගමනිකයින්ට ස්වයං රැකියා ආධාර ලබා දීම.
- කාර්යාංශයේ ලියාපදිංචිව රැකියාවකට ගොස් අවුරුද්දක් හෝ ඊට වැඩි කාලයක් විදේශ රැකියාවෙහි නිරතව ආපසු තම මව්බිමට පැමිණ අවුරුදු 5ක් නොඉක්මවූ විගමනික ශ්‍රමිකයින් වෙත අදියර දෙකක් යටතේ රුපියල් 150,000ක මූල්‍ය නොවන ආධාර ලබා දීම. (ස්වයං රැකියාවට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම ආදිය සඳහා) 2025 වර්ෂය සඳහා 2025.12.31 දින වන විට ආපසු පැමිණි විගමනිකයින් 307 දෙනෙකු සඳහා රුපියල් මිලියන 15.809ක මුදලක් ලබා දී ඇත.
- කාර්යාංශයේ ලියාපදිංචි වී දැනට විදේශ රැකියාවක නිරතව සිටින ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන් වෙත ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යනු ලබන ස්වයං රැකියාව වැඩිදියුණු කර ගැනීම සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීමේ වැඩසටහන යටතේ රුපියල් 150,000ක උපරිමයකට යටත්ව අදියර දෙකකදී ද්‍රව්‍යමය ආධාර (මූල්‍ය නොවන) ලබා දීම. 2025 වර්ෂය සඳහා 2025.12.31 දින වන විට විදේශගත ශ්‍රමිකයින් 84 දෙනෙකු සඳහා රුපියල් මිලියන 4.7ක මුදලක් වැය වී ඇත.
- විදේශ රැකියාවක නිරතව සිට ලංකාවට පැමිණ ව්‍යාපාර ආරම්භ කර සාර්ථකත්වයට පත් ශ්‍රමිකයින් ඇගයීම සඳහා රුපියල් 50,000ක මූල්‍යමය ආධාර ලබාදීම හා ඔවුන්ගේ ව්‍යාපාර ඇගයීම සඳහා ප්‍රවාරක අංශය මඟින් ප්‍රචාරණයක් ලබා දීම.
- කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශගතව සිටින ශ්‍රමිකයන්ට බහුවිධ ණය යෝජනා ක්‍රමය යටතේ සියයට 8ක පොලියට රුපියල් ලක්ෂ 20ක් දක්වා ණය ලබා දීම.

- ආපසු පැමිණ විගමනික ශ්‍රමිකයන් සඳහා ව්‍යවසායකත්ව සහාය සඳහා මූල්‍ය ආධාර ලෙස එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට පස්දෙනා බැගින් තෝරාගෙන රුපියල් 1,000,000ක ආධාරය, රුපියල් 500,000ක ආධාරය සහ රුපියල් 250,000ක ආධාර 3ක් වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 331ක් සඳහා රුපියල් මිලියන 744ක ආධාර ලබා දීම සහ ඒ සඳහා තාක්ෂණික සහාය ලබා දීම. 2025 වර්ෂය සඳහා 2025.12.31 දින වන විට 37 දෙනෙකු සඳහා රුපියල් මිලියන 10.87ක් වැය වී ඇත.
- ආපසු පැමිණි විගමනික ශ්‍රමිකයින් ව්‍යවසායකයින් දක්වා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම පිළිබඳ දැනුවත් කිරීමට රැස්වීම් පැවැත්වීම. 2025 වර්ෂය සඳහා 2025.12.31 දින වන විට රැස්වීම් 31ක් පවත්වා ඇත.
- කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශගතව ආපසු සිය රටට පැමිණි විගමනික ශ්‍රමිකයින් හෝ ඔවුන්ගේ පවුලෙහි සාමාජිකයකු කාර්යාංශය / පළාත් කාර්යාලය වෙත යම් සේවාවක් ලබා ගැනීමට පැමිණීමේදී ඔහුට / ඇයට යම් උපදේශන සේවාවක් අවශ්‍ය යැයි හැඟී ගියහොත් සුදුසු උපදේශන මධ්‍යස්ථානයකට යොමු කිරීම. 2025 වර්ෂය සඳහා 2025.12.31 දින වන විට පුද්ගලයින් 79 දෙනෙකු සඳහා උපදේශනයන් ලබා දී ඇත.
- විගමනික ප්‍රජාවගේ සමාජයීය හා ආර්ථික අභිවෘද්ධිය උදෙසා වූ වැඩසටහන් සංවිධානය කිරීම පිණිස රාජ්‍ය නොවන සංවිධාන හා සිවිල් සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- විගමනික ශ්‍රමිකයින්ගේ නිෂ්පාදන අලෙවි පහසුකම් ලබා දීම සඳහා වෙළෙඳ පොළවල් පැවැත්වීම. කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියාවක් සඳහා විදේශගතව ආපසු පැමිණි විගමනික ශ්‍රමිකයින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර හෝ ස්වයං රැකියාවන්හි නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා පහසු කිරීම හා දිරිගැන්වීම සඳහා 2025 වර්ෂය සඳහා 2025.12.31 දින දක්වා ප්‍රාදේශීය මට්ටමින් "විගමනික ශ්‍රමික නිෂ්පාදන අලෙවි පොළවල්" 28ක් සඳහා රුපියල් මිලියන 1.597ක් වැය කර ඇත.
- ආපසු පැමිණි විගමනික ශ්‍රමිකයින් සම්බන්ධ කරගෙන ඔවුන්ගේ පවුල්වල ආර්ථික ශක්තිය නඟා සිටුවීම සඳහා සමුපකාර පිහිටුවීම.
- ආපසු පැමිණි විගමනික ශ්‍රමිකයින් කළමනාකරණය හා සකසුරුවම්කම පිළිබඳ දැනුවත් කිරීම හා උපයා ගත් ධනය නාස්තියකින් තොරව වියපැහැදම් කිරීම හා ආයෝජනය කිරීම තුළින් ඔවුන්ගේ අනාගතය ආර්ථිකමය වශයෙන් සුරක්ෂිත කිරීම සඳහා විගමනික ප්‍රජාව අතර සමුපකාර පිහිටුවීම. 2025 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සමුපකාර 4ක් පිහිටුවා ඇත.
- කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශගත වන ශ්‍රමිකයන්ගේ මරණයකදී රක්ෂණාවරණය යටතේ රුපියල් 600,000ක මුදලක් යැපෙන්නන් හට ලබා දෙනු ලබයි. මෙම මුදලට අමතරව සේවක සුබසාධන අරමුදල ද මිය ගිය අය වෙනුවෙන් තවත් රුපියල් 1,400,000ක මුදලක්, එනම් මුළු මුදල රුපියල් 2,000,000ක් දක්වා ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

ඉදිරියේදී ගැනීමට නියමිත ක්‍රියාමාර්ග

- කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවක නිරතව සිටියදී මිය යන අයගේ අවමංගල්‍ය කටයුතු සිදු කර ගැනීම සඳහා මෙතෙක් ලබා දුන් රුපියල් 40,000ක මුදල රුපියල් 100,000ක් දක්වා වැඩි කර ලබාදීමට සැලසුම් කර ඇත.
- කාර්යාංශයේ ලියාපදිංචි විදේශ රැකියාවක නිරත වී සිටින කාන්තාවන්ගේ අවුරුදු 2-5 වයසේ සිටින දරුවන්ගේ පෝෂණ ඌනතා සඳහා අවශ්‍ය කිරිපිටි ලබා දීම.
- කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියාවක නියුතු වී සිටියදී මරණයට පත්වන විගමනික ශ්‍රමිකයන්ගේ දූ දරුවන්ට අවශ්‍යතාව අනුව කාර්යාංශය මඟින් ලබාදෙන පුහුණු පාඨමාලාවන් නොමිලේ ලබාදීම සඳහා යොමු කිරීම.
- කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවල නියුතු ශ්‍රමිකයන් සඳහා කාර්යාංශය හා මහ බැංකුව අනුමත බැංකු හරහා රුපියල් මිලියන 10ක උපරිමයකට යටත්ව ණය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් ඇත. මෙම ණය මුදල නිවසක් මිලදී ගැනීම හෝ නිවසක් ඉදිකිරීම සඳහා ලබා ගත හැකි අතර, බැංකුව අය කරනු ලබන පොලී ප්‍රතිශතයෙන් කොටසක් පහත ආකෘතිය පරිදි කාර්යාංශයෙන් ප්‍රතිපූරණය කිරීමට කටයුතු සලසා ඇත. ණය ගෙවිය හැකි කාලසීමාව වසර 10කි.
- කාර්යාංශ ලියාපදිංචිය ලබා විදේශගත සේවයේ යෙදී සිටින ඇමෙරිකානු ඩොලර් 300ට අඩු වැටුපක් ලබන විගමනික ශ්‍රමිකයින්ගේ දරුවන් යොමු කර ඇති දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට මූල්‍යමය දායකත්වයක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී.
- පස්වැනි ශ්‍රේණිය, සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග සඳහා අධ්‍යයනය කරන විදේශගත ශ්‍රමිකයින්ගේ දරුවන් සඳහා සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවක නිරත වන / ආපසු පැමිණි ශ්‍රමිකයින්ගේ (මාසික වේතනය ඩොලර් 300ක් හෝ ඊට අඩු වැටුප් ලබන) රජයේ විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පෞද්ගලික විශ්වවිද්‍යාලයක උපාධි පාඨමාලාවක් හදාරන හෝ රජයේ අධ්‍යාපන ආයතනයක ඩිප්ලෝමා / NVQ 4 මට්ටමින් ඉහළ පාඨමාලාවක් හදාරන දූ දරුවන් වෙනුවෙන් රුපියල් 200,000ක උපරිමයකට යටත්ව ලැප්ටොප් සහ වෙනත් අධ්‍යාපනික / ක්‍රීඩා උපකරණ ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
- කාර්යාංශයේ සක්‍රිය ලියාපදිංචිය සහිත විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සමඟ ඒකාබද්ධව සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සහ සමාජ ආරක්ෂණ මණ්ඩලය සමඟ එක්ව දිගු කාලයක් විදේශ රැකියාවන්හි නිරත වූ හා වර්තමානයේ සක්‍රිය කාර්යාංශ ලියාපදිංචිය සහිත ශ්‍රමිකයින්ට කාර්යාංශයේ දායකත්වය හා අදාළ ශ්‍රමිකයින් / විදේශ රැකියා නියෝජිත ආයතනයන්ගේ දායකත්වය සහිතව විශ්‍රාම වැටුප් ක්‍රමයක ප්‍රතිලාභ ලබා දීම.

(ආ) අදාළ නොවේ.

## කොළඹ මහ නගර සභාවේ ආදායම් බදු පරීක්ෂක තනතුර: පුරප්පාඩු

## கொழும்பு மாநகர சபையில் வருமான வரிப் பரிசோதகர் பதவி: வெற்றிடங்கள்

## POST OF INCOME TAX INSPECTOR OF COLOMBO MUNICIPAL COUNCIL: VACANCIES

627/2025

**6. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු කිංස් නෙල්සන් මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு கிங்ஸ் நெல்சன் சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Kins Nelson)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ මහා නගර සභාව, ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම ආදායම් උපයන පළාත් පාලන ආයතනය බව පිළිගන්නේද;

(ii) කොළඹ මහා නගර සභා බලප්‍රදේශයේ ආදායම් බදු එකතු කිරීම සඳහා සිටිය යුතු ආදායම් බදු පරීක්ෂකවරු සංඛ්‍යාව, මේ වන විට සිටින ආදායම් බදු පරීක්ෂකවරු සංඛ්‍යාව සහ ආදායම් බදු පරීක්ෂක තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு மாநகர சபையானது, இலங்கையிலுள்ள ஆகக்கூடிய வருமானத்தை ஈட்டுகின்ற உள்ளூராட்சி நிறுவனம் என்பதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) கொழும்பு மாநகர சபை ஆளுகைப் பிரதேசத்தில் வருமான வரியை சேகரிப்பதற்காக இருக்க வேண்டிய வருமான வரிப் பரிசோதகர்களின் எண்ணிக்கை, தற்போது கடமையாற்றுகின்ற வருமான வரிப் பரிசோதகர்களின் எண்ணிக்கை மற்றும் வருமான வரிப் பரிசோதகர் பதவியில் நிலவுகின்ற வெற்றிடங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether he accepts that out of all local government institutions in Sri Lanka, the Colombo Municipal Council earns the highest revenue;

(ii) the number of Income Tax Inspectors required to collect Income Tax within the area of the Colombo Municipal Council, the number of Income Tax Inspectors currently in service and the number of vacancies that exist in the post of Income Tax Inspector, separately;

(iii) the measures that will be taken to fill those vacancies?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ආදායම් බදු එකතු කිරීම සඳහා සිටිය යුතු ආදායම් බදු පරීක්ෂකවරු සංඛ්‍යාව, එනම් අනුමත ආදායම් බදු පරීක්ෂක තනතුරු සංඛ්‍යාව:

ආදායම් බදු පරීක්ෂක - විශේෂ ශ්‍රේණිය - 03

ආදායම් බදු පරීක්ෂක (I / II / III) ශ්‍රේණිය - 36

මේ වන විට සිටින ආදායම් බදු පරීක්ෂක තනතුරු සංඛ්‍යාව:

ආදායම් බදු පරීක්ෂක - විශේෂ ශ්‍රේණිය - 00

ආදායම් බදු පරීක්ෂක (I / II / III) ශ්‍රේණිය - 15

ආදායම් බදු පරීක්ෂක තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව:

ආදායම් බදු පරීක්ෂක - විශේෂ ශ්‍රේණිය - 03

ආදායම් බදු පරීක්ෂක (I / II / III) ශ්‍රේණිය - 21

(iii) ඔව්.

මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ සහ කාර්ය මණ්ඩල කළමනාකරණය සඳහා පත් කර ඇති අගමැති කමිටුවේ අනුමැතිය අංක අමප/25/2242/802/004-xii හා 2025.12.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබාදී ඇති බැවින්, අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරන ලෙස සියලුම පළාත් පාලන ආයතන වෙත බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/2G/ පුරප්පාඩු/ පොදු/2026 හා 2026.01.08 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

තවද, ආදායම් පරීක්ෂක (විශේෂ ශ්‍රේණිය) සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් වන අතර, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSWP/PTR/14-6/FI/4(D) හා 2025.12.31 දිනැති ලිපිය මඟින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බඳවා ගැනීම් සිදු කිරීමට දන්වා ඇති බැවින් ඒ අනුව අවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතව ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 -1716/2025- (1), ගරු ආර්.ජී. විජේරත්න මහතා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, ගරු ආර්.ජී. විජේරත්න මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! I wish to announce that this House cordially welcomes the Parliamentary Delegation led by Hon. Lee Hack Young, Deputy Speaker of the National Assembly of the Republic of Korea, now present at the Speaker's Gallery.

මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

## කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ වර්තමාන තත්ත්වය
பெண்கள் பற்றிய தேசிய ஆணைக்குழுவின் தற்போதைய நிலை
CURRENT STATUS OF NATIONAL COMMISSION ON WOMEN

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබලගැන්වීමේ පනත මඟින් මෙරට කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස "කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව" පිහිටුවනු ලැබුවා. කෙසේ වෙතත්, එම කොමිසම ස්ථාපනය කර මාස 4ක් වැනි කෙටි කාලයක් ඇතුළත එහි ප්‍රථම සභාපතිනිය වන ආචාර්ය රමණී ජයසුන්දර මැතිනිය සිය ධුරයෙන් ඉල්ලා අස්වී ඇති අතර, ඇයගේ ඉල්ලා අස්වීමට ප්‍රධාන වශයෙන්ම කොමිසමට ස්වාධීනව ක්‍රියා කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නොමැතිකම, ස්වාධීන කාර්යාල පරිශ්‍රයක් සහ නිසි කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතු වී ඇති බව මාධ්‍ය මඟින් වාර්තා වුණා. එමෙන්ම, අදාළ අමාත්‍යාංශය විසින් කොමිසමේ ස්වාධීනත්වයට හානිකර වන අයුරින් පරිපාලනමය මැදිහත්වීම් සිදු කරන බවටත්, කොමිසම අමාත්‍යාංශය යටතට ගැනීමට උත්සාහ කරන බවටත් බරපතළ චෝදනා එල්ල වී තිබෙනවා.

විශේෂයෙන්ම කාන්තාවන්ට වෙනස්කම් කිරීමට විරුද්ධව තිබෙන CEDAW ජාත්‍යන්තර ප්‍රඥප්තිය, සහශ්‍ර සංවර්ධන ඉලක්කවල 5වෙනි ඉලක්කය සහ කාන්තාවන් සවිබලගැන්වීමේ පනතේ 4, 5 සහ 6 වෙනි වගන්ති යටතේ අපේ රටේ කාන්තාවන්ගේ ආරක්ෂාව, රැකවරණය ශක්තිමත් කිරීම, ඒ වාගේම කාන්තාවන් වෙනුවෙන් ජාතික අරමුදලක් ස්ථාපනය කොට එය ක්‍රියාත්මක කිරීම වාගේ වගකීම් රැසක් මේ කොමිෂන් සභාවට ක්‍රියාත්මක කරන්නට තිබෙන මොහොතක පැරිස් ප්‍රතිපත්තිවලට - Paris Principlesවලට - පටහැනිව ගිහින් අපේ රටේ කාන්තා කොමිසම මේ වන විට ඉතාම අභාග්‍ය සම්පන්න තත්ත්වයකට වැටිලා තිබෙනවා. ඒ නිසා මම ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කරනවා, රජයෙන් පැහැදිලි කිරීම් බලාපොරොත්තුවෙන්.

1. කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ කාර්යභාරය කුමක්ද? එම සභාවේ පළමු සභාපති ධුරයට පත් කරනු ලැබූ නිලධාරිනිය වන Dr. Ramani Jayasundere මෙතරම් කෙටි කාල සීමාවක් තුළදී එම තනතුරෙන් ඉල්ලා අස්වීමට ඉදිරිපත් කළ නිශ්චිත හේතු කවරේද?

2. කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව සඳහා මේ දක්වා වෙන් කර ඇති අය වැය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද?

   ගරු කථානායකතුමනි, කාන්තා කොමිසමක් තිබුණාට අය වැයෙන් එකම එක රුපියලක්වත් වෙන් කරලා නොතිබීම එතුමිය අස් වෙන්න හේතුවක් කියලා කථා වෙනවා. ඉතින් මුදල් වෙන් කිරීමකින් තොරව කොහොමද, කාන්තා කොමිසමක් ක්‍රියාත්මක වෙන්නේ?

3. කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව ක්‍රියාත්මක වීමට ස්වාධීන කාර්යාල පරිශ්‍රයක් සහ කාර්ය මණ්ඩලයක් ලබා දී තිබේද? නොඑසේ නම්, මෙම කොමිසම අමාත්‍යාංශයට ඒකාබද්ධ කර එහි කාර්ය මණ්ඩලය භාවිත කිරීමට කටයුතු කරන ලද්දේද? කාන්තා කොමිසම කියන්නේ ස්වාධීන ආයතනයක්. එය කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතට අරගෙන ඒ කාර්ය මණ්ඩලය යොදවා කටයුතු කරන්න යම්කිසි සැලැස්මක් තිබෙනවාද? එසේ සිදු කිරීමෙන් කොමිසමේ ව්‍යවස්ථාපිත ස්වාධීනත්වයට රජය විසින් බලපෑම් කර ඇති බව පිළිගන්නේද?

   ගරු කථානායකතුමනි, මුදල් වෙන් කරන්නේත් නැහැ; තැනක් ලබා දෙන්නේත් නැහැ; බැලූ බැල්මට ස්වාධීනත්වයත් විනාශ වෙනවා.

   ඒ වාගේම, කිව යුතු වැදගත් කාරණාවක් තිබෙනවා. මේ කාන්තා කොමිසමේ අනුමැතියක් නැතිව Executive Director හැටියට, හිටපු අමාත්‍යාංශ ලේකම්වරියක් පත් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ජනාධිපති ලේකම්තුමා එක්ක සාකච්ඡාවක් ඉල්ලා තිබෙනවා. ඒක ලැබිලාත් නැහැ. අප දන්නා විධියට ඔන්න ඔය කරුණු කාරණා නිසා තමයි, බොහොම ප්‍රවීණ පුද්ගලයෙකු හැටියට හඳුන්වන Dr. Ramani Jayasundere මැතිනිය ඉල්ලා අස් වෙලා තිබෙන්නේ. මේ බරපතළ තත්ත්වය නිවැරදි කරන්නට රජය ගන්නා පියවර මොකක්ද? මේ කාන්තා කොමිසමට අවශ්‍ය කාර්යාල, නිලධාරින්, අවශ්‍ය අරමුදල්, ඒ කියන්නේ කාන්තා සංවර්ධන අරමුදල - Women's Development Fund එක - සඳහා අවශ්‍ය මුදල් වෙන් කිරීමට අලුතින් පරිපූරක ඇස්තමේන්තුවක් ගෙන එනවා නම්, විපක්ෂය හැටියට අපි ඒකට සහයෝගය ලබා දෙන්න ලෑස්තියි. ඒ සඳහා රජය ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියලා අපි අහන්න කැමැතියි.

4. කොමිසමේ ස්වාධීනත්වය ආරක්ෂා කළ යුතු වුවත්, එහි සභාපතිනියට හා සාමාජිකයන්ට අමාත්‍යාංශ පරිශ්‍රයේ සිට රාජකාරි කිරීමට ඉඩ ලබා දී ඇත්තේ කුමන පදනමක් යටතේද?

5. මෙම ස්වාධීන කොමිසම අමාත්‍යාංශයේ අංශයක් බවට පත් කිරීමට රජය උත්සාහ කරන බවට නැඟෙන චෝදනා සත්‍යයද? එසේ නොවේ නම්, එහි ස්වාධීනත්වය සහතික කිරීම සඳහා රජය ගන්නා කඩිනම් පියවර මොනවාද?

   ගරු කථානායකතුමනි, දකුණු අප්‍රිකාව, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, කැනඩාව ආදි රටවල් දිහා බැලුවොත් පෙනෙනවා, කාන්තාවන් වෙනුවෙන් ලබා දීලා තිබෙන නෛතික ශක්තිය ඉතාම ඉහළයි කියන එක. ඇත්ත වශයෙන්ම ව්‍යවස්ථාමය පැත්තෙනුත් ඒ ශක්තිය ලබා දීලා තිබෙනවා. නමුත්, ඒ රටවල එසේ වනකොට අපේ රටේ කාන්තා කොමිසමක් තිබියදීත් එය අකර්මන්‍ය කරමින්, කාන්තා අයිතිය උල්ලංඝනය කරන්නටයි මේ රජය කටයුතු කරන්නේ. ඒකට ලබා දෙන විසඳුම් මොනවාද කියලා මම අහන්න කැමැතියි.

6. මෙරට කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින ප්‍රධානතම ස්වාධීන ආයතනය මෙලෙස අකර්මණ්‍ය වීම වැළැක්වීමට රජයේ යෝජිත වැඩ පිළිවෙළ කුමක්ද?

   ඇත්ත වශයෙන්ම අපේ රටේ ශ්‍රම බළකායට කාන්තා සහභාගිත්වය සියයට 31ත්, 33ත් අතර ප්‍රමාණයක් කියලා කියනවා. අපි එය ඉහළ දමන්නට ඕනෑ. එය ඉහළ දැම්මොත් දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 20ක වර්ධනයක් අපට ලබා ගන්නට පුළුවන් කියන එක විශේෂඥයින් කියනවා. කරුණු කාරණා එසේ තිබියදී, මේ වාගේ කුඩම්මාගේ සැලකිල්ලක් දක්වමින් කාන්තා කොමිසම අකර්මණ්‍ය කරමින් ක්‍රියාත්මක කරන්නේ ඇයි කියා මම අහන්න කැමැතියි. කාන්තා අයිතීන් පිළිබඳ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සංවිධාන සහ තනි පුද්ගලයින් ඇතුළත්ව 135ක් ලිඛිතව අත්සන් කරලා, ජනාධිපතිවරයාට යෝජනා කරලා තිබෙනවා, මේ කාන්තා කොමිසම විනාශ කිරීමේ ව්‍යාපෘතියෙන් ඉවත් වෙලා, කාන්තා කොමිසම ශක්තිමත් කරන්න කියලා. මම බලාපොරොත්තු වෙනවා, රජය මේ පිළිබඳව මේ අවස්ථාවේදී උත්තර ලබා දෙයි කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ ලිඛිතව ඉදිරිපත් කර තිබෙන, අනුප්‍රශ්න 6කින් යුත් එම ප්‍රශ්නයට ඊළඟ සභා වාරයේදී පිළිතුරු ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මේ වාගේ ප්‍රශ්නයකට උත්තර සැපයීම සඳහා රජය කල් ඉල්ලන කොට අපි සම්ප්‍රදායයක් හැටියට ඒකට එකඟ වෙලා තිබෙනවා. හැබැයි, බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ජාත්‍යන්තර වශයෙනුත් ලොකු ප්‍රශ්නයකට අපි මුහුණ දෙනවා. මොකද, අපි CEDAW ප්‍රඥප්තියට අත්සන් තබලා තිබෙනවා. මේ රජය මැතිවරණ කාලයේ ලොකුවට කියාගෙන ගියා කාන්තා අයිතීන් ආරක්ෂා කරනවා කියලා. අගමැතිනියත් කාන්තාවක්. කාන්තා මන්ත්‍රීවරියන් විසිගණනකට වැඩි ප්‍රමාණයක් මේ පාර්ලිමේන්තුවේ සිටිනවා කියන එකත් ලොකුවට කිව්වා. හැබැයි, ඇයි මේ පිළිබඳව උත්තරයක් දෙන්න කල් ඉල්ලන්නේ? කල් ඉල්ලන්න අවශ්‍ය නැහැ. මේකට උත්තරයක් අවශ්‍යයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, පසුගිය සති දෙකතුන තුළ අගමැතිතුමියට කරපු අපහාස, පරිහව ගෙන බැලුවා නම්, එයින් පෙන්නුම් කරනවා ඔබතුමන්ලා කාන්තාවන්ට සලකන්නේ කොහොමද කියලා. අපි ඒ ප්‍රශ්නයට පිළිතුරක් කඩිනමින් ලබා දෙනවා. ගරු ඇමතිතුමිය මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. අපි මේ සම්බන්ධයෙන් කඩිනමින් පිළිතුරක් ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු විපක්ෂ නායකතුමා?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ point of Order එක මේකයි, ගරු කථානායකතුමනි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, මේ සම්බන්ධයෙන් උත්තරයක් සපයන්න ගරු ඇමතිතුමිය සභාවේ නැහැ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක point of Order එකක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මේ ආයතනය තිබෙන්නේ, කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ නොවෙයි. මේක ස්වාධීන ආයතනයක්. අඩුම ගාණේ මේකට අගමැතිතුමියවත් උත්තරයක් දෙන්න ඕනෑ. ඇයි, උත්තර ලබා දෙන්නේ නැත්තේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## II

## "දිට්වා" සුළි කුණාටුව නිසා සිදුවූ ජීවිත සහ දේපළ හානි සඳහා වන්දි ගෙවීම්

'தித்வா' புயல் காரணமாக ஏற்பட்ட உயிர் மற்றும் சொத்து சேதங்களுக்கு இழப்பீடு வழங்கல்

PAYMENT OF COMPENSATION FOR LOSS OF LIFE AND DAMAGE TO PROPERTY DUE TO CYCLONE "DITWAH"

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, 2025 නොවැම්බර් 28 වන දින ඇති වූ "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වූ මරණ, නිවාස විනාශය සහ පුළුල් පරාසයේ හානි සම්බන්ධයෙන් වන්දි ගෙවීම් හා ප්‍රතිස්ථාපන කටයුතු පිළිබඳව රජයේ හදිසි ප්‍රකාශයක් ඉල්ලා මම ස්ථාවර නියෝග 27(2) යටතේ නැඟී සිටිමි.

2025 දෙසැම්බර් 31 දිනට පෙර සියලු වන්දි ගෙවීම් අවසන් කළ යුතු බවට ජනාධිපතිවරයා විසින් නියෝග කර තිබියදීත් බලපෑමට ලක් වූ පුරවැසියෝ, දැඩි ප්‍රමාද, ගෙවීම් නොලැබීම, ආපසු හැරී ගිය චෙක්පත් සහ තවමත් විසඳා නොමැති රක්ෂණ හිමිකම් පිළිබඳව වාර්තා කරමින් සිටිති. මාධ්‍ය වාර්තා අනුව

දසදහස් ගණනක්දෙනා තවමත් තම නිවාස වෙත ආපසු යා නොහැකි තත්ත්වයක පසු වන බව ද සඳහන් වන අතර, මෙය දැඩිව සැලකිල්ලට ගත යුතු කරුණකි.

මෙම කරුණ සම්බන්ධයෙන් පැහැදිලිත්වය සහ පාර්ලිමේන්තු පරීක්ෂණය සඳහා පහත කරුණු පිළිබඳව පැහැදිලි කිරීමක් අගමැතිතුමියගෙන් ඉල්ලා සිටිමි.

1. විපත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ජාතික මට්ටමේ ඒකාබද්ධ හානි සහ අලාභ ඇස්තමේන්තුවක් නිල වශයෙන් අනුමත කර තිබේද?

Hon. Speaker, I am informed that the only damage estimation of Cyclone "Ditwah" has come from the World Bank, which is US Dollars 4.1 billion, and they have mentioned a gossip column as their source. While information had also been taken from more reputed ones like "Hiru", "Derana", "Sirasa" et cetera, one of the sources of the World Bank had been a gossip column. I guess that is a very dangerous trend. They are basically committing us to a US Dollars 4.1 billion damage estimation based on gossip columns.

Sir, the next one is, the International Labour Organization has said that the impact on the country is US Dollars 18.1 billion. The country has lost its capital and we need fresh capital to redeploy that capital. And, that has to be, not through loans, but through grants et cetera. I hope the Government has the sagacity to go forward and get that a on free capital basis.

එසේ නම්, එහි මුළු ඇස්තමේන්තු අලාභය කොපමණද සහ අනුමැතිය ලබා ගත් දිනය කුමක්ද?

2. නිවාස, යටිතල පහසුකම්, කෘෂිකර්මය, මත්ස්‍ය කර්මාන්තය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර - small and medium enterprises - අනුව වෙන් කර ඇති මුළු ප්‍රතිස්ථාපන වියදම කොපමණද?

   අපි දන්නා විධියට මේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ට කිසිසේත්ම ගෙවලා නැහැ. මේ ආපදාවෙන් එවැනි ව්‍යාපාර 38,900කට හානි වෙලා තිබෙනවා ලු.

3. බලපෑමට ලක් වූ මුළු ජනගහනය කොපමණද? මරණ සහ අතුරුදන්වූවන්, අවතැන් වූ පවුල්, සම්පූර්ණයෙන් විනාශ වූ හා අර්ධව විනාශ වූ නිවාස පිළිබඳව දිස්ත්‍රික්ක අනුව බෙදාහැරීමක් ඉදිරිපත් කළ හැකිද? තවමත් සන්නිවේදන අනුව සමීප වශයෙන් 48,000කට තම නිවාස වෙත ආපසු යා නොහැකි බව සත්‍යද?

   කොළඹ දිස්ත්‍රික්කය ගත්තොත්, මේ නිසා ගෙවල් 98,800ක් අර්ධ හානි වෙලා තිබෙනවා. සම්පූර්ණයෙන් විනාශ වෙලා තිබෙන්නේ 141ක් විතරයි ලු. ඒ සම්බන්ධයෙනුත් දැනුවත් කරන්න වෙයි, මෙහි සැබෑ තත්ත්වය ගැනද මේ දැනුවත් වෙන්නේ කියලා.

4. ගෘහස්ථයන්, මරණයට පත්වූවන්, ගොවීන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ අනෙකුත් බලපෑමට ලක් වූ කාණ්ඩ සඳහා අනුමත කර ඇති වන්දි කාණ්ඩ, සුදුසුකම් සහ ගෙවීම් අනුපාත මොනවාද? ඒ සඳහා බලපාන නීතිමය, කැබිනට් හෝ අය වැය අධිකාරිය කුමක්ද?

5. 2025 දෙසැම්බර් 31වන දිනටත්, අද දින දක්වාත්, රුපියල් 25,000ක සහ රුපියල් 50,000ක මුදලත්, මරණයට පත්වූවන් සඳහා රුපියල් 1,000,000ක් සහ නිවාස සඳහා රුපියල් 1,000,000 සිට රුපියල් 10,000,000 දක්වා වූ ගෙවීම් කාණ්ඩ අනුව, ගොවීන්ට සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ද ඇතුළුව ගෙවීම් සංඛ්‍යාව සහ මුළු වටිනාකම දිස්ත්‍රික්ක අනුව කොපමණද?

6. තවමත් වන්දි නොලැබූ සුදුසුකම්ලාභීන් කීදෙනෙකු සිටිනවාද? එය කාණ්ඩ සහ දිස්ත්‍රික්ක අනුව බෙදා සත්‍යාපන ප්‍රමාද, ලේඛන ගැටලු, බැංකු සීමා හෝ මුදල් හිඟ වැනි ප්‍රධාන හේතු මොනවාද?

7. රජය විසින් නිකුත් කළ වන්දි චෙක්පත් ආපසු හැරී යාමට හේතු මොනවාද? එවැනි සිද්ධීන් කීයක් තිබේද? ඒ සඳහා ගත් නිවැරදි කිරීමේ පියවර මොනවාද?

   ගරු කථානායකතුමනි, මේක ටිකක් බරපතළයි. මොකද, සාමාන්‍යයෙන් අද නීතිගත වෙලා තිබෙන්නේ cheque එකක් bounce වුණොත් ඒක criminal act එකක්. ඉතින් රජයෙන් මේක වුණාම එය පිළිගන්නම බැරි දෙයක්. මේක කොහොමද වෙලා තිබෙන්නේ කියන එක කියන්න. මොකද, අතිරික්තයක් තිබෙනවා කියනවා නේ. එතකොට මේක කොහොමද වුණේ කියන එක වහාම බලන්න අවශ්‍යයි.

8. "දිට්වා" සුළි කුණාටුවට අදාළ හිමිකම් ගෙවීම රක්ෂණ සමාගම් විසින් තහවුරු කිරීම සඳහා රජය ගත් පියවර මොනවාද?

   මොකද, එහිදී counter-insure කරන්නේ රජයක් විසින්. ඒ සම්බන්ධයෙන් රුපියල් බිලියන 48ක් තවම ගෙවලා නැහැ. රුපියල් බිලියන 48ක්. ඒ කියන්නේ, රුපියල් කෝටි 480ක් තවම මේ අයට ගෙවලා නැහැ කියලා වාර්තා වෙලා තිබෙනවා.

   තවමත් ගෙවීම් නොලැබූ හිමිකම් සංඛ්‍යාව සහ වටිනාකම කොපමණද?

9. දානපතියන්ගෙන් ලැබුණු අනුග්‍රහ, ණය සහ මානවීය ආධාර කොපමණද? ඒවායෙන් වන්දි ගෙවීම් සහ යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය සඳහා වැය කළ මුදල් කොපමණද? අන්තර්ජාතික දානපති සමුළුව - international donor conference එක - කවදා පැවැත්වීමට නියමිතද?

ගරු කථානායකතුමනි, මේ දවස්වල අපට පෙනෙනවා, "Rebuilding Sri Lanka" Fund එකට ආධාර ලැබෙන ආකාරය. ඊයේත් Development Lotteries Board එක රුපියල් මිලියන 15ක් දීලා තිබෙනවා, "Rebuilding Sri Lanka" Fund එකට. නමුත්, ඒකෙන් සියයට 35ක් බදු ගෙවන්න ඕනෑ. බදු ගෙවන්නන්ගේ මුදල් තමයි මේ Development Lotteries Board එකට ගිහිල්ලා "Rebuilding Sri Lanka" Fund එකට නැවත දෙන්නේ. රජයේ ආයතනවලට කියන්න එහෙම දෙන්න එපා කියලා. එතකොට tax එක අඩු වෙලා අනෙක් පැත්තෙන්, "Rebuilding Sri Lanka" Fund එකට දැම්මොත් ඒක අපරාධයක් වනවා. රජයේ සල්ලි කොහොමත් රජයට එන්න තිබෙනවා. ඒක "Rebuilding Sri Lanka" Fund එක තුළින් එවලා සියයට 33ක් tax අඩු කර ගන්න එපා කියලා මම කියනවා. මේ මුදල් පෞද්ගලික අංශයෙන් හෝ පිට රට ඉන්න අයගෙන් ගත්තාට කමක් නැහැ. නමුත්, රජයේ ආයතනවලට දෙන්න එපා කියන්න කියලා මම ගරු අගමැතිතුමියගෙන් ඉල්ලනවා. මෙතැන බිමල් රත්නායක, නලින්ද ජයතිස්ස, විජිත හේරත් ඇමතිතුමන්ලා ඉන්නවා. කරුණාකරලා රජයේ ආයතනවලට නියෝග කරන්න කියන්න, මේකට ආධාර දෙන්න එපා කියලා. *[බාධා කිරීමක්]* මේවා වෙන්නේ නැති නිසා නේ කියන්නේ.

මෙම කරුණු සම්බන්ධයෙන් ඇස්තමේන්තු, වෙන් කිරීම්, ගෙවීම්, ආපසු හැරුණු චෙක්පත්, රක්ෂණ තත්ත්වය සහ නොගෙවූ ශේෂයන් ඇතුළත් දිස්ත්‍රික්ක අනුව වගු සම්බන්ධ කරමින් පිළිතුරු සභාගත කරන ලෙස මම ඉල්ලා සිටිමි.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Deputy Minister of Defence.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයෙහි කොටස් 9ක් තිබෙනවා. ඒ අනුව මෙම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය.

## 2026.01.07 දින ගරු තිළිණ සමරකෝන් මහතා විසින් යොමු කරන ලද ප්‍රශ්නය: ගරු අග්‍රාමාත්‍යතුමියගේ පිළිතුර
## 2026.01.07ஆம் திகதி மாண்புமிகு திலிண சமரக்கோனால் விடுக்கப்பட்ட வினா: மாண்புமிகு பிரதம அமைச்சரினது விடை
## QUESTION POSED BY HON. THILINA SAMARAKOON ON 07.01.2026: REPLY BY HON. PRIME MINISTER

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු තිළිණ සමරකෝන් මන්ත්‍රීතුමා විසින් 2026.01.07 දින අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. 2025 වසරේ පැමිණි සංචාරකයින් ගණන 2,362,521කි. එම ප්‍රමාණය ඉතිහාසයේ මෙරටට පැමිණි ඉහළම අගයයි. මීට පෙර වැඩිම අගය වූයේ 2018දී පැමිණි 2,333,796කි. මේ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇමුණුම 01 හා 02 මඟින් **සභාගත*** කරමි.

02. එමඟින් මෙරටට ලැබුණු දළ ආදායම වූයේ ඇමෙරිකානු ඩොලර් බිලියන 3.2කි.

03. 2026 වසරේදී සංචාරක පැමිණීම් ඉලක්කය වනුයේ මිලියන 03කි.

04. එම ඉලක්කය සපුරා ගැනීමට බලාපොරොත්තු වන පියවර වන්නේ,

   i. 2026-2030 උපාය මාර්ගික සැලසුම්, පළාත් සංචාරක කාර්යාංශ සමඟ එක්ව සැකසීමට මේ වන විට කටයුතු කරමින් පවතී.

   ii. කටුනායක ගුවන් තොටුපළ වඩාත් පහසුකම් සහිතව පුළුල් කිරීමට කටයුතු කිරීම.

   iii. සංචාරක සංවර්ධන ප්‍රදේශ හඳුනාගෙන ඒවා ගැසට් කිරීමට කටයුතු කරමින් සිටින අතර, මේ වන විටත් හැමිල්ටන් ඇළ සංවර්ධනය කිරීමට මුදල් වෙන් කර ඇත. ඒ ඒ ප්‍රදේශ සඳහා විශේෂිත මාර්ගෝපදේශ සකස් කර ගැසට් කිරීමේ කටයුතු සිදු කර ඇත.

   iv. ආගමන විගමන ප්‍රතිපත්ති, වීසා, සංචාරක ආරක්ෂාව, හදිසි අවස්ථාවන්හිදී ප්‍රතිචාර දැක්වීම, මූලික යටිතල පහසුකම් සංවර්ධනය, දුම්රිය, ගුවන්, මුහුද, ගොඩබිම් මාර්ග සම්බන්ධීකරණය වැනි කටයුතු ඉටු කරන රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය හා කඩිනම් තීරණ ගැනීමට ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවා ඇත.

   v. බහුවිධ ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් සඳහා තනි/ඒකල ඩිජිටල් මාධ්‍ය අවකාශ හරහා එක් ප්‍රවේශ පත්‍රයකින් ඇතුළු වීමට හැකි පරිදි පද්ධතියක් සංවර්ධනය කිරීමට කටයුතු කරමින් පවතී.

   vi. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා උණවටුන, ලංකාපටුන, අම්පාර ආදී ස්ථාන තෝරා ගැනීමට අපේක්ෂා කෙරේ.

   vii. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් සංචාරක හා සත්කාරක සේවා අංශයට අවශ්‍ය මානව සම්පත් පුහුණුව සඳහා පුහුණු සේවකයින් 20,000ක් පුහුණු කර NVQ Level 3 මට්ටමේ සහතිකයක් ලබා දීමට කටයුතු කරමින් පවතී.

   viii. සංචාරක ප්‍රවර්ධනය සඳහා සමාජ මාධ්‍ය, ඩිජිටල් මාධ්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරමින් පවතී.

   ix. සංචාරක සේවා සපයන හෝටල් ලියාපදිංචි කර, ඒවායේ තත්ත්වය සහ ගුණාත්මකභාවය පිළිබඳව නිරන්තරව අධීක්ෂණය සිදු කරමින් පවතින අතර, අවිධිමත් අංශය විධිමත් කිරීමට සහ නියාමනය කිරීමට කටයුතු කරමින් පවතී.

   x. කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ සංචාරක සේවා සපයන්නන් දිරිමත් කරමින් ඔවුන්ව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

   xi. සංචාරක ව්‍යාපාරයේ ගුණාත්මකභාවය, තිරසර බව සහ ඔරොත්තු දීමේ හැකියාව නැවත ස්ථාපනය වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නාමය සන්නාමකරණය ප්‍රචලිත කිරීම කරන අතරතුර ප්‍රජාවන් ආරක්ෂා කරන සහ පාරිසරික හිතකාමී සංචාරක ව්‍යාපාරයක් තුළින් ඉහළ වටිනාකමක් ලබා දෙමින් කලාපීය සමතුලිතතාව සහ ගෝලීය ප්‍රමිතීන් පවත්වා ගැනීමට කටයුතු කෙරේ.

   xii. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සංචාරක ක්ෂේත්‍රයේ නියැළෙන්නන්හට රැකියා සුරක්ෂිතභාවය ඇති කළ යුතුය. එබැවින්, විශ්‍රාම වැටුප් හිමිකම් නොලබන්නන් සඳහා සමාජ ආරක්ෂණ අරමුදලක් හඳුන්වා දී ඇති අතර, (7th Start)
   එමඟින් ඔවුන් සඳහා ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කර ඇත.

---

** **කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

xiii. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ජාත්‍යන්තර වශයෙන් හඳුනා ගැනීම සඳහා නව ඉලක්ක සපුරා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත නීල ධජ සහතික - blue flag certifications - ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள்:*
** Annexes tabled:*

ඇමුණුම 01

**Summary report on tourist arrivals in the Year 2018, 2024 and 2025**

| | 2018 | 2024 | 2025 |
|---|---|---|---|
| Month | Number of Tourists | Number of Tourists | Number of Tourists |
| January | 238,924 | 208,253 | 252,761 |
| February | 235,618 | 218,350 | 240,217 |
| March | 233,382 | 209,181 | 229,298 |
| April | 180,429 | 148,867 | 174,608 |
| May | 129,466 | 112,128 | 132,919 |
| June | 146,828 | 113,470 | 138,241 |
| July | 217,829 | 187,810 | 200,244 |
| August | 200,359 | 164,609 | 198,235 |
| September | 149,087 | 122,140 | 158,971 |
| October | 153,123 | 135,907 | 165,193 |
| November | 195,582 | 184,158 | 212,906 |
| December | 253,169 | 248,592 | 258,928 |
| Total | **2,333,796** | **2,053,465** | **2,362,521** |

ඇමුණුම 02

**Top ten source markets – December 2025**

| Rank | Country | Number of Tourists |
|---|---|---|
| 1 | India | 56,715 |
| 2 | Russian Federation | 27,987 |
| 3 | United Kingdom | 20,535 |
| 4 | Germany | 16,707 |
| 5 | Australia | 14,820 |
| 6 | China | 10,364 |
| 7 | United States | 8,524 |
| 8 | France | 7,270 |
| 9 | Poland | 6,870 |
| 10 | Italy | 6,482 |
| 11 | Other | 82,654 |
| | **Total** | **258,928** |

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යැමේ දී මෙම පාර්ලිමේන්තුව 2026 පෙබරවාරි 05 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා විසින් 2026.01.07 දින මතු කරන ලද වරප්‍රසාද සම්බන්ධ කරුණු
### 2026.01.07ஆம் திகதி மாண்புமிகு அர்ஜுன சுஜீவ சேனசிங்ஹவால் எழுப்பப்பட்ட சிறப்புரிமை பற்றிய விடயம்
### MATTERS OF PRIVILEGE RAISED BY HON. ARJUNA SUJEEWA SENASINGHE ON 07.01.2026

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2026 ජනවාරි 07 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ රෙගුලාසි, ඉදිරිපත් කිරීමට ගරු අග්‍රාමාත්‍යතුමිය.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

Sir, first, let the Prime Minister move the Regulations and then, you take up the point of Order.

## ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත: රෙගුලාසි
## இலங்கை தொலைத்தொடர்புகள் சட்டம்: ஒழுங்குவிதிகள்
## SRI LANKA TELECOMMUNICATIONS ACT: REGULATIONS

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Speaker, I move,

"That the Regulations made by the then Minister of Technology under Section 71(1) read with Section 17(10) of the Sri Lanka Telecommunications Act, No. 25 of 1991 as amended by the Sri Lanka Telecommunications (Amendment) Acts, No. 27 of 1996 and No. 39 of 2024 regarding Telecommunications Infrastructure Sharing and published in Gazette Extraordinary No. 2396/32 of 07th August, 2024, which were presented on 23.01.2026, be approved.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, අද වනවිට පාර්ලිමේන්තුවේ කථානායකතුමාත්, ලේකම් මණ්ඩලයත් අතර විශාල ප්‍රශ්නයක් රටේ කථා බහට ලක් වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමේ දී, පාර්ලිමේන්තු ක්‍රමය පවත්වා ගෙන යාමේ දී ලේකම් මණ්ඩලය විශාල කාර්යභාරයක් කරනවා කියලා අපි දන්නවා. දේශපාලන පක්ෂයකින් පත් වෙන කථානායකවරයාට මේ සභාවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ලේකම් මණ්ඩලය විසින් අවශ්‍ය කරුණු කාරණා හා උපදෙස් ලබා දෙනවා. අපි ඉතිහාසයේ ඉඳන්ම මේක දැක්කා. ඉතිහාසයේ කවදාවත් කථානායකවරයා සහ ලේකම් මණ්ඩලය අතර ප්‍රශ්න වෙලා තිබෙනවා අපි දැක්කේ නැහැ.

අපිට කථානායකවරු 10 දෙනෙක් එක්ක විතර වැඩ කරන්න අවස්ථාව ලැබුණා. කීර්තිමත් කථානායකවරු හිටියා. අනුර බණ්ඩාරනායක මහතා, කරු ජයසූරිය මහතා, විජමු ලොකු බණ්ඩාර මහතා, චමල් රාජපක්ෂ මහතා වැනි කථානායකවරු හිටියා. පාර්ලිමේන්තුවේ කටයුතු ලේකම් මණ්ඩලයත් එක්ක බොහොම හොඳින් කරගෙන ගියා. අද ලේකම්වරයෙක් අස් කරලා තිබෙනවා. එම ලේකම්වරයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහිල්ලා කථානායකතුමා සම්බන්ධව පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඉතිහාසයේ කවදාවත් මේ පාර්ලිමේන්තුවේ මෙවැනි තත්ත්වයක් දැකලා නැහැ, ගරු කථානායකතුමනි. මේක බොහොම නරක තත්ත්වයක්. මම මේ ඔබතුමාට චෝදනා කරනවා නොවෙයි. මේක බොහොම නරක තත්ත්වයක්. නිහාල් සෙනෙවිරත්න මහ ලේකම්තුමා ළඟ දී අභාවප්‍රාප්ත වුණා. එතුමා පාර්ලිමේන්තුවේ සිටියදී එතුමා කටයුතු කරපු ආකාරය අපි දැක්කා. කථානායකතුමන්ලා ඇහුම්කන් දුන් ආකාරය අපි දැක්කා. අද මේ ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් වෙලා තිබෙනවා. මේක තමුන්නාන්සේලාගේ system change එකද දන්නේ නැහැ. අද අපිට දැන ගන්න ලැබුණා, හිටපු නියෝජ්‍ය මහ ලේකම්තුමා තමුන්නාන්සේට විරුද්ධව පැමිණිල්ලක් දාලා තිබෙනවා කියලා. මම දන්නේ නැහැ, මේ විධියට පාර්ලිමේන්තු ක්‍රමය ගෙනියන්නේ කොහොමද කියලා. එතුමා සම්බන්ධව තිබෙන පරීක්ෂණයට ඔබතුමා තමයි Staff Advisory Committee එකට ඒ පැමිණිල්ල ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඔබතුමාම තමයි ඒ පරීක්ෂණය කරන්න ඕනෑ ප්‍රධානියාව පත් කරලා තිබෙන්නේ. මෙතැන මොකක්ද මේ වෙන්නේ කියලා අපි අහනවා, ගරු කථානායකතුමනි. බොහොම භයානක තත්ත්වයක් මේක. රටේ ජනතාව බලාගෙන ඉන්නවා. මේ පාර්ලිමේන්තුව තුළ ගෞරවයක් තිබුණා. එකත් දැන් නැති කරගෙන යනවා. මේවායෙන් තවත් ප්‍රශ්න ඇති වෙනවා. මේ පාර්ලිමේන්තුව මෙහෙම ගෙනියන්නේ කොහොමද? තමන්ගේ නිදහසට කරුණු ඉදිරිපත් කරන්න ඒ ලේකම්වරයාට අවස්ථාවක්වත් දීලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඇයි, මේකට ස්වාධීන කෙනෙකු පත් කළේ නැත්තේ කියලා මම අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මේකට ස්වාධීන කණ්ඩායමක් පත් කරන්නේ නැත්තේ ඇයි? මේ තත්ත්වය බේරා ගන්න. පාර්ලිමේන්තුවේ පැවැත්මට මේක ලොකු ප්‍රශ්නයක්. ඉතිහාසයේ මේ වාගේ නරක තත්ත්වයක් අපි දැකලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔබතුමා පාර්ලිමේන්තුවේ ස්වාධීනව ක්‍රියා කිරීම පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
කරුණාකරලා මට මේ අවස්ථාව දෙන්න. පාර්ලිමේන්තුවේ අපට කථා කරන්න දෙන අවස්ථා, පාර්ලිමේන්තුවේ ඔබතුමාගේ තීන්දු සම්බන්ධව අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒ සම්බන්ධව බොහොම ඉවසීමෙන් කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තව විනාඩියක් ලබා දෙනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

කථා කරන්න ඉඩ දෙන්න, ගරු කථානායකතුමනි. ඔබතුමාගේ වැරැද්ද ඒකයි. විපක්ෂයට අවස්ථාව දෙන්නේ නැහැ. පාර්ලිමේන්තු ක්‍රමය විනාශ කරන්න එපා කියලා මම ඔබතුමාට කියනවා. මට ආරංචියි, මහ ලේකම්තුමියටත් මොකක්ද විභාගයක් ගෙනෙන්න යනවා කියලා. මම දන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ මේ තත්ත්වය ඇති කරන්න එපා. චමින්ද කුලරත්න නියෝජ්‍ය මහ ලේකම්වරයා සම්බන්ධව ඔබතුමාම පැමිණිල්ල ඉදිරිපත් කරලා, ඔබතුමාම කමිටුව පත් කරලා තිබෙනවා. ඒක කොච්චර අසාධාරණද? මේකට ස්වාධීන කමිටුවක් පත් කරලා, ඒ කමිටුව ඉදිරියේ පිළිතුරු දීමට එතුමාටත් අවස්ථාව දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. පාර්ලිමේන්තු ක්‍රමය මේ විධියට විනාශ වෙන්න දෙන්න එපා. මට මතකයි, කරු ජයසූරිය කථානායකතුමාට එදා කණ්ඩායමක් ගහද්දී ලේකම් මණ්ඩලය එතුමාව ආරක්ෂා කරපු ආකාරය. ඒක තමයි පාර්ලිමේන්තුවේ ඇතුළේ තිබෙන තැන. ඔබතුමා මේකවත් පාඩමකට ගන්න, මේ පාර්ලිමේන්තු ක්‍රමය හරියට ගෙන යන්න. අපි විශ්වාසභංග අත්සන් කරන්නේ නැහැ. නමුත් ඔබතුමාගේ ක්‍රියාදාමය සම්බන්ධව විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කලකිරීමක් තිබෙනවා; අපැහැදිලිතාවක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

කරුණාකරලා ස්වාධීන කමිටුවක් පත් කරලා ඒ පරීක්ෂණය කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කථානායකවරයාට පමණක් නොවෙයි, පාර්ලිමේන්තුවේ ලේකම් මණ්ඩලයටත් පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සම්බන්ධව වගකීමක් තිබෙනවා. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාට අනුර බණ්ඩාරනායක මැතිතුමාගේ ඉඳලා අපේ පාර්ලිමේන්තුවේ කථානායක ධුර දරපු මහින්ද යාපා අබේවර්ධන කථානායක දක්වා ඔක්කෝම හොඳයි නේද? මහින්ද යාපා අබේවර්ධන දක්වා ඔක්කෝම හොඳයි නේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

නැහැ, නැහැ. ප්‍රශ්න තිබෙනවා. මීට වඩා හොඳයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

තේරෙනවා, තේරෙනවා. හොඳකම ගැන නේ එතුමා කිව්වේ.

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය මහ ලේකම්වරයා සම්බන්ධ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ Staff Advisory Committee එකේ තීරණයක්. මෙවැනි ප්‍රශ්නයක් ආවාම පාර්ලිමේන්තු කාර්ය පටිපාටිය අනුව එම කටයුතු කරන්න තිබෙන ආයතනය තමයි ඒ කමිටුව. ආණ්ඩු පක්ෂය පමණක් නොවෙයි, විපක්ෂ නායකවරයාත් ඒ කමිටුව නියෝජනය කරනවා. එම Staff Advisory Committee එකේදී තමයි ඒ පැමිණිල්ල සම්බන්ධව පරීක්ෂණයක් කරන්න ඕනෑ කියලා තීන්දුවක් ගත්තේ. ඒ වාගේම එම පරීක්ෂණය කිරීම සඳහා ඒක පුද්ගල කමිටුවක් පත් කළේත් එම Staff Advisory Committee එක. එම Committee එකේ report එක ලැබුණේත් Staff Advisory Committee එකට. Staff Advisory Committee එක තමයි අවසානයේ නියෝජ්‍ය මහ ලේකම්වරයා සම්බන්ධයෙන් තීන්දුවක් අරගෙන තිබෙන්නේ. එතුමාටත් ඒ පරීක්ෂණ මණ්ඩලයට කරුණු පැහැදිලි කරන්න අවස්ථාවක් දුන්නා. ඉදිරියේ විධිමත් පරීක්ෂණයේ දීත් එතුමාගේ පැත්තෙන් එතුමාට කරුණු පැහැදිලි කරන්න අවස්ථාවක් තිබෙනවා. ඒක නිසා මේක පාර්ලිමේන්තුවේ තිබෙන කාර්ය පටිපාටිය අනුව සිදු කරන ලද ක්‍රියාදාමයක්. කාට හරි අසාධාරණයක් වුණා කියනවා නම් ඒකටත් ඕනෑ තරම් අවස්ථාව තිබෙනවා, කරුණු දැක්වීමක් කරන්න. ඒක නිසා මේක කිසිම ආකාරයකින් පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයන්, ස්වාධීනත්වය අභිමි කරන එකක් නොවෙයි. කවුරු වුණත්, එහෙම පැමිණිල්ලක් ලැබුණාට පසුව ගතයුතු ක්‍රියාමාර්ග ඒ Staff Advisory Committee එක අරගෙන තිබෙන බව අපට කියන්න පුළුවන්. විපක්ෂ නායකතුමාත් ඒකේ සාමාජිකයෙක්. මේ සියලු තීන්දු ගැනීමේදී එතුමා හෝ එතුමාගේ නියෝජිතයෙක් දිගටම ඒකට සම්බන්ධ වෙලා තිබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

අපේ ඇමතිතුමා කියපු කාරණය අනුව මම මේ කාරණය මතු කරන්න කැමැතියි. පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පනත මා ළඟ තිබෙනවා. ඒකේ බොහොම පැහැදිලිව තිබෙනවා, කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ වැඩ තහනම් කිරීම, ඔවුන්ට දඬුවම් පැමිණවීම සහ ඔවුන් සේවයෙන් නෙරපීම ඇතුළු කාර්ය මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමේ බලය අදාළ පරිදි සභාපති හෝ කථානායකතුමාගේ අනුදැනුම ඇතුව කටයුතු කරන එක් එක් මන්ත්‍රී මණ්ඩලයේ ලිපිකරු වෙත පැවරෙනවා කියලා. ඒ කියන්නේ මහ ලේකම්තුමියට හෝ මහ ලේකම්තුමාට තමයි මේ වගකීම පැවරෙන්නේ. හැබැයි, සභාපතිතුමා හෝ කථානායකවරයාගේ අනුදැනුම ඇතුව කරන්න ඕනෑ. ඔබතුමා විසින් නම් කරනවා, මෙන්න මේ පුද්ගලයා තමයි මේ පරීක්ෂණ කමිටුවට පත් කරන්න ඕනෑ කියලා. ඔබතුමා Staff Advisory Committee එකේදී කියන්න ඕනෑ, "මේ සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. කරුණාකරලා පරීක්ෂණයක් කරලා අපට වාර්තාව ඉදිරිපත් කරන්න" කියලා. හැබැයි, එහෙම සිදු වුණේ නැහැ.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. දෙවැනි කාරණය මෙයයි. මේ පත් කරපු පුද්ගලයා ගැන විනය කාර්ය පටිපාටියේ 7 (1) වගන්තියේත්, ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව කියන දෙකේත් බොහොම පැහැදිලිව තිබෙනවා, චූදිත නිලධාරියාගේ නිලයට වඩා ජ්‍යෙෂ්ඨ කෙනෙක් විසින් ඒ පරීක්ෂණය සිදු කළ යුතුයි කියලා. මම මේ ගැන ඉතිහාසයට යනතුරු හොයලා බැලුවා. නියෝජ්‍ය මහ ලේකම් තනතුරත් කැබිනට් ලේකම් හා සමාන තනතුරක්. මහ ලේකම් තනතුරත් කැබිනට් ලේකම් හා සමාන තනතුරක්. එතකොට අනිවාර්යයෙන්ම අතිරේක ලේකම්වරයෙක් කියන්නේ, ඊට පහළින් ඉන්න කෙනෙක්. ඔහුට මේ සම්බන්ධව වැඩ කරන්න බැහැ. ඒක සම්පූර්ණයෙන් වැරදියි.

අනෙක් කාරණය මේකයි. බොහොම පැහැදිලිව ඔබතුමාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා. එහි කරුණු විශාල සංඛ්‍යාවක් තිබෙනවා. එහි බොහොම පැහැදිලිව සඳහන් වී තිබෙනවා, මන්ත්‍රීවරයන් විසින් පොදු දේපළ භාවිත කිරීම හා පෙළඹවීම සම්බන්ධයෙන්. එහි බොහොම පැහැදිලිව තිබෙනවා, "පොදු සම්පත් භාවිත කිරීම සැම විටම සිය පාර්ලිමේන්තු කාර්යභාරය සඳහා වන බවට ද වගබලා ගත යුතු අතර, එය ඔවුන්ගේ හෝ වෙනත් අයගේ හෝ යම් දේශපාලන සම්ප්‍රදායක් හෝ අයුතු පෞද්ගලික හෝ මූල්‍යමය ප්‍රතිලාභයක් සඳහා නොවිය යුතුයි" කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ කරුණු ඉදිරිපත් කිරීම අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න. මේ කාරණයත් එක්ක මට තව එක කාරණයක් කියන්න තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න, මේ කාරණය කියලා ඉවර කරන්න.

ඊට අමතරව මම කියන්න කැමැතියි, මේ කාරණයත්. ඔබතුමා මේ කමිටුව සම්බන්ධයෙන් මුදල් වියදම් කර තිබෙනවා. ඒ වාර්තාව සභාවට ඉදිරිපත් කරන්න. මොකද, මා ළඟ තිබෙනවා, මේ සම්බන්ධ වාර්තාව. ගරු කථානායකතුමනි, මේ වාර්තාව පළ වෙලා තිබෙනවා. මම ඒ නිසායි කිව්වේ. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ වාර්තාව සභාගත කරන්න සූදානම්ද කියලා. Facebook එකේ දාලා තිබුණු වාර්තාවක් මට හම්බ වුණා. මේ අවස්ථාවේදී එම වාර්තාව මම **සභාගත*** කරනවා.

***** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

කරුණාකරලා මේ සම්බන්ධ ඇත්ත වාර්තාව අපට ඉදිරිපත් කරන්න. *[බාධා කිරීමක්]* මොකද අපි දන්නේ නැහැ, මේකේ ඇත්ත කථාව මොකක්ද කියලා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මම අදහස් ප්‍රකාශ කරන්න නොවෙයි හිටියේ. නමුත් මට හිතුණා, යමක් පැහැදිලි කරන්න. Staff Advisory Committee එකට විපක්ෂ නායකතුමාට යන්න බැරි දවසට එතුමාගේ නියෝජිතයෙක් යවනවා. මට එදා ඒකට යන්න කිව්වා. මේ ආන්දෝලනාත්මක රැස්වීමෙන් පසුව අපි දැක්කා, මාධ්‍ය විසින් විවිධාකාර විධියට මේ පිළිබඳව වාර්තා කරලා තිබෙනවා. බොහෝ මාධ්‍යවල ඉතාම නිවැරදිව පළ කරලා තිබුණා, විපක්ෂය නියෝජනය කරපු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විසින් නියෝජ්‍ය මහ ලේකම්වරයාට අවස්ථාව දිය යුතු බවට අදහස් පළ කළ බවත්, මුදල් නියෝජ්‍ය ඇමතිතුමා ද ඒ මතයේ සිටි බවත්. රජය වෙනුවෙන් කරුණු පැහැදිලි කිරීමේදී සමහර මාධ්‍ය එකක්, දෙකක් පෙන්වන්න උත්සාහ කරලා තිබුණා, මෙය විපක්ෂයත් ඉන්න කමිටුවකින් ගත් තීරණයක් බවත්, ඒ සම්බන්ධයෙන් විපක්ෂයෙන් අදහස් පළ කළේ නැති බවත්. ගරු කථානායකතුමනි, ඔබතුමාට හොඳට මතක ඇති, ඔහුට අවස්ථාව දිය යුතුයි කියලා අවස්ථා දෙක තුනකදීම මම ප්‍රකාශ කළා කියලා. ඒ වෙලාවේ මම ඔබතුමාට එක තැනක් පෙන්වා කිව්වා, ඒ කියන්නේ කථානායකවරයාගේ පෞද්ගලික අමනාපයක් නිසා මේ තත්ත්වය ඇති වුණා කියලා වාර්තාවේ තිබුණු නිසා මම කිව්වා, ඔහුට අවස්ථාව දීම වඩාත් හොඳයි නේද කියලා. ඒ වාගේම රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාත්, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් මතු කළා වාගේම මමත් කිව්වා, විශ්‍රාම ගිය අතිරේක ලේකම්වරයෙකු යොදාගෙන මේ වාගේ තනි තීරණයක් අරගෙන මෙහෙම කටයුතු කරන එක සුදුසුද, එම නිසා ඔහුට අවස්ථාවක් දෙන්න කියලා. මම පැහැදිලිව කියනවා, ඔහුට අවස්ථාව දිය යුතුයි කියලා විපක්ෂය විධියට අපි අපේ මතය ප්‍රකාශ කළ බව.

මම නැවත නැඟිටිනකොට මට අවස්ථාව නොලැබෙන නිසා මම තත්පරයක් අරගෙන මීට අමතරව තව කාරණයක් ගැන කියන්න ඕනෑ. දකුණු පළාත කියන්නේ රටේ වැදගත්ම පළාතක්; ගාල්ල, මාතර, හම්බන්තොට කියන දිස්ත්‍රික්ක තුනම නියෝජනය වෙනවා. අපේ පළාතේ ආණ්ඩුකාරවරයාගේ පුරප්පාඩුව ඇති වෙලා මේ වනකොට මාස තුනකට ආසන්නයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එම කාරණය අදාළ නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
දකුණු පළාතට පූර්ණ කාලීන ආණ්ඩුකාරවරයෙක් පත් කරන්න තවම බැරි වුණා. ඒකත් මම මේ වෙලාවේ මතක් කරනවා.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද්‍රාණී කිරිඇල්ල මන්ත්‍රීතුමිය.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අපි දන්නවා, අපේ පාර්ලිමේන්තුවේ පරිපාලනය සිදු වෙන්නේ ස්ථාවර නියෝග සහ පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතට අනුව බව. ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම එම පනතේ 7වැනි වගන්තියට අනුව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයන් පිළිගැනීමට මේ පාර්ලිමේන්තුව බැඳී සිටිනවා. අපි දැන් කථා කරන අපේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමාගේ තනතුර සම්බන්ධව ගත්තොත්, බ්‍රිතාන්‍ය සම්ප්‍රදායයන් ගැන ඇතුළත් වන "Erskine May: Parliamentary Practice" කියන ග්‍රන්ථයේ සඳහන් වනවා, උසස් නිලධාරියෙකුට විරුද්ධව යම් කිසි පැමිණිල්ලක් - complaint එකක් - තිබේ නම් ඒ සම්බන්ධයෙන් තිබෙන සාක්ෂි, ඒ කියන්නේ එතුමාට විරුද්ධව සහ පක්ෂව තිබෙන සාක්ෂි පිළිබඳව ඔබතුමා විසින් පාර්ලිමේන්තුව දැනුවත් කරන්නට ඕනෑය කියලා. මම ඒ කොටස කියවන්නම්: “If a complaint is made against an officer of the House, the usual mode of proceedings is to examine the facts and then lay a statement of the evidence before the House, of which the person complained of is a member or an officer of...”

ගරු කථානායකතුමනි, ඒ අනුව ඔබතුමාට වගකීමක් තිබෙනවා, විශේෂයෙන්ම යම් කිසි ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට. මොකද, කලින් කථාවල සඳහන් වුණු ආකාරයට මේ සම්බන්ධව මාධ්‍ය තුළිනුත් නොයෙක් තොරතුරු ප්‍රචාරය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ තුළින් මේ පාර්ලිමේන්තුවේත්, ඔබතුමාගේත්, අපේත් ගෞරවයට හානියක් සිද්ධ වනවා. ඉතින්, ඒක නිවැරදි කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම චමින්ද කුලරත්න මැතිතුමා කේන්ද්‍රගතව උද්ගත වී තිබෙන මේ තත්ත්වය පිළිබඳව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න මම කැමැතියි.

විශේෂයෙන්ම පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අර්ථ කථනය කිරීමේදීත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ කථනය කිරීමේදීත්, ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ මේ පාර්ලිමේන්තුවේ සියලු කටයුතු ක්‍රියාත්මක කිරීමේදීත්, කථානායකතුමාත්, ලේකම් මණ්ඩලයත්, කාර්ය මණ්ඩලයත් යම් සුහදතාවක් තුළ, එකමුතුභාවයකින්, හොඳ අදහස් හුවමාරුවක් තුළ ක්‍රියා කළ යුතුයි. මේ තත්ත්වය තුළ විශේෂයෙන්ම බැලූ බැල්මට අපට පෙනීයනවා, ක්‍රියාත්මක කළ මෙම ක්‍රියාවලිය *mala fide* කියලා. ඒ කියන්නේ, in bad faith. මොකද, පැහැදිලිවම අද හෙළිදරව් වී තිබෙන කරුණු-කාරණා අනුව ඔබතුමාගේත්, හිටපු නියෝජ්‍ය මහ ලේකම්තුමාගේත් අදහස්වල යම් කිසි පරස්පරතාවක් ඇතිවෙලා තිබෙනවාය කියන එක බොහොම පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා. එම නිසා ඒ සඳහා ගනු ලබන ක්‍රියාවලිය *mala fide* වෙන්න බැහැ, ඒක *bona fide* වෙන්න ඕනෑ. ඒ කියන්නේ, නිර්ව්‍යාජ ආකාරයට මෙය හොඳ අදහසකින් ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් වෙන්නට ඕනෑ. ඒ වාගේම conflict of interest එකක් තිබෙන්නටත් බැහැ. ඉතින් මේ තත්ත්වය තුළ මේ ගමන ඉදිරියට යනකොට, අදාළ අණ පනත්වලට අනුකූලව, අදාළ කාර්ය පටිපාටියට අනුකූලව, ඒ වගන්තිවලට අනුකූලව මෙය ස්වාධීනව ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියලා මම ඔබතුමාට යෝජනා කරනවා. මේ සභාවේදී පැහැදිලිව කියවුණා, ඇත්තටම නියෝජ්‍ය මහ ලේකම් තනතුර සම වන තවත් තනතුරු තිබෙනවා කියලා. එවැනි සම තනතුරුවල සිටින පුද්ගලයෙකුව ඊට පහළ තනතුරක නිලධාරියෙකු හරහා යම් කිසි විමර්ශනයක් කිරීම නෛතිකව නිවැරදිද? ඒක සදාචාර සම්පන්නද? මෙන්න මේ කරුණු කාරණා පිළිබඳව ගැටලු රැසක් නිර්මාණය වෙලා තිබෙනවා.

එම නිසා මම මේ අවස්ථාවේ ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ඉතිහාසයේ පළමු වතාවට ලේකම් මණ්ඩලයයි, ඔබතුමායි අතර ඇති පරස්පරතාවක් නිසා මෙවැනි ගැටලුවක් උද්ගත වී තිබෙන මොහොතක මම හිතන විධියට හොඳම දේ තමයි, that you take a step back. හැමෝම පියවරක් පිටුපසට අරගෙන මේ කරගෙන යන ක්‍රියාවලියේ බැරෑරුම්කම ගැන හොඳ අවබෝධයක් ලබා ගෙන, ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂා වන ආකාරයට, ඒ වාගේම චමින්ද කුලරත්න මැතිතුමාගේ මූලික අයිතියත්, මානව අයිතියත් ආරක්ෂා වන ආකාරයට කටයුතු කරමින්, දැනට තිබෙන ක්‍රියා පටිපාටිය උල්ලංඝනය නොකර, නිවැරදි ක්‍රියාමාර්ගයක් තුළ එතුමාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වැදගත් කියන එක මම මේ අවස්ථාවේ යෝජනා කරනවා. මම මේ යෝජනාව බොහොම සදාචාරසම්පන්නවයි ඔබතුමාට ඉදිරිපත් කරන්නේ. අඩියක් පස්සට ගන්න. ඒක පරාජයක්, මදිකමක් කියලා හිතන්න එපා. අඩියක් පස්සට අරගෙන මේ පිළිබඳව නැවතත් සොයා බලා යම් කිසි එකමුතුභාවයකට එන්න පුළුවන් නම්, යම් කිසි විසඳුමකට එන්න පුළුවන් නම් ඒක වඩාත් යෝග්‍යයි කියන එක මම ඔබතුමාට යෝජනා කරනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, මේ කාරණය වෙනුවෙන් මම පෙනී සිටින්නේ, චමින්ද කුලරත්න කියන නමට, individualට නොවෙයි. පාර්ලිමේන්තු ලේකම් මණ්ඩලයේ සිටින මහ ලේකම්, නියෝජ්‍ය මහ ලේකම් කියන තනතුරුවලටයි මම පෙනී සිටින්නේ.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ගරු කථානායකතුමනි, ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා දැන් ප්‍රකාශයක් කළා. මම දන්නවා, එතුමා ඒ ප්‍රකාශය කළේත් හෘදය සාක්ෂියට එකඟව නොවෙයි කියලා. ඒක මට කියන්න පුළුවන්. මොකද, ආණ්ඩු පක්ෂයේ සිටින මැති ඇමතිවරුන් විශාල පිරිසකුත් මේ කරපු වැඩේ වැරදියි කියන ස්ථාවරයේ ඉන්නවා. නලින්ද ජයතිස්ස ඇමතිතුමා මට එහෙම කිව්වේ නැහැ. හැබැයි, එතුමාගේ ප්‍රකාශයෙන් මටත් ඒක නිකම් හැඟී ගියා. ගරු කථානායකතුමනි, ඔබතුමා ඒ නිලධාරියාට මූලික අදහස් දැක්වීමක්වත් කරන්න අවස්ථාවක් ලබා දුන්නේ නැහැ. එතුමාට විරුද්ධව තිබෙන චෝදනා මොනවාද? මම දන්න තරමින් ඊයේ පෙරේදා තමයි එතුමාට විරුද්ධව තිබෙන charge sheet එක අත්සන් කළේ. Charge sheet එකක්වත් අත්සන් කරන්නේ නැතුව එතුමාට නිදහසට කරුණු කියන්න අවස්ථාවක් ලබා නොදී එතුමාව මේ තනතුරෙන් යවලා අද ඇති වෙලා තිබෙන තත්ත්වය, ඉතාම අසික්කිත තත්ත්වයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම මේ කාරණයත් කියා අවසන් කරනවා, ගරු කථානායකතුමනි. ඔබතුමාට විරුද්ධව පැමිණිල්ලක් දාලා තිබෙනවා, Bribery Commission එකේ. ඔබතුමාත් මේ කාරණය මතක තියා ගන්න. මීට පෙර හිටපු කථානායකතුමාට සහතික පිළිබඳ ප්‍රශ්නය ඇවිල්ලා තිබුණේ නැත්නම් මේ වෙනකොට ජාතික ජන බලවේගය ඔබතුමාව ඔය තනතුරෙන්, ජාතික ජන බලවේගයෙන් අයින් කරලා ගොඩක් කල් කියලා මම දන්නවා. ඔබතුමා හිතන්න එපා, අවුරුද්දක් තුළ කථානායකවරු තුන් දෙනෙක් පත් කරන්න බැරි නිසා ජාතික ජන බලවේගය ඔබතුමාව දිගටම තියාගෙන ඉන්නවා කියලා. හැබැයි, ගරු කථානායකතුමනි, ඔබතුමා මේ කාරණයේදී ඉතාම අසාධාරණ ලෙස, "එක්කෝ කථානායකතුමා කියන විදියට ඉන්න, නැත්නම් charge sheet එකක්වත් නැතුව ගෙදර යවනවා" කියලා නිලධාරීන්ට කියන එක තමයි තිබෙන තත්ත්වය. මේක ඉතාම බැරෑරුම් තත්ත්වයක්. පාර්ලිමේන්තුව කියන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ - democracyවල - ඉහළම තැන. ගරු කථානායකතුමනි, එම නිසා ඔබතුමා ඒ ලබා දීලා තිබෙන පූර්වාදර්ශය ඉතාම වැරදියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, දැන් විපක්ෂ නායකතුමා ඇතුළුව විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කියන්න උත්සාහ කළා, මේ මූලික විමර්ශන නිලධාරියා පත් කිරීම පිළිබඳව සහ ඔහුට සුදුසුකම් නැහැ කියන එක පිළිබඳව.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Charge sheet එකකුත් නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
සාමාන්‍යයෙන් රාජ්‍ය සේවයේ ඉන්න නිලධාරින් පිළිබඳව විමර්ශන කිරීමේදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සංචිතයක් තිබෙනවා. ඒකෙන් තමයි මේ තෝරා ගැනීම් කරන්නේ. මෙහි මූලික විමර්ශන නිලධාරි හැටියට තෝරා ගත්ත එස්.කේ. ලියනගේ මහතා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙක් හැටියට කටයුතු කළ කෙනෙක්. ඒ මහතා අපි දන්න හැටියට විමර්ශන නිලධාරියෙක් හැටියට සැලකිය යුතු ආයතන ගණනාවක විමර්ශන කරලා තිබෙන කෙනෙක්. එතුමා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ තිබෙන ඒ සංචිතයේ සිටින කෙනෙක්. ඒ වාගේම එතුමාව මේ මූලික විමර්ශනය සඳහා පත් කර තිබෙන්නේ 2025 අගෝස්තු 20වැනි දින. මීට මාස පහකට කලින් තමයි ඒ සිද්ධිය වෙලා තිබෙන්නේ. මම කලින් කිව්වා වාගේ, ඒ පත් කිරීම කරන්නේත් විපක්ෂ නායකතුමාත් නියෝජනය කරන Staff Advisory Committee එකෙන්. මේ පත් කිරීම සම්බන්ධයෙන් මොකක් හරි ප්‍රශ්නයක් තිබුණා නම් මාස පහක් කට වහගෙන හිටියේ ඇයි? ඒ ගැන කථා කරන්න තිබුණා නේ, Staff Advisory Committee එකේදී නැත්නම් පාර්ලිමේන්තුවේදී. මෙතුමා විමර්ශනය කරලා, වාර්තාවත් දීලා, ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගන්නකම් ඒ මූලික විමර්ශන නිලධාරියා ගැන ප්‍රශ්නයක් ඇති කළේ නැහැ නේ. ප්‍රශ්නයක් ඇති කරන්න හේතුවකුත් නැහැ. එතුමා ඒ සුදුසුකම් සහිත කෙනෙක්. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සංචිතයෙන් ගත්ත කෙනෙක් තමයි මෙහි මූලික විමර්ශන නිලධාරියා හැටියට පත් කරලා තිබෙන්නේ. මොකද, මේක මීට කලින් ආණ්ඩුවලින් කමිටුවක් පත් කරගෙන නඩු අහලා කෙනෙක් අයින් කළා වාගේ එකක් නොවෙයි නේ. මම මේ ගැන කලිනුත් කිව්වා. පාර්ලිමේන්තුවේ කාර්ය පටිපාටිවල සඳහන් ආකාරයට, ඒකේ සාමාජිකයින් ඉන්නවා. විපක්ෂ නායකතුමාත් එහි සාමාජිකයෙක්. එතුමා ආවාද, නැද්ද කියන එක වෙන කථාවක්. හැබැයි, එතුමාගේ නියෝජිතයා හැටියට විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මේ කමිටු හැම එකටම ඇවිත් සක්‍රියව දායක වෙලා තිබෙනවා. එතකොට, විමර්ශන නිලධාරියා ගැන, විමර්ශනය කරන ආකාරය පිළිබඳව මොකක් හරි ප්‍රශ්නයක් තිබුණා නම් මාස පහක් තිස්සේ කථා කරන්න තිබුණා. වාර්තාව ආවට පස්සේ, ඒ වාර්තාව පදනම් කරගෙන Staff Advisory Committee එක තීන්දුවක් ගත්තාට පසුව ඒ ගැන දැන් කථා කරලා තේරුමක් නැහැ. තමන්ට අසාධාරණයක් වුණා කියලා හිතනවා නම් දැන් ඒ නිලධාරියාට මේකට අදාළ විධිමත් පරීක්ෂණයේදී උත්තර දෙන්න අවස්ථාව තිබෙනවා.

අනෙක් කාරණය මේකයි. මම දන්න හැටියට ඒ නිලධාරියාට අවස්ථා ගණනාවක් ලබා දීලා තිබෙනවා, තමන්ගේ පැත්තෙන් පිළිතුරු ලබා දෙන්න. දැන් මේ තිබෙන චෝදනා මොනවාද, ඒ චෝදනා කොහොමද ආවේ, මෙතුමා පත් කළේ කොහොමද, කවුද හිටියේ, ලකුණු දුන්නේ කොහොමද, අතීතයේ මොකක්ද සිද්ධ වුණේ වාගේ ඔක්කෝම මෙතැන ඇදගන්න ඕනෑ නැහැ. මම හිතන විදියට, එහෙම කරන එකේ තේරුමක් නැහැ. ක්‍රියා පටිපාටිය බොහොම පැහැදිලියි. ඒක නිවැරදියි. ඒක තමයි පාර්ලිමේන්තුවේ ක්‍රමය. කවුරු හරි ඒක අභියෝගයට ලක් කරනවා නම් මෙන්න මේ ක්‍රියා පටිපාටියේ වරදක් තිබෙනවා කියලා කරුණාකරලා කියන්න. මේක, විපක්ෂයේ නියෝජිතයෙක් ඒ කමිටුවේ හිටියා කියන එක නොවෙයි, විපක්ෂ නායකතුමා ස්ථිර සාමාජිකයෙක් වන Staff Advisory Committee එකෙන් තමයි මේ පත් කිරීම කළේත්, මේ කාර්යාවලිය කළේත්, ඒ තීන්දුව ගත්තේත්. ඒ නිසා දැන් මෙතැන කියන්න එන්න එපා, මේ පත් කිරීම වැරදියි කියලා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය ලියනගේ මහත්මයා ගැන නොවෙයි. රාජ්‍ය සේවය තුළ ලියනගේ මහත්මයා, කුලරත්න මහත්මයාට වඩා කනිෂ්ඨ කෙනෙක්. එතුමා කනිෂ්ඨද, ජ්‍යෙෂ්ඨද? කුලරත්න ජ්‍යෙෂ්ඨයි, ලියනගේ කනිෂ්ඨයි. එතකොට ඔබතුමාගේ තර්කය අදාළ වන්නේ නැහැ.

ඊළඟ ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. අපි දන්නවා, තමන්ගේ නඩුව තමන් අහන්න එපා කියලා ස්වාභාවික යුක්ති මූලධර්මයක් තිබෙන බව. ඒ අනුව, තමන්ගේ නඩුව තමන්ට අහන්න බැහැ. ගරු කථානායකතුමනි, ලියනගේ මහත්මයාගේ නියෝගයේ තිබෙනවා, "තමා සම්බන්ධයෙන් වන විමර්ශනය ගරු කථානායකතුමා තමා සමඟ ඇති අමනාපයක් නිසා සිදු කරවන්නක් බව කුලරත්න මහතා පුන පුනා ප්‍රකාශ කරන ලදී. එම කරුණු නිවැරදිද, නැද්ද යන්න පිළිබඳ පැවසීමේ හැකියාවක් මට නැත" යනුවෙන්. කවුද එහෙම කියන්නේ? නීතිඥ එස්.කේ. ලියනගේ කියන විශ්‍රාමික අතිරේක ලේකම්තුමා. එතුමාටත්, ඒ කියන්නේ පරීක්ෂණය කරපු නිලධාරියාටත් නිගමනය කරන්න බැහැ, ඔබතුමාට විරුද්ධව කියන කාරණා ඇත්තද, බොරුද කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, ස්වාභාවික යුක්තියේ මූලධර්ම ගැන. ඔබතුමා පරිපාලන ක්ෂේත්‍රයේ හිටපු නිසා අඩු ගණනේ ඒවායෙන් යම් ප්‍රමාණයක් අහලා ඇති. ඔබතුමාට චෝදනාවක් තිබෙනකොට, ඔබතුමා වමින්ද කුලරත්න මහත්මයා සමඟ පෞද්ගලික ආරාවුලක් තිබෙනවා කියලා නිශ්චිතව පරීක්ෂණවලින් හෙළි වනකොට, මේ පරීක්ෂණය කරපු නිලධාරියා වන ලියනගේ මහත්මයා ඒක හරිද, වැරදිද කියලා මට කියන්න බැහැ කියලා තමන්ගේ වාර්තාවේ කියන -ඒ කියන්නේ ඒක ඇත්ත වෙන්නත් පුළුවන් නේ- තත්ත්වයක් තුළ ඔබතුමා වමින්ද කුලරත්න මහත්මයා හා සම්බන්ධ පරීක්ෂණවලදී නායකත්වය දීම වැරදියි. ඔබතුමාටයි චෝදනාව තිබෙන්නේ. ඔබතුමා වැරදියි කියායි කුලරත්න මහත්මයා කියන්නේ. ඒක හරිද, වැරදිද කියලා මේ පරීක්ෂණ නිලධාරියා වන ලියනගේ මහත්මයාට කියන්න පුළුවන්කමක් නැහැ. හැබැයි, එවැනි තත්ත්වයක් තුළ ගරු කථානායකතුමනි, ඔබතුමා මේ පරීක්ෂණවලට මඟ පෙන්වමින්, මේ තීරණ ගන්න තැන්වල මුලසුන දරමින්, වාඩි වෙමින් කොහොමද මේ කථානායක තනතුර දරමින් කටයුතු කරන්නේ? ඒ නිසා කරුණාකරලා මේ කටයුත්ත වෙනම ස්වාධීන තැනකට භාර දෙන්න. ඔබතුමාගේ තනතුර අනුවත්, පෞද්ගලිකත්වය අනුවත්, මේ රටේ නීතියේ ආධිපත්‍යය අනුවත් ඔබතුමා තවදුරටත් මේ සම්බන්ධයෙන් කටයුතු කරන එක සම්පූර්ණයෙන් වැරදියි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් වන නීතිමය තත්ත්වය ගැන ගොඩක් අය පැහැදිලි කළා. මම ඔබතුමාට පැමිණිල්ලක් කළා, ඔබතුමාගේ ලේකම්, PHI මැතිතුමා Reception එකට කථා කරලා අහපු ප්‍රශ්නයක් සම්බන්ධයෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මේ කාරණයට අදාළ කාරණාවක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඒක මේ කාරණයට අදාළයි. මම ඔබතුමාට දීපු පැමිණිල්ල ඔබතුමා භාර ගත්තේ නැහැ. ඔබතුමා ලේකම් මණ්ඩලයේ පරිපාලනය,- *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මට මේ කාරණ කියන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කිරීම, the Hon. Eranga Weeraratne. You have 20 minutes. *[බාධා කිරීම්]* ඒක මේ කාරණයට අදාළ නැහැ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]* /ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, කරුණක් වශයෙන් මම කියන්න කැමැතියි, පාර්ලිමේන්තුවේ ලේකම් මණ්ඩලයේ තනතුරු සම්බන්ධ ප්‍රශ්නය පිළිබඳව. අපේ ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව පත් වුණාට පසුව කැබිනට් මණ්ඩලය තීන්දුවක් ගත්තා, ඉන්ධන දීමනාවල ඉඳලාම විවිධ ඇමතිවරුන්ට තිබෙන වරප්‍රසාද සහ බලතල මොනවාද, අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වරප්‍රසාද සහ බලතල මොනවාද, අතිරේක ලේකම්වරුන්ගේ වරප්‍රසාද සහ බලතල මොනවාද කියලා. ඒ අනුව අපි Staff Advisory Committee එකේදී තීන්දුවක් ගත්තා, පාර්ලිමේන්තු මහ ලේකම්තුමියගේ වරප්‍රසාද සහ අයිතිවාසිකම් අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ බලතල හා සමාන වන බවටත්, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්ගේ තනතුර අතිරේක ලේකම්වරයෙකුගේ තනතුර හා සමාන වන බවටත්, පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම්ගේ තනතුර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකුගේ තනතුර හා සමාන වන බවටත්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කවුද ඒ තීරණය ගත්තේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක Staff Advisory Committee එකෙනුයි තීරණය කළේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක වැරදියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
පළමුවැනි කරුණ ඒකයි. *[බාධා කිරීම්]* මට කියන්න තිබෙන්නේ මේකයි. මමත් ඒ කමිටුවේ සාමාජිකයෙක් නිසා ඒ ගැන කථා කරන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් කරුණක් වශයෙන් ගත්තොත්, ඒක හරියටම අපි කරලා

[ගරු බිමල් රත්නායක මහතා]

තිබෙනවා. ඒ තනතුරුවල ප්‍රශ්නයක් නැහැ. දැන් හැම තැනම පරීක්ෂණ කටයුතු සිදු වෙනවා, ඒ පරීක්ෂණවල ප්‍රතිඵල ආවාට පස්සේ හරි කියලා මම හිතනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි,-

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මටත් අවස්ථාවක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, රට නොමඟ යවන නිසායි මම මේ කථා කරන්නේ. මේ පරීක්ෂණය කරලා තිබෙන්නේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්වරයා කථානායකතුමාට චෝදනා කළාය, ඒ ගැන පැමිණිල්ලක් විභාග කළාය කියන කාරණා සම්බන්ධයෙන් නොවෙයි නේ. ඒ ගැන විමර්ශනයක් කරන එකක් නොවෙයි නේ, මේ. මේ විමර්ශනය කරන්නේ මොකක් ගැනද? නියෝජ්‍ය මහ ලේකම්වරයා කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් කියන තනතුර සඳහා තෝරා ගැනීම, ඔහුගේ සුදුසුකම් සහ ඔහු එම තනතුරේ සේවය ස්ථිර කිරීම යන කරුණු පිළිබඳවයි මේ විමර්ශනය කරන්නේ; ඔහුගේ පත්වීම පිළිබඳවයි විමර්ශනය කරන්නේ. එහෙම නැතුව, ඔබතුමාට හරි කාට හරි කරපු චෝදනා ගැන නොවෙයි මේ විමර්ශනය කරන්නේ. ඔහුගේ පත්වීම ගැන විමර්ශනයක් කරලා වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඔබතුමන්ලා challenge කරනවා නම් කරන්න ඕනෑ ඒ පත්වීම හරි, එය නීත්‍යනුකූලයි, ඔහුට සුදුසුකම් තිබෙනවා, ඒ ඉදිරිපත් කරපු සුදුසුකම් අතිශය නිවැරදියි කියන කරුණු ගැන මිස වෙන දෙයක් නොවෙයි. පත්වීම හරිද, වැරදිද කියන එක තමයි විමර්ශන වාර්තාවෙන් කියලා තිබෙන්නේ. ඒ ගැන කථා කරන්නේ නැතුව වටේ ගිහිල්ලා තේරුමක් නැහැ. මම හිතන විධියට, විපක්ෂ නායකතුමාත් ඒකට එකඟ වෙන්න ඇත්තේ ඒ කාලයේදීම - මීට මාස 5කට කලින් - මේක සිදු කළේ ඒ නියෝජ්‍ය මහ ලේකම්තුමා පත්වීම, පත් වුණු ආකාරය හරිද, වැරදිද සහ ඔහුට සුදුසුකම් තිබෙනවාද කියන එක අනුවයි. එහෙම නැතුව, වෙන හේතුවක් නිසා නොවෙයි නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, අපේ සභානායකතුමා කිව්වා, මේ ක්‍රමය හරි කියලා. ඒ වාගේම සංවිධායකතුමා කිව්වා කැබිනට් එක මේ තනතුර සම්බන්ධව - *[බාධා කිරීම්]* මම අහන්නේ රජයේ තිබෙන තනතුරු සම්බන්ධව ඕනෑ ඕනෑ වෙලාවට, ඕනෑ ඕනෑ විධියට තීන්දු ගන්න පුළුවන්ද? අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ බලතල - *[බාධා කිරීම්]* මම තමුන්නාන්සේලා දැනුම ගැන කනගාටු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මම හිතන විධියට, මෙතුමා කිව්වා - *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම මේ ගැන විවාදයකට පැටලෙන්නේ නැහැ. Staff Advisory Committee එකේ මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ඉන්නවා. පාර්ලිමේන්තුවට ඕනෑ ඕනෑ විධියට වැටුප් වැඩි කරගන්න බැහැ. අපි බලයට එනකම්ම unlimited fuel ලබා ගෙන තිබුණා. ලේකම්ලා ඔක්කෝම පාවිච්චි කර තිබුණා. කථානායකවරුත් පාවිච්චි කර තිබුණා. අපි ඒවා වෙනස් කළා. මොකද, ආණ්ඩුවට තමයි බලය තිබෙන්නේ, මුදල් සම්බන්ධ තීන්දු ගන්න. ඒ නිසා කරුණාකරලා - *[බාධා කිරීම්]* මම කථා කරන්න බලාපොරොත්තු වුණේ නැහැ, මේ ගැන. නමුත් මම තව දෙයක් කියන්න කැමැතියි. මම නීතිඥයෙක් නොවුණාට, සාමාන්‍ය තර්කනය තේරෙනවා. කවුරු හරි කෙනෙක් උසාවියක නඩුවක් අහනකොට, ඒ චූදිතයා නඩුකාරයාට පැමිණිල්ලක් දැම්මොත්, නඩුව අහන්න බැරි වෙනවා නේ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Eranga Weeraratne, you can start the Debate. You have 20 minutes. *[Interruption]*

Please sit down, Hon. Members.

[පූ.භා. 11.36]

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)
ගරු කථානායකතුමනි, විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාව සම්බන්ධ ඉතාම වැදගත් රෙගුලාසියක් තමයි අද විවාදයට ගන්නේ. *[බාධා කිරීම්]* මේ සම්බන්ධයෙන් පළමුවෙන්ම කථා කරන්න මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. *[බාධා කිරීම්]* අපි ලංකාවේ telecommunication සම්බන්ධ ඉතිහාසය ගැන බැලුවොත්, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
අපේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ඉතිහාසය ගත්තාම, 1996 වෙනකම් ඒකාධිකාරයක් තමයි තිබුණේ. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ එහෙම ඒකාධිකාරයක් තිබෙන්න ප්‍රධාන හේතුව තමයි - *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, මොකක්ද point of Order එක?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, න්‍යාය පුස්තකයේ සඳහන් වෙනවා, ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳව. මේ මොහොත වනවිට කොම්පැනි 8ක් මේ කාරණය හේතු කරගෙන රටින් එළියට යනවා කියලා දැනුවත් කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
ටෙලිකොම් ආයතනයට එහෙම ඒකාධිකාරයක් තිබෙන්න ප්‍රධාන හේතුව තමයි යටිතල පහසුකම් සංවර්ධන කිරීම සඳහා ඉතා විශාල ප්‍රාග්ධනයක් වැය වීම. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඒක procedure එකට අදාළ කාරණයක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
ඒ සඳහා මුල් වියදමක් යනවා. ඒ මුල් වියදමින් යහපත් ප්‍රතිඵල ලබා ගන්න නම්, ඒකාධිකාරයක් තිබෙන්න ඕනෑය කියන එක ඒ දවස්වල නියාමනය වුණා. ඒ දවස්වල ටෙලිකොම් ආයතනයට පමණයි මේ යටිතල පහසුකම් හදලා ස්ථාවර දුරකථන පහසුකම අපේ ජනතාවට ලබා දෙන්න හැකියාව තිබුණේ. නමුත් 1996දී මේ තිබුණු ඒකාධිකාරය නැති කරලා අනෙක් සමාගම්වලට අවස්ථාව දීමත් සමඟම සන්ටෙල්, ලංකා බෙල් වාගේ ආයතනත් ලංකාවට ආවා. ඒ නිසා ඒ අයටත් ලංකාවේ ජනතාවට ස්ථාවර දුරකථන සේවාව ලබා දෙන්න ඉඩ සැලසුණා.

ඒ වාගේම 1989දී සෙල්ටෙල් සමාගම ලංකාවට ඇවිල්ලා mobile telecommunication කටයුතු පටන් ගත්තා. ඒ වාගේම 1993දී ඩයලොග් ආයතනය ආවා. ඊට පසුව හච්, එයාර්ටෙල් වාගේ ආයතනත් ලංකාවේ ස්ථාපනය වුණා. මේ වාගේ සමාගම් විශාල ප්‍රමාණයක් ලංකාවට ඇවිල්ලා telecommunication network එක ස්ථාපිත වුණාට, ඒ ඒ සමාගම් ඔවුන්ගේ ප්‍රාග්ධන හැකියාව අනුව, ඔවුන්ට තිබෙන මූල්‍යමය හැකියාව අනුව වියදම් කරලා ඔවුන්ගේ network එක හදා ගන්නා ක්‍රමයක් තමයි තිබුණේ. අපි දන්නවා, ඒ networksවල විශාල අර්බුද තිබුණු බව. සමහර පැතිවලට network coverage එක තිබුණත්, අපේ ජනතාවට අවශ්‍ය විධියට දුරකථන පහසුකම් සලසා ගැනීමට බැරි වුණු අවස්ථා තිබුණා. ඒ වාගේම ලංකාවම ආවරණය වීම සියයට 100කින්ම සිදු නොවුණු අවස්ථා තිබෙනවා. එහෙම ආවරණය වෙලා නැහැ. සියයට 95ක් වාගේ තමයි ආවරණය වෙලා තිබෙන්නේ. එහෙම සියයට 95ක්වත් ආවරණය කරගන්න බැරි සමාගම් අදටත් ලංකාවේ තිබෙනවා.

මේ හේතුව නිසා ඒ ඒ සමාගම් විසින් ඔවුන්ගේ යටිතල පහසුකම් ඔවුන් විසින්ම සාදා ගන්නා ක්‍රමවේදය නවත්වා, තිබෙන යටිතල පහසුකම් වාගේම ඉස්සරහට හදන්න තිබෙන ඒවාත් ඒක රාශි කර සමාගම් හවුල්කාරිත්වයකට යන ක්‍රමවේදයක් සෑදීම අනිවාර්යයෙන්ම අවශ්‍ය දෙයක් හැටියට අප දකිනවා. එම ක්‍රමවේදය තමයි අපි ලෝකයේ අනෙක් රටවලත් දකින්නේ. මේ යටිතල පහසුකම් හවුල්කාරිත්වය ලංකාවට වඩා ලෝකයේ අනෙක් රටවල සෑහෙන දුරට ව්‍යාප්ත වෙලා තිබෙනවා. සමහර රටවල් national networksවලට පවා ගිහිල්ලා තිබෙනවා. ඒ කියන්නේ, රජය වියදම් කරලා එක network එකක් හදනවා. ඒ network එක පාවිච්චි කරලා තමයි දුරකථන සේවා සපයන සමාගම් පාරිභෝගිකයන්ට සේවා ලබා දෙන්නේ. ඒ හරහා ඒ රටවලට හැකියාව ලැබී තිබෙනවා, අපේ රටේ වාගේ පරිසරයට අයහපත් ලෙස බලපාන, නාගරික සැලසුම්වලට අයහපත් ලෙස බලපාන විධියට එක එක තැන්වල towers හදන එක, පාරවල් කඩලා cables දමන එක වාගේ දේවල් නැති කර ගන්න. ඒ වාගේම ඕනෑම සේවා සපයන සමාගමකට ඉතාම ඉක්මනින් ජනතාවට සේවා ලබා දෙන්න ඒ හරහා හැකියාව ලැබී තිබෙනවා.

මේ යටිතල පහසුකම් හවුල්කාරිත්වය ස්තර හතරක් යටතේ අපි අධීක්ෂණය කරනවා. එකක් තමයි, passive infrastructure. ඒ කියන්නේ, නිෂ්ක්‍රිය යටිතල පහසුකම්. උදාහරණයක් විධියට කිව්වොත්, ටෙලිකොම් සමාගම්වල තිබෙන towers, masts, poles වාගේ දේවල්. Poles කියන්නේ towers වලට වඩා උසින් අඩු කණු. ඒ වාගේම විදුලිය සපයන generators වාගේ දේවල් තිබෙනවා; AC වාගේ cool කරන දේවල් තිබෙනවා; ඒ වාගේම ducts, duct fibre cables තිබෙනවා. ඒ ඔක්කෝටම කියන්නේ passive infrastructure කියලා. ඒවා ඇත්තටම විදුලි සම්ප්‍රේෂණයට උපකාරී වෙන්නේ නැහැ. ඒ සඳහා ආධාරකයක් විධියට තමයි passive infrastructure තිබෙන්නේ. ඒවා share කර ගන්න පුළුවන්; operatorsලා අතර share කර ගන්න පුළුවන්.

ඊළඟට, active infrastructure sharing. ඒ කියන්නේ, ක්‍රියාකාරී යටිතල පහසුකම්. ඒවාට අයිති වෙනවා, radio equipment. උදාහරණයක් විධියට කිව්වොත්, antennas. ඒ වාගේ දේවල් operatorsලා අතර share කර ගන්න පුළුවන්. ඒ share කර ගන්න එකට කියනවා MORAN - Multi-Operator Radio Access Network - sharing කියලා. ඒක තමයි දෙවැනි අදියර. තුන්වැනි එක තමයි, active infrastructure sharing එක්කම විද්‍යුත් සංඛ්‍යාත share කර ගන්නත් පුළුවන් වීම. විද්‍යුත් සංඛ්‍යාත share කර ගන්නවා කියන්නේ, එක් operator කෙනෙක් මොකක් හරි විද්‍යුත් සංඛ්‍යාතයක් ගත්තොත්, ඔහුට පුළුවන් මොකක් හරි ගිවිසුමකට ඇවිල්ලා තවත් operator කෙනෙකුට ඒ සංඛ්‍යාතයෙන්

[ගරු එරංග වීරරත්න මහතා]

ලබා දෙන සේවාව ලබා දෙන්න. උදාහරණයක් විධියට කිව්වොත්, අපි ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේදී 5G තාක්ෂණය ලංකාවේ commercially ආරම්භ කරන්න 5G සංඛ්‍යාත ලබා දුන්නා. ඒ සංඛ්‍යාත ලබා දෙනකොට සමාගම් දෙකක් පමණයි ඒ සංඛ්‍යාත ලබා ගත්තේ, ඒ සමාගම්වල මූල්‍ය හැකියාව අනුව. එතකොට ඒ සමාගම් දෙකට පුළුවන් වුණා, ඊට පස්සේ සතියේ ඉඳලාම 5G තාක්ෂණය ජනතාවට ලබා දෙන්න. අපේ රටේ සමාගම් තුනක් තිබෙනවා. නමුත් තුන්වැනි සමාගමට මූල්‍ය හැකියාවක් තිබුණේ නැහැ, 5G spectrum එක මුදල් දීලා ලබා ගන්න. එක්කෝ, ඒ කට්ටියට මූල්‍යමය හැකියාවක් නැහැ. මොකද, 5G spectrum එක ලබා ගත්තත් විශාල ප්‍රාග්ධනයක් අවශ්‍යයි, මුල් වියදමක් දරන්න සිද්ධ වෙනවා, 5G තාක්ෂණයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කරන්න. ඉතින් එතකොට ඒ සමාගමෙන් සේවා ලබා ගන්නා පාරිභෝගිකයන්ට 5G තාක්ෂණය නොලැබිය යුතුද? කොහෙත්ම එහෙම විය යුතු නැහැ. ඒ සමාගමට හැකියාව තිබෙන්න ඕනෑ, 5G තාක්ෂණය තිබෙන තවත් සේවා සපයන්නන් හා ගිවිසුමකට ගිහිල්ලා, ඒ ගිවිසුම හරහා ඔවුන්ගේ පාරිභෝගිකයන්ටත් 5G තාක්ෂණය ලබා දෙන්න. ඒ හරහා තමයි ඒ සමාගමෙන් සේවාව ලබා ගන්නා පාරිභෝගිකයන්ටත් අවස්ථාව හම්බ වෙන්නේ, 5G තාක්ෂණයට යන්න. එහෙම නැති වුණොත් ඒ පිරිස කොන් වෙනවා; ඒ පිරිසට 5G තාක්ෂණයට ප්‍රවිෂ්ට වෙන්න හැකියාව නැති වෙනවා. ඒක තමයි තුන්වැනි අදියර වෙන්නේ. ඒ කියන්නේ, Spectrum සහ active infrastructure sharing ඇති කිරීම.

අපි කියනවා, MOCN - Multi-Operator Core Network - sharing කියලා. මෙතැනදී පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. මේ Multi-Operator Core Network sharing කියන එක spectrum සහ active network componentsවලට ගියාට ඒකෙන් කොයිම වෙලාවකවත් කියැවෙන්නේ නැහැ, ටෙලිකොම් සමාගම්වල තිබෙන core network එක share කර ගන්නවාය කියලා. Core network කිව්වාම ඒකට අදාළ වෙනවා, mobile switch කරන switching platforms, HLR වාගේ පාරිභෝගිකයන් register වෙලා ඉන්න database එක. ඒ වාගේ core network infrastructure එකක් තිබෙනවා. ඒ යටිතල පහසුකම share කර ගන්නවාය කියන එක නොවෙයි, මේ තුන්වැනි අදියරෙන් කරන sharing එක වෙන්නේ.

Core network එක - ඒ කියන්නේ, ප්‍රධාන network එක - share කර ගන්න එක කොහෙත්ම නොකළ යුතුයි. එහෙම share කර ගත්තොත් අප එක පද්ධතියක් මතම depend වෙලා එම පද්ධතිය ගොඩක් දුරට බිඳ වැටීමකට ලක් වෙන්න පුළුවන්. එහෙම වුණොත්, operatorsලා දෙන සේවාව අඩාළ වෙන්න පුළුවන්. ජාතික ආරක්ෂාව පැත්තෙන් ගත්තත් එකම network එකකින් යෑමේදී සැහෙන ගැටලු තිබෙනවා.

මේ පනතට අදාළව සංශෝධන ඇවිල්ලා තිබෙන්නේ 2024 අගෝස්තුවලයි. ඒ වාගේම, මේ ඉදිරිපත් කර තිබෙන, අද විවාදයට ගන්නා රෙගුලාසිවලට වුණත් core network sharing කියන එක අදාළ වෙන්නේ නැහැ. ඒ හැරෙන්නට මා මුලින් සඳහන් කළ, passive infrastructure, active infrastructure සහ spectrum phase - ඒ කියන්නේ, විද්‍යුත් සංඛ්‍යාත පහසුකම් - කියන ස්ථර තුනටම share කර ගන්න පුළුවන්. එහෙම share කර ගන්න ප්‍රධාන හේතුවක් තිබෙනවා. අලුතින් network එකක් හදන්න ඉතා විශාල ප්‍රාග්ධනයක් වැය වෙනවා. මෙසේ share කර ගැනීම මඟින්, අලුතින් network එකක් හදන්න යන ප්‍රාග්ධනය අඩු වෙනවා. ඒ කාරණයට අදාළව අද ලෝකයේ තිබෙන සාමාන්‍යය ගත්තොත්, සියයට 30ක්, සියයට 50ක් වාගේ ප්‍රමාණයකින් මුල් වියදම අඩු වෙනවා කියලා ගණන් බලා තිබෙනවා. මුල් වියදම විතරක් නොවෙයි, නඩත්තු කරන්න යන වියදමත් අඩු වෙනවා. අපි දන්නවා tower එකක් හැදුවාට පසුව එය නඩත්තු කරන්න අවශ්‍ය බව. ඒකට අදාළ විදුලිය පිරිවැයක් තිබෙනවා. ඒකට battery backups අවශ්‍ය වෙනවා. පිරිස් බලය යොදවා එය හරියට නඩත්තු වෙනවාද, කාර්යක්ෂමව වැඩ කරනවාද කියලා බැලිය යුතු වෙනවා. ඒ සියලු නඩත්තු කිරීම් සියයට 20ක්, සියයට 40ක් වාගේ ප්‍රමාණයකින් අඩු කරන්න පුළුවන් මේ කියන sharing මඟින්, මේ කියන හවුල්කාරිත්වයට යෑම මඟින්.

ඒ වාගේම, අපගේ "ගමට සන්නිවේදනය" කියන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා. එම ව්‍යාපෘතියෙන් අපි බලාපොරොත්තු වෙනවා, අපේ රටේ දුෂ්කර පළාත්වල ජනතාවට සන්නිවේදන පහසුකම් ලබා දීමට. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනයට අපේ රජය TRCSL එක හරහා මැදිහත් වෙලා එම සේවා සපයන සමාගම්වලට මුදල් ප්‍රදාන සිදු කරලා අපට අවශ්‍ය towers සෑදිය යුතුයි. ඒ අලුතින් හදන towersවලින් ලංකාවේ තිබෙන සේවා සපයන හැම සමාගමකටම එක හා සමාන විධියට සේවා ලබා ගැනීමේ අවකාශය අප ඇති කළ යුතුයි. ඒ හදන towersවලින් එක සමාගමක් විතරක් නම් සේවා සපයන්නේ, ඒකෙන් අපේ ජනතාවට නියම ප්‍රතිඵල ලැබෙන්නේ නැහැ. එය නියාමනය කරන්නත් මේ ගෙනැවිත් තිබෙන රෙගුලාසිවලින් හැකියාව ලැබෙනවා. මේ හරහා අපි බලාපොරොත්තු වෙනවා අවුරුද්දකට දුෂ්කර පළාත්වල අලුතින් towers 150ක්වත් ඉදි කරන්න. ඒ ඉදි කිරීම හරහා අපේ ජනතාවට ඉදිරියේදී ඉතා හොඳ සේවාවක් ලබා දෙන්න හැකියාව ඇති වෙනවා. ඒකට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම සඳහා මේ කියන හවුල්කාරිත්වය ඉතාම වැදගත් වෙනවා.

අනෙක් කාරණාව තමයි, එක පළාතකට මෙම සේවාව සපයන්න tower එකකට වඩා සෑදීමේදී යටිතල පහසුකම් සඳහා අවශ්‍ය ගොඩක් උපකරණ පිට රටවලින් ගෙන්වීමට සිදු වීම. එසේ පිට රටවලින් ගෙනෙන්නේ, radio antennas වෙන්න පුළුවන්, එහෙම නැත්නම් towers හදන්න අවශ්‍ය යකඩ වෙන්න පුළුවන්. එවැනි දෑ විශාල ප්‍රමාණයක් ගෙන්වන්නේ පිට රටවලින් වීම නිසා towers හදන වැඩේදී සහ යටිතල පහසුකම් - infrastructure - හදන කටයුත්තේදී උපකරණ විශාල ප්‍රමාණයක් පිට රටවලින් ගෙන ඒම සඳහා විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ලංකාවෙන් පිටට යනවා. අපට ඒකත් අඩු කර ගන්න පුළුවන්, ඒ හදන tower එක හෝ ඒ සකස් කරන infrastructure අපේ ඉන්න ඔක්කෝම operatorsලා එක්ක share කර ගන්න පුළුවන් නම්.

අනෙක් කාරණාව තමයි, මෙකී infrastructureවලට සහ tower එකක් ක්‍රියා කරවීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වීම. විදුලිය ගොඩක් අවශ්‍ය වෙනවා. විදුලිය ඇන හිටීමක් වුණොත් generators පාවිච්චි කරන්න සිදු වෙනවා. Generators ක්‍රියා කරවන්න ඩීසල් ආදි දේවල් අවශ්‍ය වෙනවා. එහෙම නැත්නම් battery backups අවශ්‍ය වෙනවා. මේ කියන දේවල් පවා අපේ රටේ තිබෙන ධනය, විදේශ විනිමය පිටතට යන ක්‍රියාමාර්ගයක්. අපට එම වියදමත් අඩු කරන්න පුළුවන් මේ කියන infrastructure sharing එකට ගියාම. මම මේ කථා කළේ වියදම අඩු වන විධිය ගැන. අපේ රටේ ටෙලිකොම් සේවා සපයන සමාගම්වලට වියදම අඩුවීම හරහා ටෙලිකොම් සේවාව මීට වඩා හොඳ තත්ත්වයට ගන්න ක්‍රමානුකූලව අපට පුළුවන් වේවි. ඒ වාගේම, ඒ සේවාවලට පාරිභෝගිකයන්ගෙන් අය කරන මුදල පවා අඩු කරන්න අපට ඉදිරියේදී හැකියාව ලැබෙනවා.

හතරවැනි කාරණාව මෙයයි. අපේ රටේ තිබෙනවා telecommunication සමාගම් තුනක්. සමාගම් තුනක් තිබුණාට ඒ හැම සමාගමකටම එක හා සමාන මූල්‍යමය හැකියාවන් ඇතිව

ස්ථාපිත වෙලා නැහැ. එක් සමාගමක් තිබෙනවා සියයට 60ක්, 65ක් වාගේ ප්‍රමාණයක. තව සමාගමක් තිබෙනවා සියයට 15ක්, 17ක් වාගේ ප්‍රමාණයක. එතකොට මේ දෙකේ පවතින අසමතුලිත තත්ත්වය මත මේ දෙගොල්ලන්ගෙන් එක් සමාගමකට පුළුවන් වෙයි මේ යටිතල පහසුකම් ඉතා ඉක්මනින් හදාගෙන යන්න. නමුත්, අනෙක් සමාගමට යටිතල පහසුකම් හදාගන්න හැකියාවක් නැහැ. එතකොට ඒ සමාගම ක්‍රමානුකූලව අපේ රටින් ගිලිහී යන තත්ත්වයක් ඇති වෙන්නත් පුළුවන්. මේ market එක හරියාකාරව ක්‍රියාත්මක කරන්න නම්, අපට මේ සේවා සපයන්නන් තුන්දෙනාම ලංකාවේ තබාගන්න අවශ්‍යයි. එසේ කරන්න නම් මේ හදන යටිතල පහසුකම් මේ සමාගම් කීපයටම යොදා ගත හැකිය කියන එක අනිවාර්ය කරන්න වෙනවා. ඒ කියන්නේ, ලොකු සමාගමක් හදන යටිතල පහසුකමේ ප්‍රතිලාභය ඒ පොඩි සමාගමට පවා ලබා ගන්න හැකියාව තිබෙන්න ඕනෑ. හැබැයි, ඔවුන් ලබා ගන්නා ඒ පහසුකමට අදාළව ගෙවීමක් කරන්න ඕනෑ. එතකොට ලොකු සමාගමට ආදායමක් එනවා. ඒ අයට කිසිම අලාභයක් වෙන්නේ නැහැ. ඒ හවුල්කාරිත්වය උඩ අන්තිමට අපේ පාරිභෝගිකයන්ට හොඳ සේවාවක් ලබා ගන්න හැකියාව ලැබෙනවා. ඒ හරහා ඇත්තටම කරන්නේ එයයි.

අනෙක් කාරණාව මේකයි. ටෙලිකොම් යටිතල පහසුකම් කියන එක operatorsලා විසින්ම හැදුවාම ඔවුන්ට ඉතා විශාල ප්‍රාග්ධන මුදලක් ඒකට යොදන්න අමාරුයි; ඒවා නඩත්තු කරන්නත් අමාරුයි. ඒ නිසා තමයි ගොඩක් තැන්වල විදුලිය ඇන හිටියාම අවශ්‍ය ප්‍රමාණයට battery backups හෝ generator backups නැත්තේ. "දිට්වා" සුළි කුණාටුව වාගේ අවස්ථාවල අපි දැක්කා, විදුලිය ඇන හිටීම මත මේ තිබෙන base stations ක්‍රියා විරහිත වීම හරහා හුහක් ආවරණ - ඒ කියන්නේ ටෙලිකොම් ආවරණ - නැති වුණු බව. ඉදිරියේදී අපි බලාපොරොත්තු වෙනවා, මේ වාගේ ආපදා තත්ත්වයකදී මුහුණ දෙන්න පුළුවන් අවම රෙගුලාසියක් ගෙනෙන්න. ඒකට කියන්නේ, guideline එකක් කියලා. මෙන්න මේ කියන අවම තත්ත්වය මේ සමාගම් විසින් මේ මේ ස්ථානවල පවත්වාගෙන යා යුතුයි කියලා guideline එකක් ගෙනෙන්න, එනම් battery backup එක කොච්චර වෙලාවක් තිබෙන්න ඕනෑද, generator backup එක කොයි වාගේ තිබෙන්න ඕනෑද ආදිය සඳහන් guideline එකක් ගෙනෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ guideline එකත් හොඳින් ක්‍රියාත්මක කරන්න පුළුවන් වන්නේ මේ වාගේ එක් යටිතල පහසුකමක් හැදුණාට පසුව ඒ යටිතල පහසුකම සියලුම operatorsලා බෙදා ගැනීම හරහායි. එවිට එක් එක්කෙනා වියදම් කරනවා වෙනුවට අර කියන ක්‍රමවේදත් එක්ක ඒ යටිතල පහසුකම ගුණාත්මකභාවය, කැඩීම් බිඳීම්වලට ඔරොත්තු දීමේ හැකියාව වාගේ දේවල් ද එක්ක එක් තැනක ඇති කිරීමේ හැකියාව ලැබෙනවා. මෙසේ sharingවලට යන එකෙන් ඔන්න ඔය වාගේ ගොඩක් ප්‍රතිලාභ අපට ලැබෙනවා.

ඊළඟට, අපි මේ පනතේ **17.(6)(b)** යටතේ විදුලි සංදේශ යටිතල පහසුකම් ඉදි කිරීමටත්, ඒවා පවත්වාගෙන යාමටත් දැනට බලපත්‍ර දෙකක් ලබා දීලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා සති 2ක් වාගේ ඇතුළත තුන්වැනි බලපත්‍රයත් ලබා දෙන්න. ඒකෙන් කරන්නේ මොකක්ද? මේ බලපත්‍ර ක්‍රමය එන්න ඉස්සර වෙලා ටෙලිකොම් සේවා සපයන සමාගම් තමයි telecom towers වාගේ දේවලුත් ඉදි කළේ. තම සමාගම්වල මුදල් හැකියාව අනුව තමයි මේ කියන towers වාගේ දේවල් ඒ කට්ටිය ඒ ඒ තැන්වල ස්ථාපිත කළේ. නමුත්, ඒවා ස්ථාපිත කරන එක ටෙලිකොම් සමාගම්වලින් කරන්නම ඕනෑ කියලා නියමයක් නැහැ. මේ බලපත්‍ර ලබා දීම හරහා, ඒ කියන්නේ යටිතල පහසුකම් ඉදි කිරීමේ බලපත්‍ර ලබා දීම හරහා අපි දැන් ගෙනැල්ලා තිබෙනවා සමාගම් දෙකක්, ඒ යටිතල පහසුකම් ඉදි කිරීම සඳහා පමණක්. එතකොට, ඒවාට ආයෝජනය කරන්නේත් ඔවුන්, ඒවා ඉදි කරන්නේත් ඔවුන්, ඒවා ක්‍රියාත්මක කරගෙන යන්නේත් ඔවුන්. ඒ කරන ඉදිකිරීම්වලින් ඒ සමාගම්වල සේවාව - ඒ towersවල සේවාව - අපේ විදුලි සංදේශ සේවා සපයන සමාගම් මිල දී අරගෙන ඔවුන්ගේ පාරිභෝගිකයින්ට ලබා දෙනවා. මා කියපු විධියට අපි දැන් මේ වාගේ සමාගම් දෙකක් ගෙනැල්ලා බලපත්‍ර ලබා දී තිබෙනවා. තුන්වැනි සමාගමත් එනවා. තුන්වැනි සමාගම ගොඩක් වෙලාවට ලාංකීය සමාගමක් හෝ ලාංකීය හවුල්කාර සමාගමක් වෙන්න පුළුවන්. දැනට දීලා තිබෙන බලපත්‍ර දෙකෙන් ඇත්තටම ලංකාවට විදේශ විනිමය එන මාර්ගයක් තිබෙනවා. මම අර ඉස්සර වෙලා කියපු විධියට මේ යටිතල පහසුකම් හදන්න අපට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් යනවා. ඒ, අපට ගොඩක් බඩු පිට රටින් ගෙනෙන්න තිබෙන හින්දා. මේ වාගේ infrastructure හදන companies ලංකාවට ඇවිල්ලා ආයෝජනයක් විධියට ඒවා ලංකාවේ සෑදීම හරහා රටට වාසියක් වෙනවා. මොකද, විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඔවුන් ගෙනෙනවා. උදාහරණයක් හැටියට EDOTCO කියන ආයතනය ගත්තොත්, 2030 අවුරුද්ද වනකොට ඒ අය ආයෝජනය විධියට ඩොලර් මිලියන 67ක් ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ සමාගම් ඇවිල්ලා අපේ රටේ යටිතල පහසුකම් හදනවා නම් අපේ සමාගම්වලට විදේශ විනිමය පාවිච්චි කරන්න අවශ්‍ය වන්නේ නැහැ. එතකොට අපේ රටේ විදේශ විනිමය රැකෙනවා. ඒ සමාගම් ඇවිල්ලා අපේ රටේ යටිතල පහසුකම් හදනවා.

අනෙක් කාරණය තමයි, හැම සමාගමක්ම යටිතල පහසුකම් හදන්න ගියාම පරිසරයට සහ නාගරික සැලසුම්වලට සිදු වන බලපෑම. මොකද, ගොඩක් තැන්වල Telecom towers එකකට වඩා හැදීම හරහා පරිසර හානි ඇති වෙලා තිබෙන ආකාරය අපි දකිනවා. ඒ වාගේම නාගරික සැලසුම් පවා හරියට කර ගන්න බැරි වෙලා තිබෙනවා, ඒ tower නිසි පිළිවෙළක් නැතුව හැදීම නිසා.

ඊළඟට, "ගමට සන්නිවේදනය" වාගේ වැඩසටහන් ක්‍රියාත්මක කරනකොට Telecom towers හදන්න භූමිය නිරවුල් කර ගන්න අවශ්‍යයි. ඒ සඳහා ආයතන 21කින් පමණ අවසර ගන්න ඕනෑ. ඒ අවසර ගැනීමත් කඩිනම් කරන්න පුළුවන්, අපි හරියට නියාමනය කරලා, අපේ TRC එක හරහා කරන යටිතල පහසුකම් සංවර්ධනය කරන වැඩ පිළිවෙළට ගියාම.

ඒ වාගේම මම කලින් සඳහන් කළා වාගේ මේ රටේ ටෙලිකොම් සමාගම් අතර තිබෙන අසමතුලිතතාව තුරන් කරගෙන දැනට ලංකාවේ තිබෙන සමාගම් ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියන එක ගැන Significant Market Power - SMP - Analysis එකක් කරන්න අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඒකට cost model එකක් ගෙනෙන්නත් අපි බලාපොරොත්තු වනවා. මොකද, අපේ රටේ යටිතල පහසුකම් හවුල්කාරිත්වයෙන් කරන්න ඕනෑ කිව්වාට, ඒ යටිතල පහසුකම් හදලා තිබෙන සමාගම් අනෙක් සමාගම්වලට විශාල පිරිවැයක් දරන්න දීම නිසා ඒ හවුල්කාරිත්වය හරියට ක්‍රියාත්මක වෙන්නේ නැති අවස්ථා අපි දැකලා තිබෙනවා. මෙන්න මේ වාගේ තමයි ඔයගොල්ලන් යටිතල පහසුකම් හවුල්කාරිත්වයේදී ඒ cost එක හදන්න ඕනෑ කියලා හරියට cost market model එකක් ගෙනැල්ලා ඒ සමාගම්වලට දුන්නොත් ඒ තත්ත්වය වළක්වන්න පුළුවන්. ඒක හොඳ අවස්ථාවක්.

**ගරු කථානායකතුමා**
**(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)**
(The Hon. Speaker)
Hon. Deputy Minister, your time is over.

**ගරු එරංග වීරරත්න මහතා**
**(மாண்புமிகு எரங்க வீரரத்ன)**
(The Hon. Eranga Weeraratne)
Sir, give me one more minute.

[ගරු එරංග වීරරත්න මහතා]

ඒ හරහා සාධාරණ market එකක් ඇති කරන්න අවස්ථාවක් ලබා දෙන්න අපට පුළුවන් වේවි. ඒ වාගේම අපේ TRC එකට මේ ගෙනෙන Regulationවලින් බලාත්මක කිරීමක් දෙනවා වාගේම හරියට ක්‍රියාත්මක කිරීමේ හැකියාවත් ඇති කරනවා. මේ රෙගුලාසි උල්ලංඝනය කරන සේවා සපයන්නන්ට එරෙහිව නියාමන පියවර ගැනීම, දඩ සහ බලපත්‍ර සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග අරගෙන ඒ යටිතල පහසුකම් හවුල්කාරිත්වය ඉතා හොඳින් සංවර්ධනය කරන්න ඒ හරහා අපේ මේ TRC එකට පුළුවන්කම ලැබෙනවා.

අපේ ජනතාවට දැන් ටෙලිකොම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් තිබෙන දැවෙන ප්‍රශ්න මඟ හරවා ගන්නත්, ඔවුන්ට හොඳ සේවාවක් ලබා දෙන්නත්, නියාමනය ඉතා කාර්යක්ෂම විධියට කරන්නත් අපට මේ තුළින් හැකියාව ලැබෙනවා. ඒ සඳහා අද මේ සම්මත කරන රෙගුලාසි බොහෝ සෙයින් උපකාරී වෙනවා. මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The next speaker is the Hon. Ajith P. Perera. You have 12 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[පූ.භා. 11.59]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රජය විසින් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සම්පත් බෙදා හදා ගැනීම පිළිබඳ ප්‍රතිපත්තිය පිළිගනිමින් ඉදිරිපත් කරන රෙගුලාසිවලට අපගේ සහයෝග පළ කරනවා වාගේම අපි එහි වැදගත්කම අගය කරනවා. නමුත්, මේ ක්ෂේත්‍රයේ ඉතා වැදගත් තත්ත්වයක් මතු වෙමින් තිබෙනවා. මේ රටේ පුරවැසියන් විසින් තමන්ගේ වත්කම්වලින් ගොඩනඟපු ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සහ එහි උප සමාගමක් වන මොබිටෙල් සමාගම, ඩයලොග් ආයතනය විසින් ගොදුරු කර ගැනීම හරහා ඒකාධිකාරයක් - monopoly එකක් - නිර්මාණය කර ගැනීම පිළිබඳ සැකසංකා විශේෂයෙන්ම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය තුළ මතු වෙමින් තිබෙනවා. මේ රජය විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය තුළ අලුත් පත්වීම් කරද්දී කරන තෝරා ගැනීම් හරහා වාගේම රජය ඩිජිටල්කරණ වැඩ පිළිවෙළ තුළ කටයුතු කරන විලාසය හරහා ශ්‍රී ලංකා ටෙලිකොම් පෞද්ගලික සමාගමකට යටත්වීමට හෝ අත්පත් කර ගැනීමට අවකාශය සලසන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා කියලා සේවකයින් අතර සැකයක් ඇති වෙලා තිබෙනවා. ඒ සැකය සුදුසු එකක් නොවෙයි. ඇමතිතුමා කිව්ව විධියටම තරගකාරිත්වය තිබෙන්න ඕනෑ. තරගකාරිත්වය තිබෙන්න ඕනෑ නම් සමතලයක ක්‍රීඩා කරන්න හැකි වෙන්න ඕනෑ. ඒ විධියට සමතලයක සමාගම් කිහිපයක් නැති වුණොත්, ඒකාධිකාරී ලෙස කටයුතු කිරීමට හැකි වුණොත්, එසේ නොමැති නම් ප්‍රබලතම සමාගමට යටත්ව ක්‍රියා කරන අනෙකුත් සමාගම් ඇති වුණොත්, අවසානයේ පාරිභෝගිකයාට තමන්ගේ සේවා ලබා ගැනීමේදී මිල සහ ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙනවා. ඒ නිසා මෙම රෙගුලාසි පිළිබඳව අපේ සහයෝගය පළ කරන ගමන් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙන මේ අර්බුදකාරී තත්ත්වය පිළිබඳවත්, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ පත් කිරීම් සිදු කිරීමේදී විනිවිදභාවය පිළිබඳව ඇති වෙලා තිබෙන ප්‍රශ්න පිළිබඳවත්, ඒ වාගේම තීරණ ගැනීමේදී ඇති වෙලා තිබෙන conflict of interest තත්ත්වය පිළිබඳවත් මේ ගරු සභාවේ අවධානය යොමු කරන්න මම කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊට වඩා බැරෑරුම් ප්‍රශ්නයක් මේ රටේ අද වනකොට ඇති වෙලා තිබෙනවා. බලශක්ති විෂයභාර කුමාර ජයකොඩි ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්න එක ගැන මම සන්තෝෂ වෙනවා. මොකද, මේ රටේ ජනතාව පසුගිය කාලය පුරාවටම එතුමා ගැන තමයි හිතුවේ. කුමාර ජයකොඩි ඇමතිතුමා ගැන ජනතාව කල්පනා කරනවා. ඇත්තවශයෙන්ම මේ ආණ්ඩුව පත් වෙන්න කලින් අපි කවුරුවත් එතුමා ගැන දැනගෙන හිටියේ නැහැ, හඳුන්නෙත්ති ඇමතිතුමනි. පසුගිය කාලය පුරාවටම කුමාර ජයකොඩි ඇමතිතුමාගේ හපන්කම්, දක්ෂකම්, වැඩ පිළිවෙළ සහ ප්‍රතිපත්ති ගැන මේ රටේ සාමාන්‍ය පුංචි මිනිහාගේ ඉඳලා සමාලෝචනය කරනවා. මේ සභාවේදීත් ඒ ගැන කථා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2022 සැප්තැම්බර් මාසයේ 20වැනි දා ජාතික විගණන කාර්යාලය විසින් සකස් කරන ලද නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාල පරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගැයීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව මා සතුව තිබෙනවා. මේ විශේෂ විගණන වාර්තාවේ නිර්දේශ තිබෙනවා. ඒ වාගේම මෙවැනි බරපතළ ප්‍රසම්පාදන ක්‍රියාවලියකදී අනුගමනය කළ යුතු ක්‍රියාවලිය දක්වා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එහි අවශ්‍ය සුදුසුකම් හැටියට දක්වා තිබෙන එක දෙයක් තමයි, පසුගිය මාස 36 තුළ GCV අගය කිලෝග්‍රෑමයට කිලෝ කැලරි 5,900ක හෝ ඊට වැඩි ධාරිතාවක ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියනයක් අවම වශයෙන් සැපයීමේ පළපුරුද්දක් සහිත වීම. අවම වශයෙන් එවැනි ප්‍රමාණයක් තිබෙන්න ඕනෑ. කොච්චර තිබෙන්න ඕනෑද? හඳුන්නෙත්ති ඇමතිතුමනි, තිබෙන්න ඕනෑ ප්‍රමාණය ඔබතුමන්ලාත් දන්නේ නැතුව ඇති. අවුරුද්දකට මෙට්‍රික් ටොන් මිලියනයක් සපයා තිබෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ රජය පරාජයට පත් කරලා වර්තමාන රජය පත් වුණා. ඒ වාගේම ආර්ථිකය දැන් යම් ආකාරයකට ස්ථාවරව තිබෙනවා. මේ ගුණාත්මකභාවය සහිත ගල් අඟුරු සපයන්න පුළුවන්, ආර්ථිකයේ ස්ථාවරභාවය තිබෙන, අනෙකුත් අවශ්‍යතා සපුරන, මෙට්‍රික් ටොන් මිලියනයක් සැපයීමේ අත්දැකීම් තිබෙන සමාගම් ලෝකයේ තිබෙනවා. හැබැයි, එසේ තිබියදී අලුත් සමාගමකට, ගල් අඟුරු ක්ෂේත්‍රයේ පළපුරුද්ද ටොන් ලක්ෂයක් පමණයි කියලා ඔවුන් ප්‍රකාශ කරන - ඒකත් සැක කටයුතුයි - සමාගමකට undercut කරලා, බාල ගල් අඟුරු සපයන්න අවකාශය සපයන ආකාරයට මේ වර්තමාන ටෙන්ඩරය ලබා දී තිබෙනවා. දැන් ආඩම්බරයෙන් කියනවා නේ, ටෙන්ඩර් කැඳවූවා කියලා. ඇත්ත, විදුලිබල ක්ෂේත්‍රයේ ටෙන්ඩර් වෙනුවෙන් අවංකව පෙනී හිටපු, ක්‍රමවේද හදපු, අපේ කාලයේ

එකම ප්‍රශ්නයක්වත් නැතුව සුළං විදුලි බලය පිළිබඳව පළමුවැනි ටෙන්ඩරය, සූර්ය බලය පිළිබඳව පළමුවැනි ටෙන්ඩරය කැඳවලා මේ බලශක්ති ක්ෂේත්‍රයේ පිරිසිදුකම සහතික කරන්න කටයුතු කරපු කෙනෙක් හැටියට මම පිළිගන්නවා, ටෙන්ඩර් කැඳවන්න ඕනෑ කියන එක. හැබැයි, ටෙන්ඩරය fix කළාම, ටෙන්ඩරයේ තරගකාරිත්වය ඇති කිරීමට අවශ්‍ය කරන සාධක ඉවත් කළාම, ඊළඟට ඒ ටෙන්ඩරය හරහා එන්නේ සුදුසු කෙනෙක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. සමහර වෙලාවට මිල අඩුවෙන් කියන්න පුළුවන්. හැබැයි, ගුණාත්මකභාවයෙන් පහළට යන්න පුළුවන්. ඒ වාගේම අඛණ්ඩ සැපයීම සනාථ කරන්න පුළුවන් වෙන්න ඕනෑ. ලක්විජය ගල් අඟුරු බලාගාරය අපේ රටේ හදවත වාගේයි. අපේ රටේ බලශක්ති අවශ්‍යතාවෙන් සියයට 35ක් විතර සපයන්නේ මේ ලක්විජය ගල් අඟුරු බලාගාරය. මේ ලක්විජය බලාගාරය අවුරුද්ද පුරා අපිට හරියාකාරව නියමිත ප්‍රමිතියෙන් ක්‍රියාත්මක කරන්න බැරි නම් අපේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන් කඩා වැටෙනවා. ඒ වාගේම, එය පිහිටා ඇති ස්ථානයේ තිබෙන මුහුදේ ස්වභාවය නිසා, අවුරුද්දේ මාස හයක වාගේ කාලයක් ඇතුළත - ඇත්තටම ජනවාරි සිට අප්‍රේල් මාසය වෙනකොට - අවුරුද්දටම අවශ්‍ය කරන ගල් අඟුරු ප්‍රමාණය ගෙනැල්ලා ගොඩගහලා ගබඩා කර ගන්න ඕනෑ.

ඒ නිසා මේ තෝරා ගැනීමේ ක්‍රියාදාමය තුළ විශ්වාසවන්ත සමාගම් එන්න ඕනෑ; ගුණාත්මකභාවය සහතික වෙලා තිබෙන්න ඕනෑ; පළපුරුද්ද තිබෙන්න ඕනෑ; ඇලා යන්නේ නැති සමාගම් වෙන්න ඕනෑ. කුමාර ජයකොඩි ඇමතිතුමා අවස්ථා කිහිපයකදීම මේ සභාවේ කියන්න උත්සාහ කළා, "මම මොනවා කරන්නද? මම ඇමතිවරයා විතරයි" කියලා. ඒවා කරුණු දන්න මිනිස්සුන්ට කියන්න සුදුසු දේවල් නොවෙයි, ගරු ඇමතිතුමා. තමන්ගේ අමාත්‍යාංශය සම්බන්ධව ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව spot tender එක ඕනෑද, term tender එක ඕනෑද, කොච්චර ප්‍රමාණයක් ගන්නවාද, specificationsවල තිබෙන වෙනස්කම් කරනවා නම් ඒ කොහොමද, දින 42 දින 21 කරනවාද, නැද්ද කියන කාරණා පිළිබඳව අදාළ උපදෙස් ටික අමාත්‍ය මණ්ඩලයට දීලා, අමාත්‍ය මණ්ඩලයෙන් අනුමත කරගන්න ඕනෑ. අමාත්‍ය මණ්ඩලයෙන් මේ ටෙන්ඩර් අනුමත කරන්න ඕනෑ. අමාත්‍ය මණ්ඩලයෙන් අනුමත කර ගැනීමේ වගකීම තිබෙන්නේ ඔබතුමාට. ඔබතුමා තමයි ඒ කරුණු කියන්නේ. ඔබතුමා කියන දේ තමයි අමාත්‍ය මණ්ඩලය විශ්වාස කරන්නේ. මොකද, අමාත්‍ය මණ්ඩලයේ අනෙක් සමාජිකයන් මේ විෂය පිළිබඳව ප්‍රාමාණික දැනුම තිබෙන අය නොවෙයි. විෂයභාර ඇමතිතුමා යමක් කියනවා නම් ඔවුන් විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමනි, තවදුරටත් ඔබතුමා විශ්වාස කරයිද කියලා නම් මම දන්නේ නැහැ. මේ සභාවේ අපිත් එක්ක අවුරුදු ගණනක් එකට වාඩි වෙලා හිටපු නිසායි අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට අපි මේක කියන්නේ. එතුමා අපෙත් ජනාධිපති නේ. අපි ඡන්දය දුන්නේ නැහැ. නමුත්, රටේ ජනතාව ඡන්දෙ දීලා එතුමාව මේ රටේ ජනාධිපති බවට පත් කළා. තුනෙන් දෙකක බලයක් සහිත ආණ්ඩුවක් දුන්නා. එතුමා අපෙත් ජනාධිපති. අපි අනුර කුමාර ජනාධිපතිතුමාට කියනවා, විෂයභාර ඇමතිතුමා මත විශ්වාසය තියලා වැඩේ කළාට අද වෙනකොට වැඩේ අවුල් වෙලා තිබෙන බව. අපේ රටේ බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳ, අපේ රටේ ආර්ථික ප්‍රවර්ධනය පිළිබඳ මුළු මහත් ජනතාවටම අදාළ වන මේ ප්‍රශ්නයේදී විසඳුමකට එන්න ආණ්ඩුව අද අසමත් වෙලා තිබෙනවා. මේ තෝරාගත්ත සමාගම පිළිබඳව නිසි විමර්ශනයක් කළා නම් පෙනී යනවා, මෙම සමාගම මීට කලින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට සහල් සැපයීම පිළිබඳ ටෙන්ඩර් එකට ඉදිරිපත් වෙලා, ජයග්‍රහණය කරලා, නිසි ප්‍රමිතියට හාල් ටික දෙන්න බැරිවෙච්ච සමාගමක් කියන එක. Blacklist කරපු සමාගමක්. එහෙම සමාගමකට තමයි අවුරුද්දටම ගල් අඟුරු සැපයීමේ ටෙන්ඩරය දෙන්නේ. ඒක දෙන්නෙත් මේ තිබෙන නිර්දේශ නොතකා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විගණකාධිපතිතුමාගේ වාර්තාවේ නිර්දේශ 7.2 යටතේ තිබෙනවා, මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයේ සඳහන් අරමුණුවලට අගතියක් නොවන පරිදි සහ සැපයුම්කරුවන්ගේ මූල්‍ය ශක්‍යතාව, පළපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය, ප්‍රමාණවත් නෛතික බැඳීම් පිළිබඳ අවශ්‍යතා සහතික කරන්න අවශ්‍යයි කියලා. මේවා අපි කියන දේවල් නොවෙයි. මේ කියන්නේ, විගණකාධිපතිතුමා. පසුගිය රජය යටතේ ටෙන්ඩරයක් ඉදිරිපත් කිරීමේදී ගැටලුවක් ඇති වෙලා, ඒ පිළිබඳව විගණකාධිපති විසින් පරීක්ෂා කරලා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් පරීක්ෂා කරලා නිර්දේශ ඉදිරිපත් කළා. මේ රජයට වගකීමක් තිබෙනවා, පසුගිය ආණ්ඩුවේ, ඒ කියන්නේ රාජපක්ෂ ආණ්ඩුවේ හෝ වික්‍රමසිංහ ආණ්ඩුවේ තිබුණු වැරදි, අඩුපාඩුකම් හදාගෙන ඉස්සරහට යන්න. හැබැයි අද මොකද වෙලා තිබෙන්නේ? අද ආපස්සට ගිහිල්ලා තිබෙනවා. අද වෙනකොට තිබෙන අනතුර තමයි, ඉතා කනගාටුදායක දේ තමයි, පළමුවෙනි ගල්අඟුරු සැපයුම නියමිත ප්‍රමිතියට නොමැතිවීම. අවම වශයෙන් කිලෝග්‍රෑම් 5,900ක් තිබෙන්න ඕනෑ එක 5,900ට අඩු වෙනවා. ඇමතිතුමා කියනවා, ලක්විජය බලාගාරයේ පරීක්ෂණාගාරය එතුමාට පිළිගන්න බැහැයි කියලා. ඉන්පසුව ඉන්දියාවේ තිබෙන accredited lab එකට යනවා. ඔවුන්ගේ වාර්තාව ගෙන්වනවා. නොගැළපෙනවා.

නලින්ද ජයතිස්ස ඇමතිතුමා කියන්නේ, ආණ්ඩුවේ මාධ්‍ය ප්‍රකාශකතුමා. ඇත්තටම, එතුමාට මහා නරක රස්සාවක් තමයි හම්බ වෙලා තිබෙන්නේ. එතුමාට විෂය ගැන පුළුල් දැනුමකුත් නැහැ. Note එක ලියා දුන්නාම ප්‍රශ්න ටික අහන බව දන්න නිසා එතුමාට කියන්න වෙනවා. නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඕක බොහොම අමාරු රස්සාවක්. නලින්ද ඇමතිතුමා කියනවා, දැන් අපි ඩොලර් මිලියන 2.1ක දඩයක් ගැහුවා කියලා. ආණ්ඩුවට ලාභ ලු. පසුගිය කැබිනට් මණ්ඩලය තීරණය කර තිබෙනවා, හදිසි ගල් අඟුරු මිලදී ගැනීම්වලට යන්න. දැන් මේ ආණ්ඩුව යටතේ තෝරා ගත්ත සමාගමේ සැපයුමේ ගුණාත්මකභාවය දිගින් දිගටම අඩු වෙනවා. පළමුවෙනි ගල් අඟුරු නැව, තුන්වැනි ගල් අඟුරු නැව, හතරවැනි ගල් අඟුරු නැව ගුණාත්මකභාවයෙන් පහළට ගිහිල්ලා තිබෙනවා. එකිනෙකට විරුද්ධ, නොගැළපෙන, විශ්වාස නැති වාර්තා ඉදිරිපත් වෙනවා. ගැටලුවක් තිබෙනවා. අපි නොරොච්චෝලේ බලාගාරයට ගියා. එහි ඉංජිනේරුවන් එක්ක කථා කළා. ඔය මාධ්‍ය සාකච්ඡාවල කියන දේවල් නොවෙයි ඒ නිලධාරින් අපිත් එක්ක කිව්වේ. අපි ඇමතිකම් කරන කාලයේ අවංකව වැඩ කරපු නිසා, ඒ නිලධාරින් අපිත් එක්ක ඇත්ත කිව්වා. නොරොච්චෝලේ බලාගාරයේ යන්ත්‍රවලට ඇති වෙලා තිබෙන පීඩනය, බාල ගල් අඟුරු නිසා ඒ බලාගාරයේ යන්ත්‍ර කැඩෙන්න පුළුවන්කම, බාල ගල් අඟුරු නිසා අනාගතයේ ඇති වෙන්න පුළුවන් ප්‍රශ්න, බාල ගල් අඟුරු නිසා බලශක්තිය අඩුවෙන් නිෂ්පාදනය කරනකොට වැඩිපුර අවශ්‍ය වෙන විදුලිය ගන්න ඩීසල් බලාගාරවලින් හෝ වෙනත් මූලාශ්‍රවලට යන්න වෙන නිසා රටට වෙන හානිය අපි දැක්කා, ඇහුවා. ඒ වාගේම අදාළ මෙහෙයුම් මධ්‍යස්ථානයේ තිබුණු පරිගණක දත්ත අපි පරීක්ෂා කළා. මට ආරංචියි, ඊට පස්සේ කිව්වාය කියලා කාටවත් පෙන්වන්න එපා ය කියලා. එහෙම කාටවත් පෙන්වන්නේ නැති තොරතුරු මේ රජයට තිබෙන්න බැහැ; මේ ආණ්ඩුවේ එහෙම දෙයක් තිබෙන්න පුළුවන්කමක් නැහැ. හැමෝටම ඒවා දැන ගන්න අයිතියක් තිබෙනවා. ඔබතුමාට පුළුවන්කමක් නැහැ, කිසිම තොරතුරක් වසන් කරන්න. අපි නොරොච්චෝලේ බලාගාරයට ගියාට පස්සේ ඔබතුමා ඉංජිනේරුවන්ට නියම කරලා තිබෙනවා, කාත් එක්කවත් මොකුත් කියන්න එපා කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ එහෙම කරුණු සඟවන්න පුළුවන්කමක් නැහැ. මේ රටට ආදරය කරන, බලාගාරයට ආදරය කරන, විදුලි පද්ධතියට ආදරය කරන මිනිස්සු අවංකව කථා කරනවා. ගරු ඇමතිතුමනි, මට එක ප්‍රශ්නයයි අහන්න තිබෙන්නේ. අලුතෙන් හදිසි ගල් අඟුරු මිලදී ගැනීම් නිසා වැඩිපුර වියදම් වන බිලියන ගණනක මුදල ඔබතුමා ගෙදරින් අරගෙන එනවාද? ඔබතුමාගේ ප්‍රතිපත්තිමය වැරදි නිසා, ඔබතුමාගේ තෝරා ගැනීමේ ක්‍රියාවලියේ වැරදි නිසා ඒ වැඩිපුර වියදම් වෙන, මේ හදිසි මිලදී ගැනීම් සඳහා ගල් අඟුරුවලට වියදම් වන මුදල ඔබතුමා ගෙදරින් අරගෙන එනවාද? ඒවාට වග කියන්නේ කවුද? *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමා, අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මට වැඩිපුර වේලාවක් හම්බ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

හොඳයි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ මිනිස්සු දැන ගන්න ඕනෑ තව එකක් තිබෙනවා. මේ රටේ විදුලි බිල වැඩිවීමට බලපාන ප්‍රධාන දෙයක් තමයි, ඩීසල් සහ heavy fuelවලින් විදුලිය නිෂ්පාදනය කරන එක. කාලයක් තිස්සේ අපි උත්සාහ කළා, LNG ලබා ගන්න. LNG සාපේක්ෂව පරිසරයට හිතකරයි. LNGවලින් ක්‍රියාත්මක කරන්න පුළුවන් කෙරවලපිටියේ තිබෙන බලාගාරය විතරක් නොවෙයි, කැලණිතිස්ස බලාගාරයත් LNGවලට හරවන්න පුළුවන් කියලා ඔබතුමාත් දන්නවා; මමත් දන්නවා, ගරු ඇමතිතුමනි. මේ රටේ මේ ක්ෂේත්‍රය ගැන දන්නා මිනිස්සුත් දන්නවා. මේ රටට LNG ඕනෑ. LNG tender කරන්න කියන එකට fight කරලා, fight කරලා මේ ගැන විවිධ ජාත්‍යන්තර බලපෑම්, ඒ වාගේම අපේ රටේ පරමාධිපත්‍යයටත් විවිධ අවස්ථාවල විවිධ ගැටලු මතු වුණා, මේ ටෙන්ඩරය නිසා. එහෙම කරලා බොහොම අමාරුවෙන් අවසානාත්මකව ටෙන්ඩරයක් තීරණය කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ සති අන්ත පුවත්පත්වල පළ වෙනවා, ඔබතුමාගේ අමාත්‍යාංශ ලේකම් කිව්වා කියලා මේ LNG tender එක ඔබතුමා අවලංගු කරන්න යනවාය කියලා. ඔබතුමා LNG tender එක අවලංගු කරන්න යන්නේ ඇයි? මොකක්ද හේතුව? LNG නැතුව තවදුරටත් කෙරවලපිටියේ තිබෙන බලාගාරය දිගටම heavy fuelවලින් දුවන්නද? ඩීසල්වලින් දුවන්නද? ඩීසල් මාෆියාව ඔබතුමා යටත් කරගෙනද?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට අහන්න තිබෙනවා, ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, ඉතිහාසය. මේ LNG tender එකක් ගන්න unsolicited ඉල්ලීම් දිගින් දිගට ආවා. ලෝකයේ බලවත් රාජ්‍යයන් අපිව යට කර ගන්න හැදුවා. අපි ඒවාට ඉඩ දෙන්නේ නැතුව, මෙච්චර අමාරුවෙන් තරගකාරී ටෙන්ඩරයක් ලබා දීලා අවසානාත්මකව ඇගයීම කරලා ඒ සියල්ලම කළාට පස්සේ දේශ ප්‍රේමී කියන, දූෂණ විරෝධී කියන ආණ්ඩුව, කුමාර ජයකොඩි ඇමතිතුමා ඇමතිකම දරන ආණ්ඩුව මොකක්ද මේ කරන්නේ? ඔබතුමා කරුණාකරලා මේ LNG tender එක පිළිබඳ තත්ත්වය පැහැදිලි කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා මගේ නම බොහොම වාරයක් කිව්වා. ඒකට බොහොම ස්තුතියි. මොකද, සාමාන්‍යයෙන් එහෙම හරි කියන එක හොඳයි. කාට හරි නමක් දැම්මාම ඒක නැවත නැවත කියන තරමට හොඳයි නේ, ඒ පුද්ගලයාට. ඒ නිසා මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ අතරේ ඉතින් ඇත්තටම මේක ඇතුළේ නිසාද දන්නේ නැහැ, බොරු ගොඩක් කිව්වා; නමට වැඩිය බොරු ගොඩක් කිව්වා. ඒකයි මම මේ කියන්නේ. මොකද, 2022දී ගල් අඟුරු පිරිවිතරයන් වෙනස් කළේ නැහැයි කිව්වාට 2023දී වෙනස් කළා. අපි නොවෙයි, ඒක වෙනස් කළේ. ඒවායේ ඇත්ත දැනගෙන ඔබතුමා වගකිව යුතු ඇමති ධුරයක් දරපු මන්ත්‍රීවරයකු විධියට බොරු ප්‍රකාශ කරන්න එපා. ඇත්ත ප්‍රකාශ නොකර බොරු විතරක් කියන්න එපා. මොකද, 2023දී තමයි ඒක වෙනස් කරලා තිබෙන්නේ. අපි කිසිම පිරිවිතරයක් වෙනස් කරලාත් නැහැ. මේ දක්වා ටෙන්ඩර් කොන්දේසියක් වෙනස් කරලාත් නැහැ. ඉදිරියේදී වෙනස් වෙන්න පුළුවන්. මේ දක්වා ඔය පැවති ටෙන්ඩරයෙත් වෙනස් වෙලා නැහැ. ඒක නිසා ඒක සම්පූර්ණ සාවද්‍යයි.

ඒ වාගේම පිරිවිතරයන් අඩුවීම සම්බන්ධයෙන් කියන්න ඕනෑ. මොකද, ඒ ගිවිසුම්වල පැහැදිලිවම තිබෙනවා, GCV අගය 5,900ට අඩු වුණාම සහ 5,900 - 6,150යි අතර තිබෙනකොට ගිවිසුම අනුව කටයුතු කරන්නේ කොහොමද කියලා. ඔබතුමා වගකිව යුතු ඇමතිවරයෙක් විධියට කටයුතු කළා නම්, මේවා නොදන්නවා වෙන්න බැහැ. මොකද, අගය 5,900ට අඩු වුණාම ඒකට අදාළ, ඒ අවස්ථා දෙකටම අදාළව formula එකක්, ඒ කියන්නේ වෙනම සූත්‍ර තිබෙනවා. GCV එක විතරක් නොවෙයි. ඇත්තටම මට මතක හැටියට නම්, පිරිවිතරයන් සංඝටක 6ක්; fly ash ද, හැම එකක්ම. ඒ 6ටම අදාළව කොහොමද දඩ මුදල් අය කර ගන්නේ කියලා. මොකද, ඒවා දාලා තිබෙන්නේ මේ කාගේවත් හිතේ අමාරුවටවත්, කාටවත් තරහටවත් නොවෙයි. ඒවා ජාත්‍යන්තර කොන්දේසි විධියටයි මේ ගිවිසුම්වල තිබෙන්නේ. මොකද, ජාත්‍යන්තර වෙළෙඳාමේදී ඇති වන dispute resolutionවලට තමයි ඒවා දාලා තිබෙන්නේ. එහෙම නැතිව තිබුණු ආණ්ඩුවල හෝ අපේ ආණ්ඩුවේ අවශ්‍යතාවක් අනුව හෝ දේශපාලන වුවමනාවකට නොවෙයි ඒවා දාලා තිබෙන්නේ. ඒ අනුව කටයුතු කරන්න අපි බැඳිලා ඉන්නවා. මොකද, කොන්ත්‍රාත්කරුවෙකු හෝ සැපයුම්කරුවෙකු තෝරාගෙන තිබෙන්නේ ඇමතිවරයා හෝ අමාත්‍ය මණ්ඩලය මැදිහත් වෙලා නොවෙයි. ඒකට Tender Boards පත් කර තිබෙනවා. ඉදිරිපත් වන ආයතන අතරින් අවශ්‍ය සුදුසුකම් සපුරපු ඒවා තමයි ගන්නේ. 2023 ඉඳලා 2025 අවසන් වනකල්ම කිසිදු ටෙන්ඩර් පටිපාටියකින් තොරව දූෂිත විධියට කිසිම සුදුසුකමක් නැති ආයතනයකට තමයි මේ ටෙන්ඩරය දීලා තිබුණේ. ඒක, එක අවුරුද්දකවත් සුදුසුකමක් නැති, එක ගල් අඟුරු කැටයක් ලෝකයේ කොහේටවත් විකුණලා නැති, අවුරුදු දෙකක්

විකුණනකොටත් ලංකාවට ඇරෙන්න වෙන කොහේටවත් ගල් අඟුරු විකුණපු නැති, ලංකාවේ හිටපු රෙජිමයේ ළඟම ඥාතීන්ගෙන් සමන්විත කොම්පැනියක්. ඒගොල්ලන් තමයි දූෂිත විධියට ගල් අඟුරු සැපයුවේ. එතකොට ඔබතුමන්ලා කොහේද හිටියේ කියන එක මම දැනගන්න කැමැතියි. අන්තිමට ඒගොල්ලන් ඒ සුදුසුකම් හදාගත්තා. නමුත් අවුරුදු 3ක් ගියාමයි ඒ සුදුසුකම් හැදුණේ. ඒ සුදුසුකම් හදාගෙන තමයි මේ ටෙන්ඩරයට ඉදිරිපත් වුණේ. ඒත් ඒ සමාගමට දිනන්න බැරි වුණා. ඒ හිතේ අමාරුවට සමහර මන්ත්‍රීවරුන් මෙතැන කෑ ගහනවා. පිරිවිතර වෙනස් වනවා නම් ඒ අනුව දඩය අයකර ගැනීමේ හැකියාවක් මේකේ තිබෙනවා.

ගල් අඟුරු shipments 6ක් දැනට ලංකාවට ඇවිල්ලා තිබෙනවා. ඉතුරු ටිකත් මග එනවා. ඒකෙන් පළමුවෙනි සහ තුන්වෙනි එකේ තමයි මේකේ deviation එකක්, ඒ කියන්නේ කිලෝග්‍රෑමයට කිලෝකැලරි 5,900කට වඩා අඩු අගයක් විධියට කැලරි අගය අපට ඇවිල්ලා තිබෙන්නේ. දැන් පස්වෙනි නැවේ ඇති ගල් අඟුරු බාගෙන යනවා. එතකොට ඒවායේ ගොඩබෑම් වරායේ - discharge port එකේ - report එක තවම අපට ලැබිලා නැහැ. අපට දැනගන්න ලැබිලා තිබෙන විධියට පළමුවැනි එකේ සහ තුන්වැනි එකේ මේ අවශ්‍ය මට්ටම නැහැ. අපිත් සැපයුම්කරුට මේ සම්බන්ධව දැනුම් දීලා තිබෙනවා. මොකද, ඒ සැපයුම්කරු දිගින් දිගටම ඒක කරන්න ගියොත් ඒක default කිරීමේ හැකියාව අපට තිබෙනවා. ඒ අවශ්‍යතාව සපුරනකොට කිසිම පැකිළීමක් නැතිව - සැපයුම්කරු කවුද, කාගේ හෝ සම්බන්ධයක් තිබෙනවාද යනාදී ඒවා අපට අදාළ නැහැ - අපි අවශ්‍ය කොන්දේසි අනුව කටයුතු කරනවා.

ඒ වාගේම හදිසි අවස්ථාවක් සඳහා අවශ්‍ය වුණොත් හදිසි ගල් අඟුරු මිලදී ගැනීමකට යන්න කැබිනට් මණ්ඩලයෙන් තීරණයක් අරගෙන, අවශ්‍ය අනුමැතිය අරගෙන තිබෙනවා. ඒක තවම float කරලා නැහැ. ඒක පාඩුවක් වෙන්නේ නැහැ, ගෙනාවත්. ලක්ෂ 3කට තමයි එතැන අපි කැඳවන්නේ. Procurement Commission එකෙන් අවශ්‍ය අවසර ලබා ගැනීම සඳහාත් අපි යොමු කර තිබෙනවා. ඒකෙන් ගෙනාවාත් ඒවා ඉදිරියට පාවිච්චි කරනවා මිසක් මුහුදට දමන්න ගෙනෙනවා නොවෙයි. ඒ නිසා ඔය වාගේ වගකීමක් නැති බොරු කථා කියන්න එපා. මොකද, මේක දියවෙලා යන්නේ නැහැ. ලක්ෂ 3ක් කියන්නේ එක මාසයකටත් මදි. ඇත්තටම යන්තම් එක මාසයක් සම්පූර්ණයෙන් පවත්වාගෙන ගියොත් එක plant එකකට ඇති. ඔබතුමා ඔය වාගේ බොරු සමාජගත කරන්න එපා, මේ ක්ෂේත්‍රයේ, මේ subject එකේ හිටපු ඇමතිවරයෙකු විධියට. සමහරු තමන්ගේ වාසියට බොරු කියනවා. ඒ වාගේම තමන්ගේ companies වෙනුවෙන් කථා කරපු මන්ත්‍රීවරුනුත් හිටියා. ඒ නිසා මම හිතනවා, ඒක අනවශ්‍යයි කියලා.

LNG subject එක ගැනත් මම කියන්නම්. LNGවලට අදාළව ලංකාවට අහිතකර ටෙන්ඩරයක් තිබුණා. ඒක expire වෙලා තිබෙන්නේ. අපි cancel කරලා නොවෙයි. ඒගොල්ලන්ගේ bid validity එක ඉවර වෙලා. ඉතින්, ඒකට අපි මොකද කරන්නේ? අනෙක් එක, ලංකාවේ විදුලි බිල වැඩි වීම. මොකද, FSRU එකක් ලෝකයේ ගන්න බැහැ, මෙගාවොට් 1,500ට වඩා අඩුවෙන්. සාමාන්‍යයෙන් අපේ පරිභෝජනය තිබෙන්නේ මෙගාවොට් 1,000ට අඩුවෙන්. එතකොට අපි මෙගාවොට් 1,500ක් ගත්තොත් සියයට 50ක් වැඩිපුර capacity cost එක හැටියට ගෙවන්න වෙනවා. එතකොට කවුද ඒ වගකීම ගන්නේ? කවුද ඒ cost එක දරන්නේ? කොහොම හරි ඒක අවලංගු වෙලා තිබෙනවා. ඒ සැපයුම්කරුවනුත් දන්නවා, ඒක අවලංගු වෙලා තිබෙනවා කියලා. අපි ඒකට ඉදිරි ක්‍රියාමාර්ග ගන්නවා, හරි විධියට.

බොහොම ස්තුතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හදිසි මිලදී ගැනීමක් කියන්නේ හදිසි වැඩක්. හදිසි වෙච්ච ගමන් ජාත්‍යන්තර වෙළෙඳ පොළේ මිල වැඩි වෙනවා. ඒ වැඩිපුර මිල තමයි රටට පාඩුව. මේ වාගේ විශාල මිලදී ගැනීමකදී ඒ හදිසිය නිසා ගෙවන්න සිද්ධ වන වැඩි මිල බිලියන ගණනක්. ඒක ඇමතිතුමා දන්නේ නැත්නම් මට කරන්න දෙයක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම මම මේකත් කියන්න ඕනෑ. පසුගිය රජයේ අඩුපාඩුකම් තිබුණා. ඒ නිසා තමයි ඔබතුමන්ලා පත් කළේ. පසුගිය රජයේ පැවති අඩුපාඩුකම් වෙනසක් නැතිව ඔබතුමන්ලාත් ඒ විධියටම අරගෙන යනවාද? මොකක්ද කියන්නේ?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද point of Order එක?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බලශක්ති ඇමතිවරයා මතක් කළා, LNG සම්බන්ධයෙන්. එහෙම නම් සොබාදනවි එකට LNG නැතිව ඇයි අත්සන් කර තිබෙන්නේ? *[බාධා කිරීමක්]* එතකොට capacity charge එක ගෙවන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, විවාදයකට යන්න එපා. අද මාතෘකාවට අදාළ විවාදය කරන්න ඉඩ දෙන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දැන් ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා කථා කරනවා නේ. ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත සම්බන්ධව එතුමා ප්‍රකාශයක් කරනවා කිව්වා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.20]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පනත් කෙටුම්පතක පළමුවර කියවීම කර තිබෙනවා. නමුත්, තවම දෙවන වර කියවීමට ගියේ නැහැ. එය පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනතක්. නීතියක් හැදීමේදී ඉතාම හොඳ දෙයක් තමයි, ඒ ගැන සාකච්ඡාවක් නිර්මාණය වන එක. එතකොට නීතිය හොඳ තත්ත්වයට එනවා. නමුත් ඒ සාකච්ඡාව වෙන්නේ දේශපාලනිකව නම්, ද්වේෂ සහගතව නම්, පනත් කෙටුම්පත කියවන්නේ නැතිව නම්, එහෙමත් නැත්නම් Facebook එකේ post එකක් කියවලා නම්, ඊට පස්සේ වෙන්නේ ඒගොල්ලන් මේ පනත් කෙටුම්පත හැදීමට දායක වෙන්නේත් නැතිව, පනත් කෙටුම්පත තේරුම් ගන්නේත් නැතිව අරමුණ විනාශ කරන්න උත්සාහ ගැනීම. මේ පනත් කෙටුම්පතට අද ඒ තත්ත්වය වෙලා තිබෙනවා. මහ හඬින් කෑ ගහලා කියන හැමදේම ඇත්ත නොවෙයි. ගොඩාක් වෙලාවට බොරුවේ තමයි සද්දය වැඩි. ඒක මේ පාර්ලිමේන්තුව තුළත් අපි දැකලා තිබෙනවා. *[බාධා කිරීම්]* දැනටත් ඔබතුමියට ඇහෙනවා නේද, සද්දය. *[බාධා කිරීම්]* අන්න, හේතුව. බලන්නකෝ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බොරු කියනවා කියනකොටත් ෆෝම් වෙනවා කියන්නේ ඉතින් අහක තිබෙන තොප්පිත් ඇදලා අරගෙන දා ගන්නවා කියන එකයි. ඉතින් මට කරන්න දෙයක් නැහැ. *[බාධා කිරීම්]* හරි, හරි. අහක තිබෙන තොප්පිය ඇදලා අරගෙන දා ගත්තා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පනත් කෙටුම්පත පිළිබඳව ප්‍රධාන වශයෙන්ම කියන දේවල් ටිකක් තිබෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත වුණාම ගෙයක් කුලියට දෙන්න වෙන්නේ නැහැ, ගෙවල් අයිතිකරුවන්ට කුලී නිවැසියන්ව එළවා ගන්න -පන්නා ගන්න- හම්බ වෙන්නේ නැහැ, ඒ නිසා කර්මාන්තයක් වශයෙන් ගෙවල් හදලා කුලියට දෙන ආයතන පවා දැන් ඔවුන්ගේ ආයතන හකුළා ගෙන යන්න හදනවා කියලා නොයෙක් කථා නිර්මාණය වනවා. ඒවායේ ඇත්ත-බොරු දන්නේ නැහැ. නමුත් අපි දන්නවා, මේවා අසත්‍ය තොරතුරු බව. අසත්‍ය තොරතුරු කියන එකත් වැරදියි. මොකද, සමහරු නීතිඥයෝ වුණාට අකුරු කියවන්නත් බැරි අය ඉන්නවා නේ. තේරුම් ගන්නේ නැති අයත් ඉන්නවා. හැම නීතිඥවරයාම නොවෙයි, හොඳද? එහෙම අය මේක තේරුම් ගන්නේ නැතිවයි නොයෙක් දේවල් කියන්නේ.

මේ පිළිබඳව මම පැහැදිලි කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මීට කලින් මේ සම්බන්ධව ඉදිරිපත් කළ මතය වැරදියි. මේකෙන් ගෙවල් කුලියට ලබා දෙන අයට කිසි හානියක් වෙන්නේ නැහැ. කර්මාන්තයක් වශයෙන් ගෙවල් හදලා කුලියට ලබා දෙන අයටත් මේකෙන් හානියක් වෙන්නේ නැහැ. තවත් සමහරු මේ නිසා බය වෙලා ඉන්නවා. සමහරු තමන්ට තිබෙන හොඳම ගෙදර කුලියට දීලා ඒකේ ආදායමෙන් පොඩි ගෙදරක ජීවත් වෙනවා. ඒගොල්ලනුත් බය වෙලා තිබෙනවා. ඒ, ඇයි? "බුදු අම්මෝ! කුලී නිවැසියෝ එළවා ගැනීම තහනම් කරන නීතියක් ගෙනාවා" කියලා. මේ, අමූලික බොරු. එහෙම නම් අපි බලමු, මේකේ පරමාර්ථය මොකක්ද කියලා.

මම උදාහරණයක් ගෙන එය පැහැදිලි කරන්නම්. මට අයිති ගෙයක් මම මහින්ද ජයසිංහ සහෝදරයාට කුලියට දෙනවා. අවුරුදු දෙකකටයි කුලියට දෙන්නේ. අවුරුදු දෙක ඉවර වුණාට පස්සේ මෙතුමා ඒ ගෙදරින් ගියේ නැත්නම් ඒක නීති විරෝධීයි. එතකොට මට මෙතුමාව යවන්න පුළුවන් ද, බැරිද? අනිවාර්යයෙන්ම යවන්න පුළුවන්. මොකද, මේ පනත එතුමාට අදාළ වෙන්නේ නැහැ, එතුමා නීති විරෝධීව ඉන්න නිසා. ඒ, එක. දෙවැනි කාරණය මොකක්ද? මහින්ද ජයසිංහ සහෝදරයා අවුරුදු දෙකකට ගෙය කුලියට ගත්තාට මට වුවමනාවක් තිබෙනවා, මෙතුමාව අවුරුද්දෙන් ගෙදරින් යවන්න. අවුරුද්දෙන් යවන්න ඕනෑ නිසා මම මොකද කරන්නේ? ඒත් මට ප්‍රතිපාදනයක් තිබෙනවා. ඒ ප්‍රතිපාදනය තමයි, කොන්ත්‍රාත්තුව අනුව ඒ මාස දෙක දැනුම් දීලා නීත්‍යනුකූලව ඔහුව ඉවත් කරන්න මට පුළුවන්. ඒකත් කරන්න පුළුවන්. ඇයි? ඕනෑම කොන්ත්‍රාත්තුවක තිබෙනවා, මාස දෙකක කාලය දැනුම් දුන්නාම අයින් වෙන්න ඕනෑ කියලා. එහෙම දැනුම් දීලා අයින් වුණේ නැත්නම්, ඒකත් නීති විරෝධීයි. ඒ නිසා, ඒ කුලී නිවැසියාට මේ පනතෙන් ආරක්ෂාව ලැබෙන්නේ නැහැ. එහෙම නම්, අපි මේ පනත කාටද ගෙනාවේ? මම ඒක පැහැදිලිව කියන්නම්.

අකුරු කියවන්න පුළුවන් අය - පහ වසර පාස් අය - කියවන්න ඕනෑ, මෙහි 2, 3 සහ 4 වගන්ති විතරයි. වෙන මොකුත් කියවන්න ඕනෑ නැහැ, මේ පොඩි පනතක්. ඒකේ කියනවා, යම් අවස්ථා පිළිබඳව. අධිකරණ නියෝගයක් නැතිව නීති විරෝධී ලෙස පදිංචිකරුවෙකු ගෙදරින් පන්නා ගන්න ඕනෑ වුණාම හදිසියේ මොකද කරන්නේ? ලයිට් කපනවා, වතුර කපනවා, යන්න තිබෙන පොදු පහසුකමකට හානි කරනවා. අන්න ඒ වාගේ අවස්ථාවක ඒ කුලී නිවැසියා නීතියක් මඟින් ආරක්ෂා කර ගත යුතු නැද්ද? කර ගත යුතුයි. මොකද, ඔහු වින්දිතයා වන නිසා. ඒක නිසා මේක අදාළ වෙන්නේ කාටද? මේක අදාළ වෙන්නේ, for those landlords who are acting highhandedly above the law.

මේ පනත් කෙටුම්පත බලන්න. මෙහි වගන්ති 3, 4, 5හි මොකක්ද කියන්නේ? මේ සමහර අවස්ථාවල ලයිට් කපනවා, වතුර කපනවා, වහල කැඩුණාට පස්සේ ඒ වහල හදන්න අවසර දෙන්නේ නැහැ. හැබැයි, ඒ ඔක්කෝම කරන්නේ අනීතික ලෙස. මොකද, කුලී නිවැසියා පැන්නීමේ අරමුණින්. ඒ කියන්නේ, ගේ විකිණීම හෝ වෙනත් මොකක් හෝ හේතුවක් මත. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ දේ නවත්වන්න ගෙනාපු නීතිය තමයි, මේ නීතිය. ඔබ සියලුදෙනාට මම කියනවා, ඔබ ගෙවල් කුලියට දෙන්න හිතාගෙන ඉන්නවාද, අනිවාර්යයෙන් දෙන්න කියලා. කර්මාන්තයක් වශයෙන් ඔබ ගෙවල් හදලා කුලියට දෙනවාද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

අවසානයේ දී කථා කරමු, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. කරුණාකරලා පොඩ්ඩක් මට කථා කරන්න ඉඩ දෙන්න. අවසානයේදී මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

මම කර්මාන්තකරුවන්ට කියනවා, ගෙවල් හදලා කුලියට දෙන්න කියලා. ඒකට මේ පනතින් බාධාවක් නැහැ. මේ පනත තිබෙන්නේ නීත්‍යනුකූලව පදිංචි වෙලා ඉන්න අයට ත්‍රාඩ විධියට, චණ්ඩි විධියට හිරිහැර කරන එක නවත්වන්න. ඒක හොඳ අරමුණක්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒක නිසා,

අපි මුහුණු පොතේ පළ වන ඒවාට උත්තර දෙන්නේ ඒ ආකාරයටයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේක හොර රහසේ ගෙනෙන්න හදපු පනත් කෙටුම්පතක්ද? උත්තරය, නැත. ඇයි, ඒ? 2025 සැප්තැම්බර් 18වැනි දා අපි ඒ පනත් කෙටුම්පත ගැසට් කළා. මහ ජනතාවට ඒක බලන්න පුළුවන්. ඇයි, අපි ඒ පනත් කෙටුම්පත ගැසට් කළේ? මොනවා හරි සංශෝධනයක් කරන්න ඕනෑ නම් ඒ සංශෝධන ගෙනෙන්න. ඒකටයි ඒ පනත් කෙටුම්පත ගැසට් කළේ. කවුරුවත් ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාද, මේ පනත් කෙටුම්පත වැරැදියි කියලා? උත්තරය, නැත. අපි අනෙක් ආණ්ඩු වාගේ නොවෙයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි,-

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
සමාවෙන්න, මට මේ කාරණය කියන්න දෙන්න, ගරු මන්ත්‍රීතුමනි. මගේ කථාව අවසානයේදී ඔබතුමා ඒ ගැන අහන්න.

මොකද, මම දන්නා තරමින් ඒ කාලය තුළ Supreme Court එකට කවුරුවත් ගියේ නැහැ. හැබැයි, එතැනින් අපි නැවතුණාද? වෙන ආණ්ඩු කරන්නේ නැති දෙයක් අපි කරනවා. මොකද, අපි ජනතාවට ආදරයෙන් ආණ්ඩු කරන මිනිස්සු නේ. අපට ඕනෑ, ජනතා සහභාගිත්වයෙන් ආණ්ඩුව හදන්නයි. ඒ නිසා මම මොකක්ද කළේ? අපේ අමාත්‍යාංශය විසින් 2025 නොවැම්බර් 04වැනි දා සිට 2026 ජනවාරි 15වැනි දා දක්වා භාෂා තුනෙන්ම, පත්තර තුනක advertisements දාලා, අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියට මේ පනත් කෙටුම්පත upload කළා. ඇයි, ඒ? අලුත් අදහස් ගෙනෙන්න, වෙනස් කරන්න ඕනෑ තැන් කියන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. මොකද, ඒකට තමයි අපි ඒ දේ කළේ. ඒ කාලය තුළ ආවේ ලිපි තුනයි. ඒ ලිපි තුනේ තිබුණේත් මේ පනත් කෙටුම්පත පුළුවන් තරම් ඉක්මනට ගෙනෙන්න කියායි.

හැබැයි, මම මේ කාරණය කියන්න ඕනෑ. 2025 ඔක්තෝබර් 27වැනි දා නීතිඥ සංගමයට ලියුමකින් භාර දුන්නා, මෙන්න අලුත් පනත් කෙටුම්පතක් ගෙනෙනවා, ඔබගේ සංගමයේ අදහස් ඉදිරිපත් කරන්න කියලා. නමුත්, ඒකටවත් ඒ කාලය තුළ ප්‍රතිචාරයක් ආවේ නැහැ. හැබැයි, නීතිඥ සංගමයට මම ගරු කරනවා. පමා වීම සම්බන්ධව ඔවුන් මගෙන් සමාව ඉල්ලා තිබුණා. නමුත්, දෙසැම්බර් මාසයේ 30වැනි දා - දැනට දවස් දෙකකට කලින් වාගේ - ඔවුන් ලිඛිතව ඔවුන්ගේ තිබෙන අලුත් සංශෝධන ගෙනෙන්න අදහස් වගයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක සාධනීයයි. මම ඔවුන්ට කිව්වා, අනිවාර්යයෙන්ම ඒ ගැන සලකා බලනවා කියලා. එහෙම නම් වගකිව යුතු ආණ්ඩුවක් වශයෙන් දැන් අපි මොකක්ද කරන්න ඕනෑ? උද්ධච්චකමට මේක bulldoze කරගෙන යනවාද? නැහැ. මගේ නීති ලේකම් යටතේ නැවත කමිටුව කැඳෙව්වා, නීති සංගමයෙන් ආපු යෝජනා ටික බලන්න. ඊට අමතරව අද සිට තව මාසයක් දක්වා කාලය දීර්ඝ කරනවා. මොකක්ද අපි මේ කරන්න උත්සාහ කරන්නේ? රටේ ජනතාවට ආරක්ෂා වෙන්න පුළුවන් හොඳම නීතිය ගෙනෙන්න. කාටවත් කොළේ වහලා ගහන්න නීති ගෙනෙන්න අපි ආණ්ඩු කරන්න ආවේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මෙය අවසානාත්මක නැහැ කියන එක මම කියනවා. මොකද, මේ පනත් කෙටුම්පත දෙවන වර කියවීමට ගන්නේ මේ සියලුම යෝජනා සහ අදහස් ටික සලකා බලා ඒ සාධනීය වෙනස්කම් කරලා. ඒකට තමයි අපි මේ දැන්වීම් පත්තරේ දැම්මේ. නමුත්, බුදියාගෙන හිටපු සෙට් දැන් නැඟිටලා ඉන්නවා. ඒකට කමක් නැහැ. ආණ්ඩුවේ පත්තර වැඩිය කවුරුවත් කියවන්නේ නැති case එක තමයි මේ තිබෙන්නේ. මම හිතන විධියට එහෙම මොකක් හරි වෙලා ඇති. ඒ නිසා අපට සිදු වෙනවා, ඉදිරියේදී මිනිස්සු බලන මාධ්‍ය හරහා ඒවා පළ කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ පනත් කෙටුම්පත, 2023 පනතත් සමඟ ගැටෙන තැන් තිබෙනවා වාගේම තාක්ෂණික ගැටලු තිබෙන බවට සමහර යෝජනා ඇවිල්ලා තිබෙනවා. ඒවා සාධනීයයි. මම සියලු දෙනාගෙන් මේ කාරණය ඉල්ලා සිටිනවා. පක්ෂ, විපක්ෂ භේදයක් අවශ්‍ය නැහැ. මේ නීතිය develop කරන්න, වෙනස් කරන්න අපි සියලුදෙනාටම අවස්ථාවක් දීලා තිබෙනවා. ඒ අවස්ථාව ලබා ගන්න. Facebook එකේ ලියන එකට අමතරව, මෙතැන කරන ප්‍රකාශවලට අමතරව ඒ අවස්ථාව ප්‍රයෝජනයට ගන්න. අපේ අමාත්‍යාංශයේ මම වාගේම මගේ කණ්ඩායම ඉන්නවා, මේ යෝජනා ටික ගන්න. ඒක නිසා මම ජනතාවට කියන්නේ කිසිදු බොරු බියක් අසත්‍ය තොරතුරු මත ඇති කර ගන්න එපා කියලායි. මේක තවම පනතක් වෙලා නැහැ. මාසයක පමණ කාලයක් ලැබෙනවා, අදහස් හා යෝජනා ගෙනෙන්න. ඒ අදහස් හා යෝජනා ගෙනෙන්න. අපි ඒවා ගැන සලකා බලමු.

පනත දැනට තිබෙන විධියෙන් ගත්තත් ඔබට ඕනෑම ගෙයක් කුලියට දෙන්න පුළුවන්. නීතිය අනුව ඔවුන් එළවන්න පුළුවන්. මේ පනත් කෙටුම්පතින් තහනම් කරලා තිබෙන එකම දේ තමයි, ඒ මනුස්සයාගේ ගෙදර ලයිට් කපලා, වතුර කපලා, හිරිහැර කරලා, වෙන කෙනෙක්ව දාලා හෝ හිරිහැර කරලා, තග දාලා පන්නන එක. අධිකරණ නියෝගයක් නැතුව අනීතික ලෙස පන්නන එක සම්බන්ධයෙන් විතරයි මේ නීතිය බලපාන්නේ. ඒකේත් යම් අඩුපාඩුවක් තිබෙනවා නම් අපි ඒකත් හදා ගනිමු. අපි නිහතමානියි. අපි ඒක වෙනස් කරමු.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. තත්පර 30කින් අවසන් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, මට මේ කාරණයට පොඩි උත්තරයක් දෙන්න. ගෙයක කුලියට ඉන්න පුද්ගලයෙකුට මේ පනත යටතේ ගෙවල් කුලී ගෙවන්නේ නැතුව කිසිම ප්‍රශ්නයක් නැතුව ඉන්න

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

පුළුවන්. ඔය පනත අනුව මාස නවයකට පස්සේ නඩු අහලා ඉවර කරන්න කියලා දාලා තිබෙන්නේ. ඔබතුමා දන්නවා, ගෙවල් කුලී පනත තිබෙන බව. ඒ වාගේම 2023 අංක 1 දරන බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබා ගැනීමේ පනත තිබෙනවා. ඒ පනතට සංශෝධනයක් ඉදිරිපත් කළා නම් ඔය ප්‍රශ්නය විසඳෙනවා. ඔබතුමන්ලා දැන් කරන්න හදන්නේ ගෙවල්වල කුලියට ඉන්න පුද්ගලයා රැකීමයි. ඔහුට ඕනෑ තරම් අවස්ථා තිබෙනවා, නඩුවක් දාලා තමන්ට සිදු වූ අසාධාරණයක් සම්බන්ධයෙන් සාධාරණයක් ලබා ගන්න. ඔබතුමා නීතිඥයෙකු හැටියට ඒ ගැන දන්නවා නේ.

මේ පනතින් වෙන්නේ මේකයි. මේ රටේ ඉන්න ලක්ෂ ගාණක් සාමාන්‍ය මිනිස්සු තමන්ගේ දේපළ විශාල ප්‍රමාණයක් කුලියට දීලා තිබෙනවා. ඔබතුමා දේපළ අයිති මිනිහාව පැත්තකට විසි කරලා කුලීකරුවෝ රකිනවා. මේක සාධාරණද කියායි අපි අහන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ ප්‍රකාශය කිරීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මට මේ සම්බන්ධයෙන් අහන්න අවශ්‍ය වන්නේ මෙය 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතට යටත්ව ලැබුණු ගෙයකට විතරද බලපාන්නේ කියන එකයි. ඔබතුමා කිව්වා, කවුරුවත් මේ සම්බන්ධයෙන් උසාවි ගිහිල්ලා නැහැ කියලා. දැනට Prime Lands, Blue Ocean, Home Lands වාගේ companies 9ක් සහ පන්සල් ගණනාවක් උසාවි ගිහිල්ලා තිබෙනවාය කියලා චාමර සම්පත් මන්ත්‍රීතුමා මාව දැනුවත් කළා. මේක බලපාන්නේ කාටද කියන එක පිළිබඳව මේ අවස්ථාවේදී දැනුවත් කරන්න, ගරු ඇමතිතුමනි. මේක විතරයි ආයෝජකයින්ට දැනට තිබෙන්නේ. ඒකත් නැති වුණොත් ඔවුන්ගේ විශ්වාසය සම්පූර්ණයෙන් කඩා වැටේවි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දිගටම අවස්ථාව දෙන්න විධියක් නැහැ. මොකද, දිවා ආහාර විවේකය සඳහා දැන් සභාවේ කටයුතු නතර කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* තත්පර 30කින් අවසන් කරන්න, චාමර සම්පත් මන්ත්‍රීතුමනි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අධිකරණ ඇමතිතුමනි, හොඳ හෝ නරක හෝ සුබවාදීව හෝ අසුබවාදීව මේ පනත් කෙටුම්පත ඔබතුමා ගෙනාපු එක ඇත්ත. හැබැයි, "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව ඔයගොල්ලන් දීපු රුපියල් 25,000න් බදුල්ල නගරයේ කුලියට ගත් ගෙවල්වලිනුත් ඒ මිනිස්සුන්ව එළියට දමනවා, මේ පනත් කෙටුම්පත ගෙනෙන්න කලින්. ඒකයි වෙලා තිබෙන්නේ. ඔයගොල්ලන් කරන හැම දෙයක්ම හොඳ නැහැ. පසුපසට ගන්න ඕනෑ ඒවා ආපස්සට ගන්න කියන එකයි අපි කියන්නේ. ඒක තමයි ඇත්ත කථාව.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, විනාඩියකින් අවසන් කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මම තත්පර 30යි ගන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මගෙන් ප්‍රශ්නයක් ඇහුවා.

මම හිතන්නේ නැහැ, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා පනත් කෙටුම්පත කියවා තිබෙනවාය කියලා. එතුමා පනත් කෙටුම්පත කියවලා තිබුණත් ඒක තේරුම් අරගෙන තිබෙනවා කියාත් මම හිතන්නේ නැහැ. *[බාධා කිරීම්]* එම නිසා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මගෙන් උත්තරයක් නැත. මොකද, පනත් කෙටුම්පත කියවා තේරුම් ගන්න බැරි මනුස්සයෙකුට උත්තරයක් දීලා වැඩක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පනත් කෙටුම්පත කියවලා තිබෙන්නේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කරුණු අනුව මට තවම දැනගන්න ලැබිලා නැහැ, FR cases දාලා තිබෙනවාද කියලා. මම ඒ ගැන හොයා බලන්නම්. අවසාන වශයෙන් මම ඔබතුමාට කාරණයක් කියන්න ඕනෑ. ඔබතුමා අනෙක් අයට වඩා ඒ ගැන පැහැදිලිව දන්නවා. අපි මේක පනතක් බවට පත් කරන්නේ consultation process එකෙන් පසුවයි. එම නිසා මම ඔබතුමා කිව්ව කාරණය ගැන හොයලා කියන්නම්.

චාමර සම්පත් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ සහෝදරත්වයට සහ ආදරයට බොහොම ස්තුතියි. නමුත්, ඔබතුමාටත් මේ කාරණය තේරෙන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනු ලැබේ.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මුලින්ම මේ ආණ්ඩුව ගැනත් කාරණයක් කියන්න ඕනෑ. අපි දන්නවා නේ, අසූචි ගොඩවල්වලට පයින් ගැහුවාම මැස්සෝ වහන බව. දැන් බලන්න, මේ නියෝජ්‍ය මහ ලේකම් අයින් කිරීම ගැන.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

විධියක් තිබෙනවා. එතැනට නිලධාරීන් යනවා නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නිලධාරීන්ට ඒවා බලාගෙන ඉන්න බැහැ නේ. ඒ ප්‍රශ්න මෙතැනට ගෙනැල්ලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඕනෑ තැන් තිබෙනවා. එහෙම කරන්නේ නැතිව මේවා මෙතැනට ගෙනැල්ලා නිලධාරියෙක්ව නිකම් යවලා. ලොකු ප්‍රශ්නයක් නේ, මේක. මේවා වෙන්න ඕනෑ ප්‍රශ්න නොවෙයි. ඒක එකක්.

ඊළඟ ප්‍රශ්නය ගෙවල් කුලී පනත පිළිබඳ කාරණය. මේ පනත ගෙනාවොත්, ලොකු ප්‍රශ්නයක් වෙනවා. මොකද, "දිට්වා" සුළි කුණාටුව නිසා ආපදාවට ලක් වූ බදුල්ල දිස්ත්‍රික්කයේ -මම ඉන්න දිස්ත්‍රික්කයේ- ජනතාව විශාල පිරිසක් ගෙවල් කුලියට අරගෙන තිබෙනවා, ආණ්ඩුවෙන් දීපු රුපියල් 25,000න්. ආණ්ඩුව රුපියල් 25,000ක් දුන්නා. හැබැයි, මිනිස්සු බය වෙනවා, මෙහෙම පනත් ගෙනාවාම. අපේ අධිකරණ ඇමතිතුමා කිව්වා, "මෙහෙම වෙන්නේ නැහැ, අරෙහෙම වෙන්නේ නැහැ" කියලා. එහෙම නම් ඕවා ජනතාව අතරට ගිහිල්ලා කියලා ඒ පනත් ගේන්න ඕනෑ. මේ වෙනකොට අපේ රටේ කුලී ගෙවල්වල ඉන්න ගොඩක් අය බය වෙලා තිබෙනවා. දැන් කුලියට ඉන්න මිනිස්සු එළියට දමනවා. එහෙම ප්‍රශ්නයක් ආණ්ඩුව හදලා තිබෙනවා.

ඊළඟට මේ වෙලාවේ මම කියන්න ඕනෑ හිටපු ජනාධිපති ලේකම්, සමන් ඒකනායක පිළිබඳව. සමන් ඒකනායක කියන්නේ මේ රටේ හිටපු ජනාධිපති ලේකම්වරයෙක්. අපිත් ජනාධිපතිවරු යටතේ හිටියා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපේ ජනාධිපතිවරු ළඟ හිටපු ලේකම්ලා වාගේ නොවෙයි, සමන් ඒකනායක කියන්නේ ගෞරවාන්විත ලේකම් කෙනෙක්. එතුමාගේ නඩුව කැඳවපු වෙලාවේ නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් කියනවා "දූෂිතයෙක්, වංචාකාරයෙක්" කියලා. විභාග වෙන නඩුවකදී මිනිසුන්ට "දූෂිතයෝ" කියලා චෝදනා කරන්න නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් කෙනෙකුට අයිතියක් නැහැ. මේ, රජයේ නීතිඥයා. මෙයා ඇවිල්ලා "දූෂිතයෝ, හොරු, මංකොල්ලකාරයෝ" කියලා කියනවා.

ඊළඟට දිලීප පීරිස් කියනවා, "තව මාසයකින් මේ නඩුව පවරනවා, ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ලක් යටතේ" කියලා. ඔහු කොහොමද එහෙම කියන්නේ? ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ලක් පත් කරන්න පුළුවන් වෙන්නේ අග්‍ර විනිශ්චයකාරතුමාටයි. අග්‍ර විනිශ්චයකාරතුමාගේ ඒවාත් මොහුගේ අතට අරගෙන. නීතිපතිගේ ඒවාත් දිලීප පීරිස් අරගෙන. දිලීප පීරිස් කියන්නේ කවුද කියලා අපි දන්නවා. දිලීප පීරිස්, හිටපු පොලිස්පති තෙන්නකෝන් එක්ක රට බීලා, කාලා කරට අත දාගෙන ඉන්නේ. දිලීප පීරිසුයි, තෙන්නකෝනුයි රට කරන්න තිබුණු ජරා වැඩ කරලා තෙන්නකෝන්ගේ වාහනයේ ගිහින් දිලීප පීරිස්ව ගෙදරට බස්සනවා, දිලීප පීරිස්ගේ වාහනයේ ගිහින් තෙන්නකෝන්ව බස්සනවා. අන්තිමේදී තෙන්නකෝන්ට වැඩේ වැරදුණාට පස්සේ දිලීප පීරිස් ගිහිල්ලා මාතර උසාවියේදී කිව්වා, "තෙන්නකෝන් උසාවියට වාහනයෙන් ආවා" කියලා. ඒ වාගේ, කිසිම ගරුත්වයක් නැති, චාරයක් නැති දේවල් තමයි කරන්නේ. එයා නීතිපති දෙපාර්තමේන්තුවේ මොන තනතුර දැරුවත් අපට කමක් නැහැ. නීතිපති දෙපාර්තමේන්තුව අල්ලාගෙන මෙහෙම අය තමයි මේ ආණ්ඩුව ගේන්න හිතාගෙන ඉන්නේ. අපි බලාගමු, ඒ ගොල්ලන් ගැනත්. ඒගොල්ලන්ට හැම දාම ඔය තනතුරුවල ඉන්න බැහැ. ඔහු හිතාගෙන ඉන්නවා ඇති, ආණ්ඩුව අල්ලාගෙන නීතිපති තනතුරට පනින්න. එහෙම බලපෑම් කරලා මේ රට ගෙනියන්න බැහැ කියන එක මේ වෙලාවේ කියන්න ඕනෑ.

මට ප්‍රශ්න ගොඩක් ඇවිත් තිබෙනවා, අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. දැන් මේ DMT එකේ කොමසාරිස් ජනරාල්වරයාගේ කාලය පෙබරවාරි 26වැනි දා සිට මාසය හයකට දීර්ඝ කරලා තිබෙනවා. මෙයා කුරුණෑගල කෙනෙක්. මෙයාට වාහන අංක රඳවා තබා ගැනීම නිසා රජයට ලක්ෂ 97ක පාඩුවක් සිදුකර ඇති බවට Auditor-General විගණන විමසුමක් නිකුත් කර තිබෙනවා. මේ වෙනකොට එයාට සේවා කාලය දීර්ඝ කර දීලා තිබෙනවා. මේ, DMT එකේ ලොක්කන්ට. මේ වාගේ ඒවා තමයි මේ ආණ්ඩුව කරන්නේ.

ඊළඟ කාරණය මේකයි. ආනයන හා අපනයන පාලක ජනරාල්තුමියගේ - Controller General of Imports and Exports' - අවසරය අරගෙන ත්‍රිපෝෂ නිෂ්පාදනයට අවශ්‍ය බඩඉරිඟු මෙට්‍රික්ටොන් 2,025ක් ලංකාවට ගෙනැල්ලා තිබෙනවා. අනුමැතිය දීලා, permit එක දීලා දැන් මේ ටික ලංකාවට ඇවිල්ලා තිබෙනවා. දැන් ඇමතිවරු දෙදෙනෙකුගේ ප්‍රශ්නයක් තිබෙනවා. දෙදෙනෙක්ද, තුන්දෙනෙක්ද දන්නේ නැහැ. ආහාර සම්බන්ධ ඇමතිතුමා කියනවා මේකේ ප්‍රශ්නයක් නැහැ කියලා. ඒ වාගේම මාධ්‍ය ප්‍රකාශක කියනවා ප්‍රශ්නයක් නැහැ කියලා. නමුත් මේ ටික release කරන්නේ නැහැ. මේ මනුස්සයා කෝටි ගණනක් දීලා ත්‍රිපෝෂ සඳහා බඩඉරිඟු ලංකාවට ගෙනැල්ලා. දැන් ඒවා වරායේ හිර වෙලා. මේවා මොන පදනමක් මත කරනවාද කියලා අපි දන්නේ නැහැ. ඒ මනුස්සයාට දැන් කෝටි ගණනක් පාඩු වෙලා තිබෙනවා. ඒවා වරායේ හිර වෙලා තිබෙනවා. මේවා සම්බන්ධව මේ ආණ්ඩුව මොන විධියට කටයුතු කරනවාද, මේවායෙන් මොනවා හෝ බලාපොරොත්තු වෙනවාද කියලා අපි දන්නේ නැහැ. එහෙම බලාපොරොත්තු වෙනවා නම් එක්කෝ ඒ මනුස්සයාට කියන්න ඕනෑ. ඒවා වරායේ හිර වෙලා තිබෙනවා.

ඊළඟ කාරණය මේකයි. රට තුළ වැඩ කරන්න හැම දේම අවශ්‍යයි. සිමෙන්ති අවශ්‍යයි; වැලි අවශ්‍යයි; ගල් අවශ්‍යයි. මේ දවස්වල ගල් වළවල්වල වැඩ කරන්න බැහැ. Electric blasting caps නැහැ. අවුරුදු 2ක් තිස්සේ electric blasting cap ගෙන්වා නැහැ. Electric blasting cap නැතුව ගල් වළවල් කොහොමවත්

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

පවත්වා ගෙන යන්න බැහැ. එතකොට අවශ්‍ය ගල් නැති වෙනවා. එහෙම වුණාම පාරවල් හදන්න බැරි වෙනවා. මේ වාගේ ප්‍රශ්න ගොඩාක් තිබෙනවා.

ඊළඟ කාරණය තමයි පෞද්ගලික අංශයේ සේවකයන් විශ්‍රාම යාම පිළිබඳ කාරණය. ඔයගොල්ලන් Budget එකකදී කිව්වා, පෞද්ගලික අංශයේ අවම වැටුප රුපියල් 17,000 සිට 27,000 දක්වා වැඩි කරනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා එහෙම කිව්වාට, පෞද්ගලික අංශයේ සමහර ආයතන තව වෙනතුරු එසේ වැටුප් වැඩි කර දීලා නැහැ.

ඊළඟ කාරණය මේකයි. ප්‍රජාතන්ත්‍රවාදී විධියට කටයුතු කරනකොට, පරාජය පිළිගන්න ඕනෑ; ඒකට මුහුණ දෙන්න ඕනෑ. අපි ජනාධිපතිවරණය පැරදුණා. ඊළඟට, පාර්ලිමේන්තු මැතිවරණය පැරදුණා. ඒ වාගේ ඔයගොල්ලොත් පරාජය පිළිගන්න. මාතර දිස්ත්‍රික්කයේ කොටපොළ, බෙරලපනාතර, හක්මන සමුපකාර ඡන්ද පැවතුණා. දික්වැල්ලේත් පැවතුණා. ඒක නම් ඊයේ පෙරේදා නේ තිබ්බේ. කොටපොළ, බෙරලපනාතර, හක්මන සමුපකාර ඡන්ද තිබ්බා. නමුත් මේගොල්ලන් මහ සභාව තියන්න දෙන්නේ නැහැ. දකුණු පළාතේ සමුපකාර කොමසාරිස් බලය පාවිච්චි කරගෙන ඉන්නවා, පරාජය පිළිගන්නේ නැතුව. හැබැයි, පැරදුණා නම්, පරාජය භාර ගෙන ඒ සමුපකාරය දිනපු පැත්තට භාර දෙන්න. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ.

මේ රටේ කවදාවත් වෙච්ච නැති දේවල් සිදු වෙන්නේ. කොයි ආණ්ඩුව තිබුණත්, කොයි ජනාධිපති හිටියත් බාලදක්ෂ කොමසාරිස් විධියට පත් වුණේ ස්වාධීන මනුස්සයෙක්. හිටපු බාලදක්ෂ කොමසාරිස්ව එළවා ඒ වෙනුවටත් ජනාධිපතිතුමා වෙන කෙනෙක් පත් කරලා. මේවා ගැන ලජ්ජයි. මෙහෙම වැඩ කරන්න එපා. බලන්න, අද අර සංවර්ධන නිලධාරින් 16,000ක් එළියට බැහැලා. සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා අධ්‍යාපන ඇමතිවරයා හැටියට සිටියදී සංවර්ධන නිලධාරින් සම්බන්ධයෙන් නඩුවක් තිබුණා. දෙපැත්ත එක්කම කථා කරලා එම ප්‍රශ්නය ලස්සනට විසඳා ගෙන ආවා. හැබැයි, මේ ආණ්ඩුව ආවාට පසුව ඒ මිනිස්සු මාරාන්තික උපවාසවලට එළියට බැහැලා තිබෙන්නේ. ඔයගොල්ලන් හිතාගෙන ඉන්නවා නම්, මේ ආණ්ඩුව ඉන්න නිසා මිනිස්සු දැන් බය නැහැ කියලා, එහෙම නැහැ. දැන් සංවර්ධන නිලධාරින් 16,000ක් එළියට බැහැලා. ඊට පසුව රැකියා විරහිත උපාධිධාරීන් එළියට බහිනවා. ඊළඟට, තැපැල් සේවයේ අය බහිනවා. ඊළඟට, සෞඛ්‍ය අංශයේ අය බහිනවා. මේ වාගේ ප්‍රශ්න ගොඩාක් තිබෙනවා.

ඒ වාගේම දුම්රිය සේවය ගැනත් කිව යුතුයි. දැන් "දිව්වා" ඉවරයි. නමුත් ඒකෙන් උඩරට දුම්රිය ගමනට නම් ප්‍රශ්න මතු වුණා, ඒනිසා උඩරට දුම්රිය දුවන්න බැහැ කියලා අපි කියමුකෝ. නමුත් අද වනවිට ලංකාවේ අනෙක් පැතිවලත් සමහර දුම්රිය ධාවනය වන්නේ නැහැ. අනුරාධපුරයට යන දුම්රිය යන්නේත් මහවට. ඒ වාගේ ගොඩාක් ප්‍රශ්න තිබෙනවා.

ඊළඟට සෙවනගල සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලා සම්බන්ධවත් ප්‍රශ්න තිබෙනවා. මේවා කොයි ආණ්ඩුවෙන් හැදුවත්, මේවා ගැන බලන්න අවශ්‍යයි. අද සෙවනගල ගන්න දෙයක් නැහැ. උක් ගොවීන් ඉවරයි. උක් ගොවීන් අනාථයි. ජනාධිපතිතුමාට හරි මම කියන්නේ මේවා ගැන කල්පනාවෙන් බලන්න කියලායි. සෙවනගල සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලා වැහුණොත්, ඔයගොල්ලන්ගේ ආණ්ඩුවට හොඳ නැහැ. ඒ මිනිස්සු අද දුක් විඳිනවා. උක් ගොවීන් දුක් විඳිනවා. ඒ වාගේම කර්මාන්තශාලා ඉවරයි. කර්මාන්තශාලා පවත්වාගෙන යන්න බැහැ. දැන් සීනි නැහැ. උක් අඹරන්නේ නැහැ. ඒ වාගේ ලොකු ප්‍රශ්න තිබෙනවා. ඒවා ගැන බලන්න. ඒ පළාතේ මන්ත්‍රීවරුන් ගෙන්වා හොයා බලන්න. ඔයගොල්ලන්ගේ මන්ත්‍රීවරුන් ගෙන්වා අහන්න, සෙවනගලට වෙලා තිබෙන්නේ මොකක්ද, පැල්වත්තට වෙලා තිබෙන්නේ මොකක්ද, ඇතිමලේ සීනි කර්මාන්තශාලාවට වෙලා තිබෙන්නේ මොකක්ද කියලා. සීනි කර්මාන්තය ඉවරයි. කර්මාන්ත අමාත්‍යාංශයේ ඇමතිතුමාට කරන්න බැරි නම්, කියන්න. දුඹුරු සීනි කඩයක් දැම්මා. නමුත් ඒ දුඹුරු සීනි කඩේ වැහුවා. මාසයයි දුඹුරු සීනි කඩේ තිබුණේ. "දුඹුරු සීනි ඇමති" කියලාත් කිව්වා. දුඹුරු සීනි කඩේ දැන් කෝ? දැන් දුඹුරු සීනිත් නැහැ, සුදු සීනිත් නැහැ, කළු සීනිත් නැහැ, කඩේත් නැහැ. ඒ වාගේ ප්‍රශ්න ගොඩාක් තිබෙනවා.

ඊළඟ ප්‍රශ්නය මේකයි. මහජන බැංකුවට security guardsලා දමා තිබෙනවා. පෞද්ගලික අංශයේ සේවකයන්ට අවම මාසික වැටුප 17,000 සිට 27,000 දක්වා වැඩි කර දෙනවා කියලා ජනාධිපතිතුමා කිව්වාට, ඒ අයට එහෙම දෙන්නේ නැහැ. ඒවා ගැන හොයා බලන්න. අපි මේවාට මොනවා හරි කිව්වාම, ආණ්ඩුව මොකක්ද කියන්නේ? දැන් අධිකරණ ඇමති කියලා ගියා, චාමරට තේරෙන්නේ නැහැ කියලා. චාමරට තේරෙන්නේ නැහැ කියන එක කමක් නැහැ කියමුකෝ. හැබැයි, ඒ මනුස්සයා නීතිඥයෙක් නේ. ඒ මනුස්සයාට තේරෙන්න එපායැ. ඒ මනුස්සයාට තේරෙන හින්දා නේ නීතිඥයෙකුට මේ රටේ අධිකරණ ඇමතිකම දුන්නේ. චාමරට තේරෙන්නේ නැහැ කියන එක හරි කියමුකෝ. ඒ මනුස්සයාට කුලිය සම්බන්ධයෙන් තේරෙන්නේ නැහැ වාගෙයි. එතුමාට කුලිය සම්බන්ධයෙන් තේරෙන්නේ නැහැ කියන්නේ මොකද? එතුමා ඉන්නේ කුලී ගෙයක නොවෙයි නේ. එතුමා ඉන්නේ ප්‍රේමදාස මහත්මයා දීපු ගෙදරක. ඔය අධිකරණ ඇමති ඉන්නේ ප්‍රේමදාස මහත්මයා දීපු ගෙදරක. එතුමා ගල්කිස්සේ ඉන්නේ ප්‍රේමදාස මහත්මයා දීපු ගෙදරක. කුලී ගෙදරක ඉඳලා ගිහින් ප්‍රේමදාස මහත්මයා දීපු ගෙදරක ඉන්න එතුමා තමයි අනික් මිනිස්සු ගෙවල් කුලියට දුන්නාම, ඒ ගෙවල් ටිකත් විනාශ කරන්න ඉඩ දෙන්නේ. මිනිහෙක් ගෙයක් හැදුවාම එහෙම කරන්න දෙයිද? මේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තියාගෙන, වැඩ කරන්නේ නැති ඇමතිලා තියාගෙන මේ ආණ්ඩුව කොහොමද පවත්වා ගෙන යන්නේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තව පොඩි වේලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

1948න් පසු කාලය ගත්තාම මේ ආණ්ඩුව බුද්ධිමත්, උගත් අය, උපාධි ඇති අය, මහාචාර්යවරුන්, ආචාර්යවරුන්, ඒ ඔක්කෝම එකතු වෙලා හදපු ආණ්ඩුවක් නේ. මීට කලින් වාගේ නොවෙයි නේ. Doctorsලා, proctorsලා ඔක්කෝම එකතු වෙලා හදපු බුද්ධිමත්ම ආණ්ඩුව නේ මේක. මේ ආණ්ඩුව මෙහෙම පිස්සු කෙළියාම මොකද වෙන්නේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා විනාඩියක් වැඩියෙන් ගත්තා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

1948 අවුරුද්දේ ඉඳලා හදපු ආණ්ඩුවලට වඩා වෙනස් දෙයක් නේ මේ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණේ. ඒක ඉටු වෙන්නේ නැහැ නේ, මේ ආණ්ඩුවෙන්. ඒ නිසා මම මේ වෙලාවේ කියනවා, මේවා සම්බන්ධයෙන් හරියට හිතලා වැඩ කරන්න කියලා. එහෙම නොකර විපක්ෂයට බණින්න එන්න එපා. වැඩේ වරද්දා ගත්තාට පස්සේ අපට නිකම් දොස් කියන්න එපා. එසේ ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. M.K.M. ASLAM took the Chair.*

[අ.භා. 1.12]

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ මාතෘකාව තිබෙන්නේ, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ හදපු Regulationsවලට අදාළවයි. විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිත කිරීමේ රෙගුලාසි සම්බන්ධයෙන් වන විවාදයක් විධියට තමයි අද දවසේ මේ සාකච්ඡාව පැවැත්වෙමින් තිබෙන්නේ. හැබැයි, මට දැනෙන්නේ නැහැ පාර්ලිමේන්තුව ඇතුළේ විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් මේ මාතෘකාව පිළිබඳව දශමයකවත් අවබෝධයකින් කථා කරනවා කියලා. මොකද, ඒ අයගේ මුළු සාකච්ඡාවේම තිබෙන්නේ වෙනත් වෙනත් මාතෘකායි.

විශේෂයෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ ගෙන එන මෙම Regulations හරහා අපි බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. විදුලි සංදේශ ක්‍රියාකරුවන් විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිත කිරීම හරහා මේ රටේ ජන සමාජයට දැවැන්ත වාසියක් එකතු වෙනවා. විශේෂයෙන්ම මෙය පරිසර හිතකාමී ක්‍රියාමාර්ගයක් ලෙස පවා ගන්න පුළුවන්. මෙය නගර සැලසුම්කරණ ක්‍රියාවලියට ඉතාම පහසුවක් වෙනවා. ඒ වාගේම, අධික වියදම් සහිත යටිතල පහසුකම් එකිනෙකා වෙන වෙනම ගොඩනගනවා වෙනුවට, ඒවා පොදුවේ භාවිත කිරීම හරහා ප්‍රාග්ධනය වැය වීමේ ඉතිරියක් වන නිසා ඒ මුදලේ වාසිය නැවතත් ජන සමාජයටම ලැබෙනවා. ඒ වාගේම, එක් අවස්ථාවක ඒකාධිකාරයක් ගැනත් කියැවුණා. ඒකාධිකාරයන් බිඳ දැමීම සඳහා මෙවැනි නියාමනයන් අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. එම නිසා මේක කිසිසේත්ම ඒකාධිකාරයන් ගොඩනැඟීමට නොව, ඒකාධිකාරයන් බිඳ දැමීමටයි තිබෙන්නේ.

කොහොම වුණත්, අද දවසේ සාකච්ඡාව දිහා බැලුවාම පෙනෙනවා, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමා සම්බන්ධ ගැටලුව ගැන කථා කරන්න වැඩි කාලයක් ගත්තු බව. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව ඇතුළේ ඒ සම්බන්ධයෙන් කරපු සාකච්ඡාව ගත්තාම, ඒ තීරණයට එරෙහිව මතු කරපු සාකච්ඡාව ගත්තාම ඉතාම පහත් මට්ටමේ අදහස් ප්‍රමාණයක් තමයි එළියට ආවේ. ඒක එතුමන්ටත් කරන හානියක්.

ඒ කාරණය සම්බන්ධයෙන් අපට විශේෂයෙන් මතු කරන්න ඕනෑ දේ මේකයි. එතුමාගේ ගැටලුව ඒ අදාළ කමිටුවට ආවේම 2023දීයි. 2023 හත්වැනි මාසයේ ඉඳලා විවිධ කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ලද යම් පෙත්සම් ප්‍රමාණයක්, එම තනතුර සම්බන්ධයෙන් මතු කළ ගැටලු ප්‍රමාණයක් එක්කයි ඒ ප්‍රශ්නය ආවේ. RTI එක හරහා ඒ සම්බන්ධ තොරතුරු ඉල්ලා තිබුණා. එම තොරතුරු ලබා දීමේදී මතු වුණු කාරණා තමයි Staff Advisory Committee එකේදී සාකච්ඡාවට ලක් වුණේ. ඒ මත පදනම් වෙලා නීත්‍යනුකූල ආකෘතියක තමයි ඒ තාවකාලික තහනම ක්‍රියාත්මක වෙන්නේ. එතුමන්ට ඉතාම හොඳ අවස්ථාවක් තිබෙනවා, විධිමත් විනය පරීක්ෂණයට මුහුණ දෙන්න. ඒකට අදාළ charge sheets භාර දීලා තිබෙනවා. ඒ සියල්ල ගත්තාම පෙනෙනවා, පාර්ලිමේන්තුවට නියමිත විධිමත් ක්‍රියාවලිය තුළ ඒක සිදු වෙලා තිබෙන බව. ඒ කාරණය ගැන විපක්ෂය කියන්නේ මොනවාද බලන්න.

විපක්ෂයට මේ වෙච්ච සන්තෑසිය මොකක්ද? ඒ අයට කිසිම දෙයක් සමාජයේ සාකච්ඡාවට ලක් කරන්න බැහැ ඒකට අසභ්‍ය කොටසක් එකතු කරන්නේ නැතුව. වෙන මොකක් ගැන කථා කළත්, මොන දේ ගැන කථා කළත් අසභ්‍ය කොටසක් ඒකට එකතු කරන trend එකක් ඒ අය දැන් හදාගෙන තිබෙනවා. අධ්‍යාපනයේ අසභ්‍යකරණයක් ගැනත් ඒ අය කිව්වා. ඇත්තටම අසභ්‍යකරණයට ලක් වෙලා තිබෙන්නේ අධ්‍යාපනය නොවෙයි; මේ විපක්ෂයයි. මේක අසභ්‍යකරණයට ලක් වූ විපක්ෂයක්. වැඩේ කියන්නේ, අපේ ආණ්ඩුවේ මූලික ව්‍යාපෘතිවලට අමතරව දැන් අපට සිද්ධ වෙලා තිබෙනවා තවත් අලුත් ව්‍යාපෘතියක් කරන්න; විපක්ෂය අසභ්‍යහරණය කරන්න. අලුත් ව්‍යාපෘතියක් විධියට එය කරන්න වෙලා තිබෙනවා. ඒ මට්ටමටම පත් වෙලායි තිබෙන්නේ. කිසිවක් කථා කරන්න බැහැ, අසභ්‍ය කොටසක් ඒක ඇතුළට ඔබන්නේ නැතුව. ඇත්තටම මෙහෙම සන්තෑසියක් වෙච්ච විපක්ෂයක් ජීවිත කාලය පුරාම දකින්න හම්බ වෙන්නේ නැහැ, මේ කාලයේ හැරෙන්න. ඒ තරම් අවුලකට පත් වෙලායි තිබෙන්නේ. එහෙම අසභ්‍යකරණයට ලක් වෙච්ච විපක්ෂයක්

[ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා]

තමයි තිබෙන්නේ. අධ්‍යාපන වැඩසටහන ගත්තත්, මොන වැඩසටහන ගත්තත්, මොන දේ ගත්තත් ඒවාට අසභ්‍ය කොටසක් එකතු කරන්න ඒ අය සමත් වෙලා තිබෙනවා. ඒ අයට එක වචනයක් කථා කරන්න බැහැ, අසභ්‍ය කොටසක් කියන්නේ නැතුව. තමන්ගේ කථාව ජන සමාජය ඇතුළේ පැළ කර ගන්න උත්සාහ කරනවා, අසභ්‍ය කොටසක් එකතු කිරීම හරහා. එහෙම වෙන්නේ නැහැ. මොකද, ජන සමාජය ඒවා ප්‍රතික්ෂේප කරනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා ඔබ දරන ඒ උත්සාහය, ඇත්තටම ඉතාම පහත් පෙළේ උත්සාහයක්.

අපට කියන්න තිබෙන්නේ මේකයි. අපි දේශපාලන ව්‍යාපාරයක් විධියට මේ රටේ යම් brand එකක් අත්පත් කරගෙන තිබෙනවා. නිහතමානී, ඒ වාගේම යම් සාකච්ඡාවකට ඉඩ දෙන, යම් නීතිගරුක ආකෘතියක වැඩ කරන, හැම කාරණයක් කෙරෙහිම අවධානය යොමු කරලා ඒක නීතිගරුක රාමුවක් තුළට ගන්න, විනිවිදභාවයක් සහිත, තෙතමනයක් සහිත හදවතක් තිබෙන මිනිසුන්ගෙන් සමන්විත දේශපාලන ව්‍යාපාරයක් විධියට තමයි අප brand වෙලා තිබෙන්නේ. ඒක තමයි "AKD" කියන අකුරු තුනෙන් කිව්වේ. "AKD" කියන්නේ නමක් විතරක් නොවෙයි; ඒක brand එකක්. ඒ brand එක තමයි අපි හදලා තිබෙන්නේ. ඒක තෙතමනය සහිත ජන සමාජයක් නියෝජනය කරන brand එකක්, ඒක. විනිවිදභාවයක් සහිත ක්‍රියාවලීන් නියෝජනය කරන ජන සමාජය නියෝජනය කරන brand එක, ඒක. වගකීමක් සහිත මිනිසුන් නියෝජනය කරන brand එක, ඒක. ඒක තමයි brand එක.

හැබැයි, දැන් මේ විපක්ෂයේ තත්ත්වය මොකක්ද? මේ පාර්ලිමේන්තුව ගත්තාම මේක ඇතුළේ මුළුමනින්ම තිබෙන්නේ, කුණු හරුප කියන, අසභ්‍ය දේවල් ගැන කථා කරන විපක්ෂයක්. මෙහෙම කොහොමද කරන්නේ? මේ රට මුහුණ දීලා තිබෙන නරකම තත්ත්වයත් මේකයි. ඇත්තටම මේ ජාතියේ අය කොහොම මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණාද කියන එක ගැන අපි වෙනම කථා කරන්න ඕනෑ. මිනිසුන්ගේ අහිංසක ඉල්ලීමක් තමයි system change කියන එක. System එක change කරන්න කියන එක. තේරෙන මට්ටමින් හෝ නොතේරෙන මට්ටමින් සමහර මිනිස්සු රටේ පැවැති system එක, ඒ සමාජ ක්‍රමය ප්‍රතික්ෂේප කරලා තමයි අපට බලය දුන්නේ. ඒක ඇතුළේ තිබුණේ අර කියපු නුගුණ තමයි. සමාජය ඉස්සරහා කිසි ලෙසකින්වත් නීතිගරුක ආකාරයට හැසිරෙන්නේ නැති, සමාජයේ කිසිම ක්‍රියාවලියක් නීතියට අනුගත නොවන, විනයගරුක නොවන, ඒ වාගේම ජන සමාජයේ කාටවත් ගරුත්වයක් නැති system එකක් රටේ තිබුණා. එය වෙනස් කිරීම වෙනුවෙන් තමයි මේ ජන සමාජය අපව පත් කළේ.

දැන් අද දවස ගත්තත්, අද දවසේ විශේෂ සාකච්ඡාවක් දීලා තිබෙනවා, ගුරු සංවර්ධන නිලධාරින්ගේ උපවාසය සම්බන්ධ කාරණයට අදාළව. එතැනදීත් විපක්ෂයේ කණ්ඩායම් උත්සාහ කරමින් ඉන්නවා, අනීතික ක්‍රියාවලියකට ආණ්ඩුව ගැට ගහන්න. එහෙම කිසිම වුවමනාවක් නැහැ. අපි නීත්‍යානුකූලව, නීතිගරුක ලෙස කටයුතු කරමු. මොකක්ද තිබෙන ප්‍රශ්නය, නීතිගරුක ලෙස කටයුතු කළාම? ඇයි, එහෙම කටයුතු කරන්න බැරි? අපි සූදානම් විනයක් ඇතුව, නීතියකට යටත්ව වැඩ කරන්න.

හැබැයි, මේ "AKD" කියන brand එකට, ආණ්ඩුව විධියට අප උපයාගෙන තිබෙන මේ "AKD" කියන brand එකට ප්‍රතිවිරුද්ධ ලෙස ගුණාත්මක brand එකක් නිර්මාණය කර ගන්න විපක්ෂයේ කාටවත් බැහැ. එක නමකටවත් එහෙම දෙයක් කරන්න බැහැ. මෙතුමන්ලාට කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ, පොදු කුණු හරුප බළකායක් වාගේ brand එකක් හදා ගන්න විතරයි. ඒ අයට ඒ හැර වෙන කිසිම brand එකක් නැහැ; වෙන කිසිම brand එකක් නැහැ. ඒ සියලු කණ්ඩායම් එකතු වෙලා පොදු කුණුහරුප බලකායක් ගොඩනගාගෙන තිබෙනවා. ඒක තමයි දැන් රටේ ඒ අයගේ mark එක. ඒ ජාතියේ දෙයක් කිව්වොත් ඕනෑම පොඩි එකෙක් දන්නවා, ඒක කියන්නේ විපක්ෂයෙන් කියලා. ඒක තමයි brand වෙච්ච විධිය. පොදු කුණුහරුප බලකායට අපි කෙටියෙන් කියමු, "PKB" කියලා. "AKD" vs "PKB". එහෙම තමයි තිබෙන්නේ දැන්. ඒ වාගේ බලකායක්, මේක. පාර්ලිමේන්තුව තුළ අද දවස ගත්තත්, මේ මුළු දවසේම කිසිම ආකාරයක ගුණාත්මක සාකච්ඡාවක් සිදු වුණේ නැහැ. පාර්ලිමේන්තුව දිහා බලලා කිසිවෙකුට ඉගෙන ගන්න පුළුවන් ගුණාත්මක සාකච්ඡාවක් අද දවසේ මේ පාර්ලිමේන්තුව තුළ කළේ නැහැ. අලුත් මන්ත්‍රීවරුන් විධියට ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. මම මගේ පළමුවෙනි පාර්ලිමේන්තු කථාවේදීත් කිව්වා, අප මේ ජාතියේ පාර්ලිමේන්තුවක්, ඒ කියන්නේ, තමන්ට හිතෙන හිතෙන බොරු සියල්ල ප්‍රකාශයට පත් කරන, තමන්ගේ හිතේ තිබෙන ඒ අසභනයන් ප්‍රකාශයට පත් කරන ජාතියේ පාර්ලිමේන්තුවක් බලාපොරොත්තු නොවන බව. මෙය, එහෙම ආයතනයක් බවට පත් වෙන්න ඕනෑ නැහැ. පාර්ලිමේන්තුවේ ගුණාත්මකභාවය රකින්න ඕනෑ, පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු; පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ, විපක්ෂ කණ්ඩායම්.

අද දවසේ මෙම විවාදයේදීත් කරුණු දැක්වීම් අතින් විපක්ෂය ඉතාම නරක තැනකට වැටිලායි තිබෙන්නේ. විවාද වන කරුණට අදාළව නොවෙයි, කරුණු දක්වන්නේ. සමාජයේ මේ මොහොතටවත් අදාළ නැති සමහර කරුණු මෙතැනදී ඉදිරිපත් කරලා, ඒකට අසභ්‍ය කොටසකුත් ඇඳලා, ඒ අතරේ අපහාස කිරීමේ ක්‍රියාවලියක් කරගෙන යනවා හැර වෙන කිසිවක් කරන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල පවා තිබෙනවා, කිසිවෙකුට ආරෝපිත චෝදනා එල්ල කරන්න කාටවත් බැහැ කියලා. හැබැයි, පාර්ලිමේන්තුවේදී එහෙමත් කටයුතු කෙරෙනවා. ඒ පිළිබඳව සොයා බලන්න කියලා, ගරු කථානායකතුමාගෙන් ඉල්ලන්න ඕනෑ. ඇයි, එහෙම කරන්න ඉඩ දීලා තිබෙන්නේ? කිසිවෙකුට ආරෝපිත චෝදනා කරන්න ඉඩ දෙන්න අවශ්‍ය නැහැ. විපක්ෂයට වෙලා තිබෙන මේ සන්තෑසිය වෙනුවෙන් අපි දවසක් කනගාටු වුණාට ඇත්තටම පාඩු නැහැ. මෙවැනි සන්තෑසියකට ලක් වුණු විපක්ෂයක් එක්ක කටයුතු කරන්න සිදු වීම ගැන අපි කනගාටු වනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.22]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "AKD" කියන්නේ, brand එකක් ලු; තෙතමනය තිබෙන brand එකක් ලු; system change එක ක්‍රියාත්මක කරන brand එකක් ලු. ඔය තෙතමනය තිබෙන "AKD" ක්‍රියාත්මක කරන system change එකද දන්නේ නැහැ, බුදු දහමට නිග්‍රහ කරන එක? සම්බුද්ධ ශාසනය සම්බන්ධයෙන් උත්තරීතර ස්ථාවරයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව තිබෙනවා. නොදන්නවා නම් ඒක කියවන්න. රජයේ

පාර්ශ්වය නියෝජනය කරන system change එකේ අය, තෙතමනය තිබෙන අය, සම්බුද්ධ ශාසනයට, ගෞරවනීය මහා සංඝරත්නයට ඒ එල්ල කරන ප්‍රහාර රටේ උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් අපේ රට තුළ බුද්ධ ශාසනයට විශේෂ ස්ථාවරයක් ලබා දීලා, අනෙකුත් සියලු ආගම්, සංස්කෘතීන් ආරක්ෂා වන ආකාරයට නීති පනවා තිබෙනවා. ඒ ආරක්ෂාව තුළින් රට තුළ තිබෙන එකමුතුභාවය ශක්තිමත් වනකොට තෙතමනය තිබෙන brand එක දැන් බුදු දහමට නිග්‍රහ කරනවා. මම අහන්න කැමැතියි, ඕකද system change එක කියලා.

ඒ විතරක් නොවෙයි. ලජ්ජා නැතුව මේ ගරු සභාවේ කියනවා, තෙතමනයත් එක්ක හොඳ දේවල් කරනවා ලු. ඉතින්, හොඳ දේවල් කරනවා නම් මේ රටේ ගුරු හිඟයට විසඳුමක් ලබා දුන්නු අර 17,000ක් පමණ වන සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න. ඒ නිකම් සංවර්ධන නිලධාරීන් නොවෙයි. ගුරු සංවර්ධන නිලධාරීන්. ඒ අය කොරෝනා වසංගතය සමයේ රට බංකොලොත් වුණු අවස්ථාවේ කන්නන්ගර මැතිතුමාගේ නිදහස් අධ්‍යාපන සංකල්පය ශක්තිමත් කරලා, නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් ලොකු කැප කිරීමක් කළ, වසර 5ත්, 10ත් අතර කාලයක අත්දැකීම් තිබෙන විශිෂ්ට සේවාවක් කළ කණ්ඩායමක්. ජනාධිපතිවරණයේදී, මහ මැතිවරණයේදී, පළාත් පාලන මැතිවරණයේදී පොරොන්දු වුණු ආකාරයට ඒ සංවර්ධන නිලධාරීන් යම් ක්‍රමවේදයක් තුළ ගුරු සේවයට අන්තර්ග්‍රහණය නොකරන්නේ ඇයි? අභ්‍යාසලාභී පත්වීම් 2-II ශ්‍රේණියට ලබා දීලා, වසර තුනක් තුළ පශ්චාත් අධ්‍යාපන උපාධිය සමත් වුණාට පසුව ස්ථිර කරන්න පුළුවන්, ඒ theoretical and practical examinations තුළ. නමුත්, එදා ඡන්ද කාලයේ ගුරු සංවර්ධන නිලධාරීන් ප්‍රයෝජනයට අරගෙන, ඡන්ද ටික අරගෙන, දැන් මහ පාරට ඇද දමා තිබෙනවා. ඒකද තෙතමනය? ඒකද "AKD" brand එක? ඒකද system change එක?

ඒ විතරක් නොවෙයි, ඊයේ දවසේ ඇමෙරිකා එක්සත් ජනපදයත්, ඉන්දියාවත් වෙළෙඳ ගිවිසුමකට ප්‍රවේශ වෙලා තිබෙනවා. ඉන්දියාවට පැනවූ ප්‍රතිවාරක බදු - reciprocal tariff - සියයට 50 සිට සියයට 18 දක්වා ඒ මඟින් අඩු කරලා තිබෙනවා. අපි රජයට කිව්වා, කොයි යම් හෝ මොහොතක එය අඩු වන බව. ආණ්ඩුව එදා පොඩ්ඩක් සතුටු වෙලා හිටියේ, ඉන්දියාවට සියයට 25ක් වැදුණා, ඒ සියයට 25ත් එක්ක තවත් සියයට 25ක් වැදුණා; ඔක්කෝම සියයට 50යි කියලා. නමුත් අපි දන්නවා, භූ දේශපාලනය තුළ ඒ reciprocal tariff එක අඩු වෙනවා කියලා. අන්න ඊයේ එය අඩු කළා සියයට 18ට. දැන් අපේ අපනයනකරුවන්ට ඇමෙරිකානු වෙළෙඳ පොළ තුළ මොකක්ද සිද්ධ වෙන්නේ? අපේ tariff එක සියයට 2ක් වැඩියි. ඉන්දියාවට අදාළව එය සියයට 18ට බස්සලා; සියයට 2ක් අඩුයි. ඔය "AKD" brand එක, තෙතමනය තිබෙන ඔය brand එක, system එක change කරන ඔය brand එක ඒ සම්බන්ධයෙන් මොකක්ද ගන්නා පියවර? අපි ඒක දැනගන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා දන්නවාද, අද වනකොට කර්මාන්තශාලා වහන්නට සැලසුම් සකස් කරලා තිබෙන බව. එදා රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ "ඇඟලුම් කම්හල් 200" වැඩසටහන තුළ විශිෂ්ට සේවාවක් කරපු මාස් ආයතනයේ කර්මාන්තශාලා කිහිපයක් අද වන කොට වහන්න යනවා. ඔබතුමන්ලා ඒක දන්නවාද? අපේ කර්මාන්ත ඇමතිතුමා ඒ ගැන දන්නවාද? බොහෝ දෙනෙකුට රැකියා අහිමි වෙනවා. නමුත්, ඔබතුමන්ලා පොරොන්දු වෙලා ආවේ කර්මාන්තශාලා වහනවා කියලා නොවෙයි, වෙනදාටත් වඩා ඉක්මනින් අලුත් ඒවා විවෘත කරනවා කියලා. ඇඟලුම් කම්හල් 200ට ඔබතුමන්ලා කිව්වේ "76 වසරක සාපය" කියලා. දැන් සාපයට මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් "AKD" brand එකට මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් තෙතමනයට මොකක්ද වෙලා තිබෙන්නේ? අපි පැහැදිලිවම කියනවා, මේ රට තුළ බරපතළ අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙන බව.

ගෞරවනීය මහා සංඝ රත්නයට: ත්‍රෛනිකායික මහා සංඝ රත්නය ප්‍රමුඛ සම්බුද්ධ ශාසනයේ මුරදේවතාවන් වන අපේ ගෞරවනීය මහා සංඝ රත්නයට අද දැවැන්ත තර්ජනයක් එල්ල වෙලා තිබෙනවා. එය එසේ සිදු වන්නට බැහැ. නොදන්නවා නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියවන්න; ඒ උත්තරීතර නීතිය කියවන්න. බොරුවට මාධ්‍ය ඉදිරියේ ගිහිල්ලා පුද පූජා පින්කම් පවත්වලා ආපසු මන්දිරයට ඇවිල්ලා මේ රටේ ආගම් භේදය, ජාති භේදය, සංස්කෘතීන් අතර භේදය ප්‍රවර්ධනය වන ප්‍රකාශ කිරීමෙන් වළකින්න. රටේ ජනාධිපතිවරයා ප්‍රමුඛ මේ රජයේ වගකීම භේදභින්නවීම් ඇති කිරීම නොවෙයි. සම්බුද්ධ ශාසනයට මුල් තැන ලබා දෙමින්, අනෙකුත් සියලුම ආගම්, සියලුම සංස්කෘතීන් රැක ගනිමින්, මේ රටේ ලක්ෂ 220ක් ජනතාව සුරක්ෂිත කරමින්, සැබැවින්ම රටේ ඒකීයභාවය, ස්වෛරීත්වය, භෞමික අඛණ්ඩතාව, දේශපාලන නිදහස සුරක්ෂා කිරීමයි කෙරෙන්නට ඕනෑ. වෛරී ප්‍රකාශ තුළින්, ඒ වාගේම ආගම ධර්මය පිළිබඳ පහත් ප්‍රකාශ තුළින් අද සිදු වෙලා තිබෙන්නේ අපේ රටේ සමාජය තුළ, විවිධ සංස්කෘතීන් තුළ ව්‍යාකූලත්වයක් නිර්මාණය වීමයි. මේ අධම ක්‍රියාවෙන් බැහැර වෙන්න කියලා ඔය "AKD" brand එකටයි, system change කරනවා කියපු අයටයි, ඔය පපුවේ තෙතමනයක් තිබෙනවා කියන අයටයි අපි ප්‍රකාශ කර සිටිනවා.

ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
විශේෂයෙන්ම ගුරුවරුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් කරපු වැරැදි ප්‍රකාශය පිළිබඳව යම් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එය තත්පර 30කින් අවසන් කරමු. *[බාධා කිරීම්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හොඳයි. එකක් තමයි, ආණ්ඩුවේ ඇමතිවරයෙකු ලෙස මට අයිතියක් තිබෙනවා, වැරැදි ප්‍රකාශයක් කළාම ඒක නිවැරැදි කරන්න. *[බාධා කිරීම්]* එකක් තමයි,- *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම ඇමතිවරුන්ට ඕනෑ ඕනෑ වෙලාවට නැඟිටලා කථා කරන්න බැහැ. විෂයයට අදාළ ඇමතිවරයාට අනිවාර්යයෙන්ම උත්තර දෙන්න පුළුවන්. *[බාධා කිරීමක්]* එහෙම නම් ඔබතුමා point of Order එක කියන්න එපායැ. ඔබතුමාට එහෙම එක්වරම නැඟිටින්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා. *[බාධා කිරීම්]* ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා, කථාව පටන් ගන්න.

[අ.භා. 1.31]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේදී විශේෂයෙන් විවාද කරනු ලබන්නේ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ ඉදිරිපත් කර ඇති රෙගුලාසි පිළිබඳවයි. සාමාන්‍යයෙන් මේ වාගේ පනතක් යටතේ අලුතින් රෙගුලාසි එකතු කරන කොට ඒ රෙගුලාසි එකතු කිරීම පිළිබඳ විවාදයක් පාර්ලිමේන්තුවේ ඉල්ලා සිටින්නේ විපක්ෂයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ සංශෝධනයක් විවාද කරන ආකාර කිහිපයක් තිබෙනවා. අපට ඕනෑ නම් පුළුවන්, Parliamentary Business Committee එකේදී තීරණය කරලා මෙය විවාදයකින් තොරව අනුමත කරන්න. මේ පනත යටතේ ගෙනෙන රෙගුලාසි පිළිබඳව විපක්ෂයට විවාදයක් නැත්නම්, කරුණු කියන්න දෙයක් නැත්නම්, කාලය ඉතිරි කරලා වැදගත් මාතෘකාවක් සාකච්ඡා කරන්න මෙය විවාදයකින් තොරව සම්මත කරන්න පුළුවන්. නමුත්, මේ විදුලි සංදේශ නියාමන කොමිසමට අදාළ නව සංශෝධන ගැන විපක්ෂය විවාදයක් ඉල්ලා තිබෙන්නේ විවාද කරන්න කරුණු විපක්ෂයට තිබිච්ච නිසා.

විවාද කරන්න කරුණු නැත්නම්, සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන්; විවාදයකින් තොරව සංශෝධනය කරන්න පුළුවන්. එහෙම නම්, අද වැදගත් මාතෘකාවක් අරගෙන සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් හරි ගෙනැල්ලා කථා කරන්න තිබුණා. අද ඔබතුමන්ලාට තිබුණේ බුද්ධාගමට නිගරුවක් වුණා කියන ප්‍රශ්නයක් නම්, එහෙම නැත්නම් ඉන්දියාව ඇමෙරිකාව එක්ක ගහපු ගිවිසුමේ තිබුණු බදු සංශෝධන පිළිබඳ කාරණා නම්, එහෙම නැත්නම් කර්මාන්තශාලා වැසී යාම පිළිබඳ ප්‍රශ්නයක් නම්, එහෙමත් නැත්නම් අභ්‍යාසලාභීන්ගේ ප්‍රශ්නය නම් ඔබතුමන්ලාට පක්ෂ නායක රැස්වීමේදී එකඟතාවකට එන්න තිබුණා, "ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ රෙගුලාසි ගැන අපට කථා කරන්න දෙයක් නැහැ, ඒක නිසා අපි අද දවස වැදගත් මාතෘකාවකට වෙන් කර ගන්නවා" කියලා. එහෙම නම් පක්ෂ නායක රැස්වීමේදී ඒ මාතෘකාව ගැන එකඟතාවකට ඇවිල්ලා සාකච්ඡා කරන්න තිබුණා. දැන් මෙතැන මොකක්ද වෙන්නේ? විපක්ෂය විවාදයක් ඉල්ලලා තිබෙනවා, නමුත් විපක්ෂය කථා නොකරන්නේම ඒ මාතෘකාව. දැන් මෙතෙක් කථා කළ, - මම දන්නේ නැහැ මීට පස්සේ කථා කරයිද කියලා - විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් විපක්ෂය විසින් විවාදය ඉල්ලපු මාතෘකාව ගැන වචනයක්වත් කථා කළේ නැහැ. අනෙක් කාරණා අවැදගත් කියලා නොවෙයි මම කියන්නේ. ඒගොල්ලන්ට වැදගත් ඇති. වැදගත් නම් තිබුණේ ඒකට දිනය වෙන් කර ගන්නයි. ඒ කාරණයත් සඳහන් කරමින්, මම මේ මාතෘකාවේ වැදගත්කම ගැන පොඩ්ඩක් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට හැටියට දැනට ශ්‍රී ලංකාවට අයිති සබ්මැරීන කේබල් 10ක් තිබෙනවා. SLT එකට 6යි, ඩයලොග් එකට 3යි, හච් එකට 1යි. දැනට 9ක් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ඉන්දියන් සාගරයේ වැදගත්කම සහ අපේ රටේ පිහිටීම අනුව සබ්මැරීන 40ක් ඉන්දියන් සාගරය තුළ ක්‍රියාත්මක වෙනවා. ඉන්දියන් සාගරය තුළ ක්‍රියාත්මක වෙන සබ්මැරීන 40න් මේ දත්ත පද්ධතියට, එහෙම නැත්නම් මේ සන්නිවේදන ජාලයට අපි එකතුවීමෙන් ඩිජිටල්කරණය පිළිබඳව, සන්නිවේදන තාක්ෂණය පිළිබඳව, ඒ වාගේම අපේ රටේ ජනතාවට පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් අපට විශාල හැකියාවක් ලැබෙනවා.

අපට මතකයි, මුලින්ම mobile phones එන කාලයේ "සෙල්ටෙල්" කියලා තමයි අපි ඒ ඔක්කෝටම කිව්වේ. මතකද, ගඩොල් භාගය? ගඩොල් භාගය ආව කාලයේ incoming call එකටත් අය කළා, outgoing call එකටත් අය කළා. මේ, වැඩි ඈතක නොවෙයි. 1990 මුල් කාලයේ call එකක් රුපියල් 25යි. ඒ කාලයේ phone එක තියා ගත්තේ ආභරණයක් වාගේ, calls ගන්න නොවෙයි පෙන්වන්න. Mobile phone එකක් තිබෙන කෙනෙක් කියන්නේ ඒ තරම් වැඩකාරයෙක්, වැදගතෙක්; එහෙමයි තිබුණේ. මොකද හේතුව? ඒ කේබල් ස්ථානගත කිරීම, ඒ පහසුකම් සැපයීම, ප්‍රාග්ධනය යෙදවීම ලේසි නැහැ; ඒක විශාල පිරිවැයක්. ඒකක පිරිවැය වැඩි නිසා වියදම වැඩියි. ඒ වියදම දරන්න සිද්ධ වුණේ පාරිභෝගිකයාට, phone එක ගන්න කෙනාට, පාවිච්චි කරන කෙනාට. දැන් මේ කරන්නේ මොකක්ද? සරලව කිව්වොත්, මේ කරන්නේ ඒ මූලික යටිතල පහසුකම්වල වියදම් ඒ සමාගම් අතරේ හුවමාරු කිරීම. ඒ කියන්නේ එකඟතාවට ඇවිල්ලා, ඒකාබද්ධ කරලා, ඒ යටිතල පහසුකම් භාවිත කිරීම පහසු කරගෙන වියදම අඩු කරන්න උත්සාහ කිරීම. ඉතාම වැදගත් දෙයක් මේක.

අපේ රට නව තාක්ෂණ යුගයකට යනකොට, ඩිජිටල්කරණයට යනකොට, සන්නිවේදන තාක්ෂණයේ ආසියාවේ කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙන්න අපට තිබෙන ඉලක්ක සම්පූර්ණ කරනකොට ඒකක පිරිවැය අඩු කරගෙන යටිතල පහසුකම් ටික සකස් කර ගන්න එක අත්‍යවශ්‍ය කටයුත්තක්. එතකොට මෙන්න මේක කරන්න අදාළ ක්‍රියාකරුවන්ගෙන්, ඒ සමාගම්වලින් එකඟතාව, කැමැත්ත ගත යුතුයි, කැමැත්ත ප්‍රකාශ කළ යුතුයි. මේ රෙගුලාසි සම්මත වුණාට පසුව අද ඉඳලා ඒ කැමැත්ත ඉල්ලා සිටීම විදුලි සංදේශ නියාමන කොමිසමට පැවරෙනවා. කලින් තිබුණා, හැබැයි ඒක නිශ්චිත නැහැ. කලින් ඒ බලය විදුලි සංදේශ නියාමන කොමිසමට නිසියාකාරව පැවරිලා තිබුණේ නැහැ.

අද මේ රෙගුලාසිවලින් කෙරෙන වැදගත්ම දේ මොකක්ද? මේ සමාගම් අතර යටිතල පහසුකම් සකසන අය ඉන්නවා, ඒ වාගේම සංඛ්‍යාත - frequencies - භාවිත කරන අය ඉන්නවා. ඒ සියලු කණ්ඩායම්වලට මේ දේ කළ යුතුය, ඒකක පිරිවැය අඩු

කරන්න මේ ක්‍රියාමාර්ග ගත යුතුය කියන නිශ්චිත නියෝග ලබා දෙන්න, මේ පනතේ 17 (2) වගන්තිය යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට බලයක් ලැබෙනවා. ඒක වැදගත් දෙයක්. විශේෂයෙන්ම ඒ යටතේ passive network කියන කොටසේ ජෙනරේටර් වාගේ දේවල් භාවිත කිරීම, ඒ වාගේම radio network signal towers පාවිච්චි කිරීම ඇතුළත් වෙනවා. අපි දන්නවා, signal towers පාවිච්චි කරන කොට ඒ ආයතන සේවා ලබා ගන්නා බව. ඒ මූලික දේවල්, යටිතල පහසුකම් පවත්වා ගෙන යන ආයතන ඒකාබද්ධ කිරීමක් මේ මඟින් සිද්ධ වෙනවා. ඒ වාගේම frequencies සඳහා 5G වාගේ ගත්තොත්, 5G ආයතන දෙකක් තිබෙනවා. ඒක ආයතන තුනකට දෙන්න යනවා. ඒවා දැන් ජනතාවට පහසුකම් සලසන, ඒකක පිරිවැය අඩු කරන ක්‍රියාවලියකට ගිහිල්ලා තිබෙනවා. හැබැයි, මෙහිදී වැදගත් දෙයක් තිබෙනවා. මෙම රෙගුලාසි යටතේ core networking කියන එක සම්පූර්ණයෙන්ම තහනම් කරනවා. Core networking බෙදා ගැනීමක් කෙරෙන්නේ නැහැ. මොකද, ඒක ඕනෑම රටක ජාතික ආරක්ෂාව සම්බන්ධ දෙයක්. ඒක බෙදා හැරීමක් නැතුව, යටිතල පහසුකම්, ඉදි කිරීම් වැනි දේවල්, සංකේත භාවිත කිරීම ආදී සියල්ල පොදුවේ මේ ජාලයට සම්බන්ධ වන දුරකථන පහසුකම් ලබා දෙන, සන්නිවේදන පහසුකම් ලබා දෙන, තාක්ෂණික පහසුකම් මෙහෙයුම් කරන සියලු අයට මේ හැකියාව ලැබෙනවා. ඒ හැකියාව ලබා ගැනීම තමයි මේ මඟින් කරන්නේ. ඒකෙන් තව දෙයක් සිද්ධ වෙනවා. ආයෝජන කරන අයට ආයෝජන පිරිවැය - වියදම්- අඩු වෙනවා වාගේම පරිසර පද්ධතිය ආරක්ෂා වෙනවා. මොකද, මේ කේබල් ස්ථානගත කරද්දී, මේ යටිතල පහසුකම් සකස් කරද්දී, අපේ වාගේ පුංචි දිවයිනක විශාල ඉඩම් කොටසක් ඒකට වෙන් කරන්න අමාරුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මෙහිදී පාරිසරික වශයෙනුත් විශාල වියදම් ප්‍රමාණයක් අඩු වෙනවා, පාරිසරික වශයෙන් වෙන හානිය අඩු වෙනවා, යටිතල පහසුකම්වලට යන වියදම් අඩු වෙනවා, නගර සැලසුම් කිරීමේදී තව පහසුකම් හැදෙනවා. ඒ නිසා විශේෂයෙන්ම පරිසර හිතකාමී කලාප තුළ මේක ක්‍රියාත්මක කරන්න පුළුවන්කම ලැබෙනවා.

පසුගිය කාලයේ networking cables සඳහා ස්ථාන වෙන් කරද්දී සමහර අය තමන්ගේ වඩා වටිනා ඉඩම් ඒ වෙනුවෙන් දුන්නා අපිට මතකයි. ඒවා නැවත ඉවත් කරන්න අමාරුයි. ඒ දේවල් සම්බන්ධයෙන් මේ තුළින් යම් නියාමනයක් කෙරෙනවා. සිතූ සිතූ විධියට ඒවා සිද්ධ වෙන්නේ නැහැ. ඒ නියාමනය තුළින් අවසාන බලාපොරොත්තුව මොකක්ද? අවසාන බලාපොරොත්තුව වන්නේ, මේ දුරකථන කුලුනු, කුලුනු මත ස්ථාපිත උපකරණ, power සැපයුම් පද්ධති, සම්බන්ධිත පහසුකම්, radio access network කියන දේවල් බෙදා ගත හැකි පහසුකම් බවට පත් කරන එක. බෙදා ගත හැකි පහසුකම් හැටියට දැනට තිබුණත්, ඒවා විදුලි සංදේශ නියාමන කොමිසමේ අදාළ සැපයුම්කරුවන්ගෙන්, ක්‍රියාකරුවන්ගෙන් නිශ්චිත කරලා නියාමනය කරන්න මෙච්චර කාලයක් බලයක් තිබුණේ නැහැ. අන්න ඒ බලය තමයි දැන් මේ රෙගුලාසි තුළින් ලැබෙන්නේ.

ඒ වාගේම මෙහි තවත් වැදගත් දෙයක් තිබෙනවා. TRC එකට මේ නියාමන බලය ලැබුණාට මදි, ඒකට අවශ්‍ය කරන තාක්ෂණික උපකරණ අවශ්‍යයි. ඒකට අවශ්‍ය කරන මෙවලම් අවශ්‍යයි. ඒකට අවශ්‍ය කරන යන්ත්‍රසූත්‍ර අවශ්‍යයි. ඒ දේවලුත් ඉක්මනින්ම සපයා ගන්න ඕනෑ. මම විශ්වාස කරනවා, අපේ නව රජයේ අවුරුද්දක ප්‍රගතිය තුළ - ගිය අවුරුද්ද තුළ - විදුලි සංදේශ නියාමන කොමිසම ලබා ගෙන තිබෙන සාර්ථකත්වයන් තුළ, ඒ දේ කරන්න පුළුවන් කියලා. මොකද, විදුලි සංදේශ නියාමන කොමිසම මේ කෙටි කාලය තුළ විශාල ප්‍රගතියක් ලබලා තිබෙනවා. 2024 වර්ෂයේදී ආදායම රුපියල් බිලියන 37ක්, වියදම රුපියල් බිලියන 8.6ක්. 2025 අවුරුද්දේ ආදායම රුපියල් බිලියන 45ක්. රුපියල් බිලියන 37ක් තිබුණු එක බිලියන 45.3ක් දක්වා වැඩි කර ගත්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වියදම රුපියල් බිලියන 5.4ක්. වියදම අඩු කර ගෙන තිබෙනවා. පසුගිය ආණ්ඩු කාලයේදී රුපියල් බිලියන 8.6ක් වුණු විදුලි සංදේශ නියාමන කොමිසමේ වියදම නාස්තිය, දූෂණය අඩු කිරීමේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ග එක්ක ගිය අවුරුද්දේ රුපියල් බිලියන 5.4ට අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම ආදායම වැඩි වෙලා තිබෙනවා, රුපියල් බිලියන 37 ඉඳලා 45 දක්වා. ඒ කාර්යක්ෂමතාව සහ ආදායම එකතු කර ගැනීමේ යන්ත්‍රණය නිසා. එතකොට මේ ලබා ගන්නා ආදායමේ ප්‍රතිලාභ ලැබෙන්න ඕනෑ කාටද? මේ ආදායමේ ප්‍රතිලාභ ලැබෙන්න ඕනෑ මහජනතාවට. මම කියන්නේ, මේ තාක්ෂණයේ නව විද්‍යාත්මක සොයා ගැනීම්වල ප්‍රතිඵල ජනතාවට ලැබෙන්න ඕනෑ කියන එකයි. ඒකයි මම මුලින් කිව්වේ, අපේ රටට "සෙල්ටෙල්" එක ආපු කාලයේ ඒකේ තිබුණු යටිතල පහසුකම් බෙදා ගැනීමේ මෙවැනි යන්ත්‍රණයක් නොතිබුණු නිසා, ඒවා ආරම්භ කරපු සමාගම්වල සියලු පිරිවැය - වියදම - පාරිභෝගිකයාට තමයි ගියේ කියන එක. Telephone එකක ගාස්තු වැඩි වුණා. ඒ connection එක ගන්නත් විශාල මුදලක් ගෙවන්න සිද්ධ වුණා. Telephone එක, විශාල වියදමක් දරන්න සිද්ධ වුණු සුඛෝපභෝගී භාණ්ඩයක් බවට පත් වුණා. හැබැයි, අද එහෙම නැහැ. අද එය සාමාන්‍ය භාණ්ඩයක් බවට පත් වෙලා තිබෙනවා. 1978දී විවෘත ආර්ථිකය ආපු මුල් කාලයේ ගෙදරක කැසට් එකක්, රේඩියෝ එකක්, ටෙලිවිෂන් එකක් තිබෙනවා නම්, එය මධ්‍යම පාන්තික ගෙයක් බවට පත් වුණා. නමුත්, ඒ තාක්ෂණය සාමාන්‍ය ජනතාව අතරට යන්න ඕනෑ. දැන් එය බෙදිලා යනවා. ඒ බෙදී යෑමේ ප්‍රතිලාභයක් ලෙස අද ජංගම දුරකථනයට ඒ පහසුකම් ලැබිලා තිබෙනවා. හැබැයි, ජංගම දුරකථනයට ඒ ආපු පහසුකම dataවලින් වෙන්න පුළුවන්, දත්ත බෙදා ගැනීමෙන් වෙන්න පුළුවන්, සාමාන්‍ය ජනතාවට ලැබෙන්නයි ඕනෑ. අද ඇමතිතුමා ඇතුළු ඒ හැමදෙනාම උත්සාහ දරන්නේ, ලෝකයේ රටවල් -චීනය වෙන්න පුළුවන්, ජපානය වෙන්න පුළුවන්, දකුණු කොරියාව වෙන්න පුළුවන්, මලයාසියාව වෙන්න පුළුවන්- සොයා ගන්නා නව දැනුම, නව තාක්ෂණික මෙවලම්වල පහසුකම අපේ රටේ ජනතාවට ඉතා ඉක්මනින් ලබා දෙන්න අවශ්‍ය කටයුතු මෙහෙයවීමටයි. ඒ සඳහා වන වැදගත් රෙගුලාසි අනුමත කිරීමක් තමයි අවුරුදු 28කට පසුව මේ සිද්ධ වන්නේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ රෙගුලාසි වර්තමානයට අදාළව සංශෝධනය වන්නේ, අවුරුදු 28කට පසුවයි. ඒ වාගේ වැදගත් පනතක් සංශෝධනය වනකොට ඉවකින් හරි විවාදයක් ඉල්ලා කරුණු ඉදිරිපත් කරන්නේ නැතිව, අධ්‍යයනයක් කරන්නේ නැතිව, විපක්ෂයේ කාර්යභාරය ඉෂ්ට කරන්නේ නැතිව මේ තරම් පහත් මට්ටමෙන් වල් පල් දෙඩවීම ගැන කනගාටුව පළ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.44]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

මගේ පරණ මිත්‍රයෙකු වන අපේ හඳුන්නෙත්ති ඇමතිතුමා කථා කළාට පසුව මට කථා කරන්න අවස්ථාව ලැබීම සම්බන්ධයෙන් බොහොම සන්තෝෂ වනවා. එතුමා විපක්ෂයට යම් චෝදනාවක් කළා. හැබැයි එතුමාගේ හෘදය සාක්ෂිය දන්නවා, එතුමාට ලැබුණු නිහතමානීම, decentම විපක්ෂය, මේ විපක්ෂයයි කියන එක. ඔබතුමන්ලා තුන් හතර දෙනෙක් විපක්ෂයේ හිටපු කාලයේ ඔබතුමන්ලා කොයි ආකාරයෙන්ද කටයුතු කළේ කියලා දන්නවා ඇති. ඒ වාගේම COPE එකේ සභාපතිතුමා සඳහන් කළා, "AKD" කියන්නේ brand එකක් කියලා. ඇත්තටම, මම පොඩ්ඩක් හිතලා බැලුවා, එතුමාගේ brand එක, එතුමාගේ ආරම්භය කොහොමද කියලා.

ෆැසිස්ට්වාදය, මාක්ස්වාදය, සමාජවාදය කරේ තියාගෙනයි ඔබතුමන්ලා දේශපාලනය පටන් ගත්තේ. ඊට පසුව එය යම් ආකාරයකට වෙනස් කරලා, පොඩ්ඩක්දුරට සමාජවාදය තමන්ගේ ඇඟ ඇතුළට දමාගෙන, මේ වනකොට ධනවාදය ද, සමාජවාදය ද මොකක්ද කියන එක අමතක වෙලා හිතාගන්න බැරිව ඉන්නවා කොහේද ඉන්නේ කියලා. මම දකිනවා, අපේ ජනාධිපතිවරයා, ඒ වාගේම නලින්ද ජයතිස්ස මැතිතුමා, හරිනි අමරසූරිය මැතිතුමිය වාගේම සුනිල් හඳුන්නෙත්ති මැතිතුමන්ලාත් සෑහෙනදුරට ධනවාදයට බරයි කියන එක. සම්පූර්ණයෙන්ම එය කරන්න හදනවා, හැබැයි ඒක කරගන්න බැහැ. එතුමාට තරහත් ගියා, මම එතුමාට ඒ කාලයේ කිව්වා, කඩයක්වත් කරගන්න බැහැ කියලා. කඩයක කැෂියර් එකක් කරන තැනට මම එතුමාව දැම්මා. එතුමාට ගොඩක් තරහ ගියා. මමත් ඇමෙරිකාවේදී කැෂියර් එකක වැඩ කරලා තිබෙනවා. ඒක ලොකු දෙයක් නොවෙයි. හැබැයි, අද වනකොට ඒ කථාව ඇත්ත වෙලා තිබෙනවා. තමන්ට කඩයක්වත් කරගන්න බැහැ කියන එක මේ ආණ්ඩුව ඔප්පු කර තිබෙනවා. මේ වනකොට මේ ආණ්ඩුව ආර්ථිකය පැත්තෙන් සහ අනිකුත් සෑම පැත්තකින්ම පහළට වැටෙමින් පවතිනවා.

එකින් එක ගත්තොත්, මම පටන් ගන්නම්, කථානායකතුමාගෙන්ම. ඇත්තටම, අද කථානායකතුමා අපට කථා කරන්න දුන්නේත් නැහැ. ඒ අවස්ථාවේ මම කථා කරන්නත් නොවෙයි හිටියේ. හැබැයි, එතුමා අර නියෝජ්‍ය මහ ලේකම්තුමා සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ගය නිසා එතුමාට විරුද්ධව චෝදනා කිහිපයක් එල්ල වෙලා තිබෙනවා.

අපි සහකාර මහ ලේකම්තුමාගෙනුත් මම මේ කියන්න යන කරුණට අදාළව යම් ඉල්ලීමක් කළා. මම පසුගිය වතාවේත් එතුමාට මේ ගැන සඳහන් කළා. කථානායකතුමාගේ ලේකම් - අර PHI මහත්තයා - ලක්ෂාන් කියන ඔබතුමන්ලාගේ receptionist කෙනෙක්ට, ඔහුගේ නම කියලා කථා කරද්දි, එම නිලධාරියා ඒ නම දන්නේ නැතුව කවුද කියලා අහද්දි, පරුෂ වචනයෙන් බැණලා, කථානායකවරයාගේ කාර්යාලයට ගෙන්වා, එම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව ඇදලා තිබෙනවා. පරිපාලනය සම්බන්ධයෙන් ක්‍රියා කරන්න අයිතිය තිබෙන්නේ, මහ ලේකම්තුමිය ඇතුළු ඔබතුමන්ලාගේ කාර්යාලයටයි. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටියා, ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා. හැබැයි, මට ඒ අවස්ථාවේදී පොඩ්ඩක් වැරදුණා; ඒ receptionist කාන්තාවක්ය කියලා වැරදියට සඳහන් කරපු එක මම නිවැරදි කළා. කාන්තාවකට නොවෙයි, ලක්ෂාන් කියන නිලධාරියාට තමයි ඒ අකරතැබ්බයට මුහුණ පාන්න සිදු වුණේ. මේ සම්ප්‍රදායට තනිකර විරුද්ධව, මේ නීති රීතිවලට සම්පූර්ණයෙන් විරුද්ධව එතුමා ඒ අවස්ථාවේදී ක්‍රියා කර තිබුණා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න. ඒ වාගේම ඒ පරීක්ෂණය කරන ගමන්ම කථානායකතුමාට එරෙහිව එල්ල වී තිබෙන චෝදනා සම්බන්ධයෙනුත් සොයා බලන්න. නියෝජ්‍ය මහ ලේකම්තුමා දේශපාලන වශයෙන් පත්වීම ගැන මම කථා කරන්නේ නැහැ. හැබැයි, එතුමා හොඳ සේවයක් අපක්ෂපාතීව කරගෙන ආවා කියන එක අප සියලුදෙනාම පිළිගන්න ඕනෑ. ඒ සේවය කරගෙන යන අවස්ථාවේදී පෞද්ගලික කෝන්තරයක් මත එතුමා ඉවත් කළාය කියනවා. කථානායකතුමාගේ කාර්යාලය තුළ සිදුවන දේවල් අපට අදාළ නැහැ. හැබැයි, ඒක පාර්ලිමේන්තුවට අදාළයි. මේක තමන්ගේ පෞද්ගලික ස්ථානයක් නොවෙයි. එතකොට එතුමාට විරුද්ධව එල්ල වෙලා තිබෙන චෝදනාව මොකක්ද? ගොඩක් වෙලාවට මම ගිහිල්ලා එතුමාට කථා කරනකොටත් ඒ ලේකම්තුමා එහා පැත්තේ ඉඳගෙන ඉන්නවා. සාමාන්‍යයෙන් ඒක සදාචාරාත්මක නැහැ. අපි නිලධාරියෙක් හමුවෙන්න යන්නේ එම නිලධාරියාව තනිවම හමුවෙන්න. සහකාර මහ ලේකම්තුමනි, නිලධාරියෙක් වශයෙන් ඔබතුමාව හමුවෙන්න මම එනවා නම්, ඒ එන්නේ ඔබතුමා හමුවෙන්න, කාර්ය මණ්ඩලය හමුවෙන්න නොවෙයි. එතකොට අපට අවස්ථාව තිබෙන්න ඕනෑ, ඒ නිලධාරියාත් එක්ක කෙළින් කථා කරන්න. නමුත් අපට ඒ අවස්ථාව ලැබෙන්නේ නැහැ. ඒ වාගේම එතුමාට විරුද්ධව වාහන අවභාවිතාව සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් කරලා තිබෙනවා. නීති විරෝධී ලෙස ඉන්ධන දීමනා දෙකක් ලබා ගැනීම සම්බන්ධයෙන් එතුමාට විරුද්ධව චෝදනා එල්ල වී තිබෙනවා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ මාධ්‍ය අංශය සතු උපකරණ අවභාවිතය සම්බන්ධයෙන් එතුමාට චෝදනාවක් එල්ල වී තිබෙනවා. නියමිත මුදල නොගෙවා පාර්ලිමේන්තු ගිණුම යටතේ අමතර දිවා ආහාර පහසුකම් ලබා ගැනීම සම්බන්ධයෙන් එතුමාට චෝදනාවක් එල්ල වී තිබෙනවා. නීති විරෝධී ලෙස විමර්ශන නිලධාරියෙක් පත් කිරීමත්, ඔහුට පාර්ලිමේන්තු ගිණුමෙන් මුදල් ගෙවීම, ආහාර සහ ප්‍රවාහන පහසුකම් ලබා දීමට කටයුතු කිරීම ගැනත් චෝදනා එල්ල වී තිබෙනවා. නීති විරෝධී ලෙස රජයට අයත් නිල නිවාස දෙකක් භාවිත කිරීම, මේ ආදී වශයෙන් තව චෝදනා විශාල ප්‍රමාණයක් එතුමාට එරෙහිව එල්ල වී තිබෙනවා.

දැන් මෙතුමන්ලා සඳහන් කරනවා, නීතිය සියල්ලටම එකයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට හෝ CID එකට හෝ මෙහෙම පැමිණිලි කළොත්, ඒ සම්බන්ධයෙන් කිසිම ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ. මේ ආණ්ඩුවේ තිබෙන සොරකම්, විශේෂයෙන්ම නොරොච්චෝලේ බලාගාරයට ගල්අඟුරු මිලදී ගැනීම සම්බන්ධයෙන් තිබෙන සොරකම බලන්න. මේ සොරකම නිසාම මේ රට වැටෙන්න පුළුවන්. හැබැයි, ඒ සම්බන්ධයෙන් කිසිම ක්‍රියාමාර්ගයක් මේ ආණ්ඩුව ගන්නේ නැහැ; ඒ ආයතන ගන්නේ නැහැ. හැබැයි, අපට මොකක්ද කියන්නේ? අපට විරුද්ධව පැමිණිල්ලක් දැම්මොත් එහෙම චෝදනාවක් නැතුව පවා CID එක, ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම පාවිච්චි කරලා අවුරුදු ගාණක් අපහසුතාවට පත් කරලා උපරිම දණ්ඩනය දෙන්න බලනවා. "AKD" brand එකේ තිබෙන නවතම ආණ්ඩුකරණය තමයි මේක. මෙහිදී ආයතන සියල්ල තමන්ගේ අභිමතයට හරවා ගන්නවා. අධිකරණය අද පුදුම විධියට පීඩනයට පත් කරනවා. උසාවියක bail දෙන නඩුකාරයෙක් හිටියොත්, ඒ නඩුකාරයා අයින් කරනවා. ආණ්ඩුවට ඕනෑ විධියට bail දෙන්නේ නැත්නම් එතැන තිබෙන්නේ වෙනස් විධියක්. උසාවියක bail දීම කියන්නේ රීතියක්. අනිවාර්යයෙන්ම සියයට 99ක් bail දෙන්න ඕනෑ, විශේෂ කාරණාවකදී හැර. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ඒක කරන්නේ නැතුව විශාල ලෙස අධිකරණය පීඩනයට පත් කරනවා, මේ ආණ්ඩුව විසින්.

ඒ වාගේම අධ්‍යාපනය සම්බන්ධයෙන් අද අගමැතිතුමිය සඳහන් කළා. මේ ගෙනෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ 120කට වැඩිය, මම හිතන විධියට 140කට අධික වැරදි ප්‍රමාණයක්

තිබෙනවා. හැබැයි, මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්නේ නැතුව විපක්ෂයට දෝෂාරෝපණය කළා. විපක්ෂයට දෝෂාරෝපණය කරන එක නොවෙයි, කරන්න ඕනෑ. එහෙම කරලා කියනවා, විපක්ෂය විසින් අසහායකරණය කරනවාය කියලා. විපක්ෂය මොකක්ද කරපු අසහායකරණය? අපි බලයේ ඉන්න කොට හිටපු අමාත්‍යාංශය පිළිබඳව ඔබතුමන්ලා බලන්න. අපට ගැහැනු සම්බන්ධයෙන්වත්, පිරිමි සම්බන්ධයෙන්වත්, මුදල් සම්බන්ධයෙන්වත්, අල්ලස් සම්බන්ධයෙන්වත් කිසිම චෝදනාවක් නැහැ. අපි කෙළින් වැඩ කළා. හැබැයි, මේ ආණ්ඩුවට එහෙම නැහැ. මේ ආණ්ඩුවට විශාල චෝදනා තිබෙනවා, ඉන්න ලේකම්වරු සම්බන්ධයෙන්, ඉන්න ලේකම්වරියන් සම්බන්ධයෙන්, අනෙකුත් දේවල් සම්බන්ධයෙන්. අපට පෞද්ගලික දේවල් අදාළ වන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, අපි කියන්නේ මේ රටේ නීතිය හරියට ක්‍රියාත්මක කරන්න කියලායි. නැත්නම් නීතිය අතට අරගෙන මෙහෙම ගියොත් මොකද වෙන්නේ? මොකක්ද අර කථාවක් තිබෙන්නේ, හිට්ලර් කළා වාගේ ගෙස්ටාපෝ පාලනයක් මේ ආණ්ඩුව දැනටම අරන් ඇවිල්ලා ඉවරයි. ඒ කාලයේ නම් ඒවා කරන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මේ කාලයේ, මේ තිබෙන දියුණු තාක්ෂණයත් එක්ක එහෙම කළොත් ආණ්ඩු වැටෙනවා. මේ ආණ්ඩුව වැටෙන්න බලපාන විශාලම හේතුව තමයි, දූෂණය. මේ දූෂණය සම්බන්ධයෙන් මොනවාද කරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගල් අඟුරු සම්බන්ධ කාරණය ගත්තොත්, අපි ගියා, නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයට. එතැන දවසකට විදුලිය මෙගාවොට් 900ක් නිෂ්පාදනය කරන්න ඕනෑ. ඒ මෙගාවොට් 900න් මෙගාවොට් 90ක් යනවා, නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ කාර්යභාරය සඳහා. එතකොට දවසකට මෙගාවොට් 810ක්වත් නිෂ්පාදනය වෙන්න ඕනෑ. හැබැයි, නිෂ්පාදනය වෙන්නේ මෙගාවොට් 705ක වාගේ ප්‍රමාණයක්. මෙගාවොට් 100ක් අඩුවෙන් නිෂ්පාදනය වෙන්නේ, මේ බාල ගල් අඟුරු හින්දා. මේ බාල ගල් අඟුරු කවුද ගෙනාවේ? ටෙන්ඩරය දාන්න ඕනෑ අප්‍රේල් මාසයේදීයි. ඒත් ටෙන්ඩරය දැම්මේ නැහැ, සැප්තැම්බර් මාසය වෙනකම් ඇද ඇද හිටියා. පළමුවෙනි ටෙන්ඩරය දෙන්න හැදුවේ තමන්ගේ හිතවතෙකුට. මේක දීලා තිබෙන්නේත් තමන්ගේ හිතවතෙකුට. මේ හින්දා විශාල විදුලි අර්බුදයක් අනාගතයේදී රටේ ඇති වෙන්න පුළුවන්. ආණ්ඩුව දැන් spot tenders දාන්න උත්සාහ කරනවා. හැබැයි, ගිය ආණ්ඩුවේ spot tenders දමපු සභාපතිට සහ අමාත්‍යවරයාට විරුද්ධව දැනටමත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් නඩු පවරලා අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, මේ ආණ්ඩුව spot tenders දාන්න යනවා. ඒ spot tenders දාන්න යද්දි වෙන පාඩුවට නඩු නැහැ. ඒවාට නීති නැහැ. ආණ්ඩුවේ කටයුතුවලට අධිකරණය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නීති අංශ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. හැබැයි, විරුද්ධ පක්ෂයට පන්න පන්නා ගහනවා. ආණ්ඩුවේ තිබෙන හොර මැරකම් සියල්ල වහගෙන ඉන්නවා. ඒ හින්දා සිදුවෙන මේ විනාශය බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 30ක් නොරොච්චෝලේ බලාගාරයේ තිබෙන මේ විදුලි උපකරණ පාවිච්චි කරන්න පුළුවන්. හැබැයි, මේ බාල ගල්අඟුරු හින්දා මේ කාලය අවුරුදු 25කට වාගේ ප්‍රමාණයකට පහළට එන්න පුළුවන්. මේ උපකරණ පාවිච්චි කරන්න පුළුවන් කාලය අඩුවීම රටට විශාල පාඩුවක්. මොකද, මේ නිසා විශාල ආයෝජනයක් අපතේ යන්න පුළුවන්. තව අවුරුදු 5ක් මේ විදුලි උපකරණ අලුත්වැඩියා කළොත් අවුරුදු 35ක්, 40ක් දක්වාවත් අපට මේ තාප බලාගාරය පවත්වාගෙන යන්න පුළුවන්. හැබැයි, මෙවැනි බාල ගල් අඟුරු දිගින් දිගටම ගෙනාවොත් අපට මේ තාප බලාගාරය තව අවුරුදු 25ක්, 26ක් එහාට පවත්වාගෙන යන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම මේ තුළින් සිදු වන පාඩුව රුපියල් මිලියන ගණනක්. දවසකට මෙගාවොට් 100ක අඩුවක් කියන්නේ, රුපියල් මිලියන 100කට ආසන්න පාඩුවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ පාඩුව කවුද ගෙවන්නේ? මේ පාඩුව කවුරුවත් ගෙවන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "AKD" brand එක ගැන මෙතුමන්ලා කථා කළා. බලන්න, අද වනකොට ඉන්දියාවයි, චීනයයි අතර ඇති වෙලා තිබෙන යුද්ධය. චීනය මේ වනකොට ලංකාවට ලබා දීමට තිබෙන ආයෝජන සියල්ල නවත්වා තිබෙනවා. චීන විදේශ ඇමතිවරයා ජනාධිපතිවරයා මුණ ගැහෙන්න තිබුණා. නමුත්, ඒක නැවැත්වූවා. හම්බන්තොට තෙල් පිරිපහදුව ඉදිකිරීම් කටයුතු මේ වනකොට නැවතිලා තිබෙනවා. මධ්‍යම අධිවේගී මාර්ගය හදන එක මේ වනකොට නැවතිලා තිබෙනවා. සංචාරකයෝ අපේ රටට ගෙනෙනවාය කිව්වා. නමුත්, ඒකත් නවත්වා තිබෙනවා. ආයෝජකයින් අපේ රටින් පිට වෙලා ගිහිල්ලා තිබෙනවා.

ඉන්දියාවත් එක්ක මොකක්ද කළේ? ඉන්දියාව එක්ක හොර රහසේ ගිවිසුම් 8ක් අත්සන් කළා. මේකද "AKD" brand එක? AKD ඒ දවස්වල කථා කළේ මේවාට විරුද්ධවයි. හැබැයි, මේ වනකොට ඉන්දියාවත් එක්ක හොර රහසේ ගහපු ගිවිසුම් මොනවාද කියලා දන්නේත් නැහැ. භෞමික අඛණ්ඩතාවට වාගේම රටේ අනාගතයට විශාල පහරක් මේකෙන් වදින්න පුළුවන්. ඒ වාගේම ටිල්වින් සිල්වා මහත්මයා සහ තව නායකයෝ චීනයට ගිහිල්ලා කියනවා, භය නැතුව පරීක්ෂණ නැව ලංකාවට ගෙනෙන්න කියලා. හැබැයි, චීනයෙන් ඒ පරීක්ෂණ නැව ගෙනෙන්න හදනකොට ඒකට ඉඩ දෙන්නේ නැහැ. මම හිතන විධියට, මේ ආණ්ඩුව තමන්ගේ ප්‍රතිපත්තිය මිශ්‍ර කරගෙන තිබෙනවා. ධනවාදය ද, සමාජවාදය ද, මාක්ස්වාදය ද කියන මේ කිසිම දෙයක් ගැන එක කණ්ඩායමක් ලෙස කටයුතු කරන්නේ නැහැ. ලාල් කාන්ත එකක් කියනවා. අනුර කුමාරයි, හරිනි අමරසූරියයි තව දෙයක් කියනවා. ටිල්වින් සිල්වා තවත් එකක් කියනවා. මේ ආණ්ඩුවට දැන් යන පාර හොයා ගන්න බැරිවයි ඉන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ විධියට රටවල් සංවර්ධනය කරන්න බැහැ. නිවැරදි ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. විවෘත ආර්ථිකය ක්‍රියාත්මක කරනවා නම් ඒවා කොහොමද ක්‍රියාත්මක කරන්නේ, කොයි රටවල් එක්කද සම්බන්ධතාව පවත්වාගෙන යන්නේ, චීනයත් එක්ක කොහොමද කටයුතු කරන්නේ, ඉන්දියාවත් එක්ක කොහොමද කටයුතු කරන්නේ, ඇමෙරිකාවත් එක්ක කොහොමද කටයුතු කරන්නේ කියන එක සම්බන්ධයෙන් නිවැරදි දැක්මක් තිබෙන්න ඕනෑ. මේවා මිශ්‍ර කරගෙන ඒ කටයුතු කරන්න බැහැ. ඒ නිසා මේ යන ගමනේදී විශාල ආර්ථික අවපාතයකට අපට මුහුණ පාන්න සිදු වනවා.

IMF ගිවිසුම සංශෝධනය කරනවාය කිව්වා. නමුත්, IMF ගිවිසුම සංශෝධනය කරන්න බැහැ කියලා IMF එක කියනවා. මහ බැංකු අධිපතිවරයා කිව්වා, දැන් තිබෙන තත්ත්වය අනුව අනිවාර්යයෙන්ම IMF ගිවිසුම සංශෝධනය කරන්න කියලා. මේ අවුරුද්ද වනකොට අපට සියයට 6ක ආර්ථික වර්ධන වේගයක් ළඟා කර ගන්න බැරි වුණොත්, සියයට 3.5න්, සියයට 4න් පහළ මට්ටමක ආර්ථික වර්ධනය තිබුණොත්, තව අවුරුදු දෙකක් ගත වනකොට අනිවාර්යයෙන්ම මේ රට ආර්ථික වශයෙන් විශාල අගාධයකට ඇද වැටෙන්න පුළුවන්. මේ යන ගමන අසාර්ථක ගමනක්. ඒ නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, ප්‍රජාතන්ත්‍රවාදය සහ රටේ දියුණුව සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම තමන්ගේ අවධානය යොමු කරන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිතිඥ හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.55]

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දවසේ, විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාව සම්බන්ධයෙන් වූ රෙගුලාසි පිළිබඳ විවාදයක් තිබෙන්නේ. නමුත්, අද දවස තිස්සේ කෙරෙන මේ විවාදය පිළිබඳව අපි සමාලෝචනයක් කර බලමු. ආණ්ඩු පක්ෂය විධියටත්, විපක්ෂය විධියටත් මතවාදීව, ප්‍රතිපත්ති මත, කරුණු මත, statistics මත තමයි අපි ගැටෙන්න ඕනෑ; මේවා මත තමයි අපි හැප්පෙන්න ඕනෑ. හැබැයි, දැන් ආණ්ඩුවට එරෙහිව ප්‍රතිපත්තිමය වශයෙන් ගැටෙන්නට බැරි වන නිසා දවසේ මාතෘකාවක් ඇදලා ගනිමින් මේක ඕපදූප මඩුවක් බවට පත් කරන්නට උත්සාහ කරනවා දෝ කියලා වෙලාවකට අපට හිතෙනවා. මොකද, අද දවසේ විවාදයකට අපිව කැඳවලා තිබියදී ඒ විවාදය පසෙකලා මේ වනකල් කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඇඟිලි ගණනට ගණන් කරන්න පුළුවන් පිරිසක් තමයි මේ රෙගුලාසි ගැන කථා කළේ.

පාර්ලිමේන්තුවට පැමිණි මුල්ම දවස්වල නවක මන්ත්‍රීවරු විධියට අපිත් ඇත්තටම හිතාගෙන හිටියා, ප්‍රතිපත්ති කරුණු මත විවාද කරන්නට. නමුත්, අද වනකොට මේ රටේ විපක්ෂයට වෙලා තිබෙන්නේ මොකක්ද? කලින්, සතියක් ඇදගෙන යන්න මාතෘකාවක් හොයා ගත්තා. දැන් පැය 24ක් ඇදගෙන යන්නවත් මාතෘකාවක් හොයා ගන්න බැහැ. ඔහොම ගිහිල්ලා අවසානයේ විනාඩියක්වත් කථා කරන්න බැරි වන මට්ටමට තමයි මේ රටේ විපක්ෂය පත් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාව තුළ අදහස් දැක්වීමේදී අතිශය සංවේදී කාරණා තිබෙනවා. අධිකරණමය කාරණා තිබෙනවා. එවැනි අවස්ථාවලදී high-profile cases තිබෙන, සංවේදී නඩු කාරණා තිබෙන, බරපතළ නඩු ගණනක් තිබෙන අය අපේ රටේ prosecutorsලාට එරෙහිව තර්ජනාත්මක විධියට කථා කරනවා නම්, මම හිතන විධියට ඒ සම්බන්ධව අපි අවධානය යොමු කරන්න ඕනෑ. ඒ වාගේම ගරු කථානායකතුමාගේත් අවධානයට අපි යොමු කරනවා, high-profile cases තිබෙන අය රටේ prosecutorsලාට එරෙහිව තර්ජනාත්මක ලෙස කටයුතු කිරීම, එහෙම නැත්නම් ඒ ප්‍රකාශ කිරීම සම්බන්ධව පාර්ලිමේන්තුව විධියට අපි මීට වඩා සමාලෝචනය කර ගත යුතුය කියන කාරණය පිළිබඳව.

අද දවසේ අපි විවාදයට ගන්නා විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාව සම්බන්ධයෙන් වූ රෙගුලාසි මේ පනතේ 17 (2) වගන්තිය යටතේ සඳහන් වන සියලු ක්‍රියාකරුවන්ට අදාළ වෙනවා. මේ හරහා ඇත්තටම සිදු වෙන්නේ දූරකථන සමාගම් විසින් යටිතල පහසුකම් හවුලේ භාවිතයට ඉඩ ප්‍රස්ථාවක් හදා දීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විවාද කරනකොට මේ රටේ ඉන්න සුවහසක් පුරවැසියන් බලාගෙන ඉන්නවා, අපි මේ කාලය යොදවමින් මොනවා ගැන ද සාකච්ඡා කරන්නේ කියලා. එලෙස විමසිල්ලෙන් සිටින ජනතාව දැනුවත් කිරීම සඳහා අද දවසේ අපි මේ සමාලෝචනයට ලක් කරන රෙගුලාසි පිළිබඳව, එහි අවශ්‍යතාව පිළිබඳව සහ ඉන් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව යම් අදහසක් ඔවුන්ට ලබා දිය යුතුයි කියලා මම හිතුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සාමාන්‍යයෙන් මේකට කියනවා, එකම පහසුකම නැවත නැවත ඉදිවීම කියලා. එහෙම නැත්නම් ප්‍රතිබහු ඉදිකරණය අවම කිරීම සඳහා තමයි විශේෂයෙන්ම මේ විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාව පිළිබඳ රෙගුලාසි අද දවසේ අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශේෂයෙන් මෙතැනදී අවධානය යොමු කළ යුතු මූලධර්මයක් විධියට අපිට හඳුනා ගන්න පුළුවන්, regulating telecommunication networks for sustainability කියන එක. ඒ කියන්නේ, තිරසාරාත්මක විධියට අපි telecommunication networks හරහා ජනතාවට ප්‍රතිලාභ අත්පත් කර දෙන්නේ කොහොමද කියන එක.

මෙතැනදී විශේෂයෙන්ම environmental and cost impact sharing vs duplication කියන දෙක අතර තමයි සට්ටනය සිද්ධ වෙන්නේ. අපි මේ සම්බන්ධව ගෝලීය වශයෙන් ගත්තත්, අන්තර්ජාතික වශයෙන් ගත්තත් විවිධ අණපනත් ලෝකය පුරා තිබෙන විවිධ රටවල් සම්මත කරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, International Telecommunication Union සහ ලෝක බැංකුව අතර තිබෙන collaboration එකක් හරහා සම්පාදනය කර තිබෙන Digital Regulation Platform එකේ "Introduction" යටතේ මෙහෙම සඳහන් වෙලා තිබෙනවා: “Despite its critical importance, the infrastructure is now under threat. War, pandemics, climate change, natural disasters, increase in the cost of living and the crises in the global market economy have all heaped pressure on the utility of infrastructure. Therefore, a major rethinking of the role of infrastructure is now underway”. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විධියට වාගේම ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් විධියට ඩිජිටල්කරණය ගැන කථා කරනකොට අපිට තිබෙන එක අභියෝගයක් තමයි, අපි බලාපොරොත්තු වන ඒ digitalization එකට යනකොට මේ infrastructure කියන එක අප මෙහෙයුම් කර ගත යුත්තේ කෙසේද කියන එක. විශේෂයෙන්ම ඉන්දියාව, පිලිපීනය වාගේම දකුණු ආසියාවේ බොහෝ රටවල් මේ වනවිට මෙන්න මේ කියන infrastructure collaborate කර ගන්න එකට, එහෙම නැත්නම් sharing කියන concept එකට ගිහිල්ලා තිබෙනවා. නමුත්, අපි මේ කථා කරන මොහොතේදීත් අපේ රටේ TRC එකට මේ සම්බන්ධව නිසි නියාමනය සහ අධීක්ෂණය සම්බන්ධව බලපවත්වන රෙගුලාසියක් නැති නිසා තමයි මේ රෙගුලාසි සම්බන්ධව සාකච්ඡා කරමින් ඒවා අනුමත කරන්න සූදානමින් සිටින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි smart generation එකක් ගැන කථා කරනවා; තාක්ෂණයේ ඊළඟ අවධිය ගැන කථා කරනවා. හැබැයි, අපි කථා කරන මේ මොහොතේදීත් තමන්ගේ phone එකට සිග්නල් හොයා ගන්න බැරිව ආවරණ කලාපයෙන් බැහැරයි කියන tone එක ඇහෙන මිනිස්සු අපේ රටේ ඉන්නවා. එවැනි ගම්මාන අපේ රටේ තිබෙනවා. ඒකටත් විසඳුමක් අපිට මෙන්න මේ infrastructure sharing කියන concept එක හරහා ලබා ගැනීමේ අවස්ථාව තිබෙනවා. ඒ වාගේම ප්‍රාග්ධන වියදම් අඩු කර ගැනීමටත් අපිට මේ හරහා හැකියාවක් ලැබෙනවා. සෑම තැනකම එක එක ක්‍රියාකරුවන් ලවා කුලුනු ඉදි කරන්න ගියොත්, කුලුනු ඉදිකිරීම සඳහාම විශාල ප්‍රාග්ධනයක් වියදම් වෙනවා කියලා අපි දන්නවා. ඒ වෙනුවට සේවා ගුණාත්මකභාවය වැඩි කරන්නට මේ හරහා අවස්ථාව ලැබෙනවා. එහෙම තමයි මේකේ ප්‍රතිලාභය ජනතාවට ලැබෙන්නේ. අපි කථා කරන මේ රෙගුලාසිය පිළිබඳව ගත්තොත්, විශේෂයෙන්ම තරගකාරිත්වය සෑදීම හරහා සියලු ආයතනවලට, සියලු ක්‍රියාකරුවන්ට තමන්ගේ යටිතල පහසුකම්වලට විතරක් නොවෙයි, සේවාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහාත් වැඩි effort එකක් දරන්නට අවස්ථාව ලැබෙනවා.

ඒ වාගේම පාරිසරික අර්ථයෙන් ගත්තොත්, මම හිතන විධියට පසුගිය කාලයේ ඇති වුණු "දිට්වා" සුළි කුණාටුවත් එක්ක භූමියේ

තිබෙන utility එක සම්බන්ධව අපිට වෙනම තක්සේරුවක් තිබිය යුතුයි. නගර අලංකරණ නිර්මාණය, එහෙම නැත්නම් නගර සැලසුම් නිර්මාණය කරන්න ගියත් අපිට තිබෙන ප්‍රධාන අභියෝගයක් තමයි, අපි සතුව තිබෙන සීමිත ඉඩම් ප්‍රමාණය අපේ ආර්ථික කාරණාවලට ගළපා ගන්නේ කොහොමද කියන එක. ඒක අපිට අභියෝගයක්. ඒකටත් මේ රෙගුලාසි හරහා අපිට අවස්ථාවක් ලැබෙනවා.

හැම තැනම කුලුනු ඉදි කරමින් යන්නේ නැතුව, නිසි ක්‍රමවේදයක් යටතේ, ගිවිසුම්ගතව networks කිහිපයක් එකිනෙකට ඒකාබද්ධ කරගනිමින් sharing concept හරහා අපට නගර නිර්මාණය සඳහාත් අවස්ථාවක් ලැබෙනවා. ඒ වාගේම visual pollution කියන එක, ඒ කියන්නේ, අපේ view එක disrupt වෙනවා නම් අන්න ඒකට අදාළවත් අපි කටයුතු කරන්න ඕනෑ. අපි tourism ගැන කථා කරනවා, සංචාරක ඉලක්කයන්ට යන්න හදනවා. අන්න ඒ වාගේ අවස්ථාවලදීත් අපේ view එක pollute කරගන්නේ නැතුව නගර නිර්මාණ කටයුතු සිදු කිරීමටත් මේක හරහා අවස්ථාව ලැබෙනවා.

අද දවසේ අපි මේ කථා කරන සියලු දේවල්වලට අමතරව මේ හරහා මේ සියලු දේවල් regulate කිරීම සඳහා TRC එකට බලය ලැබෙනවා. එහිදී ඒ ගිවිසුමේ ඇතුළත් විය යුතු කරුණු කිහිපයක් තිබෙනවා. විශේෂයෙන් ගිවිසුම් වර්ගය, ගිවිසුමේ ප්‍රධාන කොන්දේසි, කාල ප්‍රාන්තරය, මිල ගණන් පිළිබඳව වාගේම මහජන සුබසිද්ධිය සඳහා නොවේ යැයි සැලකෙන ඕනෑම ගිවිසුමක් ප්‍රතික්ෂේප කරන්නටත්, TRC එකට බලයක් ලැබෙනවා. කාට හරි සැකයක් තිබෙනවා නම් මේ හරහා මහජනතාවට යම් අවැඩක් සිදු වෙනවාද කියලා, ඒකටත් අදාළ Regulations මේ තුළ තිබෙනවා. ඒ වාගේම තමයි මෙහිදී කොමිෂන් සභාවේ අවසාන තීරණය විධියට නිල වෙබ් අඩවියේ අවසාන තීරණය දැක්වූවාට පසුව දින 10ක කාලයක් දෙනවා මහජන අදහස් ලබා ගන්න. මහජන අදහස්වලට ගරු කරමින් අවසාන තීරණය ලබා දෙන්නට කොමිෂන් සභාවට බලය තිබෙනවා. ඒ හරහා එක්කෝ අනුමත කිරීම, එහෙම නැත්නම් ප්‍රතික්ෂේප කිරීමට කොමිෂන් සභාවට බලතල ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නැවත වතාවක් සඳහන් කරන්න කැමැතියි, ආණ්ඩුවක් විධියට අපි ප්‍රතිපත්තිමය කාරණාත් එක්ක ඉස්සරහට යන බව. අපට තිබෙනවා ප්‍රතිපත්තියක් digitalization කියලා. ඒක වචනයකට විතරක් සීමා නොකර ඒකේ ප්‍රතිලාභය ගමට දැනෙන්න, ගමට සන්නිවේදනය අරගෙන යන්නට අපි ප්‍රතිපත්ති, රෙගුලාසි, තීන්දු තීරණ ගනිමින් ඉන්න අතරේ අපට සිදු වෙලා තිබෙනවා, මේ ඕපදූපවලටත් උත්තර දෙන්න. හැබැයි, මම හිතනවා, මේ රටේ සබුද්ධික ජනතාව මේ තත්ත්වය තේරුම් ගනීවි කියලා. මේ සභාවේ මහජන ගැලරියේ ඉඳගෙන බලාගෙන ඉන්න දරුවන්ටත් තේරෙනවා ඇති, ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය අතර වෙනස මොකක්ද කියලා. ලෝකයේ කිසිම විපක්ෂයකට අපේ විපක්ෂයට වෙලා තිබෙන ඇබැද්දිය වෙන්න එපා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. M.K.M. ASLAM left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 2.05]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ අපට කථා කරන්න තිබෙන දේවල් වැඩි වෙලා තිබෙනවා. මේගොල්ලන් දවස ගණනේ මාතෘකා දහය ගණනේ වාගේ දෙනවා. අපට පැයෙන් පැයට මාතෘකා දෙනවා. දැන් කර ගන්න දෙයක් නැහැ. අන්තිමට දුන්නු මාතෘකාව තමයි, ඊයේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් චමින්ද කුලරත්න මහතා ගිය කාරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමුවැනි වතාවටයි නියෝජ්‍ය මහලේකම්වරයෙක් කථානායකවරයාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා තිබෙන්නේ. නියෝජ්‍ය මහ ලේකම් හැටියට එතුමාට ඒ තනතුර තාවකාලිකව හරි නතර කළා නම් ඒ පිළිබඳවත් ගැටලුවක් තිබෙනවා. ඒ තනතුර එතුමාට අහිමි කිරීමට කථානායකතුමාට තිබෙන බලය පිළිබඳව, ඒ කරපු පරීක්ෂණය පිළිබඳව දැවැන්ත ගැටලුවක් තිබෙනවා. අපි ඉතාම ඕනෑකමින් මේ කාරණය කියනවා.

මේ උත්සාහ කරන්නේ ජනතා විමුක්ති පෙරමුණට - පැලවත්තට - ඕනෑ විධියට මුළු රටම පාලනය කරන්න. විගණකාධිපති තනතුරට තමන්ගේ ගෝලයෙක්ව දාන්න හදනවා. තමන්ට ඕනෑ විධියට කරන්න බැරි වෙනකොට නීතිපතිතුමාට ප්‍රහාර එල්ල කරනවා. මේ පාර්ලිමේන්තුවත් පාලනය කරන්න උත්සාහයකයි යෙදෙන්නේ. අද ඒක ඉතාම පැහැදිලියි. මේ රටම පැලවත්තට ඕනෑ විධියට පාලනය කරන්න හදන්නේ. පැලවත්තට ඕනෑ විධියට මුළු රටම පාලනය කරන්න හිතන්න එපා. 1988-89 කාලයේ නම් එහෙම වෙන්න ඇති. තමුන්නාන්සේලා වෙඩි තියලා මිනී මරලා, 1988-89දී කළ විධියට රට පාලනය කරන්නද යන්නේ ආයෙත්? ඒවා නම් හරියන්නේ නැහැ. ඒ දවස්වල තමයි තුවක්කු පෙන්වලා, ගල්කටස් පෙන්වලා, තුණ්ඩු දාලා, කඩවල්, ටවුම් වහලා රට පාලනය කළේ. ඒ සෙල්ලම් කරන්න හම්බ වෙන්නේ නැහැ. කරුණාකරලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ගරු

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

කරන්න. මේ රටේ ස්වාධීන ආයතන තිබෙනවා. ඒ ස්වාධීන ආයතන ස්වාධීන ලෙස කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතුව ගල්කටස් එක පෙන්වලා 1988-89 කාලයේදී කරපු විධියට කරන්න බැහැ.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටත් මේක හොඳ අවස්ථාවක්. එම කොමිසමට තිබෙන ලොකුම චෝදනාව තමයි විපක්ෂයට එක නීතියක්, ආණ්ඩු පක්ෂයේ අයට තව නීතියක් විධියට කටයුතු කරනවා කියන එක. රටේ තුන්වැනි පුරවැසියාට -කථානායකවරයාට- මේ එල්ල කර තිබෙන්නේ එසේ මෙසේ චෝදනා නොවෙයි. ඉතාම බරපතළ චෝදනා. මේ බරපතළ චෝදනා පිළිබඳව හැකි ඉක්මනින් විමර්ශනයක් සිදු කිරීම ඉතාම වැදගත්. මේ පිළිබඳව අල්ලස් පිළිබඳ කොමිසමේ විශේෂ අවධානය යොමු කරන්න.

වාහන අවභාවිතයක් ගැනත් කියනවා. අනික තමයි මේවා කියන්නේ යූටියුබ්කාරයෙක්වත්, එහෙම නැත්නම් smartphone එකක් තිබෙන වීරයෙක්වත් නොවෙයි. පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් කථානායකවරයාට චෝදනා කරනවා, නිල වශයෙන් වාහන දෙකක් තිබෙද්දී වාහන තුනක් පාවිච්චි කරනවා කියලා. වාහන තුනක් පාවිච්චි කරනවා විතරක් නොවෙයි, නීති විරෝධී ලෙස ඉන්ධන දීමනා දෙකකුත් ලබා ගන්නවා ලු. කථානායකවරයා විධියට එක දීමනාවකුත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට තවත් දීමනාවකුත් ලබා ගන්නවා ලු. මේවා එසේ මෙසේ විධියට නොවෙයි, කියා තිබෙන්නේ. ඔහු විසින් මේ වන විට තමාට නිල වශයෙන් හිමි වාහන දෙකට අමතරව පාර්ලිමේන්තුව සතු WP NC-4923 දරන වෑන් රථයද තම පෞද්ගලික පරිහරණයට භාවිත කරනවා ලු. කෙළින්ම වාහනයේ අංකයේ ඉඳන්ම කියලා තිබෙන්නේ. තමුන්නාන්සේලා ආවේ කොහොමද? "අනේ, අපට වාහන එපා. අපට V8 එපා" කිව්වා. මම මේ මාධ්‍යවේදීන්ට කියනවා, කරුණාකරලා බලන්න, පාර්ලිමේන්තුවට V8 කීයක් එනවාද කියලා. තමුන්නාන්සේලා එපා කිව්ව වාහන ටික පාර්ලිමේන්තුවට පෝලිමේ එන්නේ; බෙන්ස්වලින්, රේන්ජ් රෝවර්වලින් එන්නේ. පුළුවන් නම් පොඩ්ඩක් බලන්න. එක පැත්තකින්, වාහන එපා කියලා ආපු අයට කැබ් 1,700ක්ද කොහේදෝ ගේනවා. අනෙක් පැත්තෙන්, වාහන දෙකට අමතරව තුනක් පාවිච්චි කරලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අනේ, මම දන්නේ නැහැ. අපේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්වරයා කථානායකවරයාට විරුද්ධව මෙහෙම පැමිණිලි කරනකොට අපට ලජ්ජයි.

තව කාරණා තිබෙනවා. පාර්ලිමේන්තුවේ මාධ්‍ය අංශය සතු උපකරණත් අවභාවිත කරනවා ලු. පාර්ලිමේන්තුවේ තිබෙන මාධ්‍ය අංශය එකක්, කථානායකතුමාට තිබෙන මාධ්‍ය අංශය තව එකක්. පාර්ලිමේන්තුවේ මාධ්‍ය අංශය කථානායකවරයා සම්බන්ධයෙන් පමණක් කටයුතු කරන්න බැහැ.

ඒ විතරක් නොවෙයි. ඊළඟ කාරණාව තමයි, නියමිත මුදල නොගෙවා පාර්ලිමේන්තු ගිණුම යටතේ අමතර දිවා ආහාර පහසුකම් ලබා ගැනීම. අයියෝ! මේ, පාර්ලිමේන්තුවේ කැන්ටිම වහන්න ආපු අය නේද මේ? තමුන්නාන්සේලා වේදිකාවක් ගාණේ කිව්වේ, "පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මාර කෑමක් කන්නේ, මේ කැන්ටිම වහන්න ඕනෑ" කියලා නේ. කැන්ටිම වහන්න ආපු අය වුණාට අද වනකොට පාර්ලිමේන්තුවේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ වාගේ වැඩ. මම දන්නේ නැහැ, කථානායකතුමාගේ පෞද්ගලික ලේකම් මහත්තයෙකුත් කථානායකතුමාත් එක්කම හැමදාම කෑම කනවා ලු. කෑම කෑවාට කමක් නැහැ. අපට ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. ඒකේ බිල ගෙවන්න. තමුන්නාන්සේලා බලයට ආවේ "කැන්ටිමේ නිකම් කන්නේ, පාර්ලිමේන්තුවේ කැන්ටිමෙන් අය කරන මුදල් ප්‍රමාණය අඩුයි, ඒක වැඩි කරන්න ඕනෑ" කියලා නේ. එහෙම නේ ආවේ. දැන් ඒවා වැඩි කරලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මොකක්ද, ඒකේ තේරුම? වැඩි කරලා හොරෙන් කනවා. පුදුම කට්ටිය නේ මේ. මෙන්න මේ විධියට තමයි තමුන්නාන්සේලා මේ රටේ ජනතාව අන්දලා බලයට ඇවිල්ලා තිබෙන්නේ. අයියෝ! මේවා කියන්නත් ලජ්ජයි අප්පා. මොනවාද තව කියන්නේ? "මෙසේ කථානායකතුමා ආහාර ලබා ගන්නා කාමරයේදී පෞද්ගලික ලේකම්වරයාද එතුමා සමඟ ආහාර අනුභව කරන්නේ නම්, ඒ සඳහා කථානායකවරයා විසින් අමුත්තෙකුට ආහාර ලබා දීම වෙනුවෙන් වැය කරන මුදල ගෙවිය යුතු බව 2025 වසරේ මුල ගරු කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද පාර්ලිමේන්තුවේ අංශ ප්‍රධානීන්ගේ රැස්වීමේදී අදාළ නිලධාරීන් විසින් අවධාරණය කරන ලදී. එහිදී කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ, මින් ඉදිරියට එසේ සිදු නොවන බවයි. නමුත්, එතැන් සිට මේ දක්වාම ඒ ආකාරයෙන් දෙදෙනාම එකම කාමරයේදී දිවා ආහාර ලබා ගැනීම සිදු කරනු ලබයි."

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
වෙලාවත් අඩු කළාද දන්නේ නැහැ. එහෙම කළේ නැහැ නේද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒ විතරක් නොවෙයි. නීති විරෝධී ලෙස විමර්ශන නිලධාරියෙක් පත් කිරීමටත්, ඔහුට පාර්ලිමේන්තුවෙන් මුදල් ගෙවීමටත්, ආහාර සහ ප්‍රවාහන පහසුකම් ලබා දීමටත් කටයුතු කරලා තිබෙනවා. කරුණාකරලා මේ ගැන අවධානය යොමු කරන්න ඕනෑ.

මෙතැන තවත් බරපතළ කාරණාවක් තිබෙනවා. තමුන්නාන්සේලා බලයට ආවේ, "අපිට නිල නිවාස එපා" කියලා.

එහෙම නේද? නිල නිවාස වහනවා කිව්වා. නිල නිවාස එපා කියලා ආපු මේ කණ්ඩායම දැන් රජයට අයත් නිල නිවාස දෙකක් නීති විරෝධී ලෙස පාවිච්චි කරලා. කථානායකතුමා නිල නිවාස එපා කියලා එක පැත්තකින් මාධ්‍යයට ප්‍රකාශ කරනවා. තමුන්නාන්සේලා මේ රටේ ජනතාව ඇන්දුවා, පුදුම ඇන්දිල්ලක්! ඇන්දුවේ කොහොමද? "අපි නිල නිවාසවලට එන්නේ නැහැ, සාමාන්‍ය ජනතාවට නොලැබෙන කිසිම වරප්‍රසාදයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපිට එපා" කියලායි තමුන්නාන්සේලා බලයට ආවේ. තමුන්නාන්සේලා එදා කිව්වේ කොහොමද? තමුන්නාන්සේලා රටේ ජනතාවගෙන් ඇහුවා, "අනේ, කැමැති නැද්ද, යුරෝපයේ වාගේ බස් එකෙන්, train එකෙන් පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරුන් දකින්න?" කියලා. දැන් අපේ රටේ ජනතාවගෙන් මම අහනවා, මොන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාද බස් එකෙන් ආවේ කියලා. එහෙම එන එක් කෙනෙකුවත් දැකලා තිබෙනවාද? කෝච්චියෙන් ආපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් දැකලා තිබෙනවාද? දැන් නිල වාහනත් ඕනෑවට වඩා අරගෙන තිබෙනවා. නිල වාහන එපා කිව්ව අයට දැන් කැබ් රථ 1,700 ගණනක් order කරලා. ඒ වාගේම, V8වල යන්න ඕනෑ නැහැ කියපු අය දැන් V8වල, Mercedes-Benzවල, Range Roverවලයි යන්නේ. දැන් ජනාධිපතිතුමාත් අලුතින් වාහන ගෙනැල්ලා.

ඒ විතරක් නොවෙයි, නිල නිවාස ඕනෑ නැහැ කිව්ව අය දැන් නිල නිවාස ගන්න පටන් අරගෙන තිබෙනවා. මේ ලජ්ජා නැති වැඩේ කරන්න එපා. කරුණාකරලා මේ පිළිබඳව විමර්ශනයක් සිදු කරන්න. මේක පාර්ලිමේන්තුවට වෙච්ච නිග්‍රහයක්. ඉතිහාසයේ කවදාවත් මේ වාගේ දෙයක් සිදු වෙලා නැහැ. ඒ නිසා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මේ ගැන විශේෂ අවධානයකින් කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.15]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතන විධියට, විපක්ෂය එක්කෝ අද මාතෘකාව දන්නේ නැහැ. එහෙම නැත්නම් පුරුද්දටයි පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. ඒ අයට කිසිම අදාළත්වයක් නැහැ, අද දවසේ මාතෘකාව. ඉතින්, ඔහොම තමයි හැමදාම. රටට වැදගත් කිසි එකක් ඒ අයට අදාළ නැහැ නේ.

දැන් පච තොගයක් කිව්වා; අමු බොරු තොගයක් කිව්වා. බොරු කියලා, කියලා දැන් කැබ් රථ එක්දහස් හත්සිය ගණනක් ගැනත් කිව්වා. පාර්ලිමේන්තුවේ ඉන්නේත් මන්ත්‍රීවරු 225යි. ඇයි, කැබ් රථ 8 ගණනේ ගන්නද, 1,750ක් ගෙන්වන්නේ? ඉඳලා හිටලා පාර්ලිමේන්තුවට ආවාමත් ඔය වගේ case වෙනවා. මොකද, දන්නේ නැහැ නේ, අතරමැද වුණේ මොකක්ද කියලා. අය වැය කථාව අහලාත් නැහැ. ඒ මොකුත් දන්නේ නැතුව මෙතැනට ඇවිල්ලා කථා කරනවා. මේ රටේ හැමෝම දන්නවා, කැබ් රථ ටික ගෙනෙන්නේ රාජ්‍ය යන්ත්‍රණයේ තිබෙන අඩුපාඩු පිරවීමේ කටයුත්තටත් එක්කයි කියලා. ඕවි ඉතින්, මේ අය ඉඳලා හිටලාවත් සම්බන්ධීකරණ කමිටුවකට එන්නේ නැහැ නේ. එන්නේම නැහැ. අපේ පැත්තේ නම් මම වැඩිය දැකලා නැහැ. ඉඳලා හිටලා ප්‍රධාන රැස්වීමකට ඔහේ එක්කෙනෙක් දෙන්නෙක් එනවා, නින්දෙන් ඇහැරුණා වාගේ. අනෙක් අය කොහොමටවත් එන්නේ නැහැ. එහෙම එන්නේ නැතුව කොහොමද, රටේ ප්‍රශ්න ගැන දැන ගන්නේ? ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවකට ආවාම තමයි ඒවා තේරෙන්නේ. ඔය බලන්න, එතුමා දැනුත් යන්න යනවා. ආවා, කිව්වා, ගියා. ඔච්චර තමයි. යන ගමන් රෙස්ටුරන්ට් එකෙන් කාලාත් යන්න. ආවා, බොරු ටිකක් කිව්වා, ගියා; එච්චරයි. සම්බන්ධීකරණ කමිටුවකට එන්න එපා යැ, අඩුම තරමින් රටේ යටිතල පහසුකම්වල ප්‍රශ්න, රාජ්‍ය නිලධාරින්ට ගමනාගමනයට තිබෙන ප්‍රශ්න, සෞඛ්‍ය අංශවලට තිබෙන ප්‍රශ්න, MOHලාට වාහන නැති ප්‍රශ්නය වාගේ ප්‍රශ්න ගැන දැන ගන්න. මෙච්චර කාලයක් මේ රට කරවපු මිනිස්සු නේ මේ.ඒ නිසා ඉතින්, ඒ අය ගැන කථා කරලා වැඩක් නැහැ. තනිකර බොරු ගොඩක් නේ ඒ කිව්වේ.

අර බොරු ජොෂ්ය්‍යා ඉන්නවා නේ. කවුද? බදුල්ලේ මන්ත්‍රීතුමා, චාමර සම්පත් මන්ත්‍රීතුමා. එතුමා කියපු ගමන් ඒ voice -cut එක ගහනවා, චැනල් එකකින්. හැබැයි, ඒකට දීපු උත්තරවත්, මොකුත් දමන්නේ නැහැ. එතුමා දැන් සීනි වෙළෙඳ සැලක් ගැනත් කිව්වා. මා හිතන විධියට, ඒ පිළිබඳ අසත්‍ය ප්‍රචාර යන කොට එතුමා සිග්නල් තිබෙන තැනක ඉන්න ඇති. ඒක හින්දා සීනි වෙළෙඳ පොළ හරි, සීනි කඩේ හරි වහලා කියලා දැක්කා. හැබැයි, ඒක සීනි සමාගමෙන් නිවැරදි කරපු මාධ්‍ය නිවේදනය එතුමා දකින්න නැතිව ඇති. එතකොට එතුමා සිග්නල් නැති හරියකයි ඉන්න ඇත්තේ. ඒ හින්දාම තමයි අපි මේ සිග්නල් හදලා දෙන්න හදන්නේ. මොකක් හරි පොඩි අවුලක් තිබෙනවා. මොකද, ඒගොල්ලන් යන යන දිහාවල සමහර වෙලාවට සිග්නල් නැහැ. සමාජ මාධ්‍යවල බොරු ටික නම් ඒගොල්ලන්ට එනවා. ඒවා නිවැරදි කරන හෝ සත්‍ය හෝ news ටික එන්නේ නැහැ. එක්කෝ, එතුමන්ලාගේ devicesවලටත් එක්කම එතුමන්ලාගේ ලෙඩේ බෝ වෙලායි තිබෙන්නේ.

2024 අංක 1 දරන විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාවේ රෙගුලාසි පිළිබඳව ආණ්ඩු පක්ෂය විධියට අපිම කථා කරන්නම්. මොකද, බොහෝදුරට විපක්ෂයට මේක අදාළ නැහැ. මට කලින් විපක්ෂයේ කවුරුවත් මේ ගැන විශේෂයෙන් කථා කළේත් නැහැ. නමුත්, ජනතාවට වැදගත් නිසා අපි කථා කරන්න ඕනෑ, මොකක්ද වෙන්න යන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සන්නිවේදනය හෝ විදුලි සංදේශ ක්ෂේත්‍රය කියන්නේ විශේෂ ක්ෂේත්‍රයක් නොවෙයි කියලා අපි දන්නවා. දැන් එය සාමාන්‍යයෙන් හැමෝම පාවිච්චි කරන තැනට ඇවිල්ලා නේ තිබෙන්නේ. දුරකථන පහසුකම් ගෙන බැලුවොත්, අපේ රටේ දුරකථන කුලුනු විශාල ප්‍රමාණයක් තිබෙනවා. දිස්ත්‍රික්ක 25 තුළ 8,633ක් තිබෙනවා. විවිධ ආයතනවලට අයිති දුරකථන කුලුනු සහ 5Gවලට සහ multipurpose විධියට අලුතින් ආපු කණු තිබෙනවා. මේ ඔක්කොම ගත්තොත් 8,633ක් තිබෙනවා. මා අත තිබෙන මේ diagram එකේ පෙනෙන්නේ, ඒවා කොයි තරම් පැතිරිලා තිබෙනවාද කියන එකයි. අපි ගමනක් යද්දී සාමාන්‍යයෙන් අපට හැම තැනම towers පෙනෙන්න තිබෙනවා. ගොඩක් අඩුයි එහෙම නැති තැන්. ආවරණය තිබුණාට ප්‍රශ්නය තිබෙන්නේ ඒවායේ quality එක සම්බන්ධවයි. එක්කෝ data transfer කර ගන්න අමාරුයි; එහෙම නැත්නම් අඛණ්ඩ සේවාවක් ලැබෙන්නේ නැහැ; එහෙමත් නැත්නම්, වේගය අඩුයි. විශේෂයෙන්, කඳුකර ප්‍රදේශවලට. ඒවායේ සේවා ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රශ්නයක් අපට තිබෙනවා.

මේක කර්මාන්තයක්; industry එකක්; ව්‍යාපාර ක්ෂේත්‍රයක්. ඒ නිසා මේ ආයතන ප්‍රාග්ධනය යොදවන කොට ඒගොල්ලෝ

[ගරු තනුර දිසානායක මහතා]

පරිස්සම් වෙනවා තමන්ගේ ප්‍රාග්ධනය ඉතාම ඵලදායී විධියට යොදා ගන්න. සමාගමක් දුරකථන කුලුනු හෝ යටිතල පහසුකම් හැදුවාට පස්සේ ඒක තනි සමාගමක් විසින්ම පවත්වාගෙන ගියාම, ඒක එම ආයතනයට ආර්ථික වශයෙන් ඵලදායි නැහැ. ඒ නිසා එම ආයතන ආයතන කථා කරගෙන ගිවිසුම්වලට ගිහිල්ලා facility එක share කර ගන්න පුරුදු වෙලා ඉන්නවා. එක්කෝ towers, එහෙම නැත්නම් ඒ towers ක්‍රියා කරවන්න ඕනෑ කරන facilities. එය, විදුලි බලය වෙන්න පුළුවන්, generators වෙන්න පුළුවන්. කොහොම වුණත් towers share කර ගන්න ඒ අය පුරුදු වෙලා ඉන්නවා. ඒක, agreement එකකින් යන්නේ. හැබැයි අපට අදහසක් නැහැ, මේ යටිතල පහසුකම් share වීම සම්බන්ධයෙන්. මේක කර්මාන්තයක් වගේම සේවාවක් සහ රටට ඉතාම වැදගත් දෙයක්. ඒ නිසා මෙය අනිවාර්යයෙන්ම නියාමනයට ලක් වෙන්න ඕනෑ. මේ ආයතනවල ප්‍රාග්ධන වියදම වැඩි වුණාට පස්සේ සහ මේ ආයතන අතර ඇති ගිවිසුම් නියාමනය කර ගන්න තැනක් නැති වුණාට පස්සේ, එය මිල ඉහළ යෑමට බලපානවා. එක පැත්තකින්, සේවා ගුණාත්මකභාවය වැඩි කරන්න අපට ඕනෑ. ලංකාවේම විදුලි සංදේශ සේවා ගුණාත්මකභාවය වැඩි කරන්න ඕනෑ. ඒ වාගේම ඒවායෙහි මිල අඩු කරවන්නත් ඕනෑ. මිල අඩු කරන්න නම් ඒගොල්ලන්ගේ ප්‍රාග්ධන වියදම අඩු වෙන්න ඕනෑ. ඒ සඳහා අප විසින් නියාමනයක් කරන්න අවශ්‍ය වෙනවා. මේ රෙගුලාසි නිසාම දැන් TRCSL එකට මැදිහත් වෙන්න පුළුවන් ඒවා නියාමනය කරන්න. Feasibility studies කරන්න, මිල ගණන් නියාමනය කරන්න, සාකච්ඡා කරන්න මැදිහත් වීමේ අවස්ථාව ඒ අයට ලැබෙනවා.

ඒත් එක්කම, විපක්ෂයේ තවත් මන්ත්‍රීතුමෙක් කිව්වා "මේ රටේ ඔක්කොම අනෙක් පැත්තට යන්නේ. ඔක්කොම බිඳ වැටිලා තිබෙන්නේ. ඔක්කොම ආයතන පාඩු ලබනවා" කියලා. මොකක් හරි අවුලක් තිබෙන්න ඇති ඒගොල්ලන්ට. මොකද, පෙනෙන දේ reverse වෙලායි ඒගොල්ලන්ට පෙනෙන්නේ. ඒ නිසා ඔය වාගේ කථා තමයි කියන්නේ.

2024 වර්ෂයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - TRCSL එක - බලපත්‍ර ගාස්තු ආදියෙන් රුපියල් බිලියන 37ක් ආදායම් ලබා තිබෙනවා. රුපියල් බිලියන 8.6ක වියදමක් ඒගොල්ලෝ කරලා තිබෙනවා. 2025 වර්ෂයේ ආදායම රුපියල් බිලියන 45.3යි; වියදම රුපියල් බිලියන 5.4යි. මේ ඉලක්කම්වලින් පෙනෙන යථාර්ථය මේගොල්ලන්ට පෙනෙන්නේ නැති එක ගැන බලන්න කියලා ජනතාවට තමයි කියන්න වෙන්නේ. විපක්ෂයට මොකක් හරි අවුලක් වෙලායි තිබෙන්නේ. මොකද, ඒ අය සැහෙන පටලැවිල්ලක ඉන්නේ, මේ කාලයේ; කර ගන්න දෙයක් නැතිවයි ඉන්නේ. අදාළ මාතෘකාව දන්නේත් නැහැ. බොරු තමයි තනිකරම කියන්නේ.

අපි "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතිය ගෙනාවේම අර යථාර්ථය, බිමේ ප්‍රශ්නය තේරුම් ගත්ත නිසා. මොකද, මේකෙදි අලුතෙන් සමාගමක් යටිතල පහසුකම් සඳහා ආයෝජනය කරනකොට ගැටලු මතු වෙනවා. මොකද, අපි දන්නවා, කාලයක් තිස්සේ යටිතල පහසුකම් හදලා මේ කුලුනු හදන්න පුළුවන් හොඳම තැන්වල හදලා තිබෙන්නේ කියලා. එතකොට අලුත් තැන් ගන්න ගියාම ආයතන 21කින් අවසර ගන්න ඕනෑ. ඒක මාස 10ක් විතර යන ක්‍රියාවලියක්. ඒ වාගේම තමයි, සමාගම්වලට වෙන වෙනම එහෙම තැන් ගන්න ගියාම ඒගොල්ලන්ට තිබෙන මූලික පිරිවැය; වියදම වැඩියි. ඒ නිසා අපි TRCSL එකත් එක්ක එකතු වෙලා අපේ ආණ්ඩුවේ යම් වැඩ පිළිවෙළක් විධියට - අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේත් තිබෙනවා, මේ යටිතල පහසුකම් share කරගන්න එක ගැන - අපි අලුතෙන් දුරකථන towers ප්‍රමාණයක් හදන්න දාලා තිබෙනවා, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවලට. අපි ගිය අවුරුද්දේ යම් ප්‍රමාණයක් හදලා තිබෙනවා. මේ අවුරුද්දේත් අපි සමස්තයක් වශයෙන් සන්නිවේදන කුලුනු 79ක් හදලා තිබෙනවා. තව සන්නිවේදන කුලුනු 150ක විතර ප්‍රමාණයක් මේ අවුරුද්දේ හදන්න බලාපොරොත්තු වෙනවා.

අපි මෙතැනදී විශේෂ දෙයක් කරන්න උත්සාහ කරනවා. මේ රෙගුලාසි හරහා ඒ සඳහා අවස්ථාවක් ලබා දී තිබෙනවා. මෙච්චර කල් මේ යටිතල පහසුකම් - infrastructure - හැදුවේ දුරකථන සන්නිවේදන ක්ෂේත්‍රයේ ඉන්න, විදුලි සන්දේශ ක්ෂේත්‍රයේ ඉන්න සේවා සපයන සමාගම්ම තමයි. එතකොට වෙන කෙනෙකුට යටිතල පහසුකම් හදන්න අවස්ථාවක් හරියට තිබුණේ නැහැ. දැන් අපිට දුරකථන සන්නිවේදන සංඛ්‍යාත අයිති නැති, එහෙම නැත්නම් ජාලයක් හසුරුවන්නේ නැති ආයතනයකට ලයිසන් එකක් දෙන්න පුළුවන්, යටිතල පහසුකම් හදන්න. එතකොට අපිට පුළුවන්, ආයතන ගොඩකට තිබෙන බර අඩු කරලා, යටිතල පහසුකම් දියුණු කරන්න. එතකොට ඒ ආයතනය එන්නේ යටිතල පහසුකම් හදන්න. එතකොට ඒගොල්ලන්ට ඒවා negotiate කරගන්න පුළුවන්, හොඳ ශක්තිමත්, resilient sites ප්‍රමාණයක් හදන්නත් පුළුවන්. පසුගිය කාලයේ ඇති වුණු සුළි කුණාටු අවස්ථාවේදීත් ගොඩක් වෙලාවට වුණේ fibre networks කඩලා ගියපු එක, එහෙම නැත්නම් හරියට ඉන්ධන තිබුණේ නැති එක, එහෙම නැත්නම් generators offline වුණු එක. Fibre networks කැඩී ගියාට පස්සේ අපිට core network එකට connect වෙන්න බැරි වුණා. එතකොට විශේෂයෙන් යටිතල පහසුකම්වලට ආයෝජනය කරන සමාගම්වලට පුළුවන්, infrastructure හදලා agreements හරහා ජාල සබඳතාවය දෙන ආයතනවලට ඒවා දෙන්න.

විශේෂයෙන්ම අපි දැන් 2G towersවල ඉඳලා 5G, 6G towers දක්වා යනවා නේ. 4G towers, 3G towers වාගේ ඒවා නම් ටිකක් ඈතින් ඈතින් තිබෙන්නේ. මීටර් 500, කිලෝමීටර 2, 3 වාගේ. කිලෝමීටර 10, 15 ඈතිනුත් තිබෙනවා. හැබැයි දැන් අපි 5G කුලුනුවලට තමයි ක්‍රියාත්මක වෙමින් පවතින්නේ. 5G වලට එනකොට ඒක city designingවලට සහ visual pollutionවලටත් බලපානවා. මොකද, ඒ 5G poles ළඟ ළඟ සවි කරන්න වෙනවා; එක්කෝ buildings උඩ හරි සවි කරන්න වෙනවා. එතකොට සමාගම් ඔක්කෝම තම තමන් 5G poles සවි කරන්න ගත්තොත් නගරවල - townsවල - බැලුවාම අපට පේන්නේ කණු ගොඩක් විතරයි. ඒ නිසා ඇත්තටම අපි හිතන්න ඕනෑ, ඊට වඩා එහාට, ඒ කියන්නේ පරිසරයත් ආරක්ෂා කර ගනිමින් පොදු එකඟතාවන් සහිතව මේ රෙගුලාසි යටතේ නියාමනය කරන විදුලි සන්දේශ ක්ෂේත්‍රයක් ගැන. මේ කාරණා ටික විතරක් නොවෙයි, අපි මේ සමස්තය එක්ක, විදුලි සන්දේශ ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය, පරිසර ආරක්ෂාව, ඒ ආයතනවලට තිබෙන ප්‍රාග්ධන වියදම අඩු කරලා මහජනතාවට ඒ සඳහා ලැබෙන මිල අඩු කිරීම වාගේ විශාල ඉදිරි පැත්තකට යන්න තමයි හදන්නේ ඩිජිටල්කරණයත් එක්ක. අපේ අරමුණ විශේෂයෙන්ම ඩිජිටල්කරණය සහ අංකිත ආර්ථිකය. ඩිජිටල් ආර්ථිකය කියන්නේ ප්‍රධානම දෙයක්. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වෙනුවෙන් කළ යුතු Regulations ටික කරගෙන TRCSL ආයතනයට අවශ්‍ය නෛතික බලය ලබා දී තිබෙනවා. ඒක තමයි අපේ මූලිකම අවශ්‍යතාව වෙලා තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)

මීළඟට, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.26]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද සන්නිවේදනය ගැන කථා කරනකොට විශේෂයෙන්ම අද මුළු රටටම සන්නිවේදනය වෙලා ඉවරයි, මේ ආණ්ඩුව හැම දේම අනා ගන්නවා කියලා. හොඳම උදාහරණය තමයි, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමාව අයින් කරන්න ගිහිල්ලා අද ආණ්ඩුව හොට පටලවාගෙන තිබෙන එක. හංස අබේරත්න මහත්මයා, ඔබතුමාත් පරිස්සමින් ඉන්න. මොකද, කොයි වෙලාවේ ෂොට් එක දෙනවාද දන්නේ නැහැ.

ඊළඟ එක තමයි සංවර්ධන නිලධාරීන් සම්බන්ධ කාරණාව. මේ වෙනකොට ඒ අය මහ පාරේ ඉන්නවා. පසුගිය කාලයේ පැවැති රජයන්ට විරුද්ධව සංවර්ධන නිලධාරීන් පාරට ගත් අයත් අද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. හැබැයි, ඒ කිසිම කෙනෙක් එදා කොන්දේසි ගැන කථා කළේ නැහැ. අද මේ ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුවම එදා පාරට ගත් සංවර්ධන නිලධාරීන් අදත් පාරේ තබා තිබෙනවා. මේ වෙනකොට ඒගොල්ලන් අවුරුදු 7ත්, 13ත් අතර කාලයක් තිස්සේ පාසල්වල උගන්වනවා. විවිධ පුහුණු ලබනවා. විද්‍යා පීඨයක හිටියාට වඩා වැඩි කාලයක් ඒගොල්ලන් පාසල්වල සේවය කර තිබෙනවා. ශිෂ්‍යත්වයට ළමයි යවා තිබෙනවා; O/Lවලට ළමයි යවා තිබෙනවා; Advanced Levelවලට ළමයි යවා තිබෙනවා. ඒ වාගේම ප්‍රශ්න පත්‍ර හදා තිබෙනවා. උත්තර -පිළිතුරු- පත්‍ර ලකුණු කර තිබෙනවා. මෙන්න මේ වාගේ, ගුරුවරයෙක් කරන හැම දේම ඒ අයත් මේ වෙනකොට කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් මේ සභාවේ ඉන්නා මොහොතේ මා කියන්න කැමැතියි, අපේ රටේ 43,000ක විතර ගුරු හිඟයක් තිබෙන බව. එයින් 23,000ක් ඔබතුමන්ලා බඳවා ගන්නවා කිව්වා. ඒත් 20,000ක් ඉතුරු වෙනවා. ඔබතුමන්ලා ගණන් හදා බලන්න, මේ සංවර්ධන නිලධාරීන් ටිකත් - 12,000ක් විතර - අයින් වුණොත් 32,000ක විතර හිඟයක් ආපසු රට ඇතුළේ හැදෙනවා. මේ කාරණය ගැන කථා කරන මේ මොහොතේ මම කියන්න සතුටුයි, ඔබතුමන්ලා කර තිබෙන කටයුත්තක් ගැන. මෙන්න මෙහෙම දෙයක් ඔබතුමන්ලා කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ පත්වීම් ලිපිය මුලින්ම **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංවර්ධන නිලධාරීන් එක්කම ගුරු සංවර්ධන නිලධාරීන් හැටියට ගත් ස්වාමීන් වහන්සේලා සේවයට අන්තර්ග්‍රහණය කර තිබෙනවා. ඒක හොඳයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට යෝජනා කරනවා, ඒ ආකාරයටම අනෙක් අයත් අන්තර්ග්‍රහණය කරන්න කියලා. මොකද, දුෂ්කර පළාත්වල සමහර පාසල් පවත්වා ගෙන යන්නේ විදුහල්පතිවරයෙක් සහ මේ සංවර්ධන නිලධාරීන් කිහිප දෙනෙක් විතරයි.

ගුරු සේවයට බඳවා ගැනීම සම්බන්ධව බිමල් රත්නායක සභානායකතුමා ප්‍රකාශයක් කර තිබුණා. මම දැක්කා, YouTube නාළිකාවක ඒක පෙන්වනවා. ඉස්සර ගුරුවරියන් බඳවා ගත්තේ කාමරයකට ගෙනිහින් කියලා කියා තිබුණා. මම ඒ ප්‍රකාශය හෙළා දකිනවා. එතුමා ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න ඕනෑ. මොකද, ඒවා කැත කථා. සමස්ත ගුරු ප්‍රජාවටම කළ අපහාසයක් හැටියට මම ඒ කාරණය දකිනවා.

ඊළඟ කාරණය තමයි ගල් අඟුරු ගෙන්වීමේ කාරණය. මම කථා කරන්නේ ආණ්ඩුව දුන් ගල් අඟුරු ටෙන්ඩර් එක ගැන නොවෙයි, ඉස්සරහට කරන්න හදන ජාවාරම ගැනයි, දූෂණය ගැනයි. ඉස්සර බලයේ හිටපු හැම ආණ්ඩුවක්ම දේශපාලන වාසියට වඩා බැලුවේ අඛණ්ඩව රටට විදුලිය දෙන්නේ කොහොමද කියන කාරණය ගැනයි. ඒ ප්‍රශ්නය ගැන තමයි මුලින්ම හිතුවේ. ඒ නිසා තමයි දිගු කාලීන ගල් අඟුරු ගිවිසුම්, එහෙම නැත්නම් වාරික වශයෙන් ගෙන්වීම් හෝ කලින් සැලසුම් කළ ටෙන්ඩර් වාගේ දේවල් භාවිත කළේ. ඒත් අද තත්ත්වය මොකක්ද? ආණ්ඩුව ගල් අඟුරු නැව් 24ක් ගෙන්වන්න ගිවිසුම් ගහලා තිබෙනවා. නොරොච්චෝලේ බලාගාරයේ කටයුතු පවත්වා ගෙන යන්න බැහැ, ගල් අඟුරු නැත්නම්. මේ ටික නිවැරදිව කරගන්න බැරි වුණොත් 2022 වසරේදී වාගේම ලයිට් කපන්න වෙනවා කියා රටම බය කරලා මේ අය දැන් ඒ ගල් අඟුරු ටික ගන්න හදනවා. ඇත්තටම අපි හැමෝටම තේරෙනවා, ඒ තුළ හංගන්න බැරි ඇත්තක් තිබෙන බව; මේ අය කරන්නේ මොකක්ද කියන එක.

මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. ගල් අඟුරු ගෙන්වනවා නම්, මේ ආණ්ඩුවට ඒ සඳහා මාස 12ක්, 16ක් වාගේ කාලයක් තිබුණා. හරි වෙලාවට දිගු කාලීන ටෙන්ඩර් දමන්න තිබුණා. එහෙම නැත්නම් අවම වශයෙන් ඒ කාලයට - season එකට - කලින් spot tenders දමන්න තිබුණා. හැබැයි, එහෙම කළේ නැහැ. මේ වෙලාවේ කියන්න ඕනෑ, spot tenders කියන්නේ වැරදි ක්‍රමයක් නොවෙයි කියලා. ඒක වැරදි වෙන්නේ අන්තිම මොහොතේ හදිසියේ බිල්ලෙක් මවා, බය කරලා දමනකොට තමයි. Season එකට කලින් සැප්තැම්බර්, ඔක්තෝබර් වාගේ spot tenders දමා තිබුණා නම්, අඩු මිලකට, තරගකාරී ලෙස හොඳම තත්ත්වයේ ගල් අඟුරු ගෙන්වන්න තිබුණා. ඒත් ආණ්ඩුව මොකක්ද කළේ? හැම වෙලාවේම කරනවා වාගේ ප්‍රශ්නයට විසඳුම හොයන්නේ නැතුව අන්තිම මොහොත වෙනකම් සිටියා. දැන් ඔය නීතිපතිතුමාගේ ප්‍රශ්නය, ඊළඟට විගණකාධිපති ප්‍රශ්නය කියන ඒ හැම දේම අනාගෙන තිබෙන්නේ අවශ්‍ය වෙලාවේ විසඳුම් ගෙනාවේ නැති නිසායි. දැන් රටම බයයි ලයිට් කපයිද, විදුලිය නැතිව ඉන්න වෙයිද කියලා. මෙන්න මේ වාගේ භීතියක් හදනවා. ඒ බිය උඩින් තමයි දැන් මේ හදිසි මිලදී ගැනීම් කියන නාමයෙන් ගල් අඟුරු ගන්න යන්නේ.

මම දැක්කා, පසුගිය සතියේ කැබිනට් තීරණයක් ගෙන තිබුණා, හදිසි මිලදී ගැනීම් හරහා ගල් අඟුරු ගන්න. අද පත්තරයක ඒ ගැන සඳහන් වෙනවා. මෙන්න මෙතැන තමයි ලොකුම ප්‍රශ්නය තිබෙන්නේ. ලංකා ඉතිහාසය දෙස බලන්න. බලශක්ති ක්ෂේත්‍රයේ වැඩිම දූෂණය, වැඩිම මුදල් සූරා කෑම හැම දාම සිද්ධ වුණේ "හදිසි මිලදී ගැනීම්" යටතේ මිලදී ගැනීම් කරන්න ගියාමයි. තෙල් වෙලාවට ගන්නේ නැහැ. එහෙම නැත්නම් හදිසියි කියලා බාල තෙල් ගෙනෙනවා. එහෙම වුණාම රටේ සල්ලි ටික දෙතුන් දෙනෙක් අතට යනවා. නියඟයට කලින් ජලාශ හිස් කරනවා. ඩීසල් විදුලි යන්ත්‍ර දුවවනවා. ඊළඟට, ඒකකයක මිල දෙගුණයකට, තුන්ගුණයකට වඩා වැඩි වෙනවා. මේ හැම දේම වුණේ සැලසුමක් නැති නිසායි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මේ ගල් අඟුරු ගෙන්වීමත් අන්න ඒ ක්‍රියාමාර්ගයම ගන්නවා. පුත්තලමට ගල් අඟුරු බාන්න නම් දවස් 70ක් විතරයි තවත් තිබෙන්නේ. අප්‍රේල් 10වැනි දාට කලින් බාන්න ඕනෑ. එහෙම වෙලාවක හදිසි මිලදී ගැනීම් කියලා වැඩිම මිලට, අඩු

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

තරගකාරිත්වයකින් ගල් අඟුරු ගන්න ගියාම ඒකේ වාසිය යන්නේ කාටද? මෙන්න මේක තමයි හොයන්න ඕනෑ. රටට නොවෙයි; විදුලි පාරිභෝගිකයාට නොවෙයි. එහෙම නම් මේකේ වාසිය යන්නේ කාටද? ගල් අඟුරු මාෆියාවට. මෙන්න මේවාට විසඳුම් හොයන්න තමයි systems change කරනවාය කියලා ඔබතුමන්ලා ආවේ. හැබැයි, අපට එහෙම එකක් පෙනෙන්නේ නැහැ. ඉතිහාසයෙන්ම පෙනෙන දෙයක් තිබෙනවා. දිගු කාලීන ටෙන්ඩර්වලදී මිල ස්ථාවරයි; සැලසුම් තිබෙනවා; ගුණාත්මකභාවය පාලනය කර ගන්න පුළුවන්; ඒ වාගේම දූෂණයට ඉඩ අඩුයි. හැබැයි හදිසි මිලදී ගැනීම් කරනකොට බිය ගන්වලා තීරණ ගන්නවා, "අධික මිලක් ගෙවන්න වෙනවා; පාලනයක් නැහැ; ගුණාත්මකභාවයක් නැති ගල් අඟුරු ගෙන එන්න වෙනවා; ඒ වාගේම දූෂණයට දොර ඇරෙනවා" කියලා. මේ ආණ්ඩුව කළේත් හරි වෙලාවට දිගු කාලීන ටෙන්ඩර් කැඳවන්න අසමත් වෙලා, රටම බය කරලා හදිසි මිලදී ගැනීම්වලට පාර කපන එකයි. සමහර වෙලාවට මේවා පිටුපස විදුලි මාෆියාව ඇති; ගල් අඟුරු මාෆියාව ඇති; දේශපාලන බලවතුන් ඇති; ඒ කවුරුත් ඉන්න පුළුවන්. හැබැයි ඒකෙන් අවාසිය එන්නේ මේ රටේ පාරිභෝගිකයාට; මේ රටේ ජනතාවට. ඒ නිසා අද තීරණ ගන්න නිලධාරින්ට මට එකක් කියන්න පුළුවන්. මේ තීන්දු තීරණ ගන්න කියන අය රටින් පැනලා යන්න පුළුවන්. හැබැයි, මේ රටේ නිලධාරින්ට එහෙම කරන්න බැහැ. හදිසි මිලදී ගැනීම්වලට පාර කපන හැම නිලධාරියෙකුටම අනාගතයේදී දවසක උසාවි ගාණේ, රිමාන්ඩ් බන්ධනාගාර ගාණේ පිළිතුරු දෙන්න වෙයි. ඒ නිසාම මේ රටට අවශ්‍ය වෙන්නේ හදිසි විසඳුම් නොවෙයි. එහෙම නැත්නම්, බිය මත කරන ගනුදෙනු නොවෙයි. එහෙමත් නැත්නම් මේ මාෆියාව පෝෂණය කරන ක්‍රමයක් නොවෙයි. අපේ රටට අවශ්‍ය වන්නේ දිගු කාලීන, විනිවිදභාවයෙන් යුතු, රටට වාසි ගෙනෙන ගල් අඟුරු ටෙන්ඩර් ක්‍රමයක්. මෙන්න මේකට තමයි අරගළ කරලා ආණ්ඩුවක් ගෙනාවේ. හැබැයි ඔබතුමන්ලාත් පරණ කරපු ඒවාම කරනවා නම්; අරයා කළා මෙයා කළා කිය කියා ඒකම කරනවා නම්, මේ ආණ්ඩුව බලයට ගෙනාපු එකේ ප්‍රතිඵලයක් මේ රටට නැහැ. ඒ නිසා දිගු කාලීන ටෙන්ඩර් ක්‍රමයක අවශ්‍යතාව මං පෙන්වා දෙනවා. ඒක තමයි රටට වාසියක් වෙන්නේ. එයයි විදුලියේ ආරක්ෂාව වෙන්නේ. එයයි දූෂණයට විරුද්ධ වන එකම මාර්ගය වෙන්නේ. ඒකයි රටට අඩු මිලට විදුලිය දෙන්න පුළුවන් ක්‍රමය වෙන්නේ.

ඊළඟ එක තමයි විපක්ෂ නායකතුමාත් උදේ සඳහන් කළ ජාතික කාන්තා කොමිසම පිළිබඳ කාරණාව. ජාතික කාන්තා කොමිසම ආරම්භ කරන්න මුල පුරපු කණ්ඩායමේ කෙනෙක් හැටියටයි මම අද මෙතැනදී කථා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය ප්‍රමුඛ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ හිටපු මං ඇතුළු මන්ත්‍රීවරියන් දොළොස්දෙනාගේ කැපවීමෙන් තමයි 2024දී කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත ගෙනාවේ. ඒ අනුව තමයි ජාතික කාන්තා කොමිසම හැදුණේ. එදා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාත් එක්ක අවස්ථා ගණනාවකදී අපි ඒ ගැන කථා කළා. කථා කරලා, සංශෝධනය වෙන්න ඕනෑ තැන් සංශෝධනය කරලා, බොහොම මහන්සියෙන් ස්ථාපිත කළ කොමිසමක්, ජාතික කාන්තා කොමිසම. ඇත්තටම මේ රටේ අසාධාරණයට ලක් වන කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී හිටින්න තමයි ඒ කොමිසම පත් කළේ. හැබැයි අද වැඩිම කාන්තා ප්‍රතිශතයක් - මන්ත්‍රීවරියන් සංඛ්‍යාවක් - සහිත ආණ්ඩුවට එදා අර අඩු කාන්තා ප්‍රතිශතයක් - මන්ත්‍රීවරියන් සංඛ්‍යාවක් - සහිත ආණ්ඩුවෙන් පත් කළ ජාතික කාන්තා කොමිසමේ කටයුතු හරියට කරගෙන යන්න බැරි වෙලා තිබෙනවා. ඒ දරුවා හැදුවේ අපි. ඒ නිසා අපට කැක්කුමක් තිබෙනවා. ඒක වැටෙන්න දෙන්න එපා.

මට මතකයි, අපට කිව්වා නේ "නැට්ටේ එල්ලිලා එන අය" කියලා. හැබැයි ඒ කොමිසම හැදුවේත්, පනත ගෙන එන්න අවශ්‍ය දේවල් කළේත් නැට්ටේ එල්ලිලා ආපු අය තමයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කොමිසමේ සභාපතිතුමිය ඉල්ලා අස් වෙන්න හේතු හැටියට කියා තිබෙන්නේ මොනවාද? මෙහෙයුම් ස්වාධීනත්වයක් ඒ කමිටුවට නැහැ, ඒ වාගේම අය වැය ප්‍රතිපාදන වෙන් කරලා නැහැ, පරිපාලන මැදිහත්වීම් නිසා කොමිසමේ ස්වයං පාලනයට හානි කරනවා කියන කාරණා. ඒ වාගේම ප්‍රශ්න කථා කර ගන්නට අවස්ථාවක් ජනාධිපති ලේකම්ගෙන් ඉල්ලුවාය කියලාත් තිබෙනවා. ඒක දීලාත් නැහැ. අපි හදපු ඒ දරුවා පෝෂණය කර ගන්න මේ ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා. හැබැයි, ඡන්දයට කලින් ජනතාවට කිව්වේ කොහොමද ? "කාන්තාවෝ එක මිටට" කිව්වා. "ගැහැනු අපි එක මිටට" කියලා තේමා පාඨයක් ගෙනාවා. හැබැයි, මේ රටේ අසාධාරණයට ලක් වන කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපි හදපු ජාතික කාන්තා කොමිසමට මොකක්ද වෙලා තිබෙන්නේ? මෙතුමන්ලා පත් කළ එහි සභාපතිතුමියත් අද වනකොට ඉල්ලා අස්වෙලා තිබෙනවා. මම ආණ්ඩුවට කියන්නේ මෙයයි. ඒවා ස්වාධීන කොමිෂන් සභා. ඒවාට අනවශ්‍ය ඇඟිලි ගැසීම් අවශ්‍ය නැහැ. ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව තිබුණොත් තමයි ජාතික කාන්තා කොමිසමෙන් නිසි ඵල ලබා ගන්න හැකි වෙන්නේ. එම කටයුත්ත ඒ විධියට කරන්න ඉඩ දෙන්න කියන ඉල්ලීම කරමින්, මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.37]

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කළ මන්ත්‍රීතුමිය මුල් කාලයේ ගුරුවරියක් විධියට තමයි කටයුතු කරලා තිබෙන්නේ. ඉස්කෝලේට පරක්කු වෙලා එන්නේ නැතුව වෙලාවට ආවා නම් හොඳයි. උදේ කරපු පාඩම සම්බන්ධයෙන් වැරදි ප්‍රශ්න අහනවා, පසුව ඇවිල්ලා. උදේ දුන්න උත්තර ගැන පසුව ඇවිල්ලා වැරදි ප්‍රශ්න අහනවා. ඒවාට නැවත නැවත උත්තර දීම තේරුමක් නැහැ කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් කරුණු

කිව්වා. නීතියේ සුප්‍රසිද්ධ ආප්තයක් තිබෙනවා, "He who comes into equity must come with clean hands" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිල වශයෙන් කිසි ලේඛනයක් සභාගත කරලාත් නැති පැමිණිල්ලකට අදාළව එතුමා කරුණු ගොඩක් කිව්වා. විපක්ෂය මේ උත්තරීතර සභාව ඇතුළේ තමන්ට ලැබෙන කාලය මීට වැඩිය ප්‍රශස්ත දේශපාලනයක් සඳහා පාවිච්චි කරයි කියලා අපි බලාපොරොත්තු වනවා. එහෙම වුණොත් තමයි මේ රටේ ජනතාවත් අපේක්ෂා කළ, අපිත් අපේක්ෂා කරන යහපත්, ඉදිරිගාමී දේශපාලන සංස්කෘතිය නිර්මාණය වෙන්නේ. මොකද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඒ කළාය කියන පැමිණිල්ල සම්බන්ධයෙන් නීතිඥවරයකු විධියට මට පෞද්ගලිකව ප්‍රශ්නයක් තිබෙනවා. එම පැමිණිල්ලේ අඩංගු කරුණු යම් විධියකට සත්‍ය නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යන්න තමන්ගේ සේවය අත්හිටුවන කල් හිටියේ ඇයි? ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විමර්ශනයක් කරයි. අපි ජාතික ජන බලවේගයේ රජය විධියට මේ රටේ නීතිය හැමෝටම සාධාරණ විධියට ක්‍රියාත්මක කරන, ඒ ආයතනවලට අවශ්‍ය ස්වාධීනත්වය - නිදහස - දෙන රජයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය විසින් අධිකරණ පද්ධතියේ විනිසුරුවරු සම්බන්ධයෙන් මෙම උත්තරීතර සභාවේ ප්‍රකාශයක් කළා, විනිසුරුවරුන් ඇප නොදීම මත මාරු කළා; ඇප දීම මත මාරු කළා වශයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා සාධාරණ කරුණු කිසිවක් රහිතව අධිකරණ පද්ධතියේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් මෙවැනි ප්‍රකාශ කරන එක අපි දැඩිව හෙළා දකිනවා. ඒක නතර කරන්න ඕනෑ. ඒ වාගේම තවත් මන්ත්‍රීවරයෙක් මහේස්ත්‍රාත් අධිකරණයක විභාග වෙමින් පවතින නඩුවක් සම්බන්ධයෙන් සඳහන් කරමින් අතිරේක සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහත්මයා සම්බන්ධයෙන් ප්‍රකාශ කළා. නීතිය පිළිබඳව අබ මල් රේණුවක හෝ දැනුමක් තිබෙනවා නම් එවැනි ප්‍රකාශ කරන්නේ නැහැ. මොකද, පැමිණිල්ල මෙහෙයවන නිලධාරියා විධියට ඉන්නේ අතිරේක සොලිසිටර් ජනරාල්වරයායි. එතුමා තමයි පැමිණිල්ල වෙනුවෙන් කරුණු දක්වන්නේ. එතුමාට තමයි පැමිණිල්ල පැත්තෙන් කරුණු දක්වන්න අයිතිය තිබෙන්නේ. එම නිසා පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා එවැනි අසත්‍ය සමාජගත කරන්න එපා කියලා අපි විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමා එතුමාගේ කථාවේදී විනාඩි හයක් පමණ අරගෙන, බෞද්ධාගමට මොකක්දෝ මන්දා අසාධාරණයක් වනවාය, බෞද්ධ භික්ෂූන් වහන්සේලාට මොකක්ද අසාධාරණයක් වනවාය, වනවාය කිව්වා. හැබැයි, මොකක්ද වන අසාධාරණය, එහෙම වෙලා තිබෙන්නේ කොහේද කියලා කිසිම කරුණක් කිව්වේ නැහැ. එම නිසා අපි විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, කවුරුවත් කියන දේවල් කියන්නේ නැතුව තමන් කියන්නේ මොකක්ද කියලා නැවත සිතා බලා කරුණු සහිතව උත්තරීතර සභාවට ඉදිරිපත් කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයට වගේ වගක් නැති නමුත්, මේ රටේ සමස්ත ජනතාව බලාගෙන ඉන්න තවත් සිදුවීම් කිහිපයක් තිබෙනවා. "සිරිලිය" ගිණුම හරහා සිදු වූවා යැයි කියන මුදල් අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් අද ශිරන්ති රාජපක්ෂ මහත්මිය පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයට කැඳවා තිබුණා. මම හිතන්නේ දීර්ඝ ප්‍රකාශයක් ලබා දීලා මේ වන විට ඒ මහත්මිය එතැනින් පිටත්ව ගිහින් තිබෙනවා. 2015දී යහ පාලන ආණ්ඩුව තිබෙනකොට විපක්ෂ නායකතුමා, ඒ වාගේම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කැබිනට් අමාත්‍ය ධුර දරන අවස්ථාවේදී මේ සිදුවීම සම්බන්ධයෙන් ප්‍රකාශ ලබා ගත්තේ අදාළ අය කථානායකතුමාගේ නිල නිවසට ගෙනැල්ලා. එහෙම තමයි එදා කථානායකලා හැසිරුණේ. එහෙම තමයි එදා පොලීසිය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැනි විමර්ශන ආයතන හැසිරුණේ. අද නීතිය හැම දෙනාටම සමානව ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. තරාතිරම නොබලා ඒ විමර්ශන නිසියාකාරව ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. මේ ගැන විපක්ෂයට වගේ වගක් නැහැ, මතක් කරන්නේවත් නැහැ. ඒ වාගේම ඔබතුමාත් දන්නවා, හිටපු කථානායකවරයෙකුගේ බාල පුතා වන ශමීන්ද්‍ර රාජපක්ෂ 2012-2013 කාලයේ එයාර්බස් ගනුදෙනුව සම්බන්ධයෙන් සැකකාරයෙකු විධියට නම් කරන්න කියලා කොටුව මහේස්ත්‍රාත් අධිකරණය නියෝගයක් දුන් බව. කෝ, විපක්ෂයට ඒවා මතක් වෙන්නේවත් නැහැ නේ, මේ සභාවේ කථා කරන්න. කාවද මේ පරිස්සම් කරන්නේ? කා එක්කද විපක්ෂය මේ හිටගන්නේ කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

ඒ වාගේම විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, 2029 සිහින ජනාධිපති අංක 2 පිළිබඳව. අර දිවා ආහාරයට පැය භාගයකට කලින් ඇවිල්ලා දිවා ආහාරය වෙද්දි පිටවෙලා ගිහිල්ලා රට බේරාගන්න උත්සාහ කරන සිහින ජනාධිපති අංක 2 අද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මතක ඇති, ඒ අය ඒ කාලයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගියේ උද්දේට ඇවිදින කොට කලිසම පිටින්. අද නීතිය හැම දෙනාටම සමානව ක්‍රියාත්මක වන තත්ත්වයක් මේ රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දවසේ යෝජිත මාතෘකාව සම්බන්ධයෙන් කථා කරන්න තමයි මම සූදානම් වෙලා සිටියේ. නමුත්, මතුවෙච්ච කරුණුවලට යම් පිළිතුරක් දෙන්න අවශ්‍ය නිසා තමයි මේ සම්බන්ධයෙන් කරුණු කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා කිව්වා වාගේ විපක්ෂය විසින් විවාදය ඉල්ලා ඊට අදාළව කිසිදු කරුණක් ඔවුන් විවාද නොකළත්, අද විවාදයට ගැනෙන්නේ බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකරුවන් අතර විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිත කිරීමට අදාළ රෙගුලාසි. මේ රෙගුලාසි ස්ථාපිත කිරීම හරහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට මේවා නියාමනය කිරීම සම්බන්ධයෙන් විශේෂ බලයක් ලැබෙනවා. මොකක්ද, ඒ ලැබී තිබෙන බලය? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රියාකරුවන් සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමේ බලය කොමිසමට ලැබෙනවා. හවුල් භාවිත කිරීමේ ගිවිසුම් කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන්න ඕනෑ. මේ ගිවිසුම් තක්සේරු කිරීමේ බලය කොමිසමට ලැබෙනවා. ඒ වාගේම බෙදා හැරීම සම්බන්ධයෙන් නියෝග, මාර්ගෝපදේශ නිර්මාණය කිරීමේ හැකියාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම ආරවුල්වලට මැදිහත් වන්නත් පුළුවන්. තරගකාරිත්වයට හානි වන හවුල් භාවිත නවතා දමන්නත් පුළුවන්. යම් අවස්ථාවකදී මේ ක්‍රියාකරුවන් විසින් නියෝග උල්ලංඝනය කරනවා නම් සේවා සපයන්නන්ට එරෙහිව පියවර ගන්නත් පුළුවන්. දඩ පනවන්නත් පුළුවන්. බලපත්‍ර සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමේ බලයත් මේ තුළින් කොමිසමට ලැබී තිබෙනවා. ඒ අනුව, අපේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති මාලාව ඇතුළේ වැඩ කරමින් ඩිජිටල්කරණය හරහා මේ රට ඉදිරියට ගෙනයන්න, දියුණු තැනට ගෙනයන්න අත්‍යවශ්‍ය රෙගුලාසි තමයි අද මේ පාර්ලිමේන්තුව තුළ කථා බහට ගැනෙමින් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රෙගුලාසි පැනවීම හරහා මොනවාද මේ රටට ලැබෙන වාසි? විශේෂයෙන්ම ඔබතුමාත් දන්නවා, ලංකාව පුරා තිබෙන සියලු ජාල ගත්තොත් මේවායෙන් ලැබෙන සේවා හැම තැනකම එක හා සමාන නැහැ. නමුත්, මේ හවුල් භාවිතාව හරහා නිර්මාණය වන තරගකාරිත්වය තුළින් පාරිභෝගිකයින්ට වඩා ගුණාත්මක සේවාවක් ලැබෙනවා. ඒ

[ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා]

විතරක් නොවෙයි. ඒ තරගකාරිත්වය නිර්මාණය වීම ඇතුළේ ඔවුන්ට ගුණාත්මකභාවයටත් එහා ගිහිල්ලා අනාගතයේදී මේකට යන මූලික පිරිවැය - operational cost - අඩුවීම සහ තරගකාරිත්වය මත පදනම් වෙලා යම් ආර්ථික සහනයකුත් ලැබීමට නියමිතයි.

අවසාන වශයෙන් විපක්ෂයෙන් මම ඉල්ලීමක් කරනවා. මහජනතාවගේ බදු මුදල් වැය කරලා මේ පාර්ලිමේන්තුව පවත්වන්නේ, මේ උත්තරීතර සභාවේ කාලය ලබා දෙන්නේ ඔබ විසින් ඉල්ලා සිටින විවාදය සම්බන්ධයෙන් කරුණු ගේන්න, යෝජනා ගේන්න සහ විවේචන ගේන්න. එම නිසා ඒ සඳහා මේ කාලය යොදා ගන්න කියන කාරණය මතක් කරමින්, කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මොහොමඩ් නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[2.48 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Presiding Member, I would like to make just one reference to what the previous speaker, who also happens to be a learned Friend of mine in the court of law, said and it is only to correct him on one point. The one who comes seeking equity must come with clean hands is true, but as far as the Deputy Secretary-General of Parliament is concerned, he went to the Commission to Investigate Allegations of Bribery or Corruption, not for equity, but for justice. I am not here to go into the merits of it. Let the relevant authorities do the investigation and the truth to come out. That is the best way to do it and let me leave it at that.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் எனக்கு முக்கியமானதொரு தினமாகும். ஏனெனில், நான் பாராளுமன்ற உறுப்பினராக இந்தச் சபைக்கு வந்த பிற்பாடு, இன்றைய தினம்தான் என்னுடைய முதலாவது தனியார் உறுப்பினர் சட்டமூலத்தை பாராளு மன்றச் செயலாளர் நாயகத்திடம் சமர்ப்பித்து இருக்கிறேன். When I went to submit my first Private Members' Bill to the Secretary-General of Parliament, she was not there, and I gave it to an officer at the Secretariat. Since the Secretary-General is here now, I just want to bring it to her notice. I hope she would go into the matter.

ஜாதிக ஹெல உறுமய தீகவாபி விகாரையை தன்னுடைய கையில் வைத்துக்கொண்டு, உயர் நீதிமன்றத்தை நாடி, சவூதி அரேபிய அரசாங்கத்தின் நிதி உதவிமூலம் 2011ஆம் ஆண்டு கட்டி முடிக்கப்பட்ட சுனாமி வீட்டுத்திட்டத்தை நடைமுறைப் படுத்த முடியாதவாறு ஏறத்தாழ 14 வருடங்கள் முடக்கி வைத்திருக்கிறது. அங்குள்ள வீடுகளில் மரங்கள் வளர்ந்து, அவை உடைந்து போகக்கூடிய சூழ்நிலையில், இதற்கு என்ன செய்வதென்று தெரியாமல் தவித்துக்கொண்டு இருந்த நேரத்தில்தான் மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்தப் பிரச்சினையை உடனடியாகத் தீர்த்து வைப்பதாக அக்கரைப் பற்றுக்கு வந்தபோது சொன்னார். இந்த வீட்டுத்திட்டமானது, கிழக்கு மாகாணத்தில் சுனாமியால் பாதிக்கப்பட்டவர் களுக்காக வழங்கப்பட்ட வீட்டுத்திட்டமாகும். முக்கியமாக, நான் பிரதிநிதித்துவப்படுத்தும் கல்முனை பிரதேசத்தில் வாழுகின்ற சிங்கள, தமிழ், முஸ்லிம் மக்களில் 10 சதவீதமானோர் சுனாமியால் உயிரிழந்தார்கள்.

ஆகக் கூடுதலாகப் பாதிக்கப்பட்ட முஸ்லிம் சமூகத்தினர் தான் வீடற்ற நிலையில் இருந்தார்கள். கரையோரப் பாதுகாப்புச் சட்டத்தின்கீழ், உரிய பிரதேசத்துக்குள் தங்களுக்கு வீடு இல்லாத காரணத்தால், அவர்கள் வீடின்றித் தவித்தார்கள். அப்பொழுதுதான் சவூதி அரேபிய அரசாங்கம் 500 வீடுகள் அடங்கிய வீட்டுத்திட்டத்தை வழங்கி, பெரும்பாலும் முஸ்லிம்களுக்குக் கொடுக்க வேண்டுமெனச் சொல்லியது. இன்னும் 100, 160 வீடுகளை அம்பாந்தோட்டை, மட்டக்களப்பு, திருகோணமலை மாவட்டங்களுக்கும் வழங்கியது. இந்த வீட்டுத்திட்டம் கட்டிமுடிக்கப்பட்ட பின்னர், பாதிக்கப்பட்டவர்களில் பெரும்பான்மையோர் முஸ்லிம்களாக இருந்தபடியால், வீடுகளை அவர்களுக்கு வழங்க இருந்த நிலையிலே, JHUஇன் instigationமூலம் உயர் நீதிமன்றத்தில் வழக்கொன்று தாக்கல் செய்யப்பட்டு, மேற்குறித்த செயற்பாடு இடைநிறுத்தப்பட்டது. பின்னர், இந்த வீடுகளை அவர்களுக்கு மட்டும் வழங்க முடியாது, பொதுவாக இந்த நாட்டில் இருக்கின்ற வீடற்ற மக்களுக்குத்தான் வழங்க வேண்டும் என்ற தீர்ப்பை எடுத்தார்கள். இந்த நாட்டின் இன விகிதாசாரத்தின் அடிப்படையில், 70 சதவீதத்தை பெரும்பான்மைச் சிங்களவர்களுக்கும் 30 சதவீதத்தை சிறுபான்மையினருக்கும் கொடுக்க வேண்டும் என்ற ஓர் இக்கட்டான நிலையில், இதற்கு எப்படி முகங்கொடுப்பதென நாங்கள் தவித்துக் கொண்டு இருக்கின்ற சந்தர்ப்பத்திலே, இன்று நான் அதற்கான தீர்வைக் கொடுத்திருக்கிறேன்.

I have presented a solution for this problem. සුනාමියෙන් විපතට පත් වූ ඒ ජනතාවට ලබා දිය යුතු ඉඩම සම්බන්ධයෙන් මතු වී තිබෙන ප්‍රශ්නයට මම අද යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ යෝජනාව තමයි, නොරොච්චෝල නිවාස ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත. அதாவது, நுரைச் சோலை வீட்டுத்திட்டம் (விசேட ஏற்பாடுகள்) சட்டமூலத்தை இன்று நான் சமர்ப்பித்து இருக்கின்றேன். இந்தச் சட்டமூலத்தின் அடிப்படையில், மற்றைய சட்டங்களில் எது எவ்வாறு இருந்தாலும், இதற்கு முன்னர் வழங்கப்பட்ட நீதிமன்றத் தீர்ப்பில் எது எப்படி இருந்தாலும், Supreme Courtஇன் தீர்ப்பு பற்றி எந்தவித அச்சமும் இல்லாமல் உண்மையாகவே பாதிக்கப்பட்டவர்களுக்கு இந்த வீட்டுத் திட்டத்தை வழங்குவதற்கான தீர்மானத்தை வீடமைப்புக்குப் பொறுப்பான அமைச்சருக்கு எடுக்க முடியும். இதற்கான முழு அதிகாரமும் பாராளுமன்றத்துக்கு இருக்கின்றது.

පාර්ලිමේන්තුවේ අපට තිබෙනවා, සම්පූර්ණ බලතල. ඔබතුමන්ලාට සිටිනවා, 159දෙනෙක්. අවශ්‍ය නම් විපක්ෂයට ඒකට සම්පූර්ණ සහයෝගය දක්වන්න පුළුවන්. අපට පුළුවන් ඕනෑම පනතක්, ඕනෑම නීතියක් අලුතින් ඇති කරන්න. ශ්‍රේෂ්ඨාධිකරණය දීපු තීන්දු කිහිපයක්ම ආපසු වෙනස් කිරීම සඳහා අතීතයේදී පාර්ලිමේන්තුව විසින් නීති පනවා තිබෙනවා. මම හිතන විධියට, අධිකරණ ඇමතිතුමා ඒ ගැන දන්නවා ඇති.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

මට තව විනාඩි දෙකක් ලබා දෙන්න. ඉක්මනින් මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

උදාහරණයක් හැටියට ගත්තොත්, දෙමාපියන් විසින් දරුවන්ට ලබා දෙන තෑගි ඔප්පු අධිකරණයට නොගොස් අවලංගු කළ හැකියි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළ අවස්ථාවකදී එය ඉවත් කිරීම සඳහා පනතක් ගෙනාවා.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் என்னால் சமர்ப்பிக்கப்பட்டு இருக்கின்ற நுரைச்சோலை வீட்டுத்திட்டம் (விசேட ஏற்பாடுகள்) சட்டமூலத்தை நிறைவேற்றுவதற்கு நீங்கள் எல்லோரும் நிச்சயமாக ஆதரவு வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். எனக்கு வழங்கப்பட்ட குறுகிய நேரத்தில், இன்றைய விவாதத் தலைப்புக்கு அப்பால் சென்று, இந்த விடயத்தைப் பேசியதற்கு மன்னிக்குமாறு கேட்டு, என்னுடைய உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.55]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි දවසම අරගෙන විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාව සම්බන්ධයෙන් වූ රෙගුලාසි පිළිබඳව විවාද කරමින් ඉන්නවා. නමුත්, මේ මොහොතේ කිසිම හැඟීමක් නැතිව, ඊට අදාළව කරුණු කාරණා ඉදිරිපත් කරන්නේ නැතිව විපක්ෂය වෙන වෙන දේවල් තමයි කථා කළේ. සමස්ත විපක්ෂයම මෙම රෙගුලාසිවලට අදාළව විනාඩි 5ක්වත් කථා කළේ නැහැ. ඒ ගැන අපි කනගාටු වනවා. මන්ත්‍රීවරු එක්කෙනෙක් හෝ දෙදෙනෙක් මෙයට අදාළව කරුණු කාරණා ඉදිරිපත් කළා. අපි අද දවසම විවාද කරලා, මේ වැදගත් රෙගුලාසි සම්මත කර ගන්නවා. ඒ වාගේම අපේ සමාජයටත් යම්කිසි දැනුමක් අපේ වාද විවාද හරහා අපි ලබා දෙනවා. නමුත්, මෙතැනදී විපක්ෂය එයට අදාළ ප්‍රතිතර්ක ඉදිරිපත් කළේ නැහැ. ඒ ගැන අපි කනගාටු වනවා. ඒ නිසා අපි හිතනවා, අපේ පැත්තෙන් ඉදිරිපත් කළ යුතු කාරණා කිහිපයක් තිබෙනවාය කියලා. ඒ කාරණා අපට ඉදිරිපත් කරන්න පුළුවන්.

විශේෂයෙන්ම අපි දන්නවා, telecommunication කියන ක්ෂේත්‍රය, ඉතා වැදගත් ක්ෂේත්‍රයක් බවට අද වනකොට පරිවර්තනය වෙලා හමාරයි කියන එක. ඒක අපිට ප්‍රතික්ෂේප කරන්න බැහැ. විශේෂයෙන්ම වාණිජ කටයුතු, සෞඛ්‍ය කටයුතු, අධ්‍යාපන කටයුතු ඇතුළු සියලු දේවල් telecommunication හරහා සිද්ධ වන තත්ත්වයකට දැන් පරිවර්තනය වෙලා තිබෙනවා. ඒක අදාළ වන්නේ ලංකාවට විතරක් නොවෙයි. ගෝලීයකරණය - globalization - හරහා ලෝකය දැන් පුංචි ගම්මානයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ නිසා මේ ක්ෂේත්‍රය දියුණු කිරීම ඉතා වැදගත් කාරණාවක්. නමුත්, අවාසනාවන්ත විධියට සමහර ක්ෂේත්‍රවලට අදාළව යොමු කරන්න ඕනෑ ප්‍රමුඛස්ථානය යොමු නොකිරීම නිසා පසුගිය කාල වකවානුව තුළ ඒකට අදාළ කරන සංශෝධන ටික කරන්න බැරි වෙලා තිබෙනවා. අද අපි කථා කරන මේ කාරණය ගත්තොත්, 2000 දශකයේ මුල් අවධියේ ඒ කියන්නේ, 2003-2004 වාගේ කාල වකවානුව තුළ තමයි, ලෝකයේ මේ පරිවර්තනය සිද්ධ කරන්න පටන් ගත්තේ. අඩුම තරමින් අපි බලයට ආවාට පසුව හෝ මෙවැනි රෙගුලාසි ගෙන එන්න පුළුවන්කම ලැබිලා තිබෙන එක ගැන එක පැත්තකින් අපට පොඩි තෘප්තියක් තිබෙනවා.

විශේෂයෙන්ම මෙහි හරය ගත්තොත්, අපි දන්නවා ලංකාවේ විවිධ සමාගම්වලට අදාළ කරන කුලුනු තිබෙන බව. ඒ කුලුනුවලට අදාළ කරන ස්ථාන, sites 16,926ක් තිබෙනවා. කුලුනු විධියට ගත්තොත්, 8,633ක් තිබෙනවා. එක පැත්තකින්, මේ කුලුනු ප්‍රමාණය වැඩි වී ගෙන යනවා. අනෙක් පැත්තෙන්, නගර සැලසුම් ගත්තොත්, ඒකට අදාළව යම්කිසි ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා අපිට නගරය හරියාකාරව, ලස්සනට, සුන්දර විධියට සැලසුම් කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි, මේ කුලුනු සංඛ්‍යාව වැඩි වෙනකොට ඒකට අදාළ කරන දේවල් කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබීම. එතැනදී අපි බලාපොරොත්තු වෙනවා, sharing කියන එක. යටිතල පහසුකම්, මේ අදාළ කරන සමාගම් හවුලේ භාවිත කරන එක ඉතා වැදගත් දෙයක්. මෙවැනි දෙයක් සම්මත කරන ලෝකයේ පළමුවැනි අවස්ථාව මේක නොවෙයි. මම මුලින් කියපු විධියට එක්සත් ජාතීන්ගේ සංවිධානය European Electronic Communication Codes හරහා මේ දේවල් තමන්ගේ සාමාජික රටවල් තුළ සම්මත කරලා තිබෙනවා. ඒ වාගේම, United Kingdom ගත්තොත්, 2003දී මේ රෙගුලාසි සම්මත කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඔවුන් Electronic Communication Codes කියලා ඒකට අදාළ සියලු දේවල් ඉදිරිපත් කරලා තිබෙනවා. Co-location, rural network sharing ඇතුළු විවිධ දේවල් ඒ යටතේ තිබෙනවා. මම මුලින්ම කිව්වා, අපිට කුලුනු - towers - 8,633ක් තිබෙනවා කියලා. ඒ පිළිබඳව සඳහන් වන සිතියම මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මෙම සිතියමේ රතු තිත්වලින් දක්වා ඇති ප්‍රදේශවල තමයි towers තිබෙන්නේ. ඒ අනුව අපිට දැක ගන්න පුළුවන්, ගොඩක් තැන්වල towers තිබෙන බව. උතුරු, නැගෙනහිර ප්‍රදේශවල වාගේම දකුණේත් සැලකිය යුතු ප්‍රදේශ කිහිපයක towers තිබෙනවා. ඒ වාගේම අනුරාධපුරය ඇතුළු ග්‍රාමීය ජනපද ගත්තොත්, ඒ ප්‍රදේශවලට අදාළ කරන connectivity එක නැහැ. අපේ භාෂාවෙන් ඒකට කියනවා, සිග්නල් නැහැ කියලා. ඒ වාගේම, ලෝකය 3G, 4G සහ 5G දක්වා ඇවිල්ලා, 5Gවලින් එහා ගිය යම්කිසි තාක්ෂණයක් කරා මේ මොහොත වනකොට හඹා යනවා. නමුත්, අපි දකින විධියට අපේ රටේ ඉන්න දුවා දරුවන්ට වෙන්න පුළුවන්, කුඩා වාණිජ කටයුතුවල නිරත වන පාර්ශ්වයන්ට වෙන්න පුළුවන්, පසුගිය කාල වකවානුව තුළ මේ පහසුකම් හරියාකාරව ලැබිලා නැහැ.

යම්කිසි ආපදාවක් සිද්ධ වනකොටත් සන්නිවේදනය ඉතාම වැදගත් වෙනවා කියන එක අපි දන්නවා. ඒක අපි පසුගිය කාල වකවානුව තුළ අත්වින්දා. ඒ වාගේ ඉදිරියේදීත් අපිට යම්කිසි අනතුරක් එල්ල වෙන්න පුළුවන් කියලා අනාවැකියක් කියනකොට, මෙවන් සංශෝධන, මෙවන් ප්‍රතිසංස්කරණ, මෙවන් රෙගුලාසි අපට අවශ්‍යයි කියලා අපි හිතනවා. එතැනදී අපි බලාපොරොත්තු වෙනවා, මේ වාගේ යටිතල පහසුකම් හවුලේ භාවිත කරන එක හරහා එක පැත්තකින් විදේශ විනිමය අපේ රටින් පිටතට යන එක අඩු කර ගන්න. ඒ වාගේම අපේ මෙහෙයුම්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

පිරිවැය - operational cost එක - අපට අඩු කර ගන්න පුළුවන්. අනෙක් අතට, අපිට තවත් දේවල් ඒ තුළින් සිද්ධ කර ගන්න පුළුවන්. විශේෂයෙන්ම ප්‍රාග්ධන වියදම් - capital expenditure - වුණත් අපට අඩු කර ගන්න පුළුවන්.

ඉතින්, ඒ වාගේ දේවල් ඉතාම සාර්ථකව කරගත්ත රටවල් ලෝකයේ තිබෙනවා. මම මුලින්ම කිව්වා වාගේ rural connectivityවලට අදාළව එක්සත් රාජධානිය - United Kingdom - ගෙනාපු මේ සංශෝධනය හරහා ඒ අය සාර්ථකත්වය අත්පත් කර ගෙන තිබෙනවා.

ඒ වාගේම තමයි, ඉන්දියාවත් මේකට අදාළව යම්කිසි සංශෝධනයක් ගෙනාවා, විශේෂයෙන්ම 2003 වර්ෂයේ. එතැනදීත් ගාස්තු අඩු කරන්න පුළුවන් අවස්ථාවක් නිර්මාණය වෙලා තිබුණා. ඒ වාගේම තමයි චීනය. ඔබතුමන්ලා දන්නවා, චීනයත් තාක්ෂණයෙන් ඉතාම ඉහළ සංවර්ධනයක් අත්පත් කරගත්ත රටක් බව. චීනය වුණත්, China Tower Corporation කියන ආයතනය හරහා - කුලුනු පද්ධතියටම ආයතනයක් පිහිටුවා - ඔවුන්ට ගැළපෙන යම්කිසි විසඳුමක් ලබා ගන්නවා.

මෙහිදී කාට හරි යම්කිසි ප්‍රශ්නයක් මතු වෙන්න පුළුවන්, මේක තරගකාරී වෙළඳ ආර්ථිකයට, විවෘත ආර්ථිකයට පටහැනිද කියලා. කිසිසේත්ම එහෙම නැහැ. විශේෂයෙන්ම මේ සම්පත් ටික හරියාකාරව හවුලේ භාවිත කිරීම හරහා මේ ක්ෂේත්‍රය දියුණු වෙනවා. ක්ෂේත්‍රය දියුණු වීමත් එක්කම ඒකට අදාළ කරන subscribersලා, ඒ කියන්නේ ඒ සේවාව ලබා ගන්න අයගේ ප්‍රතිශතය වැඩි වෙනවා. ඒකත් එක්ක මේ ක්ෂේත්‍රය දියුණු වීමත් එක්ක ලාභය වැඩි වෙනවා. මෙය ඉතාම වැදගත් අවස්ථාවක්. මේ හරහා අපට විවිධ සංවර්ධනයන්, විවිධ ප්‍රගතීන් අත්පත් කරගන්න පුළුවන්. විශේෂයෙන්ම fibre opticsවලට අදාළව ගත්තත්, අපි කිලෝමීටර 81,000ක් සම්පූර්ණ කර තිබෙනවා. ඒකෙන් කිලෝමීටර 67,065ක විතර අයිතිය තිබෙන්නේ, එක සමාගමකට. තව සමාගම් කිහිපයක් එකතු වෙලා මේක සංවර්ධනය කරන්න ගියා නම්, ඒ වෙනුවෙනුත් යම්කිසි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමකට අදාළ වියදමක් එකතු වෙනවා. ඊට වඩා මේ රෙගුලාසි හරහා අපට පුළුවන් ඒ සියලු දේ හවුලේ බෙදා ගෙන කරගෙන යන්න. මේක ලෝකයට අලුත් දෙයක් නොවෙයි. මේක ලෝකයේ මීට කලින් අත්හදා බලපු, සෑහෙන දුරට සාර්ථකත්වයක් අත්පත් කරගත්ත යම්කිසි ජයග්‍රාහී වැඩ පිළිවෙළක්. ඉතින් අපි හිතනවා, ඒ වැඩ පිළිවෙළ අපේ රටටත් අවශ්‍යයි කියලා.

මෙවැනි දේවල් අපි කරගෙන යනකොට, මෙවැනි ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණ ගේනකොට, මෙවැනි ඉදිරි දැක්මක් එක්ක අපි ගමනක් යනකොට සමහර අයට ඒක ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. එහෙම කලබල වෙන එක සාධාරණයි. විශේෂයෙන්ම ගත්තොත්, දූෂණ, වංචා, නාස්තිය, අක්‍රමිකතාවලින් තොරව, ඉතාම හොඳ දේශපාලන සංස්කෘතියක් එක්ක පාලනයක් ඇති කරනවා කියන බලාපොරොත්තුවත් එක්ක ජනතාව අපිව පත් කළා. ඒ බලාපොරොත්තුව අපි ඉටු කරගෙන යනවා. එතකොට මෙතැන ඉන්න විපක්ෂයටත් යම්කිසි ප්‍රශ්න, ගැටලු මතු වෙන එක සාධාරණයි. හේතුව, අපි මෙහෙමම කටයුතු කරගෙන ඉස්සරහට ගියා නම් තමන්ට බලයට කවදාවත් එන්න බැහැ කියන ප්‍රශ්නය මතු වෙනවා. ඒක සාධාරණයි. ඉතින්, අපි ඒ සම්බන්ධයෙන් කනගාටු වෙන්න ඕනෑ නැහැ; ඒ සම්බන්ධයෙන් කම්පනයට පත් වෙන්න ඕනෑත් නැහැ. කුමන බාධා ආවත් අපි අපේ ගමන අනිවාර්යයෙන්ම යනවා.

අදත් ප්‍රධාන පෙළේ ඉන්න දෙදෙනෙකු සම්බන්ධව විමර්ශන පැවැත්වුණා. මම විශ්වාස කරන කාරණයක් තිබෙනවා. මම බැංකුවේ යම්කිසි application form එකක් පුරවනකොට, 222222V කියලා සඳහන් කර ඒ form එක පුරවලා භාර දෙනවා නම් මගේ application form එක භාර ගන්නේ නැහැ. මගේ වාහනය, එහෙම නැත්නම් මගේ භාරයේ තිබිච්ච වාහනය යම්කිසි ඝාතනයකට සම්බන්ධ වෙලා තිබුණා නම් මම එළියේ ඉන්න විධියක් නැහැ නේ. ඒ නිසා කාගේ හරි වාහන ඝාතනවලට සම්බන්ධ වෙලා තිබුණා නම්, කවුරු හරි වැරදි - ව්‍යාජ - ජාතික හැඳුනුම්පත් අංකයක් දීලා ගිණුම් විවෘත කර තිබුණා නම් තනතුරු කිසිවක් බලන්නේ නැතුව දඬුවම් දිය යුතුයි කියන එකත් අපි පිළිගන්නවා. ඒ වාගේම තමයි, කවුරු හරි පුද්ගලයෙක් - ඔහු දේශපාලකයෙක් වෙන්න පුළුවන්, හිටපු ජනාධිපතිවරයෙකුගේ පුතෙක් වෙන්න පුළුවන් - ඉතාම කෲර පාතාල කල්ලි නායකයෙක් එක්ක සම්බන්ධකම් පැවැත්වූවා නම් ඒ සම්බන්ධයෙන් විමර්ශන කරද්දී තමන්ගේ පාක්ෂිකයන්ව අවුස්සලා යම්කිසි කැලඹීමක් ඇති කරන්න උත්සාහ කළාට ඒක පුස් වෙඩිල්ලක් විධියට පත්තු වෙයි කියන එකත් මෙතැනදී කියන්න ඕනෑ. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" උදෙසා අපි හැමෝම එකතු වෙලා ඉන්න මොහොතක ඉතාම ප්‍රගතිශීලී සංශෝධන, ප්‍රතිසංස්කරණ අපි අනිවාර්යයෙන් ගේනවා, අද ගෙනාවා වාගේ. ඒ වාගේම තමයි, පසුගිය කාලවකවානුව තුළ අපේ රටට වින කරපු දේශපාලන සංස්කෘතිය වෙනස් කරමින් එන මොහොතක, පසුගිය කාලයේ සිද්ධ වෙච්ච දූෂණ, වංචා, නාස්තිවලට අදාළවත් කොන්දේසි විරහිතව විමර්ශනය කරමින් ඉදිරියට යන්න අපි සූදානම් වෙලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. අපේ ගරු නිසාම් කාරියප්පර් මැතිතුමා යම් කාරණාවක් ඉදිරිපත් කළා. கௌரவ நிசாம் காரியப்பர் அவர்களே, நீங்கள் மிகவும் முக்கியமானதொரு விடயத்தை முன்வைத்தீர்கள். அதாவது, அம்பாறை மாவட்டத்தின் அக்கரைப்பற்றில் அமைக்கப்பட்டு இருக்கின்ற நுரைச்சோலை வீட்டுத்திட்டம் தொடர்பான விடயத்தை முன்வைத்தீர்கள். நாங்கள் ஆட்சிக்கு வந்ததன் பின்னர், குறிப்பாக வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சராக நான் பதவியேற்றதன் பின்னர், சவூதி அரேபிய இராச்சியத்தின் தூதுவர் என்னைச் சந்திக்க வந்தார். அந்த வேளையில், நாங்கள் இந்த வீட்டுத்திட்டம் தொடர்பாகக் கலந்துரை யாடினோம். இவ்விடயம் தொடர்பான அனைத்து ஆவணங் களையும் கோப்புகளையும் நான் எடுத்துப் பார்த்தேன். உயர் நீதிமன்றத் தீர்ப்பு காரணமாகத்தான் இந்த விடயம் சற்று தாமதமடைந்தது. இந்த வீட்டுத்திட்டம் ஆரம்பிக்கப்பட்ட காலம் தொடக்கம் நீங்கள் பிரதிநிதித்துவப்படுத்தும் கட்சி அவ்வப்போது ஆட்சியிலிருந்த அரசாங்கங்களில் அங்கம்வகித்த ஒரு கட்சியாகவே காணப்பட்டது. எனினும், நாங்கள் இந்த விடயத்தில் மிகவும் சுமுகமான தீர்வை எட்டவே முயல்கின்றோம். எந்தவிதமான இனமுறுகலும் இல்லாமல், சரியான முறையில் இந்த வீட்டுத்திட்டம் மக்களைச் சென்றடைய வேண்டும் என்பதில் நாங்கள் உறுதியாக இருக்கின்றோம். இவ்விடயம் சம்பந்தமாக அனைத்துவிதமான அமைப்புகளோடும் சேர்ந்து இயங்க நாங்கள் தயாராக இருக்கின்றோம். குறிப்பாக, வீடமைப்பு அதிகாரசபையோடு சேர்ந்து இயங்கத் தயாராக இருக்கிறோம் எனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.08]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று பாராளுமன்ற அமர்வு நடைபெறும் இந்த வேளையில், நாடு முழுவதும் சுதந்திர தினத்தைக் கொண்டாடுவதற்கான ஆயத்தங்கள் மும்முரமாக நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. இது 78ஆவது சுதந்திர தினம் என்று நினைக்கின்றேன். எங்களுக்கு சுதந்திரம் இல்லாதபடியால், இது 77ஆவது சுதந்திர தினமா, 78ஆவது சுதந்திர தினமா என்று நாங்கள் கணக்குவைத்துக்கொள்வது முக்கியமில்லை.

சுதந்திர தினத்தை முன்னிட்டு கிழக்கு மாகாணத்தில் நிகழ்வொன்று நடக்க இருப்பதாகவும் அதற்கான அழைப்பிதழ் எங்களுக்கும் தரவிருப்பதாகவும் நான் கேள்விப்பட்டேன். அதேபோல, கொழும்பில் சுதந்திர தின நிகழ்வு நடக்கப் போவதாகவும் அதில் கலந்துகொள்வீர்களா எனக் கேட்டு எங்களுக்குப் பல சந்தர்ப்பங்களில் தொலைபேசி அழைப்புகளை எடுத்திருந்தார்கள். இவ்வாறானதொரு சூழ்நிலையில், இன்று அரச தரப்பால் கொண்டுவரப்பட்டு இருக்கின்ற சட்ட ஏற்பாடுகள் பற்றி நான் உண்மையிலேயே கருத்துத் தெரிவிக்க விரும்பவில்லை. ஏனெனில், எங்களைப் பொறுத்தளவில், எங்களுடைய தேசிய இனப் பிரச்சினைக்கு முக்கியத்துவம் கொடுக்காமல், அதைத் தீர்த்து வைக்காமல், இவர்கள் இந்த நாட்டில் சுதந்திர தினத்தைக் கொண்டாட முனைவதென்பது வேடிக்கையான ஒரு விடயமாகும். வடக்கு, கிழக்கு பூராவும் பெப்ருவரி 4ஆம் திகதி கரிநாளாக அறிவிக்கப்பட்டு, 'தமிழ் மக்களுக்கு சுதந்திரம் இல்லை' என்ற தொனிப்பொருளில் நாளைய தினம் பல்வேறு எதிர்ப்பு நடவடிக்கைகள் முன்னெடுக்கப்பட இருக்கின்றன. இவ்வாறானதொரு சூழலிலே, நாட்டில் புரையோடிப் போயிருக்கும் எங்களுடைய தேசிய இனப்பிரச்சினைக்கு ஒரு தீர்வு இல்லாமல், நீங்கள் மீண்டும் மீண்டும் சுதந்திர தின நிகழ்வை நடத்தி, சுதந்திர தினத்தைக் கொண்டுகின்றீர்கள். ஏன் நான் இதைச் சொல்கின்றேன் என்றால், தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் கீழும், தமிழர்களுக்குச் சுதந்திரம் என்பது மறுக்கப்பட்ட ஒரு விடயமாகவே இருப்பதனால்தான்.

தற்பொழுதும் தமிழர்மீது structural genocide நடந்து கொண்டு இருக்கின்றது. தேசிய மக்கள் சக்தி அரசாங்கத்திலும் எங்களுடைய நிலங்கள் அபகரிப்புச் செய்யப்படுகின்றன. நில அபகரிப்பு என்பது, 1948ஆம் ஆண்டிலிருந்து நடந்துகொண்டு வருகின்ற விடயம்! இன்று சுதந்திர தினம் பற்றி பேசுகின்றீர்கள். எங்களைப் பொறுத்தவரையில், எங்களுடைய தமிழருடைய தலைவிதியை பெரும்பான்மை சமூகத்தவரிடம் ஒப்படைத்துவிட்டு பிரித்தானியர் சென்றதிலிருந்து மாறி மாறி ஆட்சிக்கு வந்த அரசாங்கங்கள் எங்களுடைய மக்களை சித்திரவதை செய்திருக்கின்றன. இன்று காலையில்கூட ஒரு செய்தியைப் பார்த்தேன். அதாவது, மாண்புமிகு சனாதிபதி அவர்கள் சுதந்திர தினத்தை முன்னிட்டு 49 கைதிகளை விடுதலை செய்வதாகச் சொல்லியிருக்கிறார்.

இந்த அவைக்குள் எங்கேயாவது தேசிய மக்கள் சக்தியைச் சேர்ந்த தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்கள் இருந்தால், அவர்கள் இது போன்ற செய்திகளைக் கேட்கும்போது அவமானத்தில் வெளியே ஓடிப்போக வேண்டும். ஏனெனில், சனாதிபதியின் தேர்தல் விஞ்ஞாபனத்தில் அரசியல் கைதிகளின் விடுதலை பற்றி மிகத் தெளிவாகச் சொல்லப்பட்டு இருந்தது. தற்போதைய சனாதிபதி அவர்கள் ஆட்சிக்கு வந்து ஒரு வருடமும் நான்கு மாதங்களும் ஆகிவிட்டன. நாங்கள் இந்தப் பாராளுமன்றத்தில் அரசியல் கைதிகளின் விடுதலை பற்றி கேள்வி எழுப்பும்பொழுது, அரசியல் கைதிகள் என்றால் யார்? என்று கேட்கின்ற அளவுக்கு நிலைமை இருக்கின்றது. சுதந்திர தினத்தை முன்னிட்டு 49 சிறைக் கைதிகளை விடுவிக்கின்ற உங்களுடைய சனாதிபதிக்கு - தேசிய மக்கள் சக்தி அரசாங்கத்துக்கு - ஏன் எங்களுடைய அரசியல் கைதிகளை விடுதலை செய்ய முடியாமல் போனது? அரசியல் கைதிகளை விடுதலை செய்வதாக வாக்குறுதியளித்து ஆட்சிக்கு வந்தவர்கள்தானே நீங்கள்! பயங்கரவாதத் தடுப்புச் சட்டத்தை இல்லாமல் செய்வதாகக்கூறி ஆட்சிக்கு வந்தவர்கள், இன்று அதற்குப் பதிலாக புதியதொரு சட்டத்தைக் கொண்டுவர முயற்சிக்கிறார்கள். இப்படியானதொரு நாட்டில்தான் நாங்கள் வாழ்ந்துகொண்டு இருக்கின்றோம்.

நேற்றைய தினம்கூட, வவுனியா வடக்கு, நெடுங்கேணிப் பிரதேசத்தில் பாரியதொரு மக்கள் எழுச்சிப் போராட்டம் நடைபெற்றது. எதற்காக? எங்களுடைய மண்ணைப் பாதுகாப்பதற்காகத்தான் அது நடைபெற்றது? சுதந்திரம் கிடைத்துவிட்டதென நீங்கள் சொல்கின்றீர்கள்! சுதந்திரம் கிடைத்த நாளிலிருந்து தமிழ் மக்களுடைய மண்ணை உங்களிடம் இருந்து பாதுகாப்பதுதான் எங்களுடைய பிரதான வேலையாக இருக்கின்றது. வடக்கும் கிழக்கும் தமிழர்கள் பூர்வீகமாக வாழ்ந்த பிரதேசம்! அந்தத் தொடர்பை இல்லாமல் செய்வதற்காக 1980களில் மணலாறு பிரதேசத்தில் குடியேற்றத் திட்டங்களைச் செய்தீர்கள்! அதற்குப் பிறகு, அதன் பெயரை 'வெலிஓயா' என்று மாற்றினீர்கள்!

அங்குள்ள மக்களுக்குக் குடிநீர் வழங்க வேண்டும், விவசாயத்துக்குத் தண்ணீர் வழங்க வேண்டும் என்பதற்காக இன்று வவுனியாவில் இருக்கின்ற மக்களுடைய நிலங்களையும் காடுகளையும் சிறு குளங்களையும் அழித்து, வவுனியா வடக்கிலிருந்து தண்ணீரைக் கொண்டுசெல்ல முற்படுகின்றீர்கள். திட்டமிட்ட வகையில், தமிழர் பிரதேசத்தில் எங்களுடைய இனப்பரம்பலை மாற்றுவதற்குச் செய்த திட்டத்தை அதாவது, அந்தக் காலப்பகுதியில் இருந்த பேரினவாத அரசாங்கம் செய்த விடயத்தைத் தொடர்வதற்கான நடவடிக்கைகளை இந்த அரசாங்கம் எடுத்துக்கொண்டு இருக்கின்றது. இந்த அரசாங்கத்துடன் இருக்கும் தமிழ் பேசும் உறுப்பினர்கள் இந்த விடயத்துக்கு எதிராகக் குரலெழுப்ப முடியாமல் இருப்பதையிட்டு வெட்கப்பட வேண்டும். இதற்குள் 'சமத்துவம்' பற்றி பேசுகிறார்கள். 'சமத்துவம்' என்றால் என்ன? எல்லோருக்கும் சமமாக இருக்க வேண்டும். வவுனியாவில் இருக்கின்ற விவசாயிகளுக்கு ஒரு போகம்தான் விவசாயம் செய்யலாம். ஏனெனில், அங்குள்ள குளங்களில் தண்ணீர் இல்லை. அதுமாத்திரமன்றி, மகாவலி அதிகாரசபையால் முன்னெடுக்கப்படும் திட்டத்தினூடான தண்ணீர் இது வரைக்கும் வடக்கு, கிழக்குக்கு வரவில்லை. ஆனால், நீங்கள் வவுனியா வடக்கில் இருக்கின்ற தண்ணீரை 'கிவுல்ஓயா திட்டம்' என்ற பெயரில் மகாவலி ஊடாக மணலாறு - வெலிஓயா - என்ற பிரதேசத்துக்குக் கொண்டுசெல்லப் பார்க்கின்றீர்கள். எதற்காக? பெரும்பான்மை சமூகத்தைச் சேர்ந்த 4,000 விவாசயிகளுக்கு இரண்டு போகமும் விவசாயம் செய்வதற்காக.

வவுனியா மாவட்டத்தில் இருக்கின்ற தமிழ் விவசாயிகள் ஒரு போகம் செய்தாலும் சரி, அவர்களது விவசாயம் அழிந்து போனாலும் சரி. மிகவும் வேடிக்கையான விடயம் என்னவென்றால், வவுனியாவில் இருக்கின்ற சிறு குளங்களைப்

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

புனரமைப்புச் செய்வதற்கு அனுமதி கேட்டபோது, அதற்கு Forest Department அனுமதி மறுத்திருப்பதுதான். அதாவது, வன இலாகா - Forest Department - வவுனியாவில் இருக்கின்ற சிறு குளங்களைப் புனரமைப்புச் செய்வதற்கு அனுமதி வழங்க மறுத்திருக்கிறது. என்ன காரணம்? அந்தக் குளங்கள் Forest Departmentஇன்கீழ் இருப்பதால் அனுமதி தரமாட்டோம் என்று சொல்கின்றது. ஆனால், வெலிஓயாவில் - மணலாறு - இருக்கின்ற பெரும்பான்மைச் சமூகத்தைச் சேர்ந்த 4,000 விவசாயிகளுக்குத் தண்ணீர் வழங்குவதற்கு, 13,000 ஏக்கர் காடுகளை அழித்து, நீரைக் கொண்டுசெல்வதற்கு நீங்கள் தயார்! பிறகு ஏன், சமத்துவம் பற்றி பேசுகின்றீர்கள்?

இன்று காலையில் எங்களுடைய அம்பாறை மாவட்டப் பாராளுமன்ற உறுப்பினருடன் பேசியபோது, ஹெடஓயா திட்டத்தை நடைமுறைப்படுத்த விருப்பப்படவில்லை என்று கூறினார். ஏனெனில், அந்தத் திட்டத்தின்மூலம் அதிகளவு பயனடையப்போவது தமிழ் பேசும் உறவுகள்! இதில் பெரும்பான்மை சமூகத்தைச் சேர்ந்தவர்கள் இருந்தால், நீங்கள் அதைச் செய்வதற்கு நடவடிக்கை எடுப்பீர்கள்! 2011ஆம் ஆண்டு மஹிந்த ராஜபக்ஷ கொண்டுவந்த வேலைத்திட்டத்தை, 2022ஆம் ஆண்டு கோட்டாபய ராஜபக்ஷ அரசாங்க காலத்தில் முன்னெடுக்க முயற்சித்த வேலைத்திட்டத்தை, இன்று 24,000 மில்லியன் ரூபாய் - 24 பில்லியன் ரூபாய் - செலவில் 4,000 பெரும்பான்மைச் சமூகத்தைச் சேர்ந்த விவசாயிகளுக்கு தண்ணீர் வழங்குவதற்காக நீங்கள் முன்னெடுக்கத் திட்டமிட்டு இருக்கின்றீர்கள். ஒருபுறம், நீங்கள் சுதந்திர தின நிகழ்வில் கலந்துகொள்ளுமாறு பாராளுமன்ற உறுப்பினர்களாகிய எங்களுக்கு அழைப்பிதழ் தருகின்றீர்கள். மறுபுறம், தமிழ் மக்களுக்கு முற்றிலும் எதிரான செயற்பாடுகளை அரசாங்கம் முன்னெடுத்துக்கொண்டு இருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

இவ்வாறு பல்வேறு விடயங்களில் எங்களுடைய மக்களுக்குத் துரோகத்தைத்தான் மாறி மாறி ஆட்சிக்கு வந்த அரசாங்கங்கள் செய்திருக்கின்றன. அதே செயற்பாடுகளை இந்த அரசாங்கமும் முன்னெடுகின்றது. இது மிகவும் வேதனையானதொரு விடயம்! கிவுல் ஓயா போன்ற திட்டங்கள்மூலம் மாத்திரமல்ல, கடந்த அரசாங்க காலப் பகுதியில் மகாவலி 'பி' வலயம் என்ற பெயரில் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள எங்களுடைய தமிழ் பண்ணையாளர் களுடைய காணிகளை அபகரிப்புச் செய்ய முயற்சி எடுத்தார்கள். இன்று வட மாகாணத்தில் மகாவலி 'எல்' வலயம், மகாவலி 'கே' வலயம் என்ற பெயரில் எங்களுடைய நிலங்களை அபகரிக்க முயற்சிக்கிறார்கள். பெரும்பான்மைச் சமூகத்தின ராகிய நீங்கள், 'சுதந்திரம்' என்ற போர்வையில் எங்களுடைய மக்களின் நிலங்களை அபகரிப்புச் செய்கின்ற செயற் பாட்டைதான் கடந்த 76-77 வருடங்களாகச் செய்து வருகின்றீர்கள். எங்களுடைய மக்களுக்கு நிரந்தரமான ஓர் அரசியல் தீர்வு கிடைக்கும் வரைக்கும், நாங்கள் ஏற்றுக்கொள்ளக்கூடிய தீர்வு எட்டும் வரைக்கும் இந்த நாட்டில் தமிழ் மக்களுக்குச் சுதந்திரம் இல்லை. எனவே, பெப்ருவரி 04ஆம் திகதி கரிநாளாகவே அமையும் என்பதைச் சொல்லி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම මේ සාකච්ඡාවට එළැඹෙන්න කැමැතියි ටිකක් වෙනස් කරුණකින්. අද දිනයේදී අපි දුටුවා, ශිරන්ති රාජපක්ෂ මහත්මිය FCID එකට ගිහිල්ලා තිබෙනවා. එතුමිය FCID එකට යන්න සති දෙකක් කල් ඉල්ලලා තිබුණා. මා හිතන්නේ ඒ කාලයත් ඉඳලා තමයි එතුමිය එහි ගියේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පොලීසියකට ගිහිල්ලා පැමිණිල්ලක් කරනවා නම් සාමාන්‍යයෙන් අපේ හැඳුනුම්පත ගන්නවා. අපේ ගරු සුසන්ත දොඩාවත්ත නීතිඥ මන්ත්‍රීතුමා තමයි මේ ගැන කථා කළේ. එතුමා මේ සම්බන්ධයෙන් ගොඩක් කරුණු දන්නවා. මම දැනගන්න කැමැතියි, FCID එකට යනකොටත් ඒ යන කෙනා හැඳුනුම් පත දෙන්න ඕනෑද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න එතුමාට පොඩි අවස්ථාවක් දෙන්න පුළුවන්ද? මගේ වෙලාවෙන් විනාඩියක් එතුමාට දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මූල්‍ය අපරාධ කොට්ඨාසයට හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යනකොට තමන්ගේ සැබෑ හැඳුනුම් පත ලබා දීලා තමයි පිවිසීම සඳහා visitor pass එකක් අරගෙන යන්න ඕනෑ. හැබැයි, මේ විමර්ශනය සිද්ධ වෙන්නේ තුන්දෙනෙකු එකතු වෙලා "සිරිලිය ගිණුම" නමින් ගිණුමක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් වන නිසා, ඒ ගිණුම ආරම්භ කරන්න පාවිච්චි කරපු හැඳුනුම් පත නඩු භාණ්ඩයක් විධියට ඉදිරිපත් කරන්න අවශ්‍ය නම්, ඒක රැගෙන එන්න කියලා තිබෙනවා නම්, මා හිතන්නේ ඒකත් අරගෙන යන්න ඇති.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ මේ විවාදයේදී Sri Lanka Telecommunications Act එක යටතේ වන Regulations සම්බන්ධයෙන් විශාල දේශපාලන විවාදයක් නැහැ. ඒ නිසා මම හිතුවා මේ අවස්ථාව වැදගත් කරුණු කිහිපයක් ගැන කරුණු දක්වන්න යොදා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ගිහින් සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් ගොඩක් ලොකුවට කථා කළ බව. තව පොඩ්ඩෙන් අපේ විපක්ෂ නායකතුමා ලේත් දෙන්න යනවා. සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් එතුමා ලේවලින් අත්සන් කරලා දෙන්නත් ගියා. අපි ඇත්තටම ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ විපක්ෂ නායකතුමා ලේ දන් දෙන ඒ ක්‍රියාවලියෙන් බේරා ගත්තාට. ජනාධිපතිතුමා එක්ක ඒ සංවර්ධන නිලධාරි මහත්වරු කථා කරලා විසඳුමකට එකඟ වෙලා තිබෙනවා. විසඳුම තමයි, ප්‍රධාන කොටම සංවර්ධන නිලධාරීන් සියලු දෙනාම ගුරු විභාගයට ලියනවා. ඒ විභාගයෙන් විශාල පිරිසක් බඳවා ගන්න තමයි අපි උත්සාහ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ දැනීමේ හැටියට සංවර්ධන නිලධාරීන් උපරිම වශයෙන් 52,000ක් ඉන්නවා. ඒ කියන්නේ, මේ විභාගයට සුදුසුකම් ලබපු සංවර්ධන නිලධාරීන් 52,000ක් ඉන්නවා. ඒ 52,000 විභාගය ලිව්වාම ඒ අය අතරින් සුදුසුකම් ලබන අය තමයි ගුරු ව්‍යවස්ථාවට අනුව සහ අභියාචනාධිකරණ නඩු තීන්දුව අනුව බඳවා ගන්න පුළුවන් වන්නේ. ඒ සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡාවේදී කරුණු පැහැදිලි කළාට පසුව සංවර්ධන නිලධාරීන්ගේ සංගමයේ ප්‍රධානීන් එකඟ වෙලා තිබෙනවා, විභාගය ලියන්න. විභාගය ලියලා ඒකෙන් ඒ සියලු දෙනාටම සමත් වෙන්න බැරි වුණොත්, ඒ ඉතිරි වන පිරිස සම්බන්ධයෙන් අපි වෙනම විසඳුම්වලට යන්නම් කියලා කියා තිබෙනවා. ඒ නිසා ගරු ජනාධිපතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා, අපේ විපක්ෂ නායකතුමා ලේ සොලවන්න ගිය එකෙන් වළක්වා ගත්තාට.

ඇත්තටම විපක්ෂ නායකතුමාට අපේම පිහිට තමයි දිගටම තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ පක්ෂයේ සමහරු එතුමාට විරුද්ධ වුණත් අපි එතුමාව දිගටම තියා ගන්න කටයුතු කරන්නේත් ඒ නිසයි. ඒ වාගේම, අපි මේ කාරණයත් කියන්න කැමැතියි. දේශපාලන වශයෙන් වැලේ වැල් නැතිව ඉන්න කට්ටිය ගිහිල්ලා ඒ සංවර්ධන නිලධාරි මහත්ම මහත්මීන්ව උසි ගන්වලා ඒ ගොල්ලන්ගෙන් දේශපාලන වාසි ගන්න බැලුවා. ඉතින් අපි කවුරුත් උද්ඝෝෂණ කරන එක, අරගළ කරන එක හාස්‍යයට ලක් කරන්නේ නැහැ. අපි දන්නවා, මිනිස්සුන්ට වේදනාවන් තිබෙනවා. ප්‍රශ්න තිබෙනවා. අපට හැඟීම් නොතේරෙනවා නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම යම්කිසි ප්‍රමිතියක් සහිත නීතියක් සහිත රටක් අපි හදන්න ඕනෑ. අපේ රටේ ජනතාව, විශේෂයෙන්ම වෘත්තීය සමිති අරගළ කරලා රාජ්‍ය සේවය හෙංචයියන්ගේ තවානක් වෙලා තිබ්බ තත්ත්වයන් වෙනස් කරලා තිබෙනවා. ඔබතුමා දන්නවා, අපේ විශ්වවිද්‍යාලවල බඳවා ගැනීම්වලටත් ඔය නාමල් රාජපක්ෂ ලියුම් දුන්නා; විශ්වවිද්‍යාලයට බඳවා ගන්න. මේ එහෙම මානසිකත්වයක්. ඔබතුමා නිකම් හිතන්න, UGC එක හරහා යන්නේ නැතුව මන්ත්‍රීලාගේ ලියුම්වලින් විශ්වවිද්‍යාලයට ළමයි ගන්න ක්‍රමයක් හැදුණොත් ලංකාව ඉතුරු වෙනවාද?

අද අපේ අගමැතිතුමිය, අධ්‍යාපන ඇමතිතුමිය, එක ලියුමක් තමන්ගේ දේශපාලන හිතවත්කමක් නිසා හරි, වෙන මොනවා නිසා හරි දීලා නැහැ. මාස 14ක් අපි ගත කරලා තිබෙනවා. මම හිතන විධියට ලංකා ඉතිහාසයේ අවුරුදු 50කට පස්සේ එක ලියුමක් දීලා නැහැ, අහවල් ළමයා ගන්න කියලා. අද බලන්න, වෙනදා මේ දවස් වෙනකොට ඔය ජූනි මාසයෙන් පස්සේ දෙමව්පියෝ ඉස්කෝල ඉස්සරහ කොච්චර උපවාස කරනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ගුරුවරයෙක්. ඔබතුමා හොඳට දන්නවා. සාමාන්‍යයෙන් ඉස්කෝල ඉස්සරහ දෙමව්පියෝ අනිවාර්ය උපවාස කරනවා, මගේ දරුවා අල්ලපු වැටේ ඉන්නේ ගත්තේ නැහැ; අරයා ගත්තා කියලා. අද බලන්න කෝ, අපි ප්‍රශ්න විසඳලා තිබෙන විධිය. අපට මේවා හරියාකාරව ඉදිරිපත් කර ගන්න channels නැති එකේ ප්‍රශ්නයක් ඇති. අපට channels පිස්සුවකුත් නැහැ. අපට ජනතාව හිටියාම ඇති. නමුත් මම කියන්නේ, සාමාන්‍යයෙන් දරුවෝ ඉස්කෝලෙට භාර ගන්නකොට මොන තරම් නම් උද්ඝෝෂණ කරනවාද? අපටත් කොච්චර පෙත්සම් එනවාද? අපි විපක්ෂයේ සිටියදී සාමාන්‍යයෙන් ඕක තමයි ප්‍රධාන ප්‍රශ්නය. ජූනි මාසයේ 01 වාගේ වෙනකොට දරුවන් ඇතුළත් කර ගන්නට applications භාර ගන්න පටන් ගන්නවා, එදා සිට.

මේ රටේ ජනතාව අරගළ කරලා යම්කිසි ප්‍රශස්ත රාජ්‍ය සේවයක් හදාගෙන තිබෙනවා, පන්දම්වලට; සුදුසුකම් නැතුව jobsවලට ගන්න එකට විරුද්ධව. මම කියන්නේ වෘත්තීය සමිති ව්‍යාපාරය. ඒ ගොල්ලෝ තමයි සටන් කරලා මෙහි ප්‍රමිතිය හදලා තිබෙන්නේ. මම දුටුවා, මන්ත්‍රීතුමියක් මම ගැන කියනවා. මම ගැන කියන්න යන්නේ නැහැ. මට ජීවිතයේ අන්තිම කනගාටුදායක අත්දැකීමක් තිබෙනවා. මම ඒක සහතික වශයෙන්ම දැන ගෙන තමයි කිව්වේ. නමුත් ඒ කුණු ඉතිහාසය ඉවර කරලා තිබෙනවා, මේ රටේ ජනතාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වඩා ඔබතුමා දන්නවා ගුරුමාරුවක් හදා ගන්න පවා අසරණ වෙච්ච ගුරුවරු ගුරුවරියෝ කොතරම් ඉන්නවාද කියලා. මට වඩා ඒ ගැන ඔබතුමා දන්නවා. ඒ නිසා මම ඒ ගැන කියන්න යන්නේ නැහැ. නමුත් මේ රටේ ගුරුවරු ආත්ම අභිමානයෙන් ගුරු සේවා ව්‍යවස්ථාවක් හදාගෙන තිබෙනවා. සංවර්ධන නිලධාරීන්; ඒ ගොල්ලෝ රජයේ සේවකයන් බවට පත් වෙලා තිබෙනවා. වෛද්‍යවරු, ඉංජිනේරුවරු. ඒ නිසා අපි හැම කෙනාටම කියන්නේ සුදුසුකම්වලින්, - මොකද, අපි කිසි කෙනෙකුව ඇතුළත් කරලා නැහැ. අපි NPP කියලා කවුරුවත් දාලා නැහැ. මම ඒකයි කියන්නේ.

නමුත් මේ විපක්ෂය කරන්න හදන දේ මොකක්ද? විපක්ෂය රට 1977ට, 1970ට ගෙනියන්න හදන්නේ. ඒ කාලයේ තමයි අරහෙම පත්වීම් දුන්නේ; ඒ කාලයේ තමයි "චිට්" එකට පත්වීම් දුන්නේ. 2000 ගණන්වල තමයි නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා දරුවෙක් විශ්වවිද්‍යාලයට භාර ගන්න කියලා ලියුම් දුන්නේ. ඒ සංස්කෘතිය තමයි මේ හදන්න හදන්නේ. විපක්ෂ නායකතුමා ලේ දෙන්න යන්නේ, පරණ ජරා සංස්කෘතිය හදන්න.

ඒක නිසා මම කියන්නේ මෙහෙමයි. අපි රටක් වශයෙන් යම්කිසි ප්‍රශස්ත දේවල් හදා ගත්තාට පස්සේ ඒවා රැක ගැනීම ආණ්ඩු පක්ෂයේ විතරක් නොවෙයි, විපක්ෂයේත් වගකීමක්. විපක්ෂයේ මන්ත්‍රීතුමාට කොච්චර ලෙහෙසියක්ද? ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ළඟට එනවා, දරුවෝ ඉස්කෝලේ දාන්න කියලා කියන්න. දැන් එන්නේ නැහැ නේ. එන්නේ නැහැ. ඇයි? ඔබතුමාට කෙළින්ම කියන්න පුළුවන් "සහෝදරයා", නැත්නම් "අම්මේ, දැන් එහෙම දාන්න බැහැ. මට අධ්‍යාපන ඇමතිතුමියට කියන්න බැහැ, දරුවා ඉස්කෝලේ දාලා දෙන්න කියලා". ඔබතුමාට ලෙහෙසියි නේ. රටේ system එකක් හැදුණාම ලෙහෙසියි. ඒ නිසා මම ඒකයි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කියන්න කැමැතියි, මම අද මේ සාකච්ඡාවට සම්බන්ධ වෙන්න හිතුවේ

[ගරු බිමල් රත්නායක මහතා]

නැහැ. නමුත් මෙතැන විශාල සාකච්ඡාවක් ගොඩනඟපු නිසා, මේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමාගේ වැඩ තහනම් කිරීම සම්බන්ධ ප්‍රශ්නය සම්බන්ධයෙන් කරුණු කියන්න හිතුවා. ඔබතුමා දන්නවා, මම ඒකේ කරුණු වශයෙන් ගොඩක් කියන්න යන්නේ නැහැ.

පළමුවෙනි කරුණ තමයි පාර්ලිමේන්තුවේ 1953 සම්මත කරපු පනතකින් තමයි Staff Advisory Committee එක පිහිටුවා තිබෙන්නේ. මගේ මතකයේ හැටියට. ඒ Staff Advisory Committee එකට අනුව තමයි පාර්ලිමේන්තුවේ බොහෝ කටයුතු සිදු වෙන්නේ. මේ ඇතුළේ වෙන කටයුතු විතරක් නොවෙයි නේ. මෙහි බිල්ඩින් හදන්න සල්ලි වෙන් කරන්න ඕනෑ. විවිධ නිලධාරින් බඳවා ගන්න ඕනෑ. ඒවාට රාජ්‍ය සේවා කොමිෂම - PSC එක - අනුමත කරපු ක්‍රමවේද වාගේම daily operations ගොඩක් තිබෙනවා. එතකොට ඒ කමිටුවක් තිබෙනවා. ඒ Staff Advisory Committee එකේ නිල වශයෙන් කථානායකතුමා, විපක්ෂ නායකතුමා, සභානායකවරයා සහ මුදල් ඇමතිවරයා හෝ මුදල් ඇමතිවරයා වෙනුවෙන් නියෝජිතයෙක් ඉන්නවා. මහ ලේකම්තුමියත් ඉන්නවා, එම කමිටුවේ ප්‍රධාන ලේකම්වරිය විධියට. ඒ නිසා මේකට අදාළ procedure එක මොකක්ද, මේකට අදාළව මෙහෙම විනය පරීක්ෂණයක් කළ යුතුය කියලා පාර්ලිමේන්තුවේ Staff Advisory Committee එකෙන් නිශ්චිත වශයෙන් තීන්දුවක් ගන්නවා, බෙදීමක් නැතිව එකඟතාවෙන්. Staff Advisory Committee එකෙන්ම තමයි මේ පිළිබඳ පරීක්ෂණයක් කරන්නේ; පිටින් පුද්ගලයෙකු ගන්න එක තීන්දු කරන්නේ. මොකද, පිටින් ගන්නවා කියන්නේ, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ website එකේ pool එකක් ලැයිස්තුගත කර තිබෙනවා. ඉතා ජ්‍යෙෂ්ඨ පුද්ගලයකු තමයි ඔය අතිරේක ලේකම්වරයා වශයෙන් මේකට හඳුනා ගන්නේ. ඒකත් අපි අනුමත කරගෙන තිබෙනවා. එතුමාට ගෙවන දීමනාත් අනුමත කරගෙන තිබෙනවා. පාර්ලිමේන්තුව තුළින් පරීක්ෂණයක් කරනවාට වඩා පාර්ලිමේන්තුවෙන් එළියේ පරීක්ෂණයක් කරන එක හොඳයි කියලා අපි හිතනවා. මොකද, නියෝජ්‍ය මහ ලේකම්තුමා තනියම නියෝජ්‍ය මහ ලේකම් වුණා නොවෙයි නේ. පාර්ලිමේන්තුවේ අය නේ සම්බන්ධ වුණේ. හිටපු ඇමතිවරු, කථානායකවරු එහෙම. ඒ නිසා තමයි ස්වාධීනව වෙනම පරීක්ෂණයක් කළේ. ඒක හරියට එකඟතාවෙන් තමයි කරලා තිබෙන්නේ, Staff Advisory Committee එකෙන්.

ඊට පස්සේ ඒකට සාධාරණ කාලයක් ගත්තා. මට මතක විධියට අපි දුන්නේ මාසයයි, නැත්නම් මාස දෙකයි. එතුමාට පැහැදිලි කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ කියලා කියනවා, මම දැක්කා. මම හිතන විධියට එම වාර්තාවේ පැහැදිලිව තිබුණා, - එම වාර්තාව මන්ත්‍රීවරයකු සභාගත කළා. කාටත් බලන්න පුළුවන්. වැඩියෙන්ම සාක්ෂි ලබා දීමේ අවස්ථාව දීලා තිබෙන්නේ එතුමාට; නියෝජ්‍ය මහ ලේකම්තුමාට. එතුමා කරුණු දක්වලා තිබෙනවා. මේ පරීක්ෂණය තිබෙන්නේ කථානායකතුමා සහ එතුමා අතර තිබෙන රණ්ඩුවක්වත්, - මම දැක්කා එතුමාගේ නීතිඥතුමා කියනවා, මේක ආණ්ඩුව අතර තිබෙන ප්‍රශ්නයක් නොවෙයි කියලා. ඇත්තටම ආණ්ඩුවත් එක්ක තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. මේ පරීක්ෂණය තිබෙන්නේ එතුමාගේ පත් වීම සම්බන්ධව ඇති වෙච්ච ගැටලුවක් නිසා. ඇත්තටම RTI law එකෙන් ආපු තොරතුරක් මත තමයි මේ පරීක්ෂණය පටන් ගන්නේ.

අපි දේශපාලන වශයෙන් අත දරුවෝ නොවෙයි. අපට මෙහි වෙච්ච දේවල් ගැන යම් අවබෝධයක් තිබෙනවා. නමුත්, අපි ඒවා පස්සේ එළවන්නේ නැහැ. අපි දේශපාලන වශයෙන් 'අ', 'ආ' කියන අය නොවෙයි නේ. මේ පාර්ලිමේන්තුව රාජපක්ෂකරණයට ලක් කර ගත්තේ කොහොමද, ශිරානි බණ්ඩාරනායක මැතිනිය ගෙනාවේ කොහොමද කියලා අපි දන්නවා. හැබැයි, අපි ඒවා පස්සේ එළවන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත්, යම් කිසි ප්‍රශ්නයක් ඇති වුණාට පස්සේ ඒක ගැන පරීක්ෂණ කරන එක වළක්වන්න අපට බැහැ. මට කියන්න ඕනෑකම තිබෙන්නේ සියයට සියයක්ම procedure එකට අනුව කටයුතු කර තිබෙනවා කියලායි. නියෝජ්‍ය මහ ලේකම්තුමාට අවස්ථාව දීලා තිබෙනවා, එතුමාගේ තර්ක කරුණු ඉදිරිපත් කරන්න. ඒ වාගේම මූලික විමර්ශනයෙන් පස්සේ එතුමාට ලැබෙනවා,- මේ මූලික විමර්ශනයක් නේ කෙරුණේ. ඊට පස්සේ එතුමාට විධිමත් පරීක්ෂණයක් - formal inquiry එකක් - කරනවා. ඒ formal inquiry එකට අදාළ විස්තර ලැබුණාට පස්සේ එතුමාට පුළුවන් ඒ සම්බන්ධයෙන් කරුණු දක්වන්න. මම හිතන විධියට එතුමාට ඒකට විරුද්ධව උසාවි යන්නත් පුළුවන්. අපි Staff Advisory Committee එකේදීම කියපු දෙයක් තිබෙනවා. මොකක්ද? සාමාන්‍යයෙන් අපට තිබෙන අත්දැකීම තමයි මූලික විමර්ශනයක් කරලා ගෙදර යවන එක. වැඩ තහනම් කරලා හරි මොනවා හරි කරනවා. එහෙම කරලා formal inquiry එක පත් කරන්න අවුරුදු දෙක තුන ගන්නවා. අපේ අමාත්‍යාංශ නිලධාරින් එනවා අවුරුදු දෙක තුනයි, මූලික විමර්ශනය විතරයි තිබෙන්නේ. Formal inquiry එක කරලා නැහැ. ඒක තමයි සාමාන්‍යයෙන් රාජ්‍ය සේවයේ තිබෙන අත්දැකීම. අපි Staff Advisory Committee එක තීන්දු කළා, මූලික විමර්ශනයෙන් පස්සේ මාස ගණන් ඇදගෙන යන්නේ නැතිව ඒ formal inquiry එක ඉක්මනට කරන්න කියලා. එතකොට එතුමාට අවස්ථාවක් ලැබෙනවා, එතුමාගේ දුක් ගැනවිල්ල කියන්න.

අපි ඉතාම ප්‍රජාතන්ත්‍රවාදී විධියට, - මොකද, පාර්ලිමේන්තුව කැත කරන්න අපි ආවේ නැහැ. පාර්ලිමේන්තුව ලස්සන කරන්න අපි ආවේ. අපි මජර ක්‍රමයෙන් පාර්ලිමේන්තුව ගලවාගෙන තිබෙනවා. අද පාර්ලිමේන්තුව Standing Orders අනුව වැඩ කරනවා; පාර්ලිමේන්තුවේ සල්ලි ටොන් ගණන් අපි ඉතුරු කරනවා; පාර්ලිමේන්තුව වෙලාවට function වෙනවා. මට කියන්න තිබෙන්නේ මේකයි. මම මීට වඩා විස්තර කියන්න යන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ, කථානායකතුමා සම්බන්ධ අල්ලස් ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒක වෙනම එකක්. මම ඇත්තටම සතුටු වනවා, අල්ලස් කොමිසමට ගිහිල්ලා,- මම හිතන විධියට මෙතැනිනුත් විමර්ශනයක් ගිහිල්ලා තිබෙනවා.

ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා පිළිබඳ විමර්ශන කොමිසමට නියෝජ්‍ය මහ ලේකම්තුමාත් පැමිණිල්ලක් කරලා තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා පිළිබඳ විමර්ශන කොමිසම රටේ කීර්ති නාමයක් දිනා ගෙන තිබෙන ආයතනයක්. අපි දකින්න කැමැතියි එතුමන්ලා ඒ පරීක්ෂණය කරන ආකාරය. කථානායකතුමා හෝ කවුරුන් හෝ වැරැද්දක් කරලා තිබෙනවා නම්, ඒක වෙනම විමර්ශනයක්. නියෝජ්‍ය මහ ලේකම්තුමාට අදාළව ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒක වෙනම විමර්ශනයක්. මේ දෙකේ සම්බන්ධයක් නැහැ. අනෙක, ඒ පරීක්ෂණ දෙක තැන් දෙකක තමයි විභාග වෙන්නේ. කථානායකතුමා නඩුකාරයා නොවෙයි. කථානායකතුමා මේ කමිටුවේ එක්කෙනෙක් විතරයි. එතුමා, සභාපති.

අපි මේකේ පසුබිම දැන ගෙන තමයි වැඩ කරන්නේ. නමුත්, අපි පසුබිම යොදා ගන්නේ නැහැ. අපි පසුබිම යොදා ගන්න ගියොත් ගොඩාක් අමාරු වෙනවා; ගොඩාක් අයට අමාරු වෙනවා. අපි එහෙම කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි තුනෙන් දෙකක බලයක් අරගෙන මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා 15 වෙනි මාසයේ තමයි මේ පරීක්ෂණ සිද්ධ වෙලා තිබෙන්නේ. අපි බොහොම සාධාරණව, ප්‍රජාතන්ත්‍රවාදීව තමයි කටයුතු

කරන්නේ. පාර්ලිමේන්තුවේ නිලධාරින්, සේවක මහත්වරුන්ගේ දේශපාලන පක්ෂ අපි කවදාවත් හොයලා නැහැ. මේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන්ම පක්ෂ ශාඛාවක් කළේ රාජපක්ෂලා. මට ඒක කියත හැකියි.

මම 2000 වසරේ මෙම පාර්ලිමේන්තුවට එනකොට, කවදාවත් අර නිලධාරි මහත්මයා, අර නිලධාරිතුමිය එහෙමයි, මෙහෙමයි කියලා අපට හිතුණේ නැහැ. ඒගොල්ලන් දක්ෂයි මෙතැන වැඩ කරන්න, දේශපාලනයෙන් තොරව. ඒගොල්ලන්ට දේශපාලනයක් තිබෙනවා. මෙතැන ඉන්න අයට දේශපාලනයක් තිබෙනවා නේ. ඡන්දය දෙන පක්ෂයක් තිබෙනවා. කවදාවත් ආණ්ඩු පක්ෂයද, විපක්ෂයද කියලා විශේෂයක් ඒ අය තුළින් මම දැකලා නැහැ. මේ ලයිට් එක පත්තු කළොත් ඇමතිටත් එකයි, මන්ත්‍රීටත් එකයි. හැබැයි, 2015 වෙනකොට සහමුලින්ම මේක කාල්ටන් එකක් කරලා තිබුණා. මේක මදාවියන්ගේ, තක්කඩින්ගේ බලාත්මක තැනක් බවට පත් කරලා තිබුණා. මන්ත්‍රීලාත් එහෙමයි, සමහර සේවක මහත්තුරුත් එහෙමයි. මේක කුඩුපට්ටම් කරලා තිබුණා. අපිට ඒක සුද්ද කරන්නත් එක්ක තමයි ජනවරම දීලා තිබෙන්නේ.

මම පොඩ්ඩක් වැඩිපුර වෙලාව ගත්තාද දන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මේකයි. නාමල් රාජපක්ෂ මහත්මයා, ශිරන්ති රාජපක්ෂ මහත්මිය කියනවා, අපි පළිගන්නවා කියලා. නාමල් රාජපක්ෂ මහත්මයාම කිව්වා, එතුමාට විරුද්ධව දාපු නඩු ඔක්කෝම දාලා තිබෙන්නේ රනිල් වික්‍රමසිංහ කියලා. රනිල් වික්‍රමසිංහ දාපු නඩු තමයි තිබෙන්නේ කියලා එතුමා කිව්වා නේද? එතුමන්ලා වැරදි කරලා තිබෙනවා නම් අපි බලයේ ඉන්න කාලයේදී එතුමන්ලාට නඩු දාන්න අපට පුළුවන් වෙයි. නමුත් එතුමාම කිව්වා, 'මේ නඩු සියල්ල රනිල් දාපු නඩු' කියලා. එහෙම නම් පළි ගැනීම මොකක්ද? මේ රට විනාශ කරපු කණ්ඩායම් අද "මයික් කටාර්ලා" වෙලා. හොර channels දෙකක් තිබෙනවා. ඒ channels දෙකෙන් බොරු කියනවා. එහෙම බොරු කියලා හිතා ගෙන ඉන්නවා මිනිස්සු තමන්ගේ පැත්තට ඇවිල්ලා කියලා. එහෙම වෙලා නැහැ. කොහේ හෝ පොල්වත්තක ගුබ්බෑයමකට ගිහිල්ලා photo එක zoom කරලා අරගෙන සමාජ මාධ්‍යයේ පළ කරනවා 25,000ක් සෙනඟ හිටියා කියලා. ඒ නිසා ඔය සෙනඟවලට අපි කලබල වෙන්නේ නැහැ. අපි මේ රටේ ජනතාවට වගකීමක් ඇතිව කටයුතු කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න තිබෙන දේ තමයි අපි ජනවරමට අනුව කටයුතු කරනවා. ඒ ජනවරමට අනුව අපි මිනිස්සුන්ට ඇහුම්කන් දෙනවා. ඒ නිසා තමයි සංවර්ධන නිලධාරින්ගේ ප්‍රශ්නය අපි විසඳා ගෙන තිබෙන්නේ. ඒ වාගේම පාර්ලිමේන්තුව ශක්තිමත් කරන තැනක මිසක් පොඩ්ඩක්වත් දුර්වල කරන තැනක නැහැ. අපි පාර්ලිමේන්තුව ශක්තිමත් කරනවා. අපි සම්බන්ධව විවේචන කරන එක ගැන විවාදයක් නැහැ. නමුත්, අපිට කියන්න තිබෙන දේ තමයි අපි සම්බන්ධව බොරු විවේචන හදන්න එපා කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් ඔබතුමාගෙන් විනාඩි දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. මන්ත්‍රීවරයෙක් කිව්වා, මුලතිව්වල කිවුල් ඔය ව්‍යාපාරය හදන්නේ සිංහල ජනපදකරණය කරන්නයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට කියන්න කැමතියි අපි සහමුලින්ම ජාතිවාදයෙන් තොරව වැඩ කරන දේශපාලන ව්‍යාපාරයක් කියන එක. අපි ඒක ඔප්පු කරලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමා උතුරට ගිහිල්ලා පෙන්වලා තිබෙනවා. අපි ප්‍රායෝගිකව වැඩ කරලා තිබෙනවා. යුද්ධයෙන් පස්සේ උතුර පහළින් ඉන්න නිසා, නැඟෙනහිර ප්‍රදේශය පහළින් ඉන්න නිසා, මලයගම් - කඳුකර ප්‍රදේශය - පහළින් ඉන්න නිසා අපි ඒවාට මහන්සි වෙනවා. ජනාධිපතිතුමා 6 වෙනි දා යනවා වැඩියෙන්ම විනාශ වෙච්ච ප්‍රදේශවල - affected areasවල - ගෙවල් හදන වැඩවලට. පොංගල් සමරන්න යනවා. ඒ විතරක් නොවෙයි. අපි උතුරට විශාල මුදලක් වෙන් කරනවා. එහිදී අපි බලන්නේ නැහැ දෙමළ ගොවියා ද, සිංහල ගොවියා ද, මුස්ලිම් ගොවියා ද කියලා.

ඇයි, අපි බලන්නේ නැත්තේ? මම කියලා තිබෙනවා ලංකාවේ ලොකුම දමිළ පක්ෂය තේශීය මක්කල් ශක්ති, ලංකාවේ ලොකුම මුස්ලිම් පක්ෂයත් තේෂිය මක්කල් ශක්ති, ලංකාවේ සිංහල මිනිස්සු වැඩිපුර ඉන්න පක්ෂයත් තේශීය මක්කල් ශක්ති - ජාතික ජන බලවේගය - කියලා. එතකොට උතුරේ, වන්නි දිස්ත්‍රික්කයේ අපි තමයි ලොකුම පක්ෂය. වන්නි දිස්ත්‍රික්කයේ සිංහල අයට විතරක් අපි සලකන්නේ ඇයි? දෙමළ මිනිස්සු අතහැරලා දමපු, නිකම්ම නිකම් අනාථ වෙලා ඉන්න ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂයට අපි මිනිස්සු දෙන්නේ ඇයි? සුමන්තිරන් වාගේ මන්ත්‍රීවරයෙක් ඡන්දයෙන් පැරදිලා දැන් මොනවාවත් කියා ගන්න බැරිව, නඩු කිය කියා නේ ඉන්නේ. ඒ නිසා ඔවුන් desperate වෙලා මොකක් හරි එකක් හොයනවා, ජාතිවාදය අදින්න.

අපි උතුරු පළාතේ වාරිමාර්ග සංවර්ධනය කරනවා. අලුත් ජලාශ හදනවා. අපි මන්නාරමේ පාලිආරු හදනවා. පාලිආරු හදලා මන්නාරමටයි, යාපනයටයි දෙකටම බොන්න වතුර දෙනවා. සුමන්තිරන් මන්ත්‍රීතුමා රනිල්ගේ ආණ්ඩුවේ "*de facto* අගමැති" වාගේ නේ හිටියේ. මොකක් හරි කර ගත්තාද? අපි ලබන මාසයේ වඩමාරච්චිවලට උඩින් ජේදුරු තුඩුව කිට්ටුව තිබෙන විශාල ජලාශයක් open කරනවා. පානීය ජලය සඳහා අපි වියදම් කරනවා. උතුරු දුම්රිය මාර්ගය ඉක්මනට හදලා ඉවර කරනවා. ඒ වාගේම තමයි උතුරේ ඉන්න දුප්පත් ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනවා. ඒවා කරන්නේ කථා කරලා. හොරෙන් කරන්න බැහැ නේ.

ඒක නිසා අපි මේ කාරණය කියන්න කැමැතියි. වැලේ වැල් නැතුව හිටියාට කමක් නැහැ, ජාතිවාදය නම් ගෙනෙන්න එපා. ජාතිවාදයෙන් වැඩියෙන්ම පිච්චෙන්නේ දෙමළ සහ මුස්ලිම් ජනතාව. ඒක නිසා අපි ඒ ජාතිවාදයෙන් තොරව තමයි වැඩ කරන්නේ. ඒක නිසා මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම්, අපිත් එක්ක සාකච්ඡා කරලා කරුණු පැහැදිලි කරගෙන කටයුතු කරන්නේ නැතුව කවුරු හරි කියන තොරතුරු, බොරුමත කටයුතු කරන්න එපා කියන ඉල්ලීම කරමින්, මගේ කථාව නතර කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[පි.ව. 3.37]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அம்பாறை மாவட்டத்தின் பொத்துவில் பிரதேச செயலகப் பிரிவு எல்லைக்குள் தொலைபேசி சேவையைப் பயன்படுத்து கின்ற பயனாளிகள், 063 code இலக்கத்தைப் பயன்படுத்தி வருகின்றார்கள். இது அம்மாறை மாவட்டத்துக்குரிய code ஆகும். ஆனால், கரையோரப் பிரதேசங்களில் 067 என்ற code

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

இலக்கமே பயன்படுத்தப்படுவது வழமையாக உள்ளது. பொத்துவில் தொலைபேசி பயனாளிகள் கரையோரப் பிரதேசங்களில் உள்ளவர்களுடன் 063 இலிருந்து 067 code பாவித்து தொடர்பை மேற்கொள்ளும்போது வீணானதொரு மேலதிகச் செலவைச் செய்யவேண்டி உள்ளது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair and DEPUTY CHAIRPERSON OF COMMITTEES took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

எனவே, இந்த அரசானது பொத்துவில் மக்கள் பயன்படுத்து கின்ற தொலைபேசி code இலக்கத்தை 067ஆக மாற்றம் செய்வதற்கு ஆவன செய்ய வேண்டுமென்று இந்தச் சபையில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

நாட்டில் 16,000க்கும் மேற்பட்ட பாடசாலைகளில் கடமைபுரியும் அபிவிருத்தி உத்தியோகத்தர்கள், தமக்கு ஆசிரியர் நியமனம் வழங்கப்பட வேண்டுமென உண்ணா விரதப் போராட்டத்தில் ஈடுபட்டு வருகின்றார்கள். பாடசாலை நேரத்தில் ஆசிரியர்களாகவும், பின்னர் பி.ப 4.15 மணிவரையும் சனிக்கிழமைகளிலும் அபிவிருத்தி உத்தியோகத்தர்களாகவும் இரு கடமைகளை மேற்கொண்டு வருகின்றார்கள் என்பதை இங்கு ஞாபகப்படுத்த விரும்புகின்றேன். கடந்த ஆறு ஆண்டுகளாக பல வகுப்புகளில் ஆசிரியர்களாகக் கடமை யாற்றி வந்தவர்களுக்கு மீண்டும் ஒரு போட்டிப் பரீட்சையை நடாத்தி ஆசிரியர் நியமனத்தை வழங்க முயற்சிப்பது ஓர் அநீதியான விடயமாகும் என்பதைக் குறிப்பிட விரும்புகின்றேன். விரைவாக குறித்த அபிவிருத்தி உத்தியோகத்தர் களுக்கு நியாயமானதொரு தீர்வை வழங்கி, ஆசிரியர் சேவைக்குள் அவர்களை உள்வாங்குவதற்கான நடவடிக்கைகளை அரசாங்கம் மேற்கொள்ள வேண்டும். சம்பளத்தைப் பற்றி கவனிக்காமலாவது இந்த அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு ஆசிரியர் நியமனத்தை வழங்க விரைவில் நடவடிக்கை எடுக்க வேண்டும். நான் பிரதிநிதித் துவப்படுத்தும் பொத்துவில் பிரதேசத்தில் அநேகமான பாடசாலைகளில் இருநேரக் கடமைகளை அபிவிருத்தி உத்தியோகத்தர்கள் மேற்கொள்கின்றார்கள் என்பதைக் கூறவிரும்புகின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அம்பாறை மாவட்டத்திலிருந்து வெளிநாட்டு வேலைவாய்ப்புக் காகச் சென்ற ஆயிரக்கணக்கானவர்கள் இலங்கைக்கு அதிகமான அந்நியச் செலாவணியை ஈட்டித் தருகின்றார்கள். கிழக்கு மாகாணத்தில் குறிப்பாக, அம்பாறை மாவட்டத்தில் ஒரு கடவுச்சீட்டு அலுவலகத்தை அமைத்துத் தருமாறு வேண்டுகின்றேன். அண்மையிலுள்ள கண்டி மற்றும் மாத்தறை போன்ற இடங்களுக்குச் சென்று கடவுச்சீட்டைப் பெறுவதற்கு 5 மணித்தியாலங்களுக்கும் மேல் போக்குவரத்துக்காகச் செலவழிக்க வேண்டியுள்ளது. இது மிகச் சிரமமாகவுள்ளது.

மேலும், அம்பாறையில் சாரதி அனுமதிப்பத்திரத்தைப் புதுப்பிப்பதற்கு மருத்துவச் சான்றிதழைப் பெறுவதற்காக ஒரு நாள் முழுவதும் வீணடிக்க வேண்டிய நிலைமை காணப்படு வதால், பிரதேச மட்டத்தில் மருத்துவச் சான்றிதழைப் பெற்றுக்கொள்வதற்கான வழிவகைகள் செய்யப்பட வேண்டு மென கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அவுஸ்திரேலியாவைத் தளமாகக்கொண்ட Capital Metals PLC நிறுவனம் சுமார் 10 ஆண்டுகளாக இல்மனைட் மணல் அகழ்வை மேற்கொள்ளும் நோக்கில், கிழக்குக் கரையோரப் பகுதிகளில் தொடர்ச்சியான முயற்சிகளை மேற்கொண்டு வருகின்றது. குறிப்பாக, அக்கரைப்பற்று தொடக்கம் பொத்துவில் வரை இத்திட்டத்தை நடைமுறைப்படுத்த முயன்றுவரும் இந்தக் கம்பனி, 2018, 2019 காலப்பகுதிகளில் திருக்கோவில், தம்பிலுவில், விநாயகபுரம், தாண்டியடி மற்றும் உமிரி போன்ற பகுதிகளை இலக்காகக்கொண்டு GSMB மற்றும் CCD ஆகிய அரச நிறுவனங்களின் அனுசரணையுடன் சில வேலைத்திட்டங்களை ஆரம்பிக்க முயன்றது. அப்போது அந்தப் பிரதேசத்தைச் சேர்ந்த கௌரவ பாராளுமன்ற உறுப்பினர் கவீந்திரன் கோடீஸ்வரன் அவர்களின் தலைமையில் 5,000க்கும் மேற்பட்ட மக்கள் ஒன்றிணைந்து நடத்திய பெரும் போராட்டத்தின் காரணமாக, அந்த நிறுவனம் அப்பகுதிகளில் இருந்து வெளியேற்றப்பட்டது என்பதையும் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தற்போது அந்த நிறுவனம் மீண்டும் கோமாரி மற்றும் பொத்துவில் - அறுகம்பே போன்ற பகுதிகளை இலக்காகக் கொண்டு, சில நடமாட்டங்களை மேற்கொண்டு வருவதாக மக்களிடையே கடும் அச்சமும் கவலையும் ஏற்பட்டுள்ளது. சூழல் சமநிலையைக் கடுமையாகப் பாதிப்பதுடன், மீன் வளத்தை அழிப்பதற்கும், கடற்கரையோர அரிப்பை ஏற்படுத்து வதற்கும் காரணமாக அமைவதுடன், மக்களின் வாழ்வா தாரத்தையும் சுற்றுலாத்துறையையும் முற்றாகச் சிதைக்கும் அபாயத்தையும் கொண்டதாக அந்த நடவடிக்கை இருக்கும் என்பதாக அப்பிரதேச மக்கள் தீவிரமாக விமர்சனம் செய்து வருகின்றனர்.

எங்கள் பிரதேசம் உள்நாட்டு மற்றும் சர்வதேச அளவிலான சுற்றுலாப் பயணிகள் அதிகம் வருகை தரும் முக்கிய சுற்றுலாத் தலங்களில் ஒன்றாக விளங்குகின்றது. குறிப்பாக, அறுகம்பே போன்ற இடங்கள் நாட்டின் பொருளாதாரத்துக்கு முக்கிய பங்களிப்பை வழங்குகின்றன. எனவே, இந்தப் பின்னணியைக் கருத்திற்கொண்டு, மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த விடயத்தில் உடனடியாகத் தலையிட்டு, சூழலழிவை ஏற்படுத்தும் இல்மனைட் அகழ்வுத் திட்டத்தை முற்றாக நிறுத்துவதற்குத் தீர்மானம் மிக்க நடவடிக்கைகளை எடுக்க வேண்டுமென இந்த உயரிய சபையினூடாக வலியுறுத்திக் கேட்டுக்கொள்கின்றேன். அத்துடன், பிரதேச செயலகங்களும் பிரதேச சபைகளும் இத்திட்டத்துக்கு நேரடியாகவோ, மறைமுகமாகவோ எந்தவிதமான அனுமதிகளையோ, உதவிகளையோ வழங்கக் கூடாது என்பதையும் தெளிவாக

இங்கு வலியுறுத்த விரும்புகின்றேன். எங்கள் சுற்றுலாத்துறை சார்ந்த வளங்களையும் இயற்கைச் சூழலையும் எதிர்காலத் தலைமுறையின் உரிமைகளையும் பாதுகாக்கும் வகையில், இந்தத் திட்டம் முழுமையாகக் கைவிடப்பட வேண்டும் என்பதே எங்களின் உறுதியான நிலைப்பாடாகும்.

எமது நாட்டில் கல்வி கற்கின்ற விசேட தேவையுடைய மாணவர்களுக்காக மாகாண மட்டத்தில் விடுதி வசதியுடன் கூடிய தனியான பாடசாலையொன்றை அமைப்பதற்கான ஏற்பாடுகளை அரசு மேற்கொண்டு, மாணவர்களது கல்வியைச் சிறப்பாகத் தொடர நடவடிக்கை எடுக்க வேண்டும். அத்துடன், இம்மாணவர்கள் கல்வி பயிலும்போது அவர்களது விசேட திறமைகளை இனங்காண்பதன்மூலம், அவர்களுக்கான தொழில் வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுத்து, அரசு அவர்களது எதிர்கால வாழ்வைச் சிறப்பாக முன்னெடுக்க முடியும்.

தற்போது அதிபர்களுக்கான கொடுப்பனவாக 1,500 ரூபாய் வழங்கத் தீர்மானிக்கப்பட்டுள்ளது. இதனை அதிகரித்து வழங்க வேண்டும். பொறுப்பு அதிபர்கள் 8,000 பேரும், பிரதி மற்றும் உதவி அதிபர்கள் 4,000 பேரும் உள்ளனர். அதிபர்களுக்காக வழங்கத் தீர்மானிக்கப்பட்டு இருக்கின்ற 1,500 ரூபாய் பிரதி மற்றும் உதவி அதிபர்களுக்கும் வழங்கப்பட வேண்டும். இவர்களுக்கான தொலைபேசிக் கொடுப்பனவையும் வழங்க நடவடிக்கை எடுக்க வேண்டும். அதிபர் சேவைக்கு விண்ணப்பிக்க ஆசிரியர்கள் விருப்புவதில்லை. காரணம், இது ஒரு பதவி உயர்வாக அன்றி பதவி மாற்றமாகவே அவர்கள் கருதுகிறார்கள். அதிபராக ஆசிரியர் ஒருவர் நியமனம் பெறும்போது சம்பளம் குறையும் நிலை காணப்படுகின்றது. இதனைத் தீர்க்கும் முகமாக, அதிபர்களுக்கான சம்பள அளவு திருத்தப்பட வேண்டும் என்பதுடன், அதிபர்களது அனைத்து வரப்பிரசாதங்களும் வழங்கப்படுவதன்மூலம், பாடசாலை களைச் சிறப்பாக நிருவகிக்கக்கூடிய சூழ்நிலையை ஏற்படுத்த லாமென நம்புகிறேன். அத்துடன், மாணவர்களின் கல்வியிலும் அதிக வளர்ச்சி ஏற்படும்.

பொத்துவிலில் கிடைக்கும் பாலின்மூலம் பாலுடன் தொடர்புபட்ட உற்பத்திகளை மேற்கொள்வதற்கான ஒரு தொழிற்சாலையை அமைக்க முடியுமாக இருந்தால், அப்பகுதி இளைஞர், யுவதிகள் தொழில்வாய்ப்புப் பெறும் நிலைமை ஏற்படும். இது விடயமாக அரசு கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அம்பாறை கச்சேரியில் இயங்குகின்ற Land Registryக்குப் போதிய அளவு இடவசதி இல்லாத காரணத்தால், அதன் மூலமாக அங்குள்ள மக்களுக்குப் பூரணமான சேவையைப் பெறமுடியாமல் உள்ளது. எனவே, இதன் தேவையை அறிந்துகொண்டு விஸ்தீரணமுள்ள இடம் ஒன்றை இதற்காக வழங்கி, மக்கள் தமது சேவையைத் திறம்படப் பெற்றுக் கொள்ள வழி செய்யப்பட வேண்டும்.

பொத்துவில் தபாலகத்தில் கடமைபுரியும் Fahmy, Ranjith, Bathuru Mujaya ஆகிய ஊழியர்கள் நிரந்தரம் செய்யப் படவில்லை என்பதால், அவர்களை நிரந்தரமாக்க நடவடிக்கை எடுக்க வேண்டும் என்பதுடன், ஹிதாயாபுரம், கோமாரி, பசறிச்சேனை போன்ற இடங்களிலுள்ள உப தபாலகங் களுக்குப் புதிய அலுவலகக் கட்டிடங்கள் அமைக்கப்பட வேண்டும் எனவும் கேட்டுக் கொள்கின்றேன். மேலும், பொத்துவில் பிரதேச சபையில் நிரந்தரமாக்கப்படாமல் உள்ள Rifan, Sathiya Seelan போன்றோருக்கும் நிரந்த நியமனம் வழங்க வேண்டுமென கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මම කථාව අවසන් කරනවා.

இறுதியாக, நாடளாவிய ரீதியில் கடமைபுரிகின்ற 3,000க்கும் அதிகமான performance principlesஇன் திறமை, அர்ப்பணிப்பு, சேவைக் காலம் போன்றவற்றைக் கருத்திற் கொண்டு, அரசானது அவர்களுக்கு அதிபர் சேவை கிடைப்பதற்கு ஏற்ற நடவடிக்கையை எடுக்க வேண்டும். அவ்வாறு பாடசாலைகளில் அதிபர்களாக உள்ளவர்களுக்குப் பதிலாகப் புதியவர்களை கிழக்கு மாகாணத்தில் நியமிக்கும் நடவடிக்கையை நிறுத்த வேண்டும். ஏனைய அதிபர்களுக்கு அரசால் வழங்கப்படும் அனைத்துக் கொடுப்பனவுகளும் சலுகைகளும் இந்த அதிபர்களுக்கும் வழங்கப்பட வேண்டும் என்று இந்தச் சபையினூடாகக் கேட்டு, விடைபெற்றுக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.44]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අද අපි වැදගත් සාකච්ඡාවකට, වැදගත් විවාදයකට සම්බන්ධ වෙලා ඉන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට වැදගත් විවාදයක් වුණත්, සජබට මේක වැදගත් වුණේ නැහැ; මුස්ලිම් කොංග්‍රසයට වැදගත් වුණේ නැහැ; ඉලංගෙයි තමිළ් අරසු කච්චි එකට වැදගත් වුණේ නැහැ. අපේ රටේ සියලු පද්ධති අපි දියුණු කරන්න ඕනෑ. අද මොකක්ද මේ අය කරන්නේ? ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ ගෙන එන රෙගුලාසි බලාත්මක කරන විවාදයේදී අද ඇවිල්ලා ඔවුන් කථා කරන්නේ මොකක්ද? විපක්ෂයේ සියලු පක්ෂවලට රටේ දියුණුවක් නොවෙයි දකින්න ඕනෑ. මේ රටේ පවතින පනත් සංශෝධන වෙන්න ඕනෑය කියලා ඔවුන් දකින්නේ නැහැ.

අපේ රටේ ළමයින්ට ඩිජිටල් තාක්ෂණය, සන්නිවේදනය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ලැබෙනවා දකින්න මේ විපක්ෂය කැමැති නැහැ. නමුත් එල්ලෙන්න මොනවා හරි නැති හින්දා එක එක කරුණුවල එල්ලෙනවා. "දිට්වා" සුළි කුණාටුවේ එල්ලෙන්න හැදුවා, සංවර්ධන නිලධාරීන්ගේ කරේ එල්ලෙන්න හැදුවා, වෙනත් එක එක ව්‍යාපෘතිවල එල්ලෙන්න හැදුවා. මන්නාරමේ සුළං විදුලි බලාගාරයේ එල්ලෙන්න හැදුවා. තව කණ්ඩායමක් ත්‍රිකුණාමලයට ගිහිල්ලා එතැන මොනවා හරි ජාතිවාදී අදහස් ප්‍රකාශ කරලා, ජාතිවාදී කෝලාහලයක්, ප්‍රශ්නයක් ඇති කරලා ඒකේ එල්ලෙන්න හැදුවා. නමුත්, එල්ලෙන්න වෙන මොනවාවත් නැති නිසා මේ අය ඒවායේ එල්ලෙනවා. මේ විපක්ෂය, රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් හිතන පතන විපක්ෂයක් නම්

[ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා]

අනිවාර්යයෙන්ම ඒ පනතට ගෙන එන සංශෝධනයේ, නැත්නම් රෙගුලාසිවල තිබෙන අඩු පාඩු අද සාකච්ඡා කරන්න ඕනෑ. එහෙම කරලා, විපක්ෂයේ කාර්යභාරය අද හරියාකාරව ඉටු කරන්න ඕනෑ.

මේ සියලු පද්ධති දියුණු කරන්න ඕනෑය කියන අදහසින් අපි කටයුතු කරන්න ඕනෑ. අපට වියුක්තව මේ සංවර්ධනය කරන්න බැහැ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා නම් අනිවාර්යයෙන්ම ඒකට ඩිජිටල් තාක්ෂණය ඕනෑ. එතකොට කුලුනු ඕනෑ. සන්නිවේදන පහසුකම් ඕනෑ. අපි ආර්ථිකය නඟාසිටුවන්න ඕනෑ. පසුගිය දිනවල අපේ රට ආපදාවට ලක් වෙච්ච වෙලාවේ අපට සන්නිවේදන පහසුකම් අඛණ්ඩව ඕනෑ වුණා. වගකිව යුතු රජයක් හැටියට 1991දී හදපු පනත, 1996දී සංශෝධනය වෙලා තිබෙනවා. 1996න් පස්සේ 2024දී නැවත සංශෝධනයක් ගෙනැත් තිබෙනවා, ඒත් භාගෙට තියාගෙන. ඒ සංශෝධනය කරපු පනතට රෙගුලාසි ගෙනැල්ලා අද අපි ඒවා බලාත්මක කරන්න සාකච්ඡා කරනවා. මේ සාකච්ඡාව අත්‍යවශ්‍ය සාකච්ඡාවක් කියලා ආණ්ඩුව විශ්වාස කරනවා.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இலங்கை தொலைத்தொடர்புகள் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகளை - Regulationsஐ - நடைமுறைப்படுத்துவதானது, எமது நாட்டிலுள்ள அனைத்துத் துறைகளின் அபிவிருத்திக்கும் மிகவும் முக்கியமானது. 1991ஆம் ஆண்டு இயற்றப்பட்ட இந்தச் சட்டமானது, 1996ஆம் ஆண்டில் திருத்தம் செய்யப்பட்டுள்ளது. அதற்குப் பிறகு, 2024ஆம் ஆண்டில் திருத்தம் கொண்டுவரப்பட்டு, இடையில் நிறுத்தப்பட்டு இருக்கின்றது. இன்று நாங்கள் இந்தச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகளை - Regulationsஐ - நிறைவேற்றுவதற்கான விவாதத்தில் ஈடுபட்டுக்கொண்டு இருக்கின்றோம்.

இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டுள்ள இந்த ஒழுங்குவிதிகளில் முக்கியமான சில விடயங்கள் உள்ளன. குறிப்பாக, இந்த நாட்டின் மூலதனம் எவ்வாறு பயன்படுத்தப் படுகின்றது? என்ற விடயம் முக்கியமானது. எமது நாட்டின் தேவைகளை நிறைவேற்றக்கூடிய அளவுக்கு எமது நாட்டில் நிறுவப்பட்டிருக்கின்ற towersஇன் எண்ணிக்கை போதாது. எமது நாட்டில் சுமார் 8,000 towers இருந்தாலும், இன்னும் 800 towers தேவையாகவுள்ளது. இந்த வருடத்தில் 150 towersஐ நிறுவுவதற்குத் தேவையான மூலதனத்தில் 75 சதவீதத்தை அரசாங்கம் வழங்க உள்ளது. இந்த 800 towersஐயும் ஒரே தடவையில் நிறுவ முடியுமா என்பது தொடர்பில் நாங்கள் கலந்தாலோசித்து வருகின்றோம்.

Telecommunication service என்பது, எமது நாட்டின் அனைத்துப் பிரதேசங்களுக்கும் கட்டாயத் தேவையாகவுள்ளது. சில ஊர்களில் தொலைபேசி அழைப்புகளை எடுக்க முடியாத நிலைமை உள்ளது. ஏன் இந்த regulationsஐ நடைமுறைப் படுத்த வேண்டும் என்பதை மீண்டும் கூறுகின்றேன். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஒவ்வொரு நிறுவனமும் ஒவ்வொரு tower வீதம் நிறுவுமானால், எமது நாட்டின் மூலதனம் எவ்வளவோ வீண்விரயமாகும். அது தனியாருடைய மூலதனமாக இருக்கலாம் அல்லது அரசாங்கத்தின் மூலதனமாக இருக்கலாம்! உதாரணத்துக்கு மூன்று நிறுவனங்கள் இருந்தால், இந்த ஒழுங்குவிதிகளை நடைமுறைப்படுத்தும்போது, ஒரே towerஐ குறித்த மூன்று நிறுவனங்களும் பயன்படுத்த முடியும். இதனால் அதிகளவு மூலதனம் செலவாகுவதைத் தவிர்க்க முடியும் என்பதோடு, நடைமுறைச் செலவையும் குறைக்க முடியும். மேலும், செலவினம் குறைவடைந்து, போட்டித்தன்மை உருவாகி, நுகர்வோருக்கு அதிகளவு சலுகையுடனான சேவையையும் வழங்க முடியும்.

இந்த ஒழுங்குவிதிகளை நடைமுறைப்படுத்தும்போது, TRCSLக்கு இந்த விடயத்துடன் தொடர்புடைய நிறுவனங்களை monitor பண்ணக்கூடிய வாய்ப்பு ஏற்படும். இதன்மூலம் அந்த நிறுவனங்களின் செயற்பாடுகள் ஒழுங்குறுத் தப்பட்டு, qualityஆன உயர்ந்த மட்ட சேவையை வழங்கக் கூடியதாக இருக்கும். எனவே, இந்த ஒழுங்குவிதிகள் கட்டாயம் நிறைவேற்றப்பட வேண்டும். எமது நாட்டிலுள்ள ஏனைய துறைகளை ஒழுங்குபடுத்திக்கொண்டு செல்லும் அதே வேளையில்தான் நாங்கள் இந்த ஒழுங்குவிதிகளையும் நடைமுறைப்படுத்த உள்ளோம். TRCSLஇன் வருமானத்தைப் பார்ப்போமேயானால், 2024ஆம் ஆண்டு கிட்டத்தட்ட 37.6 பில்லியன் ரூபாயை வருமானமாகப் பெற்றுள்ளது. அதில் செலவினமாக 8.6 பில்லியன் ரூபாய் இருந்தது. எங்களுடைய அரசாங்கத்தின் செயற்பாடுகள்மூலம் - கவனமாக நிருவகித்ததன்மூலம் - 2025ஆம் ஆண்டில் 45 பில்லியன் ரூபாயை வருமானமாக ஈட்ட முடிந்துள்ளது. அது மாத்திரமன்றி, ஒரு பக்கம் வருமானத்தை அதிகரிக்கும்போது, மறுபுறம் செலவினத்தைக் குறைத்துள்ளோம். 2024ஆம் ஆண்டு 8.6 பில்லியன் ரூபாயாக இருந்த செலவினத்தை 2025ஆம் ஆண்டில் 5.4 பில்லியன் ரூபாயாகக் குறைத்துள்ளோம். இவ்வாறு பல்வேறு சட்டங்களைத் திருத்தி, இந்த நாட்டின் அடிப்படைத் தேவைகளையும் மக்களுடைய தேவைகளையும் நிறைவேற்றி, நாட்டை அபிவிருத்திப் பாதையில் கொண்டுசெல்லவேண்டிய தேவையுள்ளது.

සජබஇனராக இருக்கலாம், ஏனைய கட்சியினராக இருக்கலாம், இவர்கள் இன்றும் இனவாத அரசியலைச் செய்வது கவலையளிக்கின்றது. எனக்கு முன்னர் உரையாற்றிய ஒரு பாராளுமன்ற உறுப்பினர், முழுக்க முழுக்க இனவாதத்தையே - விஷத்தையே - கக்கினார். இவர்கள் இனவாதத்தைக் கக்கி, இதுவரை அந்த மக்களுக்காக எதனைச் சாதித்துள்ளார்கள்? இந்தப் புறத்தின் மூலையில் இருக்கும் பாராளுமன்ற உறுப்பினர் ஒவ்வொரு நாளும் இந்தச் சபையில் ஏதாவது ஒரு பிரச்சினையை இனவாதத்துடன் முன்வைப்பார். இன்று பிரதிச் செயலாளர் நாயகம் சம்பந்தமான பிரச்சினையை முன்வைத்தார்.

வடக்கு, கிழக்குக்கு அபிவிருத்தி தேவையில்லையா? Irrigation project தேவையில்லையா? வட்டுவாகல் பாலம் அமைக்கத் தேவையில்லையா? யாழ்ப்பாணத்துக்குக் குடிநீர் தேவையில்லையா? என்று நான் கேட்கின்றேன். அபிவிருத்தி வேலைகளைச் செய்யும்போது நிலத்தை acquire பண்ணவேண்டிய தேவை அரசாங்கத்துக்கு உள்ளது. அதன்மூலமே மக்களுக்குரிய அடிப்படைத் தேவைகளை நிறைவேற்ற முடியும். இன்று இந்த நாட்டு மக்கள் இந்த அரசாங்கத்தை மிகவும் மதிக்கிறார்கள். ஒரு வருடத்துக்குள் 5 முறை யாழ்ப்பாணத்துக்குப் போன தெற்கைச் சேர்ந்த ஒரு தலைவர் - சனாதிபதி - இருந்தால், எனக்குச் சொல்லுங்கள்! மலையக மக்களுக்கென செயற்றிட்டங்களை நடைமுறைப் படுத்திய ஒரு சிங்களத் தலைவரை - சனாதிபதியை - கூறுங்கள் பார்ப்போம்!

இன்று அனைத்து மக்களும் நிம்மதியாக இருக்கிறார்கள்; திருப்தியுடன் இருக்கிறார்கள். முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கலாம், தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கலாம், சிங்கள பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கலாம், இந்த அரசாங்கம்

இனவாதத்துடன் செயற்படுகின்றது என்று யாராலும் கூற முடியாது. ஏனென்றால், இன்று அனைத்து மக்களும் நிம்மதியாக வாழுகின்றார்கள். நீங்கள் மீண்டும் மீண்டும் உங்களுடைய மக்களை அதலபாதாளத்துக்குள் இட்டுச் செல்கின்றீர்கள் என்று நாங்கள் உறுதியாகச் சொல்கின்றோம். ஏன் வட்டுவாகல் பாலத்தை அமைப்பதற்குச் செலவழிக் கிறீர்கள்? ஏன் யாழ்ப்பாணத்தை அபிவிருத்தி செய்வதற்குச் செலவழிக்கிறீர்கள்? ஏன் சனாதிபதி யாழ்ப்பாணத்துக்கு 5 முறை போனார்? என்று யாரும் கேட்பதில்லை. உண்மையிலே நீங்கள் மக்கள் நேசம் கொண்ட மக்கள் பிரதிநிதிகளாகத் திகழ்வீர்களானால், எங்களுடன் சேர்ந்து பயணியுங்கள்! நாம் இந்த அழகான நாட்டை உயிர்ப்பிப்போம்; இந்த நாட்டு மக்களின் உள்ளங்களை ஒன்றிணைப்போம்! இந்த நாட்டின் வெற்றிதான் எங்களுடைய வெற்றி, மக்களுடைய வெற்றி என்று நீங்கள் நினைப்பீர்களானால், கட்டாயம் எங்களுடன் கைகோர்ப்பீர்கள் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.55]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற இலங்கை தொலைத் தொடர்புகள் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மகிழ்ச்சி யடைகின்றேன்.

இலங்கை தொலைத்தொடர்பு ஒழுங்குபடுத்தல் ஆணைக் குழுவானது, தற்போதைய தொழில்நுட்ப ஒழுங்குமுறை மற்றும் செயற்பாட்டு சவால்களை எதிர்கொள்ளவும், இலங்கையில் வளர்ந்துவரும் தொலைத்தொடர்புத் துறையின் தேவையைப் பூர்த்திசெய்யும் வகையில் தேசிய அதிர்வெண் மேலாண்மையை வலுப்படுத்தவும், செயற்பாட்டுத் திறனை உயர்த்தவும், கண்காணிப்பு அமைப்புகள் மற்றும் பொது மக்களுக்கு வழங்கப்படும் டிஜிட்டல் சேவையை எளிதாக்கவும் முன்னெடுக்கப்பட்டு வரும் செயற்பாடுகளால் மக்கள் நன்மை அடைவார்களென நான் எதிர்பார்க்கின்றேன்.

கடந்த 26ஆம் திகதியிலிருந்து மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களின் செயலகத்துக்கு முன்பாக அபிவிருத்தி உத்தியோகத்தர்கள், தமது தற்காலிக நியமனத்தை நிரந்தரமாக்குமாறு கோரி, உண்ணாவிரதப் போராட்டத்திலே ஈடுபட்டு வருகிறார்கள். இன்று கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்களும் இது தொடர்பில் பேசினார். தமக்குத் தீர்வு கிடைக்கும்வரை போராட்டத்தில் ஈடுபடப் போவதாக அந்த உத்தியோகத்தர்கள் தெரிவித்துள் ளார்கள். கௌரவ எதிர்க்கட்சித் தலைவர் சஜித் பிரேமதாஸ அவர்களும் இன்னும் சில பாராளுமன்ற உறுப்பினர்களும் சத்தியாக்கிரகப் - உண்ணாவிரதப் - போராட்டத்தில் ஈடுபட்டுள்ள பாடசாலைகளிலே இணைக்கப்பட்டுள்ள அபிவிருத்தி உத்தியோகத்தர்களைச் சந்தித்து அவர்களோடு பேசியிருந்தார்கள். இன்று ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவர் கௌரவ ரஊப் ஹகீம் அவர்களும் நானும் பாராளுமன்ற உறுப்பினர் எம்.எஸ். வாசித் அவர்களும் அவர்களைச் சந்தித்தோம். நாடு முழுவதிலுமுள்ள பாடசாலை களிலே 16,100 அபிவிருத்தி உத்தியோகத்தர் நியமிக்கப்பட்டு 5-6 வருடங்கள் நிறைவடைந்துள்ளன. எனவே, பாடசாலை களில் இணைக்கப்பட்டு கற்பித்தல் செயற்பாடுகளில் ஈடுபடும் அபிவிருத்தி உத்தியோகத்தர்களை ஆசிரிய சேவையில் நிரந்தரமாக்குமாறு அவர்கள் ஒரு நியாயமான கோரிக்கையை முன்வைத்துள்ளனர். இந்த அரசாங்கம் ஆட்சிக்கு வருவதற்கு முன்னர் பாடசாலை அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு ஆசிரியர் நியமனம் வழங்குவதாக பல வாக்குறுதிகள் வழங்கியதாக போராட்டத்தில் ஈடுபட்ட உத்தியோகத்தர்கள் இன்று எங்களிடம் தெரிவித்துள்ளார்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நமது நாட்டிலே உள்ள பாடசாலைகளில் 43,000 ஆசிரியர் வெற்றிடங்கள் நிலவுகின்றன. எமது கிழக்கு மாகாணத்தைப் பொறுத்தவரையில், அங்குள்ள பாடசாலைகளில் நீண்ட காலமாக 5,000 ஆசிரியர் வெற்றிடங்கள் நிலவி வருகின்றன. அத்தோடு, அன்று 'சனசவிய' திட்டத்தின்கீழ் ஆசிரியர்களாக நியமிக்கப்பட்டவர்கள் இம்மாதம் ஓய்வுபெற இருக்கின் றார்கள். இதன் பின்னர் கிழக்கு மாகாணத்துடைய ஆசிரியர் வெற்றிடங்கள் 6,000ஐத் தாண்டக்கூடிய நிலைமை ஏற்படும். எனவே, கௌரவ பிரதமர் அவர்கள் கிழக்கு மாகாணத்தில் நிலவுகின்ற ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதற்கு ஏற்பாடு செய்வதுடன், பாடசாலை அபிவிருத்தி உத்தியோகத்தர்களை நிரந்தர ஆசிரியர்களாக நியமிக்குமாறும் அங்குள்ள மக்கள் சார்பிலே நாங்கள் கோரிக்கை விடுக்கிறோம்.

கடந்த அரசாங்கத்திலே கல்வி அமைச்சராக இருந்த சுசில் பிரேமஜயந்த அவர்கள் பாடசாலைகளிலே ஆசிரியர்களாகக் கடமை புரியும் அபிவிருத்தி உத்தியோகத்தர்களை நேர்முகப் பரீட்சை ஊடாக ஆசிரியர் சேவைக்குள் உள்வாங்கும் நடவடிக்கையை முன்னெடுத்து வந்தார். பின்னர், ஆட்சி மாற்றத்தையடுத்து, அது தடைசெய்யப்பட்டுள்ளது.

இந்த அரசாங்கம் ஆட்சியைப் பொறுப்பேற்ற பின்னர், தென்மாகாணத்தில் போட்டிப் பரீட்சையின்றி ஆசிரியர் நியமனங்கள் வழங்கப்பட்டதாகத் தெரிவிக்கப்படுகின்றது. எனவே, ஏற்கனவே பாடசாலைகளில் இணைக்கப்பட்டிருக் கின்ற அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு நேர்முகப் பரீட்சை ஒன்றை நடத்தி ஆசிரியர் நியமனங்களை வழங்குவதற்கான விசேட ஏற்பாடுகளை அரசாங்கமும் கல்வி அமைச்சரும் மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இன்று மாண்புமிகு சனாதிபதி அவர்கள், போராட்டத்தில் ஈடுபட்டிருந்த அபிவிருத்தி உத்தியோகத்தர்களைச் சந்தித்திருக் கின்றார். அவர்களின் நியாயமான கோரிக்கைகளை நிறைவேற்றுவதற்கான ஏற்பாடுகளை நீங்கள் மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

எனக்கு முன்பு பேசிய என்னுடைய நண்பர், கௌரவ பாராளுமன்ற உறுப்பினர் அஸ்லம் அவர்கள், எதிர்க்கட்சியில் இருக்கும் முஸ்லிம் காங்கிரஸ் மற்றும் தமிழ்க் கட்சிகளில் உள்ள உறுப்பினர்கள் சில விடயங்களைப் பேசுவதாகச் சொன்னார். முஸ்லிம் காங்கிரஸ் கட்சியின் பிரதித் தேசிய அமைப்பாளர் என்ற வகையில், நான் அது தொடர்பில் சொல்லக் கடமைப்பட்டிருக்கின்றேன். முஸ்லிம் காங்கிரஸ் என்பது ஜனநாயக ரீதியான ஒரு கட்சியாகும். ஆளும் கட்சியாகிய உங்களை வழிநடத்த வேண்டிய பாரிய பொறுப்பு எதிர்க்கட்சியாகிய எங்களுக்கு இருக்கின்றது. எமது கட்சியினுடைய வரலாற்றை நீங்கள் பார்த்தால், எமது

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

மறைந்த பெரும் தலைவர் எம்.எச்.எம். அஷ்ரப் அவர்கள் அரசியலை எங்களுக்குக் கற்றுத் தந்தார். நாட்டில் ஜனநாயக ரீதியில் யார் யார் பாதிக்கப்படுகின்றார்களோ இனபோதம் இல்லாது, அவர்களுக்காகக் குரல் கொடுப்பவர்களாகவும், ஒத்துழைப்பு வழங்குபவர்களாகவும்தான் ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சி இருக்கின்றது. எனவே, எங்களை நீங்கள் வேறு விதமான கண்ணோட்டத்துடன் பார்க்க வேண்டாமெனச் சொல்கின்றோம். உங்களை வழிநடத்த வேண்டியது எங்களுடைய கடமை. ஜனநாயக ரீதியாக 159 ஆசனங்களைப் பெற்றுள்ள இந்த அரசாங்கத்தினுடைய நல்ல பணிகளுக்கு நாங்கள் ஆதரவு வழங்குவோம். நீங்கள் வழங்கிய வாக்குறுதி களை நிறைவேற்றுமாறு நாங்கள் உங்களிடம் கேட்டுக் கொண்டிருக்கின்றோம்.

எனவே, எமது மக்களுடைய பிரச்சினைகள் தொடர்பாகப் பாராளுமன்றத்தில் கதைக்கின்றபொழுது, எங்களுடைய முஸ்லிம் காங்கிரஸ் கட்சியைப் பற்றி நீங்கள் தவறாக எடை போட வேண்டாமென கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன். எமது நியாயமான கோரிக்கை என்னவென்றால், உங்களுடைய அமைச்சரவை யில் முஸ்லிம் மக்கள் சார்பாக அமைச்சர் ஒருவர் நியமிக்கப்படும்வரை, நாங்கள் அதனைப் பேசிக்கொண்டே இருப்போம். எங்களுடைய உணர்வுகளைச் சொல்லுவோம். கடந்த கால அரசாங்கங்களில் முஸ்லிம் மக்களைப் பிரதிநிதித்துவப்படுத்தி ஓர் அமைச்சரேனும் இருந்திருக்கின் றார்கள். கொடூரமாக எங்களுடைய மையத்தை எரித்த கோட்டாபய ராஜபக்ஷ அவர்களுடைய அமைச்சரவையில்கூட வெளிநாட்டு அமைச்சர் மற்றும் நீதி அமைச்சர் என இரண்டு அமைச்சுப் பதவிகளை முஸ்லிம்களுக்கு வழங்கியிருந்தார். நீங்கள் இனவாதமற்றவர்களென இந்த உயரிய சபையில் சொன்னீர்கள்! அப்படியென்றால், உடனடியாக அமைச்சரவை யில் முஸ்லிம் அமைச்சர் ஒருவரை நியமியுங்கள்! நலவுக்காகத்தான் சொல்கின்றோம். ஜித்தா கொன்சுலர் ஜெனரல் நியமனம் ஒன்றைச் செய்தீர்கள். நாங்கள் அதனைப் பிழையெனச் சுட்டிக்காட்டியதால் தற்பொழுது அதனைத் திருத்தியிருக்கின்றீர்கள்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள், அதிகளவான முஸ்லிம் மக்கள் அரசாங்கத்துக்கு வாக்களித் திருந்தார்களெனச் சொன்னார். நாங்கள் அதனை ஏற்றுக் கொள்கின்றோம். கடந்த பாராளுமன்றத் தேர்தலிலும், ஜனாதிபதித் தேர்தலிலும் முஸ்லிம் மக்கள் அதிகமான வாக்குகளை உங்களுக்கு அளித்திருக்கின்றார்கள். எனவே, எமது முஸ்லிம் மக்களின் உணர்வுகளைப் புரிந்து, அவர்கள் சார்பாக அமைச்சரவையில் ஒருவரை நியமித்து, நீங்கள் இனவாதமற்றவர்கள் என்பதை நிரூபிக்குமாறு கேட்டு விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.01]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1996 අංක 27 සහ 2024 අංක 39 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් මඟින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17(10) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන 2024 අංක 1 දරන විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිත කිරීමේ -Telecommunications Infrastructure Sharing - රෙගුලාසි පැනවීමට අදාළව පවත්වන විවාදයේදී අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම විෂයයට අදාළව කථා කරන්න කලින් මම එක කාරණයක් කියන්න කැමැතියි. අපි දැක්කා, අද දින මේ විවාදය තුළ බොහෝ කථිකයින් අදාළ විෂයයට බාහිරව ඔවුන්ගේ කථා සිදු කරනු ලැබූ ආකාරය. මම කැමැතියි, ස්ථාවර නියෝග 91 (ඉ) සඳහා ඔබතුමියගේ අවධානය යොමු කරවන්න. එහි මෙසේ සඳහන් වනවා:

> "සෑම මන්ත්‍රීවරයකු විසින්ම සිය අදහස් ප්‍රකාශ කිරීම සාකච්ඡාවට භාජනය වෙමින් පවතින විෂයයට සීමා කරනු ලැබිය යුත්තේ ය"

එම නිසා මම ඔබතුමියගෙන් ඉල්ලීමක් කරනවා, මන්ත්‍රීවරුවන්ට විෂයයට අදාළව කථා කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින විවාදයට ගන්නා විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිත කිරීම සම්බන්ධයෙන් වන රෙගුලාසිවල ප්‍රධාන අරමුණ තමයි, විදුලි සංදේශ සමාගම් විසින් වෙන වෙනම ඉදිකර තිබෙන ducts, එහෙම නැත්නම් විදුලි සංදේශ ප්‍රනාල පද්ධති, විදුලි සංදේශ කණු - poles, ඇන්ටෙනා ව්‍යුහයන් - antenna structures, විදුලි සංදේශ සබැඳියන් - lines - සහ බෙදා හැරීමේ අග්‍රයන් - distribution points - යනාදී විදුලි සංදේශ ජාලයක සක්‍රිය මෙන්ම ආධාරක මධ්‍යස්ථාන සම්ප්‍රේෂක - Base Transceiver Stations, ඊළඟට ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලි - radio frequency spectrums, මූලික ජාල ධාරිතාවන් - core network capacity - වැනි සක්‍රිය විදුලි සංදේශ යටිතල පහසුකම් හවුලේ භාවිත කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම හා ඒ සඳහා දිරිමත් කිරීම. ඒ සඳහා තමයි යටිතල පහසුකම් හවුලේ භාවිතාව සම්බන්ධයෙන් වන රෙගුලාසි -Telecommunications Infrastructure Sharing Regulations - මේ උත්තරීතර සභාව තුළින් අනුමත කර පැනවීමට බලාපොරොත්තු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි දන්නවා, සන්නිවේදනය කියලා කියන්නේ ඇත්තටම මානව අන්තර් ක්‍රියාවලියට අත්‍යවශ්‍යම අංගයක් බව. ඒක පෞද්ගලික, වෘත්තීය සහ සමාජයීය වශයෙන් සෑම අංශයකටම බලපාන කාරණයක්.

අපි දන්නවා, දුරකථනය මේ ලෝකයට හඳුන්වා දීමත් සමඟ, ඒ එක්කම ජංගම දුරකථනය හඳුන්වා දීමත් එක්ක මුළු ලෝකයේම අන්තර් මානව සන්නිවේදනයේ විශාල පෙරළියක් සිද්ධ වුණු බව. ඒ වාගේම 19වැනි සියවසේදී ගුවන් විදුලි තරංග සොයා ගැනීමත් සමඟම සන්නිවේදන ක්ෂේත්‍රය විශාල ඉදිරි පිම්මක් පැන්නාය කිව්වොත් නිවැරදියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සන්නිවේදන ක්ෂේත්‍රයේ විකාශනය සම්බන්ධව කථා කළොත්, අපි දන්නවා රැහැන් සහිත දුරකථනයේ සිට රැහැන් රහිත දුරකථනය දක්වාත්, හඬ සම්ප්‍රේෂණය, කෙටි පණිවිඩ සම්ප්‍රේෂණය, දත්ත සම්ප්‍රේෂණය සහ රූප රාමු සම්ප්‍රේෂණය දක්වාත් මේ සන්නිවේදන කටයුතු ව්‍යාප්ත වීම තුළින් ජනතාව සමඟ සන්නිවේදන ක්ෂේත්‍රය විශාල වශයෙන් බද්ධ වූ බව. අපි හැමෝම දන්නවා, සන්නිවේදන ක්ෂේත්‍රයේ ව්‍යාප්තියත් සමඟ ලෝකයේ සියලු රටවල් සන්නිවේදන කටයුතු සංවර්ධනය කිරීමේ අභිලාෂයෙන් ඒ ක්ෂේත්‍රය සංවර්ධනය කරන්න, නියාමනය කරන්න අවශ්‍ය විධිවිධාන සකස් කළා සහ කටයුතු කළා කියලා. එහිදී රාජ්‍ය අංශය වාගේම පෞද්ගලික අංශයේත් හවුල්කාරීත්වයෙන් සන්නිවේදන ක්ෂේත්‍රය නඟා සිටුවන්න ඒ රටවල් විවිධ උපක්‍රම, සැලසුම් භාවිත කළා. ඒ වාගේ අපේ රටෙත් 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත මඟින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පිහිටුවනු ලැබුවා. එම කොමිෂන් සභාව පිහිටුවීමේ පරමාර්ථයක් තිබෙනවා. පොදුවේ ගත්තොත්, රටේ සන්නිවේදන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධන කටයුතු, සන්නිවේදන ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධන කටයුතු පිළිබඳව අධීක්ෂණය කිරීම තමයි විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන රෙගුලාසි මඟින් අපි බලාපොරොත්තු වන කාරණයක් තිබෙනවා. අපේ රට තුළ දැනට සන්නිවේදන කුලුනු 8,633ක් වාගේ ප්‍රමාණයක් ඉදි කරලා තිබෙනවා. ඒ වාගේම ඉදිරියේදී "ගමට සන්නිවේදනය" වැඩසටහන යටතේ විවිධ ප්‍රදේශවල තවත් කුලුනු බොහොමයක් ඉදි කරන්න නියමිතයි. එසේ ඉදි කරන සියලු කුලුනු නියාමනය කිරීම, එහෙම නැත්නම් ඒ කුලුනු සහ ඊට අදාළ යටිතල පහසුකම් හවුලේ ප්‍රයෝජනයට ගන්න, භාවිත කරන්න අවශ්‍ය නෛතික බලය ලබා දීම තමයි අද අපි මේ රෙගුලාසි පැනවීම තුළින් බලාපොරොත්තු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වර්තමානයේ අද වන විට අපේ රටේ සන්නිවේදන ක්ෂේත්‍රයේ කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් සම්බන්ධ වන ආයතන හතරක් තිබෙනවා. ඒ, ඩයලොග් ආසියාටා පීඑල්සී, මොබිටෙල්, හච්, සහ ශ්‍රී ලංකා ටෙලිකොම්. මම කලින් කිව්වා වාගේ 8,633ක් වූ කුලුනු මේ ආයතන හතර එක්කෝ තනි තනිව, එහෙම නැත්නම් ක්‍රියාකරුවන් දෙදෙනකු හෝ තිදෙනකු ආකාරයෙන් පරිහරණය කරනු ලබනවා. මීට පසුව මේ රෙගුලාසිවලට අනුව මේ සියලුම කුලුනු පොදුවේ, නැත්නම් හවුලේ භාවිත කිරීම තුළින් විශේෂයෙන්ම ආයතනික වශයෙනුත්, පාරිසරික වශයෙනුත්, පාරිභෝගිකයන්ට - ජනතාවට - වාගේම රටටත් විශාල වාසි රැසක් -වාසි බොහොමයක්- ලැබීමට නියමිතයි කියන එකත් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

විශේෂයෙන්ම ආයතනික වශයෙන් ගත්තොත්, අපි දන්නවා මෙතැන - පාර්ලිමේන්තුවේ - ඉන්න කථිකයන් බොහොමයකුත් කථා කළා, ඒ ආයතනවලට ප්‍රාග්ධන වියදම් අඩු වෙනවා කියලා. ඒ ආයතනවලට ප්‍රාග්ධන වියදම් අඩු වීම තුළින් ඔවුන්ට හැකියාව ලැබෙනවා, පාරිභෝගිකයන්ට - consumersලාට - හොඳ සේවාවක් ලබා දෙන්න. අර කථා කළා වාගේ පසුගිය කාලයේ විශාල වශයෙන් පාරිසරික හානියක් සිද්ධ වුණා, ඒ විවිධ ආයතන හැම තැනම ඒ කුලුනු ඉදිකිරීම තුළින් සහ ඊට අදාළ යටිතල පහසුකම් සැපයීම තුළින්. ඉදිරියේදී මේ හවුලේ භාවිතාව - sharing - තුළින් කුලුනු ප්‍රමාණය යම්කිසි සීමාවකට ලක් වෙනවා. ඒ තුළින් අර සිදු වීමට නියමිත පරිසර හානිය අවම වෙනවා කියන එකත් මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ඒ වාගේම පාරිභෝගිකයන්ට තත්ත්වයෙන් උසස්, ගුණාත්මක සේවාවක් ලබා දීමට ඒ දුරකථන සමාගම්වලට අනිවාර්යයෙන්ම හැකියාව ලැබෙනවා, ප්‍රාග්ධන වියදම් අඩුවීම තුළින්.

රටක් වශයෙන් මේ තාක්ෂණ මෙවලම් හැම දෙයක්ම පිටරටවලින් ගෙන්වන්න -ආනයනය කරන්න- අපට සිදු වෙනවා. ඒ අවස්ථා සීමා වීම තුළින් අපට විදේශ විනිමය බොහෝ ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමේ හැකියාවක් ලැබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසු ගිය "දිට්වා" සුළි කුණාටුව සමයේදී අපේ පණිවුඩ ජාලය බිඳ වැටුණා, ඒවාට සිදු වුණු අනතුරු නිසා. අනතුරට ලක් වුණු, එහෙම නැත්නම් ආපදාවට ලක් වුණු ප්‍රදේශවල කුලුනු හඳුනාගෙන, ආපදාවට ලක් නොවුණු ස්ථාන මොනවාද කියලාත් හඳුනාගෙන ඒ කුලුනු හවුලේ භාවිත කිරීම, නැත්නම් share කර ගැනීම තුළින් ඉදිරි ආපදා තත්ත්වයකදී වුණත් බාධාවකින් තොරව සේවය පවත්වා ගෙන යැමට අපට හැකියාව ලැබෙනවා. 2026 වසරේදීත් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විදුලි සංදේශ සේවාවේ ගුණාත්මකභාවය සහ අත්දැකීම්වල ගුණාත්මකභාවය නියාමනය කිරීම සඳහා - ඔවුන්ගේ ව්‍යාපෘතිවලට අදාළව - රෙගුලාසි හඳුන්වා දීමට කටයුතු කරන බවත් සඳහන් කළ යුතු වෙනවා.

අවසාන වශයෙන් මා කියන්නේ, මේ හඳුන්වා දෙන රෙගුලාසි තුළින් විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් රටක් වශයෙන් අපට ලැබෙන බවයි. ඒ නිසා මේ රෙගුලාසි බලාත්මක කිරීමට අපි සියලු දෙනා සහයෝගය ලබා දෙමු කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මැතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[පි.ව. 4.12]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 1991ஆம் ஆண்டின் 25ஆம் எண் கொண்ட தொலைத் தொடர்புகள் சட்டத்தைத் திருத்துவது பற்றிய எனது கருத்துக்களை இந்த அவையிலே எடுத்துரைக்க விழைகின்றேன். 2024ஆம் ஆண்டின் 39ஆம் எண் கொண்ட இலங்கைத் தொலைத் தொடர்புகள் (திருத்தம்) சட்டமானது, 1991ஆம் ஆண்டின் இலங்கைத் தொலைத்தொடர்புகள் சட்டத்திற்குப் பிறகு, நாட்டின் தொலைத்தொடர்பு ஒழுங்கு முறைக் கட்டமைப்பில் மேற்கொள்ளப்பட்ட மிக முக்கியமான மாற்றமாகும். இலங்கையின் தொலைத்தொடர்புத் துறை யானது அரசுக்குச் சொந்தமான தனியுரிமைக்கென வடிவமைக் கப்பட்ட ஒரு சட்டத்தின்கீழ், முப்பது ஆண்டுகளுக்கும் மேலாக இயங்கி வந்தது. இது புதிய எண்மியச் சூழல், பரந்த, விரைந்த அலைவரிசை மற்றும் தகவல் தொழில்நுட்பங்களின் ஒருங்கிணைப்பு ஆகியவற்றைக் கையாளத் தவறி இருந்தது.

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

இங்கு திருத்தச் சட்டத்தின் புதிய கூறுகளை விரிவான பகுப்பாய்வு செய்து பார்ப்போமானால், இத்திருத்தச் சட்டமானது இலங்கைத் தொலைத்தொடர்பு ஒழுங்குமுறை ஆணைக்குழுவை ஒரு சாதாரண உரிமம் வழங்கும் அதிகார சபையிலிருந்து ஒரு புதிய சந்தை ஒழுங்குமுறை அமைப்பாக மாற்றும் வகையில் வடிவமைக்கப்பட்டுள்ளது. ஆணைக்குழுவின் அதிகார விரிவாக்கம் மற்றும் தொழில்நுட்பத் தரங்களைப் புதுமயம் ஆக்கல் ஆகியவை இந்தச் சட்டத்தின் மையக் கருப்பொருளாக அமைந்து உள்ளன.

1991ஆம் ஆண்டின் முதன்மைச் சட்டம் ஆனது, முதன்மையாக இறுதிப் பயனாளிகளுக்குச் சேவையை வழங்குவோர் மீதே கவனம் செலுத்தியது. எனினும், திருத்தச் சட்டத்தின் பிரிவு 17Bஆனது, தொலைத்தொடர்பு உட்கட்டமைப்புச் சேவை வழங்குநர்களையும் ஒழுங்குமுறைக்குள் கொண்டு வருகின்றது. இதன் மூலம் கோபுரங்கள், வடங்கள் மற்றும் தரைத் தள வசதிகளை வழங்கும் நிறுவனங்கள் இனிமேல் ஆணைக்குழுவின் நேரடி மேற்பார்வையின்கீழ் இயங்கும். இத்திருத்தச் சட்டத்தின் பிரிவு 5ஆனது புதிய போட்டி மேலாண்மைக் கருவிகளை அறிமுகப்படுத்துகின்றது. இதன் மூலம் ஆணைக்குழுவானது சந்தை இயக்கவியலை ஆய்வு செய்து, போட்டியைப் புரிந்து கொள்ளச் சந்தைப் பகுப்பாய்வை மேற்கொள்ளும் அதிகாரத்தை வழங்குகின்றது. மிக முதன்மையாக, "குறிப்பிடத்தக்க சந்தை அதிகாரம்" தோன்றுவதையோ அல்லது தவறாகப் பயன்படுத்தப்படுவதையோ தடுக்க ஆணைக்குழு தலையிட முடியும். இது சந்தையில் புதிய கண்டுபிடிப்புகளைத் தடுக்கும் போட்டிக்கு எதிரான நடவடிக்கைகளை முன்னமே கண்டறிய உதவும்.

திருத்தச் சட்டத்தின் பிரிவு 6Aஇன் அறிமுகமானது, கட்டண ஒழுங்குமுறைக்கு ஒரு வெளிப்படையான, அறிவியல் அடிப்படையிலான கட்டமைப்பை உருவாக்குகின்றது. கட்டணங்கள் பக்கச்சார்பு அற்றதாகவும், செலவை அடிப்படையாகக் கொண்டதாகவும் இருக்க வேண்டும் என்று வலியுறுத்துகின்றது. மானியங்கள் பொதுவாக அகற்றப்படும் என்று சட்டம் குறிப்பிடுகின்றது. ஒப்புதல் அளிக்கப்பட்ட கட்டணத் திட்டம் இன்றி சேவையை வழங்குவது, பத்து மில்லியன் ரூபாய் வரை தண்டம் விதிக்கப்படக்கூடிய குற்றமாகும். இத்திருத்தச் சட்டத்தின் பிரிவு 10Aஆனது, நுகர்வோர் விருப்பத்தை அதிகரிக்கும் வகையில், வானொலி அலைக்கற்றைகள் மற்றும் தொலைபேசி எண்கள் முதலிய வரையறுக்கப்பட்ட தேசிய வளங்களின் மேலாண்மையை வலுப்படுத்துகின்றது. பன்னாட்டுத் தொலைத்தொடர்பு சங்கத்தின் வழிகாட்டல்களுக்கு அமைய, அலைக்கற்றைகளை ஒதுக்கவும், எண் மேலாண்மைத் திட்டங்களை நிருவகிக்கவும் ஆணைக்குழுவுக்கு அதிகாரம் அளிக்கப்பட்டுள்ளது. இது நுகர்வோர் தங்களது தொலைபேசி எண்ணை மாற்றாமல், சேவை வழங்குநர்களை மாற்றிக்கொள்ளும், "எண் மாற்றத் தன்மை" வசதியை அறிமுகப்படுத்த வழிவகுக்கும்.

திருத்தச் சட்டத்தின் பிரிவுகள் 35A, 35Bஇன்படி, வளங்களின் விரயத்தைக் குறைப்பதற்காக, உட்கட்டமைப்புப் பகிர்வை ஆணைக்குழு கட்டாயப்படுத்த முடியும். ஒரு சேவை வழங்குநர் தனது கோபுரங்கள் அல்லது உட்கட்டமைப்புகளை மற்றவர்களோடு பகிர்ந்து கொள்வதை ஆணைக்குழு உறுதிப்படுத்தும். மேலும், நாட்டின் அனைத்துப் பகுதிகளுக்கும் சேவை கிடைப்பதை உறுதி செய்வதற்கான சமூகக் கொள்கை நோக்கங்களையும் ஆணைக்குழு முன்னெடுக்கும். இலங்கையின் அமைவிட நிலையைக் கருத்தில் கொண்டு, கடலடித் தந்தி வடங்களைப் பாதுகாக்க வலுவான ஏற்பாடுகள் செய்யப்பட்டுள்ளன. இதற்காகத் தேசிய கடலடித் தந்தி வடப் பாதுகாப்புக் குழு நிறுவப்படும். கடலடித் தந்தி வடங்களுக்குச் சேதம் விளைவிப்பவர்களுக்கு 100 மில்லியன் ரூபாய் வரை தண்டம் அல்லது பத்து ஆண்டுகள் வரை சிறைத் தண்டனை விதிக்கப்படலாம்.

இங்கு திருத்தச் சட்டத்தின் புதிய கூறுகளை 1991ஆம் ஆண்டின் முதன்மைச் சட்டத்துடன் விரிவாக ஒப்பிட்டு ஆய்வு செய்து பார்ப்போமானால், 1991ஆம் ஆண்டின் 25ஆம் எண் கொண்ட சட்டத்தில் இருந்து திருத்தச் சட்டத்திற்கு மாறுவது என்பது, இலங்கையின் தொலைத் தொடர்புத் துறையை ஒரு நிருவாகக் கட்டுப்பாட்டில் இருந்து சந்தை உந்துதல் மாதிரியாக மாற்றுவதைக் குறிக்கின்றது. முதன்மைச் சட்டத்தின் ஒழுங்குமுறை அமைப்பு, "அதிகார சபை" என்று அழைக்கப்பட்டது. இது பெரும்பாலும் நிருவாகக் கட்டுப்பாட்டில் கவனம் செலுத்தியது. திருத்தச் சட்டம் ஆணைக்குழுவை ஒரு கூட்டு அமைப்பாக வலுப்படுத்துகின்றது. மேலும், அதற்குத் தொழில்நுட்ப, பொருளாதார மற்றும் சமூக அதிகாரங்களையும் வழங்குகின்றது. முதன்மைச் சட்டம் ஆனது, சேவை இயக்குநர்கள் மீது மட்டுமே கவனம் செலுத்தியது. திருத்தச் சட்டம் ஆனது, இயக்குநர்கள் மீது மட்டுமன்றி, உட்கட்டமைப்பு வழங்குநர்கள் மீதும் கவனம் செலுத்துகின்றது.

முதன்மைச் சட்டமானது, தொலைத்தொடர்பு ஆணைக்குழுவை ஒரு நிருவாகக் கடமைகளை ஆற்றும் நிறுவனமாக வைத்திருந்தது. புதிய திருத்தச் சட்டமானது ஆணைக்குழுவை சந்தைப் பகுப்பாய்வு மற்றும் கணிசமான சந்தை அதிகாரம் கொண்ட மேற்பார்வை அமைப்பாக மாற்றுகின்றது. முதன்மைச் சட்டமானது அமைச்சரின் ஆலோசனையோடு கட்டணங்களை நிர்ணயம் செய்தது. திருத்தச் சட்டமானது சட்ட ரீதியான பொருளாதாரக் கொள்கைகளின் அடிப்படையில் கட்டணங்களை நிர்ணயம் செய்யும் நிலைக்கு மாற்றுகின்றது. முதன்மைச் சட்டத்தின்படி, தண்டங்கள் பழமையானவை மற்றும் பெரிய நிறுவனங்களைத் தடுக்கும் திறன் அற்றவையாகக் காணப்பட்டன.

எடுத்துக்காட்டாக, உரிமம் இன்றி இயங்குவதற்கான தண்டம், வெறும் 10,000 ரூபாய் முதல் 50,000 ரூபாய் வரை விதிக்க முதன்மைச் சட்டம் ஒப்புதல் வழங்கியது. எனினும், திருத்தச் சட்டமானது 10 மில்லியன் ரூபாய் முதல் 100 மில்லியன் ரூபாய் வரை நிருவாகத் தண்டம் விதிக்க ஆணைக்குழுவுக்கு அதிகாரம் அளிக்கின்றது. முதன்மைச் சட்டமானது நுகர்வோர் உரிமைகளுக்குப் பொதுவான பாதுகாப்பு வழங்கியது. திருத்தச் சட்டமானது, எண் மாற்றத் தன்மை மற்றும் தரக் கண்காணிப்புகளையும் வழங்குகின்றது. திருத்தச் சட்டத்தில் தொழில்நுட்ப முன்னேற்றங்கள் இருந்த பொழுதிலும், குடிசார் சமூக அமைப்புகள் மற்றும் மனித உரிமைகள் ஆர்வலர்களிடம் இருந்து விமர்சனங்களையும் எதிர்கொண்டுள்ளது. எடுத்துக்காட்டாக, ஆணைக்குழுவின் தலைவர் அமைச்சின் செயலாளராக இருப்பது ஆணைக்குழுவின் சுதந்திரத்தைப் பாதிக்கும் என்று விமர்சகர்கள் சுட்டிக்காட்டுகின்றனர். மேலும், தனியார் நிறுவனங்கள் தங்கள் சொந்த முதலீட்டில் உருவாக்கிய உட்கட்டமைப்புகளை மற்றவர்களுடன் பகிர்ந்துகொள்ளுமாறு கட்டாயப்படுத்துவது அரசியல் அமைப்பின் 16ஆவது பிரிவை மீறுவதாக அமையும் என்று கூறுகிறார்கள்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

மட விනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. தொலைத்தொடர்புத் திருத்தச் சட்டத்தின் விரிவாக்கப்பட்ட அதிகாரங்கள் மற்றும் இணையப் பாதுகாப்புச் சட்டம் ஆகிய இரண்டும் இணைந்து, இணையத்தில் கருத்துச் சுதந்திரத்தைக் கட்டுப்படுத்தப் பயன்படுத்தப்படலாம் என்ற அச்சம் நிலவுகின்றது. விமர்சகர்களின் கவலைகளை நிவர்த்தி செய்வதற்கும் சட்டத்தின் நோக்கங்களை அடைவதற்கும் பின்வரும் பரிந்துரைகளை நான் முன்வைக்கின்றேன். ஒன்று, ஆணைக்குழுவின் சுதந்திரத்தை உறுதி செய்தல்; ஆணைக்குழுவின் தலைவர் ஓர் அமைச்சின் செயலாளராக இல்லாமல், அரசியல் அமைப்புச் சபையினால் நியமிக்கப்படும் சுதந்திரமான தொழில்சார் வல்லுநரைக் கொண்டதாக இருக்க வேண்டும். இந்தத் சட்டத் திருத்தத்தின் வெற்றி என்பது அதன் நடைமுறையிலேயே தங்கியுள்ளது. ஆணைக்குழுவின் தொழில்நுட்ப மேம்பாடு சந்தைப் போட்டி நடுநிலையோடு கையாளுதல் மற்றும் நுகர்வோர் உரிமைகளைப் பாதுகாத்தல் ஆகியவையே வரும் பத்தாண்டுகளில் இலங்கையின் எண்மிய மாற்றத்தை முடிவு செய்யும் என்று கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.18]

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි කණු ගැන කථා කරන දවස. හරියටම කිව්වොත්, කණු බෙදා ගන්න එක ගැන කථා කරන දවස. ඒ අස්සේ විපක්ෂය කණු තියලා යන අය ගැනත් කථා කරමින් ඉන්නවා. ඒ කාරණය අපි පසුවට ගනිමු. කණු බෙදා ගැනිල්ල ගැන අපි මුලින්ම බලමු.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තේරෙන සිංහලෙන් කිව්වොත්, ලංකාවේ දුරකථන සේවා - telephone සේවා, දත්ත සේවා - data services, Internet වේගවත් කරන්න, ගුණාත්මක බව වැඩි කරන්න, සේවා සපයන්නන් අතර තරගකාරිත්වය වැඩි කරලා එහි වාසිය, ලාභය එම පහසුකම් භාවිත කරන්නන්ට - පාවිච්චි කරන්නන්ට - ලබා දෙන්න අවස්ථාව හදන වැඩක් තමයි මේ කරන්නේ. ඉතින්, මේ වැඩසටහන හොඳ නැද්ද? හොඳයි. 2025 අවුරුද්දේ TRCSL එක ලාභ උපයලා ආණ්ඩුවට ලාභාංශ ගෙවලා, බදු ගෙවලා ශක්තිමත් වෙලා තිබෙනවා. 2026 අවුරුද්දේදී ආණ්ඩුවේ - රාජ්‍යයේ - වුවමනාව වෙච්ච digital transformation කියන වැඩසටහන ශක්තිමත් කරන්න අවශ්‍ය කරන උපාය මාර්ගික වැඩසටහන් තමයි මේ ක්‍රියාත්මක කරමින් ඉන්නේ. මේවා උපාය මාර්ග. මේවාට අනුව තමයි අදාළ ක්‍රියාමාර්ග සකස් වෙමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අස්සේ අපේ විපක්ෂය පාර්ලිමේන්තුවේ කණුවක් තිබ්බාද නැද්ද, පාර්ලිමේන්තුවට ලණුවක් දුන්නාද නැද්ද කියන එක ගැන පරීක්ෂණයක් යන වෙලාවක ඒ පරීක්ෂණය කර තියාගෙන යනවා. මේ රෙගුලාසි ගැන නොවෙයි, ඒ ගොල්ලන්ගේ වැඩි වුවමනාව, අවධානය තිබෙන්නේ. ඒකත් හොඳයි. ඒක හොඳ වෙන්නේ මොකද? ඒකට කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදය කියලා. ඒ ප්‍රජාතන්ත්‍රවාදය නිසා ඔළුව වැල්ලේ ගහගත්තාට පස්සේ අද උදේ කිහිප දෙනෙකුගේ පශ්චාත් භාගය එළියට ආවා. ඒ කොහොමද?

ගරු දයාසිරි ජයසේකර මැතිතුමා අද මූලික පරීක්ෂණ වාර්තාවක් සභාගත කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ, එතුමාගේ වාර්තාව. එතුමා මේ වාර්තාව සභාගත කළා, මට ඒක හම්බ වුණා. එතුමා මේක සභාගත කළේ අනික් අයට බලන්න නේ.

ඒකේ සඳහන් වන පරීක්ෂණය මොකක්ද? 2025 නොවැම්බර් මාසයේ 10වැනි දා තමයි එය පටන් ගෙන තිබෙන්නේ. දැන් කොහොමද පශ්චාත්භාගය එළියට ආවේ? මම උපුටාගන්න කැමැතියි, දයාසිරි ජයසේකර මහත්මයා සභාගත කළ මෙම වාර්තාවේ පිටු අංක 18හි තිබෙන කොටසක්. එහි සඳහන්ව තිබෙනවා, "දින තුනකදීම කුලරත්න මහතාගෙන් ප්‍රකාශ සටහන් කරගත් අතර ඔහුට තවදුරටත් ප්‍රකාශ කිරීමට ඇති කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමටත් ඒ සමඟම අවශ්‍ය යැයි සලකන ලිපි ලේඛන ඉදිරිපත් කිරීමටත් ඔහුට අවස්ථාව ලබා දුනිමි" යනුවෙන්. දැන් මෙතැන වැළලෙන්න හැදුවා; වැළලෙන්න හැදුවා. කවුද? දයාසිරි ජයසේකර අපේ උගත් මිත්‍රයා- මන්ත්‍රීතුමා සහ ගරු විපක්ෂ නායකතුමා මේ සභාවේ වැළලෙන්න හැදුවා, "ඉඩ දුන්නේ නැහැ, කථා කරන්න දුන්නේ නැහැ, කියන්න දුන්නේ නැහැ, අහන්න දුන්නේ නැහැ, ප්‍රජාතන්ත්‍රවාදය අකුළලා, ප්‍රජාතන්ත්‍රවාදය රෝල් කරලා කථානායකතුමාගේ පුටුව අස්සේ ගහලා" කියලා. ඒ ජාතියෙන් කථා කළේ. හැබැයි උපුටා ගැනීම එතුමාගේ වාර්තාවෙන්ම ගත්තාමත් අනේ පව්, අවස්ථාව දීලා. බොරු නේ, මේ කියලා තිබෙන්නේ. දැන් අවුලක් නැහැ. පස්සේ වෙලාවක ෂේප් එකේ හෙමිහිට ඇවිල්ලා "sorry" කියලා කියන්න පුළුවන්. Press conference එකක් තියන්න ඕනෑ නැහැ, පාර්ලිමේන්තුවටම ඇවිල්ලා කියලා යන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කැමැතියි, ඊළඟ උපුටා ගැනීම කරන්න. ඒ උපුටා ගැනීම මෙයයි. 2023 අවුරුද්දේ ජූනි මාසයේ 25වැනි දා ඔන්න ඔය කියන "නියෝජ්‍ය මහලේකම්" කියන තනතුරට දානවා, advertisement එකක්. ඒ advertisement එකේ 5වැනි කරුණ හැටියට මේ කරුණ සඳහන් වනවා: "Professional Qualifications - Attorney-at-Law of the Supreme Court with minimum 10 years of seniority." එහි 6 (e) විධියට මේ කරුණ සඳහන් වනවා: "Experience in the Judicial Service/ Attorney-General's Department." ඒ අනුව මේවා තිබුණොත් වැඩිපුර ලකුණු දෙන බව කියා තිබෙනවා. එහි 8වැනි කරුණ විධියට මේ කරුණ සඳහන් වනවා: "Appointment will be made subject to a three-year (3) probation period." ඒ තනතුරට අවුරුදු 3ක probation period එකකුත් තිබෙනවා කියලා මේ advertisement එකේ තිබෙනවා. එහි 8(4)හි මෙසේ සඳහන් වනවා: "The selected candidate will be subject to a medical examination."

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟට මම කැමැතියි, දයාසිරි ජයසේකර මැතිඳුන්ගේ වාර්තාවේ 19වැනි පිටුවෙන් කොටසක් උපුටාගන්න. එහි සඳහන් වනවා, "වසරක සේවා කාලයකින් පසුව තමා කාර්ය මණ්ඩල ප්‍රධානි සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් තනතුරේ ස්ථිර කරන ලෙස කුලරත්න මහතා ඉල්ලා ඇති අතර, ඒ අනුව ඔහුගේ සේවය ස්ථිර කර ඇත. කුලරත්න මහතා එම තනතුරට පත්වීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිට නැත" යනුවෙන්. ඔහු අර advertisement එකේ තිබ්බව ඒවා කරලා නැහැ. ඒවා

[ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා]

advertisement එකට තමයි දාලා තිබෙන්නේ. කාගේද මේ වාර්තාව? ගරු දයාසිරි ජයසේකර මහත්මයා සභාගත කළ වාර්තාව. ඒක ගැන තමයි මම කිව්වේ, ඒක තමයි සභාගත කළේ. අන්න ඒක නිසා උදේ පැස්බරා වගේ ඔළුව හංගාගත්තා, පශ්චාත්භාගය එළියට ආවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ විමර්ශනය වෙන්නේ තොත්තු දුන්නාද, කොත්තු කෑවාද, හපා කෑවාද, කැව්වාද කියලා නොවෙයි. ගරු කථානායකතුමාට අපහාස කරලා මේ පාර්ලිමේන්තුව ඒ වාගේ අසහ්‍යකරණයකට ලක් කරනවා, සමහර මන්ත්‍රීවරුන්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කියනවා, අර බදුල්ලේ මන්ත්‍රීතුමා ගරු කථානායකතුමාට අපහාස කළාට, අයුතු ආරෝපණයක් කළාට ඒ මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග මේ ගරු සභාව ගන්න ඕනෑ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න කියන්නේ කවුද?

ඒකත් රට දැනගන්න එපායැ. හිටපු කථානායකවරුන් අසීමිතව ඉන්ධන පාවිච්චි කර තිබියදී, කථානායකවරයෙකුට අසීමිතව ඉන්ධන ඕනෑ නැහැ කියලා එතුමා විසින්ම යෝජනාව ගෙනැල්ලා, 2025 මැයි මාසයේ 02වැනි දා එය සම්මත කරගෙන එම පහසුකම කප්පාදු කළ කෙනා තමයි, මේ කථානායක. ඊළඟට, නිල රථ ඕසෙට තියාගෙන පැදපු කථානායකලා හිටපු තැන, තමන්ට අවශ්‍ය නිල රථ 2යි කියලා නිල රථ 2ක් පමණක් ගත්ත කථානායක තමයි මේ. පසුගිය කාලවල පෞද්ගලික කාර්ය මණ්ඩලයට මුළු යාපා පටුනම දමාගෙන හිටියා. මතකනේ, පුතාත් යාපා, මාමත් යාපා, දුවත් යාපා. අන්න ඒ ජාතියේ අකරතැබ්බයක් මේ පාර්ලිමේන්තුවට කරන්නේ නැතුව කාර්ය මණ්ඩලය අට දෙනෙකුට සීමා කරපු කථානායක තමයි මේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අවස්ථාවේදී තවත් කරුණු-කාරණා කිහිපයක් සඳහන් කරන්න මම කැමැතියි. ඒ මොනවාද? හිටපු කථානායකලා unlimited ඉන්ධන - fuel - ගැහුවේ. හිටපු කථානායක 2023දී රුපියල් ලක්ෂ 261ක තෙල් ගහලා; 2024දී රුපියල් ලක්ෂ 334ක තෙල් ගහලා. හිටපු නියෝජ්‍ය කථානායක 2023දී රුපියල් ලක්ෂ 148ක තෙල් ගහලා; 2024දී රුපියල් ලක්ෂ 135ක තෙල් ගහලා. ඊට පසුව ආහාර වියදම් බලන්න. කෑවා කියලාත් කියනවානේ? හිටපු කථානායකගේ 2023දී ආහාර වියදම රුපියල් ලක්ෂ 26ක්; 2024දී රුපියල් ලක්ෂ 31ක්. හිටපු කථානායකට 2023දී වාහන 8යි; 2024දී 9යි. දැන් කථානායකට වාහන 2යි, මාධ්‍ය ඒකකයේ එක වාහනයයි. එහෙමයි දැන් කටයුතු කරන්නේ. තව කියනවා නම්, ගොඩක් ඒවා තිබෙනවා. නමුත් ඒවා ඕනෑ නැහැ.

එවකට හිටපු Deputy Speaker 2023දී වාහන 6ක් පාවිච්චි කළා; 2024දී 5ක් පාවිච්චි කළා. දැන් සිටින නියෝජ්‍ය කථානායක එක වාහනයයි පාවිච්චි කරන්නේ. හිටපු DCC 2023දී වාහන 4ක් පාවිච්චි කළා; 2024දී 4ක් පාවිච්චි කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් ඔබතුමිය පාවිච්චි කරන්නේ එක වාහනයයි. ඒ විධියට ආදර්ශවත් පාර්ලිමේන්තුවක් හදන්න තමයි මේ ගරු කථානායකතුමා මැදිහත් වුණේ. දැන් මේ අයට ඒවා දරාගන්න බැහැ, අමාරුයි. ඒ නිසා තමයි මේ මඩ ව්‍යාපාරය ගෙනියන්නේ.

අද දවසේ අපි විවාද කරන්නේ සන්නිවේදන කුලුනුවලට අදාළ රෙගුලාසි ගැනයි. නමුත් කණු තියපු, ඒවා කරේ තබාගෙන ගිය විපක්ෂය දැන් ඇනගෙන ඉන්නවා. ගරු විපක්ෂ නායකතුමා මහ විනාශයක් කර ගත්තේ, පොහොට්ටුවේ කුණු කරේ තියාගෙන ගිහිල්ලා. පලා ගිය ජනාධිපතිගේ ලේකම් පවා පොලීසියට ගිහින් භාර දුන්නේත් ඔය වාගේම ලේඛනයක් තමයි. ඒ ජාතියේම ලේඛනයක් තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහින් භාර දුන්නේත්. මේවා සමාන වෙන්නේ කොහොමද කියලා විපක්ෂ නායකතුමා එතුමාගේ දේශපාලන විඥානය පාවිච්චි කරලා බලන්න ඕනෑ. ඒ නිසා නියෝජ්‍ය මහ ලේකම් වන්නම නටා අවසන් වුණාම, මහන්සි නම් එන්න අපි පස්සේ වෙලාවක සීතල වතුර වීදුරුවක් බොමු, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. M.K.M. ASLAM took the Chair.*

[අ.භා. 4.30]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මීට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා සීතල වතුර වීදුරුවක් බොන්න කථා කළා. ඔය කියන වතුර වීදුරුව සීතල වෙනවාද, රත් වෙනවාද කියන කාරණය අපට අනාගතයේදී බලාගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමා පිළිබඳව අද කථා කළා. මම ඒ පිළිබඳව දීර්ඝව කථා කරන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි උදේ ඉඳලා බලාගෙන ඉන්නවා, කථා කරන්න. මේක වැරදියිනේ. දැන් මගේ නම තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමාගේ අවස්ථාව තමයි ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාට ලබා දීලා තිබෙන්නේ. එතුමාට තමයි මුලින් අවස්ථාව තිබෙන්නේ. *[බාධා කිරීමක්]* Agenda එක අනුව තමයි කටයුතු කරන්නේ.

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මගේ කාලය දෙන්න. මොකද, බාධා කළ නිසා මම කථාව නවත්වාගෙන හිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නියෝජ්‍ය මහ ලේකම්තුමා පිළිබඳව කථා කළා. නියෝජ්‍ය මහ ලේකම්තුමා පිළිබඳව මම දීර්ඝව කථා කරන්න උත්සාහ ගන්නේ නැහැ. ගමේ මරණාධාර සමිතියේ ඉඳලා, ගමේ පන්සලේ දායක සභාවේ ඉඳලා හැම සමිතියක්ම මාලිමාකරණය කර ගන්න, එහෙම නැත්නම් මාලිමාවේ ශාඛා සමිතියක් බවට පත් කර ගන්න උත්සාහ ගන්නා ඔබේ ආණ්ඩුව මේ පාර්ලිමේන්තුවත්, ඔබේ ශාඛා සමිතියක් බවට පත් කර ගන්න උත්සාහ ගන්නා ආකාරය තමයි අද මේ නිලධාරින්ට විවිධ බොරු චෝදනා කිරීම තුළින් පෙනෙන්නේ. ඒවායේ ප්‍රතිඵල අපට අනාගතයේදී බලා ගන්න පුළුවන්. ඒ නිසා ඒ පිළිබඳව මම මීට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ.

78 වන නිදහස් දිනය සමරන හෙට දවසේ ඔබේ ආණ්ඩුව මේ රටේ ජනතාවට සැබෑ නිදහස ලබා දීලා තිබෙනවාද නැද්ද කියන කාරණය පිළිබඳව ආපසු හැරිලා බලන්න අවස්ථාව තිබෙනවා. ඒ නිසා හෙට නිදහස සමරන්න ඉන්න මොහොතේ ඔබ ආපසු හැරිලා බලන්න, ඔබේ ආණ්ඩුව මේ රටේ ජනතාවට දුන් බලාපොරොත්තු ඉටු කරලා තිබෙනවාද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ මේ රටේ පුරවැසියාගේ නිදහස අහිමි කරලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ රාජ්‍ය සේවක මහත්ම මහත්මීන්ගේ නිදහසත් අහිමි කරමින් තිබෙනවා.

අපි දන්නවා, මේ ආණ්ඩුව බලයට පත් වුණේ යහපාලනය මේ සමාජය තුළ ස්ථාපිත කරනවාය කියන පරමාර්ථය පෙරදැරි කරගෙන බව. අද මේ ආණ්ඩුව රජයේ සේවකයන්ට, එහෙම නැත්නම් සංස්ථාවල සේවකයන්ට, කාර්යාංශවල සේවක මහත්ම මහත්මීන්ට විවිධ තාඩන පීඩන සිදු කරමින් ඉන්නවා. ඒ කාරණාව අද මේ පාර්ලිමේන්තුව තුළත් අපට දකින්නට ලැබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ බදුල්ල ශාඛාවේ නිලධාරි මහත්මයෙක් ආණ්ඩුව විවේචනය කිරීමේ වරදට අද සේවයෙන් පහකරලා තිබෙනවා. මේ ආණ්ඩුව බලයට පත් වෙන්න කලින්, එදා විපක්ෂයේ ඉන්නකොට පැවැති හැම ආණ්ඩුවකටම අවලාද නැඟුවා; මඩ ප්‍රචාර දියත් කළා. මාධ්‍ය හරහා; සමාජ මාධ්‍ය හරහා දිගින් දිගටම ඒ කටයුතු සිද්ධ කළා. හැබැයි එහෙම කරපු අය අද බලයට පත් වෙලා, තමන්ගේ ආණ්ඩුව විවේචනය කරන රාජ්‍ය නිලධාරි මහත්ම මහත්මීන්ට විවිධ චෝදනා නඟමින්, ඔවුන් සේවයෙන් පහකරමින් ඉන්නවා. මේ ආණ්ඩුව අද රාජ්‍යයත්, ආණ්ඩුවත් පටලවාගෙන කටයුතු කරනවාය කියන කාරණය මේ මොහොතේ සිහිපත් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Ceylon Petroleum Corporation එකේ සේවක මහත්ම මහත්මීන් හයදෙනෙකුට හත්දෙනෙකුට වඩා අද සේවයෙන් පහත හෙළා තිබෙනවා. ඒකට හේතුව තමයි මේ ආණ්ඩුව විවේචනය කිරීම; මේ ආණ්ඩුවට විරුද්ධව තමන්ගේ ෆේස්බුක් ගිණුමේ මත පළ කිරීම. ආණ්ඩුවට විරුද්ධව මතයක්වත් ප්‍රකාශ කරන්න බැරි තැනට අද මේ ආණ්ඩුව තමන්ගේ බලය පතුරුවමින් ඉන්නවා. ඒ නිසා මම මේ මොහොතේ මේ රටේ සමස්ත රාජ්‍ය සේවක මහත්ම මහත්මීන්ට වාගේම සංස්ථාවල, කාර්යාංශවල සේවක මහත්ම මහත්මීන්ට එල්ල කරන පීඩනය පිළිබඳව මේ සභාව දැනුවත් කරන්න කැමැතියි.

අද දවසේ ශිරන්ති රාජපක්ෂ මහත්මිය FCID එකටත්, නාමල් රාජපක්ෂ මැතිතුමා CID එකටත් කැඳෙව්වා. ප්‍රශ්නයක් නැහැ. ඒකට ඔවුන් මුහුණ දුන්නා; මුහුණ දෙයි. හැබැයි මේ ආණ්ඩුව හිතාගෙන ඉන්නවා නම් දැවැන්ත මර්දන කරමින් මේ විපක්ෂය, එහෙම නැත්නම් විපක්ෂයේ අපේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ආපසස්ට හරවන්න පුළුවන් කියලා, ඒක විහිළුවක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කන්ටේනර් පෙට්ටි 323ක් රටට ඇතුළු කරපු වරදෙන් නිදහස් වෙන්න පුළුවන් කියලා මේ ආණ්ඩුව හිතනවා නම්; බාල ගල් අඟුරු ගෙනැල්ලා රටට කරපු දැවැන්ත වංචාවෙන් නිදහස් වෙන්න පුළුවන් කියලා මේ ආණ්ඩුව හිතනවා නම්; තවමත් උත්තරයක් නොදීපු ත්‍රිවිධ හමුදාවේ ආහාර ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩරය මඟින් රටට සිදු කරපු වංචාවෙන් නිදොස් වෙන්න පුළුවන් කියලා මේ ආණ්ඩුව හිතනවා නම්; ඒ වාගේම අපේ රටේ ගෞරවනීය ජනතාව අනතුරට පත් වෙන්න හේතු වුණු බාල බෙහෙත් ගෙන්වීමේ වරදෙන් නිදොස් වෙන්න පුළුවන් කියලා මේ ආණ්ඩුව හිතනවා නම්; පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු අප්‍රේල් 21 වැනිදා මේ රටට හෙළි කරනවාය කියලා ජනාධිපතිතුමා කියලා, එය බොරු පොරොන්දුවක් බවට පත් කරපු එකෙන් නිදහස් වෙන්න පුළුවන් කියලා, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ඒ වාගේම උපාධිධාරින්ට රැකියා දෙනවාය කියලා තවමත් නොදීපු එකෙන් නිදහස් වෙන්න පුළුවන් කියලා මේ ආණ්ඩුව හිතනවා නම්; ඒ වාගේම ගුරු සේවයට බඳවා ගන්නවාය කියලා සංවර්ධන නිලධාරින්ට දුන් පොරොන්දු තවමත් ඉටු නොකර, එකෙන් ගැලවෙන්න පුළුවන් කියලා මේ ආණ්ඩුව හිතනවා නම්; අපට චෝදනා කරලා, අපව FCID එකට ගෙනිහිල්ලා, අපව CID එකට ගෙනිහිල්ලා මේ ප්‍රශ්නවලින් මිදෙන්න පුළුවන්ය කියලා මේ ආණ්ඩුව හිතනවා නම්, ඒක මේ ආණ්ඩුව සිදු කර ගන්නා වරදක්. නිදහස සමරන මේ මොහොතේ මේ රටේ ජනතාව තැබූ ඒ විශ්වාසය තහවුරු කරන්න රජය ඉදිරියේදී කටයුතු කරයි කියලා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ සිදු වුණු විශාලම වංචාවක් පිළිබඳව පසුගිය පාර්ලිමේන්තු රැස්වීම් වාරයේදී ගරු

[ගරු චානක මාදුගොඩ මහතා]

සභාවේදී මා අනාවරණය කළා. එම වංචාව පැයකට කලින් සිදු වුණා කියලා තමයි මම පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළේ. එම වංචාව කරන්න එපා කියලා අපි ඉල්ලීම් කළා. නමුත්, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය යටතේ එම වංචාව සිදු කර තිබෙනවා. අද එම වංචාව මේ රටේ සිදු වෙමින් තිබෙනවා. ඒ තමයි, ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවට ආහාර ද්‍රව්‍ය සැපයීමේදී සිදු වන බිලියන ගණනක අතිදැවැන්ත වංචාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ වග කියන කිසිදු ඇමතිවරයෙක් හෝ මන්ත්‍රීවරයෙක් ඒ පිළිබඳව එකම වචනයක් තවමත් කියලා නැහැ. පුළුවන් නම් අද ඒ සම්බන්ධයෙන් කියන්න කියලාත් මම ඉල්ලීමක් කරනවා. ඉදිරිපත් වුණු අඩු ලන්සුව ප්‍රතික්ෂේප කරලා ඔබ පක්ෂයේ ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් සමඟ හිතවත්කම් තිබෙන මුදල් පොම්ප කරන ව්‍යාපාරිකයන් ඉදිරිපත් කළ ලන්සුවට එම ටෙන්ඩරය දුන් නිසා මේ රටට සිදු වුණේ මොන වාගේ පාඩුවක් ද කියන කාරණය මම උදාහරණ කිහිපයකින් පෙන්වන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවට ආහාර ද්‍රව්‍ය සැපයීමට ඉදිරිපත් කළ ටෙන්ඩර් කැඳවීමේදී, වියළි කහ කිලෝවක් රුපියල් 2,130කට සපයන්න ඉදිරිපත් කළ අයදුම්පතක් තිබුණා. හැබැයි, ඔබේ කැබිනට් මණ්ඩලය අනුමත කළේ රුපියල් 2,750කට සපයන්න ඉදිරිපත් කළ අයදුම්පතක්. එහි වෙනස කිලෝවකට රුපියල් 620යි. ඒ අනුව, වියළි කහ මිලදී ගැනීම්වලින් විතරක් අවුරුද්දකට ලක්ෂ 60ක් මේ රටට අහිමි වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම වංචාව සම්බන්ධව මට කියන්න තව කාරණා කිහිපයක් තිබෙනවා. මම අභියෝග කරනවා, පුළුවන් නම් අද හෝ පාර්ලිමේන්තුවේදී එම වංචාව පිළිබඳව රටට හෙළි කරන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ මම ඒ අභියෝගයත් කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සෙල්ලා ගරු මොහමඩ් තාහිර් මන්ත්‍රීතුමා නඟපු ප්‍රශ්නයම තමයි මා ඉදිරිපත් කරන්නේ. Speakers' list එකේ තිබෙන්නේ, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමාගේ නම. එතුමා වෙනුවට ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා කථා කරනවා. ගරු මොහමඩ් තාහිර් මන්ත්‍රීතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණත්, අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු වුණත්, මන්ත්‍රීවරුන්ට කථික ලැයිස්තුව අනුව කථාව කිරීමට තිබෙන අවස්ථාව සම්බන්ධයෙන් අපි පෙනී සිටීමක් කරන්න අවශ්‍යයි කියලා මම හිතනවා. විශේෂයෙන්ම එතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්ද කියන එක නොසලකා හරිමින් තමයි මා මෙය කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථික ලැයිස්තුවේ order එක සම්බන්ධයෙන් පොඩ්ඩක් මැදිහත් වීමක් කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. කථික ලැයිස්තුවේ නම සඳහන්ව නොමැති මන්ත්‍රීවරුන්ට අවස්ථාව දීමට පෙර නම සඳහන් මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමාගේ අවස්ථාව තමයි ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාට දුන්නේ. ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමාට වෙන් වූ අවස්ථාව ලබාගෙන තමයි ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා කථා කළේ. කථික ලැයිස්තුවේ විපක්ෂය පැත්තෙන් හතරවැනියාට තමයි ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමාගේ කථාව තිබුණේ. ඒ අවස්ථාව තමයි මෙතුමාට දුන්නේ. එය නිවැරදියි කියලා මම හිතනවා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මේ ගරු මන්ත්‍රීතුමිය හැම දෙනාගේම කරුණුවලට ඉදිරිපත් වනවා. ඒක හොඳ ලක්ෂණයක්. මෙතුමිය විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ හැමෝගේම අදාළ සහ අදාළ නැති හැම දෙයකටම ඉදිරිපත් වනවා. ඒක හොඳ දෙයක්. හැබැයි, මේ අද සිදු වුණු දෙය පාර්ලිමේන්තුවේ පළමු වතාවට සිදු වුණු දෙයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඔෂානි උමංගා ගරු මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.39]

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට ඩිජිටල් ආර්ථිකයක් කරා ගෙන යන ගමනේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් වන දිනයක්, අද. ඒකට හේතුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ ඉදිරිපත් කරන ලද රෙගුලාසි අද පාර්ලිමේන්තුවේ විවාද කරනවා. මීට ඉස්සෙල්ලා ආණ්ඩු කළ මන්ත්‍රීතුමන්ලාත් විපක්ෂයේ ඉන්නවා. ඉතින්, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මෙම රෙගුලාසි සම්බන්ධයෙන් ඉතා සාධනීය යෝජනා සහ අදහස් ඉදිරිපත් වේවි කියලා අපි බලාපොරොත්තු වුණා. නමුත්, අද උදේ ඉඳලා අපි දැක්කේ මඩ ප්‍රහාර. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ඇවිල්ලා වටේටම මඩ ගහලා, තමනුත් මඩ නාගෙන මේ වනකොට යන්න ගිහිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආණ්ඩු පක්ෂය විධියට අපේ කාර්යභාරය ඉෂ්ට කරමින් අද මේ ගෙනාපු රෙගුලාසි පිළිබඳව සාකච්ඡා කරන්න කැමැතියි.

ඩිජිටල් ආර්ථිකය කියන්නේ, එක්තරා තෝරා ගැනීමක් නොවෙයි. ගෝලීයකරණයත් සමඟ එය අනිවාර්ය අවශ්‍යතාවක් බවට පත් වෙලා තිබෙනවා. ලෝකය වේගයෙන් දුව යද්දී ලංකාවේ අපට හෙමින් ඇවිදගෙන යන්න පුළුවන්කමක් නැහැ. 2024 අංක 1 දරන විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල්

භාවිතාවේ රෙගුලාසි මඟින් එකම පහසුකම් නැවත නැවත ඉදිකිරීම් අවම කර දැනට පවතින ජාතික දුරකථන යටිතල පහසුකම් වඩාත් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම හා වැඩිදියුණු කිරීම අපේක්ෂා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අද මේ ගරු සභාව හමුවේ පෙනී සිටින්නේ විශේෂයෙන්ම ලංකාවේ අනාගතය තීරණය කරන අතිශය තීරණාත්මක සාධකයක් පිළිබඳව අවධානය යොමු කරන්න. ඒ තමයි, digital economy එක. අද මේ ගරු සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන මේ රෙගුලාසි තුළින් අපි අපේක්ෂා කරනවා, කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වශයෙන් මේ රට පොහොසත් රටක් කරා ගෙනයන්න අවශ්‍ය ප්‍රතිඵල ලබා ගන්න. හවුලේ භාවිතය යටතේ වැඩ බිම් භාවිත කරමින් ජාතික වශයෙන් වේගවත් 5G ජාලයක් ප්‍රවර්ධනය කිරීම ඉන් එකක්. මෙමඟින් ජාතික ආයෝජනයට යන පිරිවැය අඩු වෙනවා විතරක් නොවෙයි, පාරිභෝගිකයන්ට සහන ලැබෙනවා. ඒ වාගේම මහා පරිමාණ ව්‍යාපාරිකයින්ට නොවෙයි, monopoly එක කැඩිලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ටත් ඒකෙන් අවස්ථාවක් ලැබෙනවා. ඒ විතරක් නොවෙයි. ජනගහනයේ වර්ධනයත් සමඟම භූමිය ක්ෂය වෙමින් යනවා. එතකොට සම්පත් මනාව, කාර්යක්ෂමව පාලනය කිරීමට හැකියාවක් මේ තුළින් ලැබෙනවා. ඒ විතරක් නොවෙයි. ක්‍රියාකරුවන් සඳහා පිරිවැය අඩු කරමින් සේවා නවෝත්පාදනය සඳහා අරමුදල් නිදහස් කිරීමත් මින් එකක්. ඒ වාගේම වැඩිදියුණු කළ සේවාවේ ගුණාත්මකභාවය, වඩාත් හොඳ ආවරණයක් තුළින් ඇමතුම් බිඳ වැටීම අඩුවීම හා දත්ත වේගය වැඩි කිරීමත් මින් අපේක්ෂා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩිජිටල් ආර්ථිකය තුළ දේශ සීමා නැහැ. ගාල්ලේ දුෂ්කර ගමක ඉන්න තරුණයෙකුට වුණත් ඇමෙරිකාවේ ආයතනයක වැඩ කරන්න අවශ්‍ය වුණොත්, ඔහුට ඒ ආයතනයේ වැඩ කරන්න අවශ්‍ය පහසුකම මේ හරහා ලැබෙනවා. ඉතින්, අපි සංවර්ධනය වෙමින් පවතින රටක් විධියට දියුණු රටක් බවට පත් වීමේ පාලම තමයි අද මේ සවි කරන්න යන්නේ, digital economy එක හරහා. ඒ වාගේම දිගු කාලීන ප්‍රතිඵල අතර රටේ ඩිජිටල් සූදානම ඉහළ යෑමෙන් වැඩිදියුණු ඩිජිටල් සේවාවක් ලබා දීමට හා ආර්ථික වර්ධනයක් ඇති කිරීමටත් අපේක්ෂා කරනවා. ලෝක බැංකුවේ දත්තවලට අනුව සාම්ප්‍රදායික ආර්ථිකයට වඩා 2.5කට වැඩි වේගයකින් මේ වනකොට ඩිජිටල් ආර්ථික වේගය වර්ධනය වෙමින් පවතිනවා. සංවර්ධනය වෙමින් පවතින රටකට මෙය shortcut එකක් වෙන්න පුළුවන්. අපට සංවර්ධිත රටක් බවට පත් වන්න අවුරුදු ගණනක් - අවුරුදු 50ක් විතර - බලාගෙන ඉන්න පුළුවන්කමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ අසල්වැසි රට වන ඉන්දියාව දෙස බැලුවොත්, ඔවුන් "Digital India" හරහා වීදි වෙළෙඳ පොළේ ව්‍යාපාර කරන ව්‍යාපාරිකයාගේ සිට මහා පරිමාණ ව්‍යාපාරිකයා දක්වා UPI හරහා ගනුදෙනු කරනවා. අද වන විට වියට්නාමය තාක්ෂණික උපාංග අපනයනයෙන් ආසියාවේ බල කඳවුරක් බවට පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පුංචි රටක් වන එස්ටෝනියාව මුළු රාජ්‍ය තන්ත්‍රයම ඩිජිටල්කරණයට ලක් කර ලෝකය ඉදිරියේ ඉතාම හොඳ ආදර්ශයක් පෙන්වා තිබෙනවා. ඒ වාගේම තමයි, ලංකාවේ තිබෙන ඒකාධිකාරී ප්‍රවණතා අඩු කරමින් වඩාත් තරගකාරී විදුලි සංදේශ වෙළෙඳ පොළක් ඇති කිරීම මෙහි ප්‍රතිඵල විධියට අපි අපේක්ෂා කරනවා. ඒ වාගේම ඉතාම අඩු කුලුනු සංඛ්‍යාවක් සහ බලශක්තිය අඩුවෙන් භාවිත කරමින් හරිත යටිතල පහසුකම් සැලසීමත් මෙහි ප්‍රතිඵල ලෙස අපි දකිනවා.

වත්මන් මාලිමා ආණ්ඩුවේ ජාතික ප්‍රතිපත්තිය තමයි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන එක. මේ ඩිජිටල් ආර්ථිකය කියන්නේ ඒක යථාර්ථයක් බවට පත් කරන්න ඍජුව දායකත්වයක් සපයන දෙයක්. පොහොසත් රටක් හැදෙන්නේ සාම්ප්‍රදායික අපනයනවලින් පමණක් නොවෙයි, දැනුම මත පදනම් වූ ආර්ථිකයක්. ඒ කියන්නේ knowledge-based economy එකක් ගොඩනැඟීමෙන්. ඒ වාගේම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වනවා, IT කර්මාන්තය ඩොලර් බිලියන ගණනක අපනයන කර්මාන්තයක් බවට පත් කිරීම තුළින් අපේ රට පොහොසත් රටක් බවට පත් කරනවා කියලා. දූෂණයෙන් තොර රාජ්‍යයක් බිහි කිරීම මඟින් මහජන මුදල් ඉතිරි කරලා අපි මේ රට පොහොසත් රටක් බවට පත් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලස්සන ජීවිතයක් ලැබෙන්නේ පුරවැසියාට පහසුවෙන් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් ගොඩනැඟුණොත් විතරයි. අපේ රටේ පුරවැසියන් birth certificate එක ගන්න, passport එක ගන්න, driving licence එක ගන්න පෝලිමේ ඉන්නවා වෙනුවට, ඩිජිටල්කරණය හරහා ඔවුන්ට එය නිවසටම ලබා දීමට මේ රාජ්‍ය යන්ත්‍රණයත් එක්ක කටයුතු කරන්න අපට පුළුවන්. අපි දැක්කා, පසුගිය කාලයේ driving licence එක chip එකක් එක්ක දෙනවා. හැබැයි, chip එක read කරන මැෂින් එක ලංකාවට එවලා නැහැ. අර driving licence එකට යන අධික මුදල අය කර ගන්නවා. හැබැයි, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණ පහසුකම් පිළිබඳව කිසිම අධ්‍යයනයකින් තොරව තමයි මේ අය කටයුතු කළේ.

ඒ වාගේම මේ තුළින් අපේ තරුණ තරුණියන්ට ලෝකය සමඟ තරග කළ හැකි නව රැකියා අවස්ථා නිර්මාණය කිරීමට හැකි වනවා. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත්, අධිවේගී අන්තර්ජාල පහසුකම් ගමට ගෙනයෑමත්, පාසල් විෂය නිර්දේශයට තොරතුරු තාක්ෂණය අනිවාර්ය කිරීමත් අපි රජයක් විධියට කරන්න බලාපොරොත්තු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තාක්ෂණය කියන්නේ යතුරක් නම් ඒ යතුරෙන් අපට පුළුවන්, දූෂණය නැමති අගුල කඩලා සංවර්ධනය නැමති දොරටුව විවර කරන්න. පසුගිය කාලය පුරාවටම මේ යතුර මේ අය පාවිච්චි කළේ නැහැ. දූෂණය, වංචාව අගුළු දාලා ඒගොල්ලන් සාක්කුවේ යතුර තියාගත්තා. අපි ඒකට සූදානම් ආණ්ඩුවක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ සියල්ලම සඳහා අද මේ ඉදිරිපත් කරන රෙගුලාසි බලාත්මක කිරීම අනිවාර්ය වෙනවා.

අපි දශක ගණනාවක් තිස්සේ සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තය හා ඇඟලුම් කර්මාන්තය මත යැපුණු රටක්. නමුත්, ලෝකය දැන් ගමන් කරමින් සිටින්නේ 4වැනි කාර්මික විප්ලවයත් සමඟයි. අද ලෝකයේ දියුණුයි කියන සෑම රටකම කොඳු නාරටිය බවට පත්වෙලා තිබෙන්නේ ඩිජිටල් ආර්ථිකය; ඩිජිටල් තාක්ෂණය. පාට, පක්ෂ භේදයකින් තොරව අපි විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරනවා, මේ සඳහා එකතු වන්න කියා. හැබැයි, ඔබතුමන්ලාගේ අදහස් කිසිවක් අද මේ රෙගුලාසි සම්බන්ධයෙන් ඉදිරිපත් කළේ නැහැ. හතර වටේට මඩ ගහපු එක විතරයි කළේ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න කාන්තාවන් ඉලක්ක කරමින් ඉතාම කැත විධියට, නින්දිත විධියට අපහාස කරමින් කාලයක් හිටියා. අද කථානායකතුමා මුල් කරගෙන ඒ දේම කරන්න පටන් අරන් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ගෞරවය සුරක්ෂිත කරමින් ඔබතුමන්ලා ඉතාම හොඳ විනයක් සහිතව දේශපාලනය කරනවා නම් අපිත් බොහොම සතුටුයි. ඒ බවත් අපි ඔබතුමන්ලාට කියන්න ඕනෑ. ඒ වාගේම අපේ ලංකාව ගොඩ නඟන්න එන්න කියලා අපි ඔබට ආරාධනා කරනවා. ඔය තිබෙන කුහක, පටු අදහස් සියල්ලක්ම ඉවත දාලා, මේ රට පොහොසත් රටක් බවට පත් කරන්න ඔබ එකතු වෙන්න. අපේ රටේ දක්ෂ මානව සම්පතක් ඉන්නවා. අපි නිවැරදි රාජ්‍ය ප්‍රතිපත්ති හදනවා. ඩිජිටල් තාක්ෂණයත් එක්ක මේ සියල්ල මුසු කළාම සැබෑවටම පොහොසත් රටක් උරුම කරගෙන ලස්සන ජීවිතයක් අපට සහ අපේ ඊළඟ පරම්පරාවට උරුම කර දෙන්න පුළුවන්.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர் அவர்கள்! உங்களுக்கு 6 நிமிடங்கள் உள்ளன.

[අ.භා. 4.50]

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
මට විනාඩි 8ක් තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ රෙගුලාසි සම්මත කිරීම සඳහා අපි සහාය ලබා දෙනවා. රට පුරා විහිදී ඉන්න ජනතාවට නිසි සන්නිවේදනයක් ලැබෙන්නේ නැහැ. මේ රෙගුලාසි තුළින් මුළු රටටම හොඳ සන්නිවේදන සේවාවක් ලැබෙනවා නම් ඒකට අපි සතුටු වෙනවා. විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල කුලුනු තිබෙනවා. එම නිසා ඒ අයට සන්නිවේදන පහසුකම් ලැබෙනවා. නමුත්, දුෂ්කර ප්‍රදේශවලට, ධීවර ජනතාව ඉන්න ප්‍රදේශවලට වාගේම ගොවිතැන් කරන ජනතාව ඉන්න ප්‍රදේශවලට හරියට සන්නිවේදන පහසුකම්, සිග්නල් නැහැ.

මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, අලුත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා හොඳ සන්නිවේදනයක් අවශ්‍යයි කියන එක. එහෙම හොඳ සන්නිවේදනයක් තිබුණොත් තමයි අලුත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දරුවන්ට ප්‍රයෝජනවත් වෙන්නේ.

දැනට අපේ රටේ කුලුනු 8,000 ගණනක් තිබෙනවාය කියනවා. ඒ කුලුනු ප්‍රමාණය තව වැඩි කරලා, ඇත්තටම ගම්බද ප්‍රදේශවල ඉන්න ජනතාවට ඒ සන්නිවේදන පහසුකම ලබා දෙන්න ඕනෑ. මම දැකලා තිබෙනවා, සමහර දරුවෝ phone එක කන්දක් උඩට අරගෙන ගිහිල්ලා සිග්නල් තිබෙනවාද කියලා බලනවා. එවැනි අඩුපාඩු වළක්වන්න නම් හරියාකාරව මේ රටේ ජනතාවට, දරුවන්ට ඒ පහසුකම ලබා දිය යුතුයි.

ඒ වාගේම අධ්‍යාපනයට සන්නිවේදනය අත්‍යවශ්‍යයි කියන එකත් මම කියන්න කැමැතියි. විශේෂයෙන්ම අපේ රටේ ආර්ථිකයට සම්බන්ධ වෙන්නත් සන්නිවේදනය අවශ්‍යයි. සිග්නල් නැත්නම් phone එක වැඩ කරන්නේ නැහැ; හරියට කිසිම දෙයක් බලන්න බැහැ; හරියට කථා කරන්නත් බැහැ. ඒ නිසා සන්නිවේදනය රටට අත්‍යවශ්‍යයි. හොඳ රටක, හොඳ ජීවිතයක් ගත කරන්න ලැබෙනවා නම් අපිත් ඒ සම්බන්ධයෙන් සතුටු වනවා. ඊට අවශ්‍ය කරන වටපිටාව හදන එක පවතින රජයේ වගකීමක්. හොඳ දෙයක් කරනවාට අපි විරුද්ධ වෙන්නේ නැහැ. නමුත්, විපක්ෂයක් හැටියට අඩුපාඩු පෙන්වා දෙන එක අපේ යුතුකමක්. යම්කිසි වරදක් වුණා නම් ඒක නිවැරදි වෙන්න ඕනෑ. විපක්ෂයක් විධියට අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම මේ කාරණයත් කියන්න කැමතියි. මේ වනකොට දවස් ගණනක් තිස්සේ සංවර්ධන නිලධාරින් - DOsලා - උපවාස කරනවා. සංවර්ධන නිලධාරින් 52,000ක් ඉන්නවාය කිව්වා. පළාත් 9ම ගුරුවරු 40,000ක අඩුවක් තිබෙනවා. Science, commerce, IT, English වාගේ විෂයයන් උගන්වන්න ගුරුවරු නැහැ. ඒ විධියට ගුරුවරු විශාල ප්‍රමාණයක පුරප්පාඩු තිබෙනවා. අධ්‍යාපනය ලබා දීපු, ඉස්කෝලවල ළමයින්ට උගන්වපු උපාධිධාරින් ටික ගුරුවරු විධියට බඳවා ගත්තා නම් ඒ අයත් සතුටු වෙනවා; අපේ රටේ අධ්‍යාපනයටත් යම්කිසි දායකත්වයක් ලැබෙනවා. එතැන දේශපාලනයක් නැහැ. ඒ අය උපාධිය අරගෙනයි රාජ්‍ය සේවයට බැඳිලා ඉන්නේ. ඒ අයගෙන් හොඳ ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. එතකොට ඒ අයගේ ඉල්ලීමත් ඉෂ්ට වෙනවා. විශේෂයෙන්ම ගුරුවරුන්ගේ ප්‍රශ්නයත් විසඳෙනවා. ඒ වෙනුවෙන් වෙනම බරක් දරන්න ඕනෑ නැහැ. ඒ නිසා මම ඔබතුමන්ලාට කියනවා, ඒ ගැන සංවේදී වෙන්න කියලා. හෙට නිදහස් දිනය සමරනකොට ඒ උපාධිධාරිනුත් හොඳ මානසික මට්ටමකින් නිදහස් දිනය සමරන්න ඕනෑ කියන එකයි මගේ කාරුණික ඉල්ලීම.

සමස්ත ලංකා මහජන කොංග්‍රසයේ නායක රිසාඩ් බදියුදීන් මැතිතුමා රට හිටියාට එතුමා මට කිව්වා, මේ සංවර්ධන නිලධාරින් ගැන කථා කරන්න කියලා. ඕනෑම පක්ෂයක වෙන්න පුළුවන්, ඕනෑම ජාතියක වෙන්න පුළුවන් පක්ෂ භේදයකින් තොරව උපාධියක් ලබා තිබෙන ඒ සංවර්ධන නිලධාරින්ට හොඳ ගෞරවයක් ලැබෙන්න ඕනෑ. ඒ අය අවුරුදු හතක් විතර ඉස්කෝලවල උගන්වා තිබෙනවා. ඊට පස්සේ ඒ අයව සමහර තැන්වලට මාරු කරපු බව මම දන්නවා. එහෙම මාරු කරපු නිසා ඒ අය අද එක තැනක ඉන්නවා, හෙට තව තැනක ඉන්නවා. ඒක ඇත්තටම රාජ්‍ය සේවයේ ඉන්න නිලධාරින්ට කරන අගෞරවයක්. ඔවුන්ට කරන ගෞරවයක් විධියට මම මේ ඉල්ලීම කරනවා. බිමල් රත්නායක ඇමතිතුමාත් මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා. ඇමතිතුමා කිව්වා, සංවර්ධන නිලධාරින් 52,000ක් ඉන්නවාය කියලා. මම දන්නවා, ඒ 52,000ටම පත්වීම් දෙන්න බැහැ කියලා. නමුත්, ගුරු පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒ පුරප්පාඩු හඳුනා ගෙන, ඒ අයට විෂයයන් අනුව උගන්වන්න භාර දුන්නා නම් ආණ්ඩුවටත් බරක් නැහැ, උපාධිධාරි සංවර්ධන නිලධාරින්ටත් බරක් නැහැ. ඒ අය එක්ක ගරු ජනාධිපතිතුමා සාකච්ඡා කළා කියලා ගරු ඇමතිතුමා කිව්වා. විශේෂයෙන්ම මම දේශපාලනයෙන් තොරවයි මේ ගැන කථා කරන්නේ. ඒ අයට යම්කිසි හොඳ විසඳුමක් ලබා දුන්නා නම් හෙට නිදහස් දිනයේදී ඒ අයටත් නිදහසක් ලැබෙයි කියලා මම හිතනවා.

මට තව පොඩි කාරණාවක් කියන්න තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කල්පිටිය ප්‍රදේශයේ ඩච් බේ කියලා ගමක් තිබෙනවා. ඒක කතෝලික ගමක්. ඒක අවුරුදු ගණනාවක ඉතිහාසයක් තිබෙන ගමක්. ඒ ගම වෙරළ ඛාදනයට ලක් වීම නිසා කතෝලික පල්ලි ඔක්කොම විනාශ වෙලා තිබෙනවා. මේ කාරණය ගැන කියන්න පිරිසක් ගරු ධීවර ඇමතිතුමාත් හමු වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් විස්තර ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා. ඒ වාගේම මේ ඩච් බේ, කිරිමුන්දලම ප්‍රදේශයේ ජනතාවට යම් විසඳුමක් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. M.K.M. ASLAM left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 4.58]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ ගෙන එනු ලබන රෙගුලාසි ගැන විශාල සාකච්ඡාවක්, කථා බහක්, මූලික කරුණු දැක්වීමක් ඇති වුණා. හැබැයි, ඒ සම්බන්ධයෙන් කාටවත් ලොකු විවාදයක් තිබුණේ නැති බව අපි දැක්කා. ඒ වෙනුවට පාර්ලිමේන්තුවේ කථානායක ගැන, එහෙම නැත්නම් විනය පරීක්ෂණ ගැන සාකච්ඡාවක් මතු වෙලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලසනයේ ඉන්න වෙලාවේදී මට මේ කථාව කරන්න ලැබුණු එක හොඳයි කියලා මම හිතනවා. ඇත්තටම මම හිතන විධියට අද දවස ලංකාවේ අපට ඓතිහාසික දවසක්. මේ දවස්වල මූල්‍ය අපරාධ. එහෙම නැත්නම් ලංකාවේ කාලයක් තිස්සේ ඇදෙමින් තිබුණු යම් යම් පරීක්ෂණ ක්‍රියාවලි සම්බන්ධයෙන් තීරණාත්මක පියවර කිහිපයක් නිකුත් වෙලා තිබෙනවා.

පළමුවැනි කාරණය මේකයි. අද මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට - FCID එකට - හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ බිරිඳ වන ශිරන්ති රාජපක්ෂ මහත්මිය ගියා. ඒ සම්බන්ධයෙන් කරපු කථා පටන් ගැනීමේදී කියැවුණා, දේශපාලන පළිගැනීම් කියලා. මම පොඩි වෙලාවක් අරගෙන ඒ ගැන අදහසක් දක්වන්නම්. ඒ සම්බන්ධයෙන් පළ වුණු ප්‍රසිද්ධ කථාව තමයි, "සිරිලිය සවිය" කියන ගනුදෙනුව. 2006දී account එකක් ආරම්භ කරලා තිබෙනවා. ඒ account එක ආරම්භ කරලා තිබෙන බවට පසුකාලීනව අනාවරණය වුණේ, 222222222 V කියන Identity Card number එක යටතේ. ඒකේ රුපියල් මිලියන 882.8ක් deposit කරලා තිබෙනවා. ඒකෙන් රුපියල් මිලියන 305.6ක් සල්ලි අරගෙන තිබෙනවා. Transactions 129ක් වෙලා තිබෙනවා. රුපියල් මිලියන 10ක fixed deposits තිබෙනවා. ඒ account එක ආරම්භ කරලා අදට අවුරුදු 20ක් වෙනවා. පරීක්ෂණ පටන් අරගෙන අවුරුදු 11ක් වෙනවා. හැබැයි, පළමුවැනි වතාවට විමර්ශන ආයතනයකට ගිහිල්ලා කටඋත්තරයක් දෙන්නේ අද තමයි. ඒක හොඳ දෙයක් නොවෙයිද? මීට කලින් එක් වතාවක් කටඋත්තරයක් දුන්නා. ඒ, 2015 ජූනි 01වැනි දා. ඒ කටඋත්තරය දුන්නේ මෙතැන එහා පැත්තේ තිබෙන කථානායක නිල නිවාසයේදී. කථානායක නිල නිවසට තමන් කැමැති විමර්ශන නිලධාරීන් ගෙන්වලා තමයි කටඋත්තර දුන්නේ. අද කථානායක ගැන, කථානායකගේ ගෙවල් ගැන කථා කරපු නිසා ඒකත් සලකුණු කරලා යන්න මම මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා. ඒ කථානායක ගැන කිව්වොත්, විපක්ෂය නියෝජනය කරන සමගි ජන බලවේගයේ මහ ලේකම් රංජිත් මද්දුම බණ්ඩාර මහත්මයාගේ ප්‍රකාශයට අනුව කීර්තිමත් කථානායක කෙනෙක් වුණු චමල් රාජපක්ෂ මහත්මයා කථානායක වෙලා සිටියදී තමයි ඒ සිද්ධිය වුණේ. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට යන්නේ නැතුව තමන්ගේ දේශපාලන බලතල පාවිච්චි කරලා, කථානායක නිල නිවසට තමන්ගේම නිලධාරීන් ගෙන්වලා තමයි කටඋත්තර දුන්නේ.

අද පළමුවැනි වතාවට ශිරන්ති රාජපක්ෂ මහත්මියට සිද්ධ වෙලා තිබෙනවා, ගිහිල්ලා චෝදනා එල්ල වී ඇති සාමාන්‍ය පුරවැසියෙක් වාගේ වැඩ කරන්න. ඒක සාමාන්‍ය දෙයක් නොවෙයි. අපි හිතනවා, ඒක විශේෂ දෙයක් කියලා.

ඒ වාගේම අද නාමල් රාජපක්ෂ -එතුමියගේ පුතා- අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට -CID එකට- ගිහින් තිබුණා. අපි දැක්කා, තෙරපි තෙරපි ගිය හැටි. 50ක් විතර වට කරගෙන ඉතාම අමාරුවෙන් තෙරපි තෙරපි, හති දමාගෙන, දහඩිය දමාගෙන ගියා. මොකටද ගියේ? දැන් මේක දේශපාලන පළිගැනීමක්ය කියනවා නේ. ඒ නිසා මේ කථා හරියට නිරවුල් කරගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගිය හේතුව මොකක්ද? මොනවා හරි කරුණු විමසීමකට නේ ගියේ. හේතුව වශයෙන් ඉදිරිපත් කර තිබුණේ මේකයි. පසුගිය දවසක අත්අඩංගුවට ගනිපු ප්‍රබල පාතාල කල්ලි සාමාජිකයෙක් වෙච්ච "කෙහෙල්බද්දර පද්මේ" කියන පුද්ගලයාගේ ජංගම දුරකථන තොරතුරු විමර්ශනය කළාට පසුව දේශපාලනඥයන් 6දෙනෙකුගෙන් කරුණු විමසනවා කියලා තිබුණා. ඊයේ හරි පෙරේදා හරි අපි දැක්කා, ප්‍රසන්න රණතුංග මහත්තයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගිහින් තිබුණා. ගිහිල්ලා කියා තිබුණා, තාත්තා නම් යාළුවා, පුතාත් එක්ක එච්චර යාළුකමක් නැහැ වාගේ එකක්. ඉතින් අද නාමල් රාජපක්ෂ ගිහින් තිබෙනවා. එතකොට ඒ කියන දේශපාලන පළිගැනීම මොකක්ද? අපට විරුද්ධව දේශපාලනය කළා කියලාද ඔවුන් කැඳවා තිබෙන්නේ? යම් දෙයක් වෙලා තිබෙනවාද, තිබුණා නම් තිබිලා තිබෙන්නේ මොන ආකාරයේ ගනුදෙනුවක්ද, එහෙම තිබිලා නැද්ද කියන ඒවා හෙළිදරව් වෙයි. කිසි ප්‍රශ්නයක් නැහැ.

කවුද, "කෙහෙල්බද්දර පද්මේ" කියන්නේ? මිනී මැරුම්වලට, මත්ද්‍රව්‍ය වෙළඳාමට, බරපතළ අපරාධවලට චෝදනා තිබෙන, අන්තර්ජාතිකව ගිහිල්ලා අරගෙන ආපු සැකකරුවෙක්. එතකොට ඒ චෝදනා ගත්තාම "දේශපාලන පළිගැනීම්" වාගේ දේවල් කියන්න හොඳ නැහැ. ෂෝට්ක් ඇඳගෙන උදේට jogging යනවා

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

වාගේ ගිය අය අද දඬුවම් දමාගෙන, තෙරපි තෙරපී, මුහුණ රතු කරගෙන යන එක මේ රටේ ජනතාවගේ ජයග්‍රහණයක් කියලා මම හිතනවා. එහෙම පාලනයක් තමයි මේ රටේ මිනිස්සු බලාපොරොත්තු වුණේ. තරාතිරම නොබලා, පසුබිම නොබලා දඬුවම් දෙන, සාධාරණ පරීක්ෂණ කරන පසුබිමක් තමයි මේ රටේ මිනිස්සු බලාපොරොත්තු වුණේ. ඒක අපි සිද්ධ කරමින් තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා.

ඒ වාගේම දවස් දෙකකට කලින් ප්‍රවෘත්ති පළ වුණා අපි දැක්කා, හිටපු කථානායකවරයෙකුගේ පුතකු සම්බන්ධව. රංජිත් මද්දුම බණ්ඩාර මහත්තයාගේ කීර්තිමත් කථානායක list එකේ ඉන්න චමල් රාජපක්ෂ මහත්තයාගේ බාල පුතා වන ශමීන්ද්‍ර රාජපක්ෂ කියන පුද්ගලයාට විරුද්ධව වරෙන්තුවක් නිකුත් කර තිබෙනවා, අන්තර්ජාතිකව අත්අඩංගුවට අරගෙන උසාවියට ඉදිරිපත් කරන්න කියලා, කුප්‍රකට එයාර් බස් ගනුදෙනුවේ තුන්වැනි සැකකරු ලෙසින්. මේ එයාර් බස් ගනුදෙනුව සිද්ධ වුණේ 2012-2013 කාලයේ. මම මේ දැන ගන්නයි කියන්නේ. නැත්නම් දේශපාලන පළිගැනීමිය කියනවා නේ. ඒ නිසා මේවා මතක් කර දෙන්න ඕනෑ. ඔහු අත්අඩංගුවට අරගෙන ඉදිරිපත් කරන්න කියා තිබෙනවා. එයාර් බස් 14ක් සම්බන්ධයෙන් තිබුණු සිදුවීමේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 16.84ක් bribe එකක් වශයෙන් ඉල්ලුවා කියලා තමයි චෝදනාව තිබෙන්නේ. ඒකේ කරුණු වාර්තා වෙලා තිබෙනවා, ඒ මුදල් account එකට transfer කර තිබෙනවා කියා. මේකෙදි ඉදිරිපත් වෙලා තිබෙන විධියට 2013 අවුරුද්දේදී ඩොලර් එක්ලක්ෂ හැටදහසක් චමල් රාජපක්ෂ කියන කීර්තිමත් කථානායකතුමාගේ බාල පුතාගේ account එකට transfer කර තිබෙනවා. ඒ නිසා තමයි INTERPOL එකෙන් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන්න කියලා තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Board meeting තියලා තිබෙනවා -

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

අන්න හරි. මම එන්න ගියේ එතැනට. ඒ එයාර් බස් ගනුදෙනුවේ deal එක close කරලා තිබෙන්නේ ඒ කථානායක නිල නිවසේ. දැන්, කථානායකගේ ගෙවල් ගැන කථා කරනවා නේ. එතකොට අද දවසේ CID කැඳවීම්, අපරාධ සහ ඒ කථානායක අතර සම්බන්ධය මම කිව්වේ. මේ ඔක්කොම වෙද්දී මේකේ විහිළුව මොකක්ද? වැරදි කරපු මිනිස්සුන්ට, රාජපක්ෂලා වැරදි කළා නම් ඒ අයට පරීක්ෂණ පැවැත්වෙනවා. කමක් නැහැ. අපි කියපු දේවල් නේ කරන්නේ. ඒක ගැන අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ප්‍රශ්නය මොකක්ද? මෙච්චර දෙයක් වෙද්දී අද උදේ ඉඳන් සමගි ජන බලවේගය මොකක්ද කළේ? සමගි ජන බලවේගය උදේ ඉඳන් පාර්ලිමේන්තුවේ යම් නිලධාරියෙකු ගැන කථා කරනවා. පාර්ලිමේන්තුවේ යම් නිලධාරියෙකුට විරුද්ධව චෝදනා එල්ලා වෙලා ඒ පිළිබඳව පරීක්ෂණයක් කර තිබෙනවා; විමර්ශනයක් කර තිබෙනවා. ඒ විමර්ශනය විනිවිදභාවයකින් යුතුව තිබෙනවා. නැත්නම් එතුමාට ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ පිළිබඳව ඕනෑ තරම් කථා වුණා. මූලික විමර්ශනයකින් අනතුරුව එතුමාගේ වැඩ තහනම් කර තිබෙනවා. මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. නමුත්, ඒ සිදුවීමෙන් පසුව එතුමා ගිහිල්ලා කථානායකතුමාට විරුද්ධව චෝදනාවක් එල්ල කර පැමිණිල්ලක් දමා තිබෙනවා. ඒ, සිද්ධියෙන් පසුව. ඕනෑ නම් කලින් පැමිණිල්ලක් දමන්නත් අවස්ථාව තිබුණා නේ. හැබැයි, ඒවා විවෘතයි. අපේ සභානායකතුමා කිව්වා වාගේ ඒ සම්බන්ධයෙනුත් පරීක්ෂණ සිද්ධවෙයි. ඔක්කොම විවෘතයි. අපි බලමු.

අද දවසේ සමගි ජන බලවේගයේ එක්කෙනෙක්වත්, රාජපක්ෂලාට විරුද්ධව තමන්ගේ ජීවිත කාලයේම දේශපාලනය කළා කියපු මිනිස්සු එක්කෙනෙක්වත් එක වචනයක් කථා කළාද මේ පරීක්ෂණ ගැන? එක්කෙනෙක්වත් කථා කළාද? නැහැ. එක්කෙනෙක්වත් කථා කළේ නැහැ. මේ පරීක්ෂණ ගැන එක අගය කිරීමක් කළාද? එක්කෙනෙක්වත් කළේ නැහැ. ඒ වෙනුවට මොකක්ද කළේ? බොරු කිය කියා, කථානායකතුමාට විරුද්ධව කියන කුණු කථා ටික කිව්වා. අසභ්‍යකරණ, කුණුහරුප කථා ටික කිව්වා. කලින් අධ්‍යාපනයේ ප්‍රශ්නයක් ආවාම අධ්‍යාපන ඇමතිතුමියට විරුද්ධව කුණුහරුප කිව්වා. දැන් කථානායකතුමා සම්බන්ධ සාකච්ඡාව ආවාම කථානායකතුමාට විරුද්ධව කුණුහරුප කියනවා. ඇත්තටම මට තේරෙන්නේ නැහැ මේ මිනිස්සුන්ගේ මානසිකත්වය මොකක්ද කියලා. ඒක කිය කියා ඉන්නවා මිසක්, අද දවසේ වෙන කිසිම දෙයක් කළේ නැහැ. ඒක තමයි සමගි ජන බලවේගයට වෙලා තිබෙන්නේ. සමගි ජන බලවේගය අද පොහොට්ටුවේ කොන්ත්‍රාත් කරන තැනට වැටිලා. මට තේරෙන්නේ නැහැ ඒ ඇයි කියලා. මම අද කිව්වා කියලා මතක තියාගන්න, ඔය කෘත්‍යාධිකාරී මණ්ඩලයට රිංගලා ඉන්නවා, පොහොට්ටුවේ ඔත්තුකාරයන්; පොහොට්ටුවේ කොන්ත්‍රාත්කාරයන්. එතකොට මොකක්ද වෙන්නේ?

මෑතකදී අපි දැක්කා, මෙන්න මෙහෙම දේවලුත්. දැන් මේ ඔක්කෝම වෙද්දී, නාමල් රාජපක්ෂ වාගේ අය තමන්ට එල්ල වෙන චෝදනා සහ මේ පරීක්ෂණ හමුවේ තමන්ගේ පොඩි campaign එකක් කරනවා නේ. ඒකට මේගොල්ලෝ නැටවෙන හැටි බලන්නකෝ. පසුගිය දවසක අපි දැක්කා නේ, ඉන්දියාවේ කොහේ හරි ප්‍රාන්තයක කාර්මික විද්‍යාලයක ළමයින්ගේ උත්සවයකට එතුමා ගිහින් තිබුණු ආකාරය. මුලින් ලොකු ප්‍රචාරයක් දීලා තිබුණා. දේශපාලනයේදී එහෙම කරනවා අපි දැකලා තිබෙනවා. හැබැයි, ඒක නාමල් කරන එක හරි. මේ සමගි ජන බලවේගයේ මන්ත්‍රීලා හතරදෙනෙක් නැට්ටේ එල්ලිලා යන්නේ මොකටද? ඇත්තටම ලජ්ජා නැද්ද? ඇත්තද දන්නේ නැහැ, සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාගේ මාධ්‍ය ප්‍රකාශක බෑග් එක අරන් ගියා කියලාත් මම දැක්කා, post එකක් පළ වුණා. ඒවා නම් ඇත්තද බොරුද දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* එතකොට ඔන්න සමගි ජන බලවේගය කරන දේ. සමගි ජන බලවේගය රාජපක්ෂලාගේ කොන්ත්‍රාත් කර කර තමයි ඉන්නේ. වෙන මොකක්වත් කරන්නේ නැහැ. එහෙම තත්ත්වයක් තමයි තිබෙන්නේ. කනගාටුයි.

ඊළඟට, මේ සංවර්ධන නිලධාරින්ගේ ගැටලුව ගත්තොත්, අපි දැක්කා, විපක්ෂ නායකතුමා ඒක ගැන කථා කළ ආකාරය. දින කිහිපයක් තිස්සේ ඔවුන් වෘත්තීය ක්‍රියාමාර්ගයක හිටියා. අපි ඒ අයිතිය පිළිගන්නවා. අපි කැමැති දේවල් නොවෙයි වෙන්න ඕනෑ. ඕනෑ කෙනෙකුට ඒ අයිතිය තිබෙනවා. හැබැයි, ඒකෙදි මොකක්ද කළේ? එහෙම දෙයක් මතු වෙච්ච ගමන් ඒකට යනවා. ගිහිල්ලා කොහොම හරි ඒක ඇතුළේ මොකක් හරි කරන්න පුළුවන්ද, ඒකට රිංගන්න පුළුවන්ද කියලා බලනවා. ඒ අනුව තමයි ගිහිල්ලා කිව්වේ, ලේවලින් අත්සන් කරනවා; ලෙයින් ලියනවා කියලා. අර ඉස්සර තරුණ කාලයේ love letters ලියනවා වාගේ ප්‍රකාශයක් කරලා ආවා. හැබැයි, මොකක්ද වුණේ? අද දවසේ ඒ උපාධිධාරින් ජනාධිපතිතුමා එක්ක සාකච්ඡාවක් කරලා, තමන්ගේ ඉල්ලීම් ගැන සාකච්ඡා කරලා ඔවුන් යම් තැනකට ඇවිල්ලා තිබෙනවා. ඒ ක්‍රියාමාර්ගය අවසන් කරලා තිබෙනවා. එහෙම තමයි ප්‍රශ්නවලට උත්තර දෙන්නේ. හැබැයි, ලේවලින් ලියන්නම්, ලේවලින් අත්සන් කරන්නම් කියලා කිය කියා ඉන්න අතරේ අනික් පක්ෂ තමන්ගේ පක්ෂය ඇතුළට රිංගලා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව තත්පර 30ක් දෙන්න. කථාව අවසන් කරන්නම්.

සමගි ජන බලවේගයේ නායකයා ගිහිල්ලා ඕවා කිය කියා ඇවිදිනවා. අනික් පැත්තේ මිනිස්සු ගිහිල්ලා පක්ෂය ඇතුළට රිංගලා පක්ෂය ඇතුළේ කරන දේවල් තමන් දන්නෙත් නැහැ. ලේ හොල්ලන්න දෙන්නේ නැතුව, ලේ දෙන්න වෙන්නේත් නැතුව ජනාධිපතිතුමා ප්‍රශ්නය අවසන් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලේ හොල්ලන්න, ලේ දෙන්න වෙන්නේ නැහැ වාගේම මේ සිද්ධ වෙන දේවල් දිහා බැලුවාම, මට මතක් වන කාරණයක් තිබෙනවා. අර කියමනක් තිබෙනවා නේ, "ලේ දුන්නාට මොළය දෙන්න බැහැ" කියලා. ඒ හින්දා ඒ දේවල් ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.08]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை தொலைத்தொடர்புகள் சட்டத்தின் கீழ் ஒழுங்கு விதிகள் மீதான விவாதம் இன்று நடைபெற்றுக் கொண்டிருக் கின்றது. இது நாட்டைக் கட்டியெழுப்புகின்ற திட்டத்திலே மிகவும் கூடுதலான பங்களிப்பைச் செய்கின்ற விடயமாக இருக்கின்றது. இவ்வாறான ஒரு சந்தர்ப்பத்திலே எதிர்க் கட்சிகள் சிறந்த கருத்துகளை முன்வைக்காமல் வேறு ஏதோ விடயங்களைப் பேசுகிறார்கள் என்று ஆளுந்தரப்பால் எதிர்த்தரப்பைக் குற்றஞ்சுமத்துவதை நாம் பார்க்கின்றோம். குறித்த சிலர் அது சம்பந்தமாகப் பேசியிருந்தாலும், இன்றைக்கு நாட்டிலே நடந்து கொண்டிருக்கின்ற வெவ்வேறு விடயங்கள், மக்களுடைய பிரச்சினைகளைப் பற்றி இந்தப் பாராளுமன்றத்திலே ஆளுந்தரப்பினரிடத்திலே முன்வைக்க வேண்டிய கடப்பாடு இருக்கின்றது. அந்த அடிப்படையிலே, ஒவ்வொரு பிரதேசத்தைச் சார்ந்த பிரதிநிதிகளும் இங்கு வந்து தங்களுடைய பிரதேசத்திலேயிருக்கின்ற பிரச்சினைகள், பொது விடயங்கள் சம்பந்தமாக அரசாங்கத் தரப்பிடம் கோரிக்கைகளை முன்வைக்கின்றார்கள். அந்த விடயங்களில் அரசு கவனம் செலுத்துவதில்லையென்பது எங்களுக்கு மனவேதனையான விடயமாகத் தொடர்ச்சியாகக் காணப்படு கின்றது.

தொலைத்தொடர்பை ஒழுங்குபடுத்துகின்ற விடயம் சம்பந்தமாக விவாதம் நடைபெறுகின்ற இந்தச் சந்தர்ப்பத்திலே, ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். சாய்ந்தமருது பிரதேசத்திலேயிருக்கின்ற மீனவர்கள் கடலுக்குச் செல்கின்ற போது காணாமல் போகின்ற அல்லது விபத்துகளுக்கு உட்படுகின்ற சந்தர்ப்பங்கள் நிகழ்கின்றன. அவை சரியான தொலைத்தொடர்பு ஒழுங்குபடுத்தல்கள் இல்லாத காரணத்தால் ஏற்படுகின்றன. பின்னர் அவர்களைத் தேடுகின்ற பணிகளை கோடிக்கணக்கான ரூபாய் செலவு செய்து விமானப் படையும் கடற்படையும் செய்கின்றது. ஆட்சிக்கு வந்து ஒரு வருடத்தைத் தாண்டிய நிலையிலும் அந்தத் தொலைத்தொடர்பு கோபுரத்தில் இருக்கின்ற 15,000 ரூபாய் பெறுமதியான சாதாரண ஒரு கருவியை இதுவரைக்கும் திருத்திக் கொடுக்க முடியாத நிலையிலே, இன்று நாட்டின் மொத்த தொலைத் தொடர்புகளிலும் மாற்றத்தைக் கொண்டுவரப் போகிறோம் என்று பேசிக்கொண்டிருக் கின்றோம். குறித்த விடயம் சம்பந்தமாக பிரதேச மட்ட, மாவட்ட மட்ட ஒருங்கிணைப்புக் குழுக்கூட்டங்களில் கேட்டபோதெல்லாம் உடனடியாக அதனைச் செய்கிறோம் என்று கூறினாலும் இதுவரைக்கும் எதுவும் செய்யப்பட வில்லை. இருந்தாலும் இந்தச் சந்தர்ப்பத்திலாவது இதனைக் கவனத்திற்கு எடுப்பீர்கள் என்று நினைக்கின்றேன்.

தொலைத்தொடர்புச் சாதனங்களை வைத்திருக்கின்ற நிறுவனங்கள் பாரிய நிதியை மக்களிடத்திலிருந்து பெற்றாலும், மக்களுக்கான எந்தவிதமான மானியங்களும் வழங்கப்படு வதில்லை. கடந்த "தித்வா" புயல் அனர்த்தத்தின்பொழுது, பல பிரதேசங்களில் தொலைத்தொடர்பு சேவையைப் பெற முடியாதிருந்த நிலையில்கூட, மாதாந்தக் கட்டணத்தை அந்நிறுவனங்கள் அறவிட்டுக்கொண்டுதான் இருந்தார்கள். 21 நாட்களுக்குப் பின்னர்தான் எமது பிரதேசத்தில் தொலைபேசி அழைப்புகளை மக்களால் ஏற்படுத்தக்கூடியதாக இருந்தது. எனவே, இந்த விடயத்தின்பாலும் அரசு கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

நாடு தழுவிய ரீதியில் போராட்டத்தில் ஈடுபட்டிருந்த அபிவிருத்தி உத்தியோகத்தர்களது ஆசிரியர் நியமனம் சம்பந்தமான விடயத்தில், இன்று மாண்புமிகு சனாதிபதி அவர்கள் ஒரு கருத்தை முன்வைத்து, அதற்கான தீர்வை வழங்கியதற்காக எமது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம். அவ்வாறான 16,000 அபிவிருத்தி உத்தியோகத்தர்கள், அரசாங்க பாடசாலைகளில் இணைக்கப் பட்டு, தங்களால் இயன்ற சேவையைத் தொடர்ச்சியாகச் செய்திருக்கின்றார்கள். எனவே, அவர்களுடைய விடயத்தைக் கவனத்தில் கொண்டு, அவர்களுக்கான நியமனங்களை அரசாங்கம் வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

குறிப்பாக, அக்கரைப்பற்றுப் பிரதேசத்தில் உள்ள நுரைச்சோலை வீட்டுத்திட்டம் தொடர்ச்சியாகப் பேசப் படுகின்ற ஒரு விடயமாக இருக்கின்றது. காலையில் இவ்விடயம் தொடர்பாக எமது சக பாராளுமன்ற உறுப்பினரும் சனாதிபதி சட்டத்தரணியுமான கௌரவ நிசாம் காரியப்பர் அவர்கள் பேசியிருந்தார். இருந்தாலும், நானும் அதனோடு தொடர்புபட்ட சில விடயங்களை முன்வைக்கலாமென நினைக்கின்றேன். நீதிமன்றத்தில் வழக்கு தாக்கல் செய்யப் பட்டிருக்கின்ற சந்தர்ப்பத்தில் அல்லது தீர்ப்பு வழங்கப்பட்ட நிலையில் இதைத்தொட முடியாதென்று, 10 வருடங்களுக்கும் மேலாக காலம் கடத்திய வரலாற்றை நாம் பார்க்கின்றோம்.

இன்னொரு விடயத்தை நான் சுட்டிக்காட்டலாமென நினைக்கின்றேன். முன்னாள் மாண்புமிகு சனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் சனாதிபதியாக இருந்தபொழுது, பி.பீ. ஜயசுந்தர அவர்கள் நீதிமன்றத்தால் குற்றஞ் சுமத்தப்

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

பட்டவராக இருந்ததால் அவருக்கு எந்தவிதமான அரச பதவிகளும் வழங்க முடியாதெனக் கட்டளையிடப்பட்ட சந்தர்ப்பத்தில், முன்னாள் மாண்புமிகு சனாதிபதி அவர்கள் தனது நிறைவேற்று அதிகாரத்தைப் பயன்படுத்தி, மீண்டும் சனாதிபதியின் செயலாளர் பதவியையும், அதற்குப் பின்னர் நிதியமைச்சின் செயலாளர் பதவியையும் வழங்கியிருந்த வரலாற்றை நாங்கள் பார்த்தோம்.

அதேபோன்று, நீதிமன்றத்தால் எரிபொருளுக்கான கட்டுப்பாட்டு விலை நிர்ணயிக்கப்பட்டு, 120ரூபாய்க்கு எரிபொருள் வழங்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்ட நிலையில், அதே முன்னாள் சனாதிபதி அவர்கள் இந்த நாட்டினுடைய பொருளாதாரத்துக்காக, அதனை ஏற்றுக் கொள்ள முடியாது எனத் தெரிவித்து, நீதிமன்றக் கட்டளையை மீறி 175 ரூபாய்க்கு எரிபொருளை விற்பனை செய்த வரலாறுகள் இருக்கின்றன.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்.

அவ்வாறு நீதிமன்றக் கட்டளையை மீறிச் செயற்பட்ட முன்னாள் மாண்புமிகு சனாதிபதியைப் போல, ஏன் தற்போதைய மாண்புமிகு சனாதிபதி அவர்களும், பாராளுமன்ற அதிகாரத்தைப் பயன்படுத்தி, சுனாமியால் பாதிக்கப்பட்ட மக்களுக்கென வழங்கப்பட்ட வீட்டுத் திட்டத்தை வழங்காமல், ஏதோ இனரீதியான பிரச்சினையை உட்புகுத்தி, ஏன் பாதிப்புக்கு உட்படாத ஏனைய மக்களுக்கு வழங்க வேண்டும்? இன்றும் பாதிக்கப்பட்ட மக்கள் வெவ்வேறு இடங்களில் தரித்து வாழ்கின்ற நிலைமை ஏற்பட்டிருக்கின்றது. எனவே, இந்த விடயத்தை இந்த உயரிய சபை கவனத்தில் எடுத்து, உரிய நடவடிக்கையை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அத்துடன், எங்களுடைய பிரதேசத்தில் கடலரிப்பு மிகவும் மோசமாக இருக்கின்றது. கடந்த 10-15 வருடங்களாகத் தொடர்ச்சியாக இந்தப் பிரச்சினை இருக்கின்றது. இது சம்பந்தமாக நாங்களும் இந்தப் பாராளுமன்றத்தில் பேசுகின்றோம். ஆனால், இதற்கு முன்னர் இருந்தவர்கள் ஒலுவில் துறைமுகத்தின் கட்டுமானப் பணிகளை மேற்கொள்வதற்காக இலஞ்சம் பெற்றுக்கொண்டு, அதற்குப் பின்னர் ஏற்பட்ட கடலரிப்பைத் தவிர்ப்பதற்காக dump truck மூலம் கொட்டப்படுகின்ற ஓரிரு load கற்களுக்கும் commissionஐ வாங்கிக்கொண்டு, அமைதி காத்துக் கொண்டிருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில், அதற்குரித்தான சில கட்சிகளின் தலைவர்களும் இந்தப் பாராளுமன்றத்தில் இருக்கின்றார்கள். ஒலுவில் துறைமுகத்தினது கட்டுமானத்தின் முழுமையான திட்ட வரைபைப் பெற்றுக்கொள்ளாமல், அதனுடைய சாதக, பாதகங்களை விளங்கிக் கொள்ளாமல், அவர்கள் கைநீட்டி வாங்கிய commissionஇற்காக இன்று அமைதி காக்கின்றார்கள். ஆனால், இன்று மக்கள் அதனால் பாதிக்கப்படுகின்றார்கள். நிந்தவூர்ப் பிரதேசத்தில் மாத்திரம், 150 ஏக்கருக்கும் மேற்பட்ட தென்னந்தோப்புக்களும், வயல்காணிகளும் கடலுக்குள் காவு கொள்ளப்பட்டிருக்கிறது. மாளிகைகாட்டில் ஜனாசாக்கள் கடலலைகளால் இழுத்துச் சொல்லப்பட்டுள்ளன. அட்டப்பள்ளம் பிரதேசம் முழுமையாகப் பாதிக்கப்பட்டுள்ளது. அதேபோன்று, மருதமுனை, சாய்ந்த மருது பிரதேசங்களும் பாதிக்கப்பட்டுள்ளன. எனவே, இந்த விடயத்தில் அரசு கவனம் செலுத்தி உடனடியாக அதற்கான தீர்வைப் பெற்றுத்தர வேண்டுமென இச்சந்தர்ப்பத்தில் கேட்டு விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.15]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දින විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාවේ රෙගුලාසි සබැඳිව පවත්වන විවාදයේ මේ සාකච්ඡා වාරය අවසන් කිරීමට මාහට අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් අද මේ විවාදයට ලක් වුණු විෂය පථය ගත්තොත්, තාක්ෂණික කරුණු, එහෙම නැත්නම් මෙහි තිබෙන වැදගත්කම සම්බන්ධයෙන් හෝ අපේ ආණ්ඩුව ප්‍රතිපත්තිමය වශයෙන් කරන්න බලාපොරොත්තු වන දේවලට හෝ වටිනාකමක් ගෙන ඒමේ විවාදයක් විරුද්ධ පක්ෂයෙන් කොහෙත්ම සිදු කෙරුණේ නැහැ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාවේ රෙගුලාසිවලින් ප්‍රධාන වශයෙන් අරමුණු කරගෙන තිබෙන්නේ මේ සේවා සපයන්නන් අතර විදුලි සංදේශ යටිතල පහසුකම් බෙදා ගැනීම් පිළිබඳ ක්‍රමවත් නියාමන රාමුවක් ස්ථාපිත කිරීමයි. ඒකේ වාසි සහ ප්‍රයෝජන ගෙන බැලුවොත්, එය ආර්ථික ක්ෂේත්‍රයට වාගේම ආරක්ෂාව වෙනුවෙනුත්, විශේෂයෙන් ජාතික ආරක්ෂාව වෙනුවෙනුත් විශාල වශයෙන් දායක වෙනවා.

විදුලි සංදේශ ක්ෂේත්‍රය කියන්නේ අපේ ජන ජීවිතයට, අර මා කලින් කිව්වා වාගේ ආර්ථිකයට, සංවර්ධන වැඩ කටයුතුවලට විශේෂ දායකත්වයක් ලබා දෙන ක්ෂේත්‍රයක්. ඉතින් ඒකට අත්‍යවශ්‍ය, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට අවශ්‍ය ඒ නියෝග ලබා දීම, ඒක නියාමනය කිරීමට උපදෙස්, එහෙම නැත්නම් තාක්ෂණික කරුණු ගොනු කරගෙන මේ විධියේ නියාමනයක් ගෙන ඒමට පෙලඹවීම ඉතාම වැදගත් වනවා.

මෙම රෙගුලාසි හඳුන්වා දීම තුළින් විශේෂ අරමුණු රාශියක් මුදුන්පත් වනවා. එහෙම නැත්නම්, විශේෂ අරමුණු රාශියක් මෙහි ප්‍රමුඛත්වය ගන්නවා. එමඟින් මේ ක්ෂේත්‍රයේ තිබෙන තරගකාරිත්වය ප්‍රවර්ධනය කිරීමට, එම පහසුකම් නවීකරණය කිරීමට හැකි වනවා.

මේ ක්ෂේත්‍රයේ - විශේෂයෙන් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ - තාක්ෂණය විශාල ලෙස භාවිත කරනවා. වර්ෂ ගණනාවකින් මේ විධියේ වෙනස්කම් සිද්ධ වෙලා නැති නිසා මේ යාවත්කාලීන

කිරීම, මේ නියාමන ක්‍රියාවලිය බොහොම වැදගත්කමක් ගෙන දෙනවා. ඒ වාගේම තාක්ෂණික සේවාව වේගයෙන් සම්පාදනය කිරීමට අවශ්‍ය පිරිවැය -වියදම- අඩු කර ගැනීමත් මෙයින් පිළිබිඹු වන වැදගත් අරමුණක් හැටියට අපි දකිනවා. ඒ වාගේම, සන්නිවේදන යටිතල පහසුකම් නැවත නැවත ඉදි කරන්න අවශ්‍ය වන්නේත් නැහැ. මෙකී ඒකාබද්ධ - integrate - කිරීමෙන්, එහෙම නැත්නම් හවුල් භාවිතාවකට යොමු වීමෙන් පවතින සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීමට හැකි වීම ද මෙහි ප්‍රධාන අරමුණක් හැටියට දකිනවා. ඒ වාගේම, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් දියුණු කිරීම තුළින් තාක්ෂණය විශාල ලෙස අන්තර්ගත කිරීම සැලකිල්ලට භාජනය කළ යුතු යැයි විශ්වාස කරගෙන තමයි නියාමන ක්‍රියාවලියට විශේෂ අවධානයක් යොමු කර තිබෙන්නේ.

පසුගිය දිනවල ඇති වූ "දිට්වා" සුළි කුණාටුව වෙලාවේ, එහෙම නැත්නම් ඒ ආපදා තත්ත්වය අපේ රටට බලපෑ වෙලාවේ විශේෂයෙන් අපේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තුළ ආපදා කළමනාකරණ කටයුතුවලට ඉදුරාම ප්‍රතිචාර දක්වන අංශ හැටියට විශාල දායකත්වයක් සැපයුවා; විශාල කැප කිරීමක් කළා. ඒ අය තමන්ගේ දායකත්වය සපයමින් විශේෂ මෙහෙයුම්වලට සම්බන්ධ වුණා. ඒ සියලු දේවල් කළේ දැනට තිබෙන අවම තාක්ෂණික උපාංගවලින් සහ තාක්ෂණයෙන්. නමුත්, උපරිම කැප කිරීමෙන් ඒ කටයුතු කරපු නිසා අපි සාර්ථකත්වයක් ළඟා කර ගත්තා. මෙවැනි නියාමනයන් මඟින්, එහෙම නැත්නම් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ විදුලි සංදේශ යටිතල පහසුකම් පොදුවේ භාවිත කිරීම, එහෙම නැත්නම් බෙදා හදාගෙන භාවිත කිරීම තුළින් එය තවත් කාර්යක්ෂම කර ගැනීමට හැකි වෙනවා. එය විශේෂයෙන් ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයට විශාල දායකත්වයක් ලබා දෙනවා කියන එක විශේෂ කාරණයක් හැටියට මතු වෙනවා. ඒ කටයුතු සිද්ධ කරන කොට ත්‍රිවිධ හමුදාව, එහෙම නැත්නම් ආපදා කළමනාකරණයේ ප්‍රථම ප්‍රතිචාර දක්වන්නන් - first respondents - ඒ ව්‍යසනයට, ආපදාවට ලක් වෙච්ච ස්ථානවලට ළඟා වීමේදී පවා බොහොම අපහසුතාවන්ට පත් වුණා. ඒකට හේතුව තමයි, ඒ ඇති වෙච්ච ආපදා තත්ත්වයේ බරපතළකම නිසා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ විදුලි සංදේශ යටිතල පහසුකම් අඩපණ වීම, කඩා වැටීම සහ ඒවාට හානි සිද්ධ වීම. ත්‍රිවිධ හමුදාවට ලොකු රාජකාරියක් පැවැරී තිබුණත් සන්නිවේදනයට ඇති වෙච්ච බලපෑම නිසා ඒ පැවැති සන්නිවේදන පහසුකම් යටතේ හරි තොරතුරු ලබා ගැනීම දුෂ්කර වූ නිසා ඒ ඒ අවශ්‍යතා අනුව ඉක්මනට -ක්ෂණිකව, ඉදුරාම- අදාළ ස්ථාන සොයා ගැනීමේදී, ඒවාට ළඟා වීමේදී ගොඩක් අපහසුතා ඇති වුණා. ඒ නිසා මේ ක්‍රියාවලිය තුළින්, මේ හඳුන්වා දීම තුළින්, එහෙම නැත්නම් මේ නියාමනය තුළින් සන්නිවේදනයට ලොකු පන්නරයක් ලැබෙනවා. මොකද, තාක්ෂණයත් එකතු කරගෙන දත්ත පද්ධතිවල පොදුවේ භාවිත කිරීම, එහෙම නැත්නම් හුවමාරු කර ගැනීම, හවුලේ භාවිත කර ගැනීම මඟින් සන්නිවේදනයට විශේෂ දායකත්වයක් ලැබෙනවා. ආපදා තත්ත්වයන්වලදී විදුලි ක්ෂේත්‍රයේ බිඳ වැටීම් හමුවේ සන්නිවේදන ක්‍රියාවලිය බාධාවකින් තොරව පවත්වාගෙන යැමටත් මෙය වැදගත් වෙනවා.

අද ලෝකය ගත්තාම, විශේෂයෙන්ම ආපදා කළමනාකරණ තාක්ෂණය අන්තර්ගත කරගෙන තමයි ආපදා කළමනාකරණයට ඉදිරිපත් වෙන්නේ, දායක වෙන්නේ, ආපදා තත්ත්වයන්ට මුහුණ දෙන්නේ. ඒකට විදුලි සංදේශ ක්ෂේත්‍රය විශේෂයෙන්ම තාක්ෂණය අන්තර්ගත කිරීමෙන් විශේෂ දායකත්වයක් ලබා දෙනවා. මොකද, එතැන මූලිකවම සිද්ධ වෙන්නේ පෙර දැනුම් දීමක්. ආපදාවක් සිද්ධ වෙච්ච ස්ථානයේ ඇගැයීමක් කර ගැනීම, එහෙම නැත්නම් assessment එකක් කර ගැනීම පෙර දැනුම් දීම්වලින් - Early warning systemsවලින් - තමයි විශේෂයෙන් අපට කර ගන්න පුළුවන් වන්නේ. ඒ අනුව ආපදා කළමනාකරණය කිරීම සඳහා මූලික හට පිරිස්, කණ්ඩායම් යවන්නේ කොයි විධියටද, කොතැනටද, කොච්චර ප්‍රමාණයක්ද කියන එක වාගේම යම් අකටයුත්තක් සිද්ධ වෙන්නේ නැති වන විධියට ඔවුන් ඒ ස්ථානවලට යොමු කිරීමත් මෙම ක්‍රියාවලියෙන් සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම පසුගිය දා ඇති වුණු "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට පත් ජනතාව සෙවීමේ සහ ගළවා ගැනීමේ කණ්ඩායම්වලට සන්නිවේදනයේ ලොකු අපහසුතාවක් ඇති වෙලා තිබුණා. ඒ ආපදාව ඇති වුණු පළමු දවස් දෙකේ බදුල්ල ප්‍රදේශයට ගිහිල්ලා ඒ කටයුතුවලට නිසි උපදෙස් ලබා දෙමින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන්න මම මැදිහත් වුණා. එහිදී මම දැක්කා, සන්නිවේදනයේ ලොකු කඩා වැටීමක් සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ආපදාවලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කර ගැනීමට මේ සන්නිවේදන ක්ෂේත්‍රය දායක වෙනවා. කඩා වැටිලා තිබුණු ඒ ජාල සම්බන්ධයෙන් දත්ත ලබා ගැනීමෙන් පසුව තමයි මේ සම්බන්ධව විස්තර ඉදිරිපත් කරන්න පුළුවන් වෙන්නේ. උදාහරණයක් වශයෙන් ගත්තොත්, පස්සර, කඩුගන්නාව, වැලිමඩ, බිබිල, පල්ලේකැලේ, නුවරඑළිය, බදුල්ල වාගේ ගොඩක් දුර බැහැර පළාත්වලට මේ ප්‍රශ්නය බලපෑවා. ඒ වාගේම ෆයිබර් ජාලවලට හානි සිදු වීම විශේෂයෙන්ම අම්පාර, මාතලේ, අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල දිස්ත්‍රික්කවලටත් බලපෑවා. එලෙස ඇති වෙච්ච ආපදා අවස්ථාවේදී ඒ සඳහා අවශ්‍ය කණ්ඩායම් යොමු කරනකොට ගොඩක් ප්‍රමාදයන් සිද්ධ වුණා. අපි ඉස්සරහට බලාපොරොත්තු වෙන්නේ නැහැ, ඒ විධියේ අඩුපාඩුකම් සිදු වෙනවා දකින්න. මොකද, මේවා සන්නිවේදනයේ, තාක්ෂණයේ වෙච්ච අඩුපාඩුකම්. නමුත්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට මේ උපදෙස් ලබා දීම තුළින් ඒ අඩුපාඩු මඟ හරවාගෙන ඉදිරියේදී හොඳ ක්‍රමවේදයන්වලට යැමට ශක්තිය ලැබෙනවා. ඒ නිසා මෙහිදී හදිසි ඇමතුම්, මහජන අනතුරු ඇඟවීමේ පද්ධති වාගේම විශේෂයෙන්ම මූලික දත්ත සම්බන්ධතා ගොඩනැඟීමටත් විශේෂයෙන්ම මේක උපකාරී වෙනවා. විශේෂයෙන්ම ආපදා ස්ථාන වෙත හමුදාවට ළඟා වීමට ඉතා අසීරු වුණු අවස්ථාවල දී තමයි දුරකථන සම්බන්ධතාවල, එහෙම නැත්නම් යටිතල පහසුකම්වල පවතින අඩුපාඩු අපි දැක්කේ. අපි මෙවැනි රෙගුලාසි ගෙන ඒම මූලික වශයෙන් ප්‍රතිචාර දක්වන්නන්ට - first respondentsලාට - වැදගත් වෙනවා. ඒ නිසා අපි අද සාකච්ඡා කරන විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාව සම්බන්ධයෙන් වූ රෙගුලාසි ගෙන ඒම ඉතාම වැදගත් වනවා. අද මේ ගරු සභාවේ මෙම රෙගුලාසි පිළිබඳව විශාල ලෙස වාද විවාද කළේ නැති වුණත් අනෙක් මාතෘකා යටතේ තමයි ගොඩක් අය අදහස් දැක්වූවේ. නමුත්, අද මේ ඉදිරිපත් කරන ලද රෙගුලාසි ඉතාම වැදගත් වෙනවා.

විශේෂයෙන්ම ජාතික ආර්ථිකය, ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළ කාර්යක්ෂම කර ගැනීමට, විධිමත් කර ගැනීමට සහ ඒ කටයුතු ඉක්මන් කර ගැනීමට විශාල දායකත්වයක් අනිවාර්යයෙන් මේ රෙගුලාසි තුළින් ලබා දෙනවා. මොකද, අපේ ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළත් විශේෂයෙන්ම සඳහන් කරලා තිබෙනවා, අපේ ප්‍රතිපත්ති සහ සංවර්ධන වැඩ පිළිවෙළට තාක්ෂණික ග්‍රහණය ඇති කර ගන්න කියලා. ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ විදුලි සංදේශ යටිතල පහසුකම් හවුල් භාවිතාවේ රෙගුලාසිවලට අනුව සේවා සපයන්නන් අතර ඒ සම්බන්ධව ඇති යටිතල පහසුකම් බෙදා ගැනීම සම්බන්ධයෙන් ක්‍රමවත් නියාමනයක් කිරීම ඉතාම අත්‍යවශ්‍යයි. ඒ නිසා අපි යෝජනා කරන්නේ මේ රෙගුලාසි ගෙන ඒම වැඩදායක වනවා වාගේම ඉදිරි වැඩකටයුතුවලට අවශ්‍ය වනවා කියන එකයි. මේක එක ක්ෂේත්‍රයකට විතරක් අවශ්‍ය වන දෙයක් නොවෙයි. අද වනකොට සන්නිවේදනය කියන්නේ, ඉතාම සංවේදී ක්ෂේත්‍රයක්. අද වනකොට ලෝකයේ කොහේ හෝ සිද්ධ වෙන ඕනෑම දෙයක්

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

පිළිබඳ තොරතුරු තත්පරයක් වැනි කෙටි කාලයක් තුළදී අපට දුරකථනයෙන් බලා ගන්න හැකියාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම මහජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් මේ රෙගුලාසි ගෙන ඒම ඉතාම කාලෝචිතයි, අත්‍යවශ්‍යයි. මහජන ආරක්ෂාව, ජාතික ආරක්ෂාව වෙනුවෙන් වාගේම විශේෂයෙන්ම ආපදා කළමනාකරණය වෙනුවෙනුත් විශේෂ වගකීමක් අපේ ආරක්ෂක අමාත්‍යාංශයට පැවරී තිබෙනවා .

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය කියලා වෙනම අමාත්‍යාංශයක් ඇති කළේත් මෙවැනි කාරණා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරලායි. එය අපි වගකීමක් හැටියට අරගෙන තමයි මේ කටයුතු සිදු කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේක විශේෂ රෙගුලාසියක්. ඒ වාගේම මේක විශේෂ අවශ්‍යතාවක් කියලා තමයි අපි රජය හැටියට දකින්නේ. ඒක නිසා මේක අපේ ජාතික ආරක්ෂාවටත්, ජාතික ආර්ථිකයටත් වැදගත්කමක් ගෙනෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ලසිත් භාෂණ ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

## මුතුරාජවෙල තෙත්බිම් ආරක්ෂා කිරීම
## முத்துராஜவெல ஈரநிலத்தைப் பாதுகாத்தல்
## PROTECTION OF MUTHURAJAWELA WETLANDS

[අ.භා. 5.28]

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දිනයට යෙදුණු ලෝක තෙත්බිම් දිනයට සමගාමීව ලංකාවේත් උත්සවයක් ලැහැස්ති කළා. එහිදී තෙත්බිම් සම්බන්ධයෙන් අපේ රජයේත්, ආණ්ඩුවේත් ස්ථාවරය මැනවින් ප්‍රකාශයට පත් කළා. එවැනි දවසකට පසුව අද වැනි දවසක මෙම යෝජනාව ගෙන ඒමට ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "මුතුරාජවෙල තෙත්බිම යනු ශ්‍රී ලංකාවේ විශාලතම තෙත්බිම පමණක් නොව සමස්ත ආසියානු කලාපයේම පවතින තෙත්බිම් අතුරින් ඉහළ ජෛව විවිධත්වයකින් යුතු ඉහළ පිළිගැනීමකට සහ ආකර්ෂණයට ලක්ව තිබෙන ස්ථානයකි. එය කොළඹ සිට මීගමුව දක්වා හෙක්ටෙයාර 6,232ක ප්‍රදේශයක් පුරා පැතිර පවතී. විශේෂයෙන්ම එම ස්වාභාවික පිහිටීම ගම්පහ දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය පිණිස දක්වන්නේ සුවිශේෂී දායකත්වයකි.
>
> නමුත් අද වනවිට විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සහ නෛතිකව බලගැන්වී තිබෙන විවිධ ආයතනයන් අතර නිසි සන්නිවේදනයක් නොමැති වීම හේතුවෙන් මෙම කලාපයේ කටයුතු සිදු කිරීමේදී විවිධ ගැටලු සහ බාධක සහිත තත්ත්වයක් ඇති වී තිබෙන බව නිරීක්ෂණය වේ. එහි ප්‍රතිඵලයක් ලෙස අද වනවිට මෙම වටිනා පරිසර කලාපය දැඩි අවදානමකට ලක්ව තිබේ. මුතුරාජවෙල තෙත්බිමේ ස්වාභාවික පිහිටීමත්, එහි ජෛව විවිධත්වයත්, ගංවතුර පාලනය හරහා ඇති සුවිශේෂී වාසියත්, කලාපයේ පවතින ආර්ථික විභවතාවත් හේතුවෙන් මෙම ප්‍රදේශය ආරක්ෂා කර ගනිමින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.
>
> මේ හේතුවෙන් පවතින පාරිසරික, සමාජ, ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් මුතුරාජවෙල තෙත්බිම් කලාපය ආරක්ෂා කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුතුරාජවෙල තෙත්බිමෙහි තිබෙන පාරිසරික වැදගත්කම ගැන කරුණු කාරණා කථා කරන්න මේ කාලය නොවෙයි. මොකද, ඒ සම්බන්ධයෙන් අවුරුදු ගණනාවක්, දශක ගණනාවක් තිස්සේ කරපු පර්යේෂණ වාගේම පොත් තිබෙනවා. ලංකාවේත්, පිට රටත් විවිධ සංවිධාන විසින් කරපු පර්යේෂණ තිබෙනවා. ඒවායේ පැහැදිලි කරලා තිබෙනවා, මුතුරාජවෙල තෙත්බිමේ තිබෙන වැදගත්කම මොකක්ද කියලා.

ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රධානම ගැටලුවක් තමයි, ගංවතුර ප්‍රශ්නය. අපි දන්නවා, අත්තනගලු ඔයත්, ඌරුවල් ඔයත් මේ තෙත්බිම ඔස්සේ ගිහිල්ලා තමයි මීගමුව කළපුව හරහා මුහුදට බැසීම සිදු වෙන්නේ කියලා. අපි විශ්වාස කරනවා, ගම්පහ දිස්ත්‍රික්කයේ පවතින ගංවතුර අර්බුදය වාගේම ගංවතුර ආපදා තුරන් කිරීමට මේ තෙත්බිම ආරක්ෂා කර ගැනීම විශාල පිටුවහලක් වෙනවාය කියලා. ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විධියට අපි අනුකමිටු 14ක් ඔස්සේ වැඩකටයුතු කරගෙන යනවා. එයින් එක කමිටුවක් තමයි, පරිසර අනුකමිටුව. ඒ පරිසර අනුකමිටුවේදී අපි ගත්ත තීන්දුවක් තමයි, මුතුරාජවෙල තෙත් බිම සුරැකීම සම්බන්ධයෙන්ම විද්වත් කමිටුවක් පත් කිරීම. ඒ විද්වත් කමිටුව හරහා අපි යෝජනාවක් ගෙනාවා, මොකක්ද අපි මුතුරාජවෙල තෙත්බිමට සිදු කළ යුත්තේ කියලා. ඒ අනුව පසුගිය

අගෝස්තු මාසයේ ඒ විද්වත් කමිටුව පිහිටුවූවා. එහි වාර්තාව පරිසර අනුකමිටුවට ඉදිරිපත් කළා, පසුගිය දෙසැම්බර් 22වැනි දා. ඒ අනුව ජනවාරි 19වැනි දින අපි එය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කළා. ඒ අනුව, සම්බන්ධීකරණ කමිටුවේදී තීන්දුවක් ගත්තා, එම වාර්තාව අමාත්‍යාංශය දක්වා රැගෙන යා යුතුයි කියලා.

මුතුරාජවෙල ගැන කථා කරද්දී විශාල ගැටලුවක් අපි දකිනවා. ඒ තමයි, නීතිවල හිඩැස් තිබෙනවාය කියන එක. විශේෂයෙන්ම මුතුරාජවෙල හෙක්ටෙයාර 1,285ක අභය භූමියක් තිබෙනවා. ඒ වාගේම මුතුරාජවෙල සම්බන්ධව වෙන වෙනම අතිවිශේෂ ගැසට් නිවේදන නිකුත් කර තිබෙනවා. 2004දී හෙක්ටෙයාර 285කට ගැසට් නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා.

2006දී ඒක සංශෝධනය කරලා හෙක්ටෙයාර 206ක් දක්වා අඩු කරලා තිබෙනවා. 2018දී එය තවත් අඩු කරලා තිබෙනවා, හෙක්ටෙයාර 168කට. මුතුරාජවෙල ගත්තොත්, තෙත් බිම් රකින්න ඕනෑ; මුතුරාජවෙල රකින්න ඕනෑ කියලා ලෝකයට පෙනෙන්න නීති හදලා තිබෙන බව අපි දකිනවා. නමුත්, මේ නීතිවල ඇත්ත ස්වභාවය, යථාර්ථය වෙලා තිබෙන්නේ මුතුරාජවෙල ගොඩ කිරීමයි, මුතුරාජවෙල විනාශ කිරීමයි.

එම නිසා අපි විශ්වාස කරන්නේත්, ගම්පහ දිස්ත්‍රික්කයේ පරිසර අනු කමිටුව විධියට අපි සාකච්ඡා කළේත් අනිවාර්යය වශයෙන්ම මේ නීති සම්පාදනය වෙන්න ඕනෑ, මේ නීති වෙනස් වෙන්න ඕනෑ කියලායි. ඒ වාගේම පසුගිය පාර්ලිමේන්තුවේ කෝපා වාර්තාවේ විශේෂයෙන්ම සඳහන් කර තිබෙනවා, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මැල්වත්ත සමාගමට තෙත් බිම්වලින් පර්චස් 65,000කට වැඩි ප්‍රමාණයක් පර්චස් එකක් රුපියල් 500 ගණනේ විකුණා තිබෙනවා කියලා. එහෙම තමයි මුතුරාජවෙල සුරකින්න නීති ගෙනාපු උදවිය කටයුතු කරලා තිබෙන්නේ. එම නිසා මේක සංකීර්ණ තත්ත්වයක් කියලා අපි විශ්වාස කරනවා. මුතුරාජවෙල හුදෙක් අනෙකුත් දිස්ත්‍රික්කවල තිබෙන තෙත් බිම් වාගේ නොවෙයි; නාගරික කලාපයක තමයි පිහිටා තිබෙන්නේ. මේ තෙත් බිම රකින්න නම් අපි ඒකාබද්ධ ප්‍රවේශයක් ගත යුතුව තිබෙනවා. විශේෂයෙන්ම මධ්‍යම කඳුකරය සුරැකීමට මේ අවුරුද්ද ඇතුළත මධ්‍යම කඳුකරයට වෙනම අධිකාරියක් පිහිටුවීමට සූදානම් වෙනවා කියලා ජනාධිපතිතුමාත් කිව්වා අපි දැක්කා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
මම ඉක්මනින්ම අවසන් කරනවා.

ඒ හා සමානව හෝ ඊට ළඟින් යන විසඳුමක් හොයලා මේ තෙත් බිම් කලාපය රැක ගන්න; මුතුරාජවෙල රැක ගන්න ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව විධියට අපි ක්‍රියාත්මක විය යුතුයි කියලා මම යෝජනා කරනවා. ඒකාබද්ධ යන්ත්‍රණයක් ඔස්සේ ආයතන ගණනාවක් එකතු වෙලා මේ කටයුත්ත සිද්ධ කරන්න ඕනෑ. ඒ සඳහා ජාතික වැඩ පිළිවෙළක් ඕනෑ කියලා මම මේ සභාවට යෝජනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට යෝජනාව ස්ථිර කිරීම, ගරු අසෝක රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.33]

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදට යෙදෙන ලෝක තෙත් බිම් දිනයට සමගාමීව ලසිත් භාෂණ ගමගේ මන්ත්‍රීතුමා විසින් මේ ගරු සභාවට ගෙන එන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ඇත්තෙන්ම මුතුරාජවෙල ගම්පහ දිස්ත්‍රික්කය තුළ පැවතුණත් ලාංකීය භූමියේ ව්‍යුහාත්මක පිහිටීමේ සුවිශේෂිතාව ගත්තාම, අපේ රටේ ව්‍යුහාත්මක පිහිටීමට මේ තෙත් බිම ඉතාම වැදගත් කාර්යාවලියක් ඉෂ්ට කරනවා. එක පැත්තකින් මධ්‍යම කඳුකරයේ වැටෙන වර්ෂාපතනය ජලාශ කිහිපයකින් එකතු වෙලා කැළණි ගඟ දිගේ පහළට ඇවිල්ලා, ඒ කැළණි ගඟේ පිටාරතැන්න නිර්මාණය වෙන්නේ මුතුරාජවෙල ආශ්‍රිතවයි. ඒ වාගේම අත්තනගලු ඔය, දඬුගම් ඔය වැනි ඔයවල පිටාරතැන්න නිර්මාණය වෙන්නේත් මුතුරාජවෙල ආශ්‍රිතවයි. මුතුරාජවෙල භූමිය තුළ අඩි 50ක්, 60ක් ඇතුළට යනකොට ඉතාම වටිනා කාබන් තිර කරලා තිබෙනවා. වසර දහස් ගණනක් තිස්සේ පොළොව අභ්‍යන්තරයේ කඳන් දිරාපත් වෙලා, අද වනකොට ඒවා ඝන කාබන් විධියට නිර්මාණය වෙලා, කාබන් සංචිතයක් විධියට අපේ පොළොව ගර්භයේ තබාගෙන ඉන්නවා. මේ ආකාරයට කාබන් තබා ගැනීමෙන් දේශගුණික විපර්යාසවලට ඉතා වැදගත් කාර්යාවලියක් ඉෂ්ට කරනවා. ඒ වාගේම කොළඹින් පිටත මුහුදු ප්‍රදේශය තුළ කොරල් පර නිර්මාණය වීමටත්, වැලි තැන්පත් වීම සඳහාත් මේ තෙත් බිම ඉතා වැදගත් කාර්යාවලියක් ඉෂ්ට කරනවා.

ඉතා දීර්ඝ ඉතිහාසයක් තුළ විවිධ අවශ්‍යතා වෙනුවෙන් මේ තෙත් බිම පාවිච්චි කර තිබුණත්, අපේ පැරැන්නන් මේ තෙත් බිම විනාශ මුඛයට ඇද නොදමන්න අවශ්‍ය කාරණා ගොනු කරලා තිබුණා. මේ තෙත් බිම් කුඹුරු ඉඩම් විධියට නාම ලේඛනය තුළ තිබුණත්, අද ඒවා වගුරු බිම් විධියට, රක්ෂිත විධියට, ජල රැඳවුම් ප්‍රදේශ විධියට තහවුරු වෙලා තිබෙනවා. එම නිසා ජීවින්ගේ පැවැත්මටත්, ජල ගෝලයේ පැවැත්මටත්, පාංශු ජීවින්ගේ පැවැත්ම වෙනුවෙනුත්, කුරුළු රංචු ගත්තාම ඔවුන්ගේ ජනාවාසකරණයටත්, ඒ වාගේම එහි සිටින අති විශාල උරග ගහනයටත්, ගම්පහ දිස්ත්‍රික්කයට වාගේම භූගෝලීය විෂමතාව අනුව ගත්තාම ලංකාව විධියටත් මේ තෙත් බිම සංරක්ෂණය කර ගැනීම ඉතා වැදගත් කාර්යාවලියක් ඉෂ්ට කරලා තිබෙනවා. ඒ වාගේම මුතුරාජවෙල පහත් බිමක් විධියට ජලය රඳවා ගැනීම පමණක් නොවෙයි, ජලය රඳවා ගැනීමට එහා ගිය කිලෝමීටර් 3,000කට වඩා ඈතින් සෝමාවතිය පිහිටි ගොඩ බිම් හරහා හමාගෙන එන නැවුම් සුළඟින් පෝෂණය වෙන භූමියක් විධියටත් හඳුනා ගන්නවා. විවිධ අවශ්‍යතා සඳහා අද වෙනකොට මෙය වාණිජමය වශයෙන් වටිනා බිමක් විධියට හඳුනා ගෙන තිබෙනවා. ඒ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දෙමින් වාණිජ බිමක් විධියට මෙය සංවර්ධනය කරද්දී පර්චස්වලින් ගත්තොත්, පර්චස්වල වටිනාකම වැඩි වෙනවා. හැබැයි, ඊට වඩා අපේ අනාගතය නිර්මාණය කරන දූවා දරුවන්ට ඉතා හොඳ පරිසර පද්ධතියක් අපි ලබා දෙන්න ඕනෑ.

ඒ සියලු අර්ථවලින් ගත්තාම, මුතුරාජවෙල තෙත්බිම ඉතාම වැදගත් තෙත් බිමක් විධියට හඳුනාගෙන තිබෙනවා. අද වෙනකොට මධ්‍යම පරිසර අධිකාරිය තමන්ගේ ක්‍රියාවලිය ඉස්සරහට අරගෙන ගිහිල්ලා තෙත් බිම් සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශය හරහා අලුතින් නීති සම්පාදනය කරනවා. අලුතින් ගෙන එන එම නීති රීතිවලිනුත් ඒ තෙත් බිම් රැක ගැනීම වෙනුවෙන් විශාල කාර්යයක් ඉෂ්ට සිද්ධ කරනවා. මේ සියලු අර්ථ කථනයන් ගත්තාම, එය වටිනා තෙත් බිමක් ලෙස හඳුනාගෙන මතු පරම්පරාවට තිරසර ලෙස

[ගරු අසෝක සපුමල් රන්වල මහතා]

පවත්වාගැනීමටත්, පරිසරයට සහ ආර්ථික විද්‍යාවට සමගාමීව සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් යොදනවා නම් එය අනාගත පරම්පරාවට තෙත් බිමක් විධියට නැවත දායාද කරන්න පුළුවන් විධියට කටයුතු කරමින් ඉන්නවා. මේ පිළිබඳව ගම්පහ දිස්ත්‍රික්කය තුළින් ඉදිරිපත් වෙලා තිබෙන විද්වත් කමිටු වාර්තාව මේ වෙනකොට ගම්පහ දිස්ත්‍රික් ලේකම්තුමා මඟින් අදාළ අමාත්‍යාංශයට යොමු කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මේ ගරු සභාවේ අවධානය යොමු කරමින්, මෙම තෙත් බිම වසර ගණනාවක් සුරක්ෂිත වන ආකාරයට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න කියලා මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිමින්, මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.37]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
மூலාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, இன்றைய தினம் Hon. Lasith Bhashana Gamage அவர்களால், முத்துராஜவெல ஈரநிலத்தைப் பாதுகாத்தல் தொடர்பாகக் கொண்டுவரப்பட்டிருக்கின்ற ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கதைப்பதற்கு எனக்குக் 6 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளதையிட்டு சந்தோஷப் படுகின்றேன்.

இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையைக் கொண்டு வந்தமைக்கு Hon. Lasith Bhashana Gamage அவர்களுக்கு எனது மனமார்ந்த நன்றிகள். அதனை முழு மனதாக ஏற்றுக் கொள்கின்றேன். ஆனாலும், சில விடயங்களை உங்களுக்குச் சொல்ல வேண்டும். காடுகள், ஈரநிலங்கள் தெற்கில் மட்டுமல்ல வடக்கிலும் காணப்படுகின்றது. இதற்கு நல்லதோர் உதாரணம் கிவுல்ஓயா திட்டம். நான் யதார்த்தமாகக் கதைப்பவன். மகாவலி அபிவிருத்தித் திட்டத்தின் கீழ் கிவுல்ஓயா திட்டத்தை நடைமுறைப்படுத்தும்போது, காடுகள் அழிவடையும்போது உங்களுக்குப் பிரச்சினையில்லை. அங்கே ஏக்கர் கணக்கான காடுகள் அழிக்கப்பட்டு, வயல் நிலங்களாக மாற்றப்பட்ட போதும் உங்களுக்கு எந்தப் பிரச்சினையும் இல்லை. ஆனால், இங்கே முத்துராஜவெல ஈரநிலத்தை மட்டும் பொத்திப் பொத்திப் பாதுகாக்க வேண்டும். கிளிநொச்சியிலே, முல்லைத் தீவிலே, பரந்தனிலே 1,500 ஏக்கருக்கும் மேற்பட்ட ஈரநிலங்கள் பாதுகாக்கப்படாமல், இப்போது பதவி பறிபோயிருக்கின்ற

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ஊழல் செய்வதற்காக கடந்த அரசாங்க காலத்தில் வழங்கப் பட்டது. அந்த ஊழலை விசாரிப்பதற்கு நீங்கள் தயாராக இல்லை. ஏனென்றால், already 8 தடவை Constitutional Councilஇலே அவர் உங்களுக்கு வாக்கு போட்டிருக்கின்றார். இப்போது அவர் உங்களுடைய அடிவருடி! என்ன கவலை என்றால், பூநகரியில் ஈரநிலம் பாதுகாக்கப்படவில்லை: வடக்கு மாகாணத்திலே பருத்தித்துறையில் ஈரநிலம் பாதுகாக்கப்பட வில்லை. உங்களுடைய கிவுல் ஓயா திட்டத்தை மக்கள் வாழ விரும்பாத இடங்களில் புகுத்துகின்றீர்கள். மணலாறு எங்கள் வீரம் விளைந்த நிலம். அப்போது நான் 11 ஆண்டில் O/L படித்துக் கொண்டிருந்தேன். மணலாறிலிருந்து துரத்தித் துரத்தி அடித்தார்கள் என்று சொன்னார்கள்.

'மணலாறு' என்பதை 'வெலிஓயா' என்று இன்னும் 10 பரம்பரைக்குச் சொன்னாலும் 'வெலிஓயா' என்று இன்னும் ஆயிரம் பரம்பரைக்குச் சொன்னாலும் எங்களுக்கு எங்களுடைய மணலாற்று மண்ணின் வீரம் ஞாபகத்தில் இருக்கும். இப்போது நீங்கள் 'வெலிஓயா' என்று பெயர் மாற்றியிருக்கின்றீர்கள். முழுக்க முழுக்க சிங்கள மக்களை வெலிஓயாவில் கொண்டுவந்து குடியேற்றியிருக்கிறீர்கள். நான் ஒரு போதும் சிங்களக் குடியேற்றத்தைத் தடுப்பவன் அல்லன். உங்களுக்கு அபிவிருத்தி செய்ய வேண்டுமா? மகாவலித் திட்டத்தை யாழ்ப்பாணம் வரைக்கும் கொண்டுவர வேண்டுமா? நான் ஆதரவு தருவேன். ஆனால், அங்கு கொண்டுவந்து சிங்களக் குடியேற்றங்களை அத்துமீறு குடியமர்த்துவதைத்தான் நான் முழுமையாக எதிர்க்கின்றேன். அது தமிழ் மக்கள் வாழ்ந்த பூமி! முஸ்லிம் மக்கள் வாழ்ந்த பூமி! பாரம்பரியமான சிறுபான்மை இனம் வாழ்ந்த பூமியிலே நீங்கள் குடியேற்றத்தைச் செய்கின்றீர்கள்! கிவுல் ஓயா திட்டத்தைச் செய்கின்றீர்கள்! 'மணலாறு' என்பதை 'வெலிஓயா' என்று மாற்றியிருக்கின்றீர்கள். ஆனால், இன்று இந்தச் சபையில் முத்துராஜவெல ஈரநிலத்தைப் பாதுகாக்கச் சொல்லி ஒத்திவைப்பு பிரேரணையைக் கொண்டு வந்திருக்கிறீர்கள். வெட்கமாக இல்லையா? உங்கள் எல்லோரையும் பார்த்து "நீங்கள் கையால்தானா சாப்பிடுகின்றீர்கள்" என்று கேட்க வேண்டியிருக்கிறது. வெட்கமாக இல்லையா?

அதைவிட, இன்னுமொரு விடயம் பற்றி தெரிவிக்க வேண்டும். கிளிநொச்சியிலே, முல்லைத்தீவிலே, மன்னாரிலே இருக்கின்ற மக்கள் வனஇலாகாவால் மிகவும் கஷ்டப்படு கின்றார்கள். மக்கள் வாழ்கின்ற நிலங்கள், வயல் நிலங்களுக்குள் எல்லைக் கற்களை வைக்கின்றார்கள். எல்லைக் கற்களை வைத்துவிட்டு அந்த நிலங்கள் வனஇலாகாவுக்குரியது என்று அடையாளப்படுத்து கின்றார்கள். உங்களுக்கு அதைப் பற்றி கதைப்பதற்கு வக்கில்லை. உங்களுக்கு வாக்களித்த மக்களுக்கு அத்தகைய நல்ல விடயத்தைச் செய்வதற்கு வக்கில்லை. யாழ்ப்பாணம் வந்து 'புக்கை' சாப்பிடுவதற்கு உங்களுக்கு வெட்கமாக இல்லையா? இன்னும் சில விடயங்களைச் சொல்ல வேண்டுமென ஆசைப்படுகின்றேன்.

අද මම දැක්කා, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා එක්කගෙන ගිහිල්ලා ඔයගොල්ලන් පොඩි ආතල් එකක් අරගෙන තිබෙනවා. අවුරුදු දෙකක් ගියාට පස්සේ නාමල් මන්ත්‍රීතුමා සහ එතුමාගේ අම්මාවත් එක්කරගෙන ගිහිල්ලා ආතල් එකක් අරන් තිබෙනවා. හැබැයි, ඕක නිසා අපේ කොටි ඩයස්පෝරාවේ සමහරුන්ට පොඩි kick එකක් ඇවිල්ලා ඇති. ඩයික් ගහන්න කලින් පොඩ්ඩක් smell කරලා බලනවානේ, ඒ වගේ පොඩි ආතල් එකක් දීලා ඇති. හැබැයි, ඕක නිසා ජනතාව ඔයගොල්ලන්ට ඡන්දය දාන්නේ නැහැ. මතක තියාගන්න, මම කියන එක විශ්වාස කරන්න, අවුරුදු 5කින් පස්සේ හැරිලා බැලුවාම වෙන දේ අපි බලමු. මේකෙන් කවදාවත් එහෙම වෙන්නේ නැහැ.

අද අපේ Hon. Speakerට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහිල්ලා complaint එකක් දාලා තිබෙනවා, රුපියල් මිලියන දෙකක පෙට්‍රල් පාවිච්චි කළා කියලා. ඔයගොල්ලන්ට ලජ්ජා නැද්ද? ඔයගොල්ලන් බත්ද කන්නේ? ඔයගොල්ලන් බෞද්ධාගමේද? ඔයගොල්ලන් සිංහලද? ඔයගොල්ලන්ට ලජ්ජා නැද්ද? Hon. Speaker පාවිච්චි කරනවා, රුපියල් මිලියන දෙකක පෙට්‍රල්. මම එතුමාගේ අවසරය ඇතිවයි මේ කථා කරන්නේ. මම පැහැදිලිවම ඒ අවසරය ගත්තා. දෙවැනි කාරණය මෙයයි.

තව කාරණයක් තමයි, Hon. Speaker එතුමාගේ personal assistant විධියට PHI කෙනෙක්ව ගෙනැල්ලා තිබෙනවා. අපි කෑම කන්න යනකොටත් ඔබතුමන්ලාගේ 159දෙනා කාලා කෑම ඉවර කරලා. අපි සවස 3ට කෑම කන්න ගියාම එතැන කෑම නැහැ. නමුත්, එතුමාගේ personal assistantට වෙනම course එකක් order කරනවා. ඔහුට මේ පාර්ලිමේන්තුවෙන් course එකක් යනවා. කැන්ටිමට ගියාම අපට කන්න නැහැ. ඒකට විරුද්ධවත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කරලා තිබෙනවා. ලජ්ජා නැද්ද, ඔයගොල්ලන්ට. "උගන්ඩා අක්කා" කෝ? "උගන්ඩා අක්කා" නැද්ද? ඉන්නවාද? කිව්වා නේද, උගන්ඩාවේ හංගපු සල්ලි ගේනවා කියලා. රුපියලක්වත් ගෙනාවාද? පෙට්‍රල් මිල රුපියල් 5කින් වැඩි කරලා, පස්සේ රුපියල් 2කින් අඩු කළාම මිනිස්සු මෝඩයි කියලාද හිතාගෙන ඉන්නේ? මිනිස්සු දක්ෂයි; මිනිස්සු හිතනවා.

මම ඊයේ Ada Derana "360⁰ " programme එකට ගියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මාතෘකාවට අනුව කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, within one minute මම මගේ කථාව අවසන් කරනවා.

මම ඊයේ Ada Derana "360⁰ " programme එකට ගියා. මිනිස්සු අහනවා, ඔබේ නායකයෝ කවුද කියලා. මගේ නායකයා, දෙවියා තමයි, ප්‍රභාකරන්. මම ඒක භය නැතුව කියන්නේ. ඔයගොල්ලන්ට නායකයෝ නැහැනේ? පුළුවන් නම් නැඟිටලා කියන්න, ඔයගොල්ලන්ගේ නායකයා රෝහණ විජේවීර කියලා. කවුරු හරි අත උස්සලා කියන්න, ඔයගොල්ලන්ගේ නායකයා, දෙවියා රෝහණ විජේවීර කියලා. ඒ මිනිහා මැරිලාත් ඉවරයි. ඔයගොල්ලන් පාන්ද කන්නේ, බත්ද කන්නේ? නැත්නම් පීසා ද කන්නේ? ලජ්ජා නැද්ද, ඔයගොල්ලන්ට? මම කියනවා, ඔයගොල්ලන්ට තව අවුරුදු 3යි තිබෙන්නේ. ඒ අවුරුදු 3 ඇතුළේ මේ සෙල්ලම කළොත්, ඉස්සරහට ඔයගොල්ලන් මහ පාරේ තමයි දකින්න වෙන්නේ. මට දුකයි. ඔයගොල්ලන් ගියාම තව ආණ්ඩුවක් ඇවිල්ලා මේ රට විනාශ කරනකොට ඇත්තටම මට දුකයි. මමත් බලනවා, ඔයගොල්ලන් ගැන. වංචා දූෂණවලට විරුද්ධව, හැම එකටම විරුද්ධව කථා කරපු කෙනා මම. අද වෙනකම් ඔයගොල්ලන් උතුරට ඇවිල්ලා අල්ලපු එක වංචාවක්, දූෂණයක් කියන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා හැම එකම ගිහිල්ලා වංචා දූෂණ කමිටුවට දැම්මාට පස්සේ ඒ මන්ත්‍රීතුමාව ඔයගොල්ලන් හිරේ තියාගෙන ඉන්නවා. හිරේ නොවෙයි, කරේ තියාගෙන ඉන්නවා. හිරේ යන්න ඕනෑ කෙනා කරේ තියාගෙන ඉන්නවා. ලජ්ජා වෙන්න ඕනෑ, ඔයගොල්ලන්. ඔයගොල්ලන්ට පුළුවන් නම් එක්කෙනෙක් අත උස්සලා කියන්න, ඔයගොල්ලන්ගේ නායකයෝ ඉන්නවා කියලා. ඔයගොල්ලන් සිංහල බෞද්ධ ද කියලා කියන්න. *[බාධා කිරීමක්]*

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගත්කමකින් යුතු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කරද්දි මම හිතනවා, විපක්ෂය ඒකට, - *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා එය තවත් පැහැදිලි කරන්න අවශ්‍ය නැහැ. ඔබතුමා කියන එක පැහැදිලියි. ගරු අර්චුනා මන්ත්‍රීතුමා මාතෘකාවට අදාළව කථා කරන්න. මාතෘකාවට අදාළව කථා කරලා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉවර කරන්නම්. *[බාධා කිරීම්]* දඟලන්න එපා. අපි විනාඩියක් කථා කළාම තමුන්නාන්සේලාට අහගෙන ඉන්න බැරි ඇයි? විනාඩියක් නේ කථා කරන්නේ. ඇයි

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අහන්න බැරි? ඇයි අහන්න බැරි? මම ඔයගොල්ලන් වෙනුවෙන් කථා කළා, මෙච්චර කාලයක්. ඔයගොල්ලන් හොරකම් කරලා කන්ටේනර් 323ක් ගෙනැල්ලා හොරා කාලා රට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි. එම නිසා කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මේක මගේ රට. මම සිංහල අයටත් ආදරෙයි; මුස්ලිම් අයටත් ආදරෙයි; දෙමළ අයටත් ආදරෙයි. මම කථා කරන්නේ පාර්ලිමේන්තුවේ. අද ගණන් කරලා බලමුද, කී දෙනෙක් ඉන්නවාද කියලා. පුළුවන් නම් 20ක්වත් ගණන් කරලා පෙන්වන්න. දවසකට වියදම රුපියල් මිලියන 15ක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ඉවර කරනවා, සර්.

රුපියල් මිලියන 15යි දවසක වියදම. ඔයගොල්ලන් ඔක්කොම ඇවිල්ලා දවල්ට කාලා, මාදිවෙලට ගිහිල්ලා අඩියක් ගහලා නිදාගන්නවා. තව කෑබ් එකකුත් ගන්නවා. ලජ්ජා නැද්ද? හෘදය

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

සාක්ෂියට අනුව අත උස්සලා කියන්න, ඔයගොල්ලන් කරන එක හරිද කියලා. තමුන්නාන්සේලාට තවත් වැඳලා ඉල්ලන්නම්. තව අවුරුදු තුනයි තිබෙන්නේ. ඒ අවුරුදු තුනත් මෙහෙම කරගෙන ගියොත්, තමුන්නාන්සේලාව පාරේදීවත් දකින්න බැරි වේවි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා. *[බාධා කිරීම්]* බාධා කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා කථාව කරන්න. *[බාධා කිරීම්]*

[பி.ப. 5.44]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றைய தினம் முத்துராஜ ஈரநிலம் பாதுகாக்கப்பட வேண்டும் என்பது சம்பந்தமாக ஒத்திவைப்புப் பிரேரணை நடைபெறுகின்றது. நாட்டிலே பல ஈர நிலங்களும், காடுகளும் காணப்படுகின்றன. மனித வளத்தையும் மிருக வளத்தையும் பாதுகாப்பதற்கு காடுகள் பரிபூரணமான ஒத்துழைப்பை வழங்கி வருகின்றன. மனிதனுடைய தேவைகளுக்காக இன்று காடுகள் அழிக்கப்பட்டு வருகின்றன. மிதமிஞ்சிய தேவை களுக்காக, சொத்துக்களை அடைவதற்காக அல்லது உல்லாச வாழ்க்கையைப் பெறுவதற்காக அல்லது இன்னும் பல விடயங் களைக் கையாள்வதற்காக வேண்டி இயற்கை நிலங்களை நாங்கள் அழிவுக்கு உட்படுத்துகின்றோம். இதனால் இந்த நாட்டில் மனிதகுலம் தொடர்ச்சியான அனர்த்தங்களையும் ஏனைய பரிதாபகரமான நிலைமைகளையும் அனுபவித்து வருகின்றது. அவ்வாறானதொரு சூழ்நிலையில், இன்று இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களுக்கு இச்சந்தர்ப் பத்தில் நன்றியைக் கூறிக் கொள்கின்றேன்.

நிலங்களைப் பாதுகாக்க வேண்டும் என்பதற்காக இந்த நாட்டிலே இனரீதியான பாகுபாடு காட்டப்படுகின்றது. குறிப்பாக, 'புனிதபூமி' என்ற ஒரு விடயம் முன்வைக்கப் படுகின்றது. அதேநேரம், வனஜீவராசிகளைப் பாதுகாக்க வேண்டும் என்பதற்காக மேய்ச்சல் தரைகள், கரும்புக் காணிகள், சுற்றாடல் அமைச்சு, UDA என்று இப்படிப் பல விடயங்களை நாங்கள் காரணம் காட்டி காணிகளைச் சுவீகரிக்கின்றோம். இந்தச் செயற்பாடுகளால் வட, கிழக்கில் இருக்கின்ற தமிழ், முஸ்லிம் மக்கள் பாதிக்கப்படுகின்றார்கள். காலாகாலமாகச் செய்து வந்த அவர்களுடைய விவசாய நிலங்கள் இன்று காடுகளாக மாறியிருக்கின்றன. சுமார் 35 வருடங்கள் புரையோடிப் போயிருந்த பயங்கரவாதப் பிரச்சினை காரணமாக மக்கள் அந்த நிலங்களைப் பார்ப்பதற்கோ, பயன்படுத்துவதற்கோ, அங்கு செல்வதற்கோ முடியாதவொரு சூழலிலேதான் இன்று அவை காடுகளாக மாறியிருக்கின்றன.

கடந்த காலங்களில் மக்கள் பயன்படுத்தி வந்த காணிகளை, "புனித பூமி" என்றும் "வனஜீவராசிகளைப் பாதுகாக்க வேண்டும்" என்றும் கூறி ஓர் இனவாத ரீதியில் இன்று அவற்றை அரசு முடக்கியிருக்கின்றது. எனவே, இன்று கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்த நிகழ்ச்சி நிரலோடு சேர்த்து, இந்த நாட்டிலே இருக்கின்ற வெற்றுக் காணிகளை மீண்டும் விவசாயத்துக்கோ அல்லது பொருத்தமான வேறு தேவைகளுக்கோ பயன்படுத்தும் வகையில் நடவடிக்கை மேற்கொள்ள வேண்டும்.

இந்த நாட்டின் உற்பத்தியை அதிகரிக்க வேண்டும், பொருளாதாரத்தை மேம்படுத்த வேண்டுமென இன்று நாங்கள் அலைந்து திரிகின்ற இச்சந்தர்ப்பத்தில், காலா காலமாகப் பயன்படுத்தப்பட்டு வந்த இந்தக் காணிகளை ஏழை எளிய மக்களுக்கு விடுவியுங்கள்! இதிலே இருக்கின்ற பிரச்சினை களைத் தீர்த்து வையுங்கள்! மாண்புமிகு ஜனாதிபதி அவர்கள் எமது கிழக்குப் பிரதேசத்துக்கு வந்து சவூதி அரேபியா அரசாங்கத்தால் வழங்கப்பட்ட நுரைச்சோலை வீட்டுத் திட்ட பிரச்சினை, வட்டமடு காணிப் பிரச்சினை, பொத்துவில் காணிப் பிரச்சினை, விவசாயப் பிரச்சினை என அங்கிருக்கின்ற எல்லாப் பிரச்சினைகளையும் தீர்த்துத் தருவோமென வாக்குறுதி வழங்கியதன் அடிப்படையிலே இந்த ஜனாதிபதி யையும் அரசாங்கத்தையும் ஏற்றுக்கொண்டு வட, கிழக்கிலே உள்ள தமிழ், முஸ்லிம் மக்கள் அணி திரண்டு உங்களுக்கு ஆதரவாக வாக்களித்தார்கள்.

முத்துராஜவெல போன்ற உங்களுடைய பிரதேசங்களை மாத்திரம் பாதுகாக்கின்ற விடயத்தில் அக்கறை காட்டுவதை விடுத்து, நாட்டிலே இருக்கின்ற எல்லாப் பகுதிகளையும் பாதுகாக்க வேண்டும். எல்லா மக்களும் உங்களுக்குச் சமமானவர்கள். இந்த நாட்டிலே இருக்கின்ற மிருகங்களை, ஊர்வன மற்றும் ஏனைய உயிரினங்களின் விடயத்தில் கவனம் செலுத்துவதைப் போன்று நாங்கள் மனிதர்களின் விடயத்தில் கவனம் செலுத்துவதில்லை. இதற்குச் சான்றாகவே கிவுல் ஓயா திட்டம் அமைந்திருக்கின்றது.

இன்று திருகோணமலையில் இருக்கின்ற இறக்கக் கண்டிக்கும் புல்மோட்டைக்கும் இடைப்பட்ட பிரதேசத்திலே சுமார் 5,000 குடும்பங்கள் சுத்தமான குடிநீரைப் பெற முடியாமல் தவித்துக்கொண்டு இருக்கின்றன. சிறுநீரகத்தில் கல் உருவாகின்றது எனக் கூறி நாளாந்தம் 10 பேருக்கும் மேற்பட்டவர்கள் வைத்தியசாலையில் சிகிச்சை பெற்று வருகின்றார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. கிவுல் ஓயா என்பது ஒரு திட்டமிடப்பட்ட குடியேற்றத் திட்டமென்பது உங்கள் எல்லோருக்கும் தெரியும். இன்று இது நாடு பூராவும் எல்லா மக்களாலும் பேசப்படுகின்ற ஒரு விடயமாக மாறி இருக்கின்றது. காடுகளைப் பாதுகாக்க வேண்டும் என்பதற்காக நீங்கள் சில திட்டங்களைக் கையாள்கின்றீர்கள். ஆனால், கிவுல் ஓயா திட்டத்துக்காக காடுகளை அழித்தாவது நீரைக் கொண்டுசெல்ல வேண்டுமென நினைக்கிறீர்கள்.

மிக நீண்டகாலமாக மக்கள் பயன்படுத்தி வந்த மன்னார் - புத்தளம் பாதையானது, இன்று பிரச்சினைக்கு உள்ளாக்கப் பட்டு இருக்கின்றது. இன்று கொழும்பிலிருந்து புத்தளம் ஊடாக மன்னார், யாழ்ப்பாணம் செல்ல முடியாது மக்கள்

அவலப்படுகின்றார்கள். இவ்வாறான பிரச்சினைகளைத் தீர்ப்பதற்காக நியமிக்கப்பட்டு இருக்கின்ற இந்தக் குழுவின் மூலம் இந்தப் பிரச்சினையையும் பரிசீலனை செய்து, இந்த நாட்டினுடைய எல்லா மக்களையும் ஒன்றிணைத்துச் செல்வதற்கு வழி வகுக்குமாறு கேட்டு, விடை பெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)

හරි, මම කථා කරන්නම්. விவசாயம் என்பது இந்த நாட்டின் முதுகெலும்பாக இருக்கின்றது. நான் ஒரு விவசாயிக்குப் பிறந்தவன் என்ற அடிப்படையிலே எனக்கு அது சம்பந்தமான பூரண அறிவு இருக்கின்றது. நான் இயற்கையை ரசிக்கின்றவன். நான் ஒரு பாராளுமன்ற உறுப்பினராக இருந்தாலும், கூடுதலான காலம் Chairmanஆக இருந்ததனால் இன்றும் என்னை Chairman என்றுதான் அழைப்பார்கள். என்னோடு பிரயாணம் செய்கின்ற நண்பர்கள் பூந்தொட்டிகள் விற்பனை செய்கின்ற இடங்களைக் காணும்போது நான் வாங்குவேன் என்ற எண்ணத்தில் வாகனத்தை sideஇல் நிறுத்துவார்கள். எங்கெல்லாம் நாங்கள் பிரயாணம் செய்தோமோ அங்கெல்லாம் இருக்கின்ற பாரம்பரியத்துக்குட் பட்ட அழகிய மரங்களை வாங்கி, எங்களுடைய பிரதேசங்களில் நாட்டி அழகு பார்ப்பேன். நாங்கள் எல்லோரும் இயற்கையைப் பாதுகாப்பவர்களாகவும் ரசிக்கின்றவர் களாகவும் இருந்தாலும், எங்களுடைய தேவையின் நிமித்தம்தான் காடுகளை அழித்துக்கொண்டு இருக்கின்றோம். நாங்கள் பிரயாணம் செய்யும்போது, நாட்டினுடைய வளங்கள் பாவிக்கப்படாமல் இருப்பதைப் பார்க்கும்போது கஷ்டமாக இருக்கின்றது. அன்று எந்தவிதமான வளமும் இல்லாதிருந்த சிங்கப்பூரை இலங்கையைப் போன்று வளமான நாடாகக் கட்டியெழுப்புவோம் என்று கூறினார்கள். இன்று அந்த நாடு எங்கேயோ போய்க்கொண்டு இருக்கின்றது. ஆனால், அனைத்து வளங்களையும் கொண்டிருக்கின்ற எமது இலங்கை அதலபாதாளத்துக்குள் போய்க்கொண்டு இருக்கின்றது. காடுகளைப் பாதுகாக்கின்ற அதேவேளை, மனிதர்களையும் மனித வளங்களையும் மனித உறவுகளையும் நாங்கள் பிரித்துக்கொண்டு இருக்கின்றோம் எனக் கூறி, விடை பெறுகிறேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු කථාව, ගරු දම්මික පටබැඳි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.52]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුතුරාජවෙල තෙත්බිම සම්බන්ධයෙන් අද දවසේ මෙම කල් තැබීමේ යෝජනාව ගෙන ඒම පිළිබඳව විශේෂයෙන්ම ලසිත් භාෂණ ගමගේ මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මුතුරාජවෙල තෙත්බිම කියන්නේ, හෙක්ටෙයාර 6,232ක පමණ ප්‍රදේශයක පැතිරිලා තිබෙන පරිසර පද්ධති රැසක එකතුවක්.

මුතුරාජවෙල ශ්‍රී ලංකාවේ විශාලම වෙරළාශ්‍රිත ලවණ වගුරු බිමයි. කැලණි ගඟේ සිට මීගමුව කළපුව දක්වා විහිදී ඇති මෙහි බටහිර මායිම මුහුදු තීරය වන අතර, නැඟෙනහිර මායිම මීගමුව - කොළඹ ප්‍රධාන මාර්ගයයි. නාගරික හා කාර්මික ප්‍රදේශ ගණනාවක් පුරා ව්‍යාප්තව ඇති මෙම තෙත්බිම වගුරු, පරිසර හා කඩොලාන පරිසරවලින් සමන්විත වනවා. අතීතයේ සශ්‍රීක කුඹුරු යායක් ලෙස ප්‍රචලිත වූ මෙය මුතු මෙන් වටිනා සහල් ලබා දුන් රජුට අයත් වෙල් යාය නිසා "මුතුරාජවෙල" නම් වූ බව ජනප්‍රවාදවල සඳහන් වනවා. එය හෙක්ටෙයාර 3,164ක් පමණ වන මීගමු කළපුවෙන් සහ කළපුවට යාබදව දකුණු දෙසට ව්‍යාප්තව ඇති හෙක්ටෙයාර 3,068ක් පමණ වන වගුරු බිම්වලින් සමන්විත වෙනවා.

ඕලන්ද යුගයේදී කැලණි ගඟේ සිට භාණ්ඩ ප්‍රවාහනය සඳහා මීගමුව - කොළඹ මාර්ගයට සමාන්තරව මීගමු කළපුව දක්වා මුතුරාජවෙල වෙල් යාය හරහා ඇළ මාර්ගයක් සකස් කර තිබෙනවා. එය ඕලන්ද ඇළ ලෙස හැඳින්වෙනවා. පසුව ඉංග්‍රීසින් විසින් භාණ්ඩ ප්‍රවාහනය විධිමත් කිරීම සඳහා කැලණි ගඟේ සිට මුහුදු වෙරළට සමාන්තරව මුතුරාජවෙල වෙල් යාය හරහා මීගමුව කළපුව දක්වාත්, එතැන් සිට පුත්තලම දක්වාත් හැමිල්ටන් ඇළ සකස් කර තිබෙනවා. මෙහි ප්‍රතිඵලයක් ලෙස ලවණ ජලය මුතුරාජවෙලට ගලා ඒම සිදු වීම නිසා වී වගාවට තවදුරටත් නුසුදුසු තත්ත්වයක් උද්ගත වී, මේ වනවිට ගොවිතැන අභාවයට පත් වී තිබෙනවා. වඩදිය අවස්ථාවේදී ලවණ ජලය ගලා ඒම පාලනය කිරීම සඳහා හැමිල්ටන් ඇළ හා ඕලන්ද ඇළ යා කරමින් දොරටු සහිත කුඩා ඇළ මාර්ග 20කට අධික ප්‍රමාණයක් සකස් කළ ද ඉන් ප්‍රතිඵල ලැබී නැහැ. ඒ නිසා මෙම තෙත්බිම් පද්ධතිය ලවණ වගුරු පද්ධතියක් බවට ක්‍රමයෙන් පරිවර්තනය වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මොහොතේ ශ්‍රී ලංකාවේ සිදු වූ විශාලතම පරිසර දූෂණයක් හැටියට මේ තත්ත්වය වාර්තා වෙලා තිබෙනවා. ඒ නිසා මුතුරාජවෙල තවදුරටත් කලින් තිබුණු වී වගා කළ හැකි කුඹුරු යාය ලෙස සලකන්න බැහැ. ඒ නිසා දැන් මෙය ප්‍රදේශ කිහිපයකට වෙන් වෙලා තිබෙනවා. එක පැත්තකින් සංරක්ෂණ කලාපයක්, ඒ වාගේම ඒ සංරක්ෂණ කලාපයට අදාළ ප්‍රේරණ කලාපයක් සහ මිශ්‍ර නාගරික කලාපයක් හැටියට හඳුනා ගත හැකි ප්‍රදේශයක් දැන් මුතුරාජවෙල ස්ථාපිත වෙලා තිබෙනවා. ඒ වුණත්, සමස්ත මුතුරාජවෙල ප්‍රදේශය තෙත්බිම් සංකීර්ණයක් ලෙස හඳුන්වන්න පුළුවන්. ඊට හේතුව මීගමු කළපුව, ඕලන්ද ඇළ සහ හැමිල්ටන් ඇළ මුතුරාජවෙල වගුරු බිම තුළින් ගලා ගොස් මීගමු කළපුව හා එක්වන දඬුගම් ඔය ඇතුළු තෙත්බිම් වර්ග ගණනාවකින් මෙය සමන්විත වීමයි. මේ නිසා මෙම තෙත්බිම් පද්ධතිය නොගැඹුරු මුහුදු තීරයේ ජීවත් වන සාගර මත්ස්‍ය විශේෂ, ඉස්සන් හා කකුළුවන් විශේෂ බෝවීමේ ප්‍රධාන ප්‍රදේශයක් බවට පත් වෙලා තිබෙනවා. මේ නිසා මීගමු කළපුවේ මත්ස්‍ය විශේෂවල පැවැත්ම මෙන්ම සුළුපන්න ධීවරයින්ගේ පැවැත්ම ද මෙම තෙත්බිම් පද්ධතිය මත රඳා පැවතී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ මුතුරාජවෙල තෙත්බිම් පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය හැටියට අපි ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා.

විශේෂයෙන්ම ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව මධ්‍යම පරිසර අධිකාරිය විසින් මුතුරාජවෙල තෙත්බිම් ප්‍රදේශයෙන් හෙක්ටෙයාර 162.1ක ප්‍රදේශයක් දැනටමත් පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, මෙම සංරක්ෂණ හා කළමනාකරණ කටයුතු

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

මුතුරාජවෙල තෙත්බිම් සංරක්ෂණයට අදාළ සියලු පාර්ශ්වකාර ආයතන වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය ආදී ආයතනවලින් සැදුම්ලත් කමිටුවක් මඟින් කළමනාකරණය කෙරෙනවා. ඒ වාගේම, ශ්‍රී ලංකාවේ සියලු තෙත්බිම් ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම, සම්බන්ධීකරණය හා පසු විපරම් කිරීම සඳහා පිහිටුවන ලද තෙත්බිම් මෙහෙයුම් කමිටුව පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සභාපතිත්වයෙන් පවත්වනු ලබන අතර මධ්‍යම පරිසර අධිකාරිය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ රාජ්‍ය ආයතන මෙම තෙත්බිම් සංරක්ෂණය සඳහා කටයුතු කරමින් තිබෙනවා.

මුතුරාජවෙල තෙත්බිම ලංකාවේ පවතින විශාලම තෙත්බිමයි. මෙය අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරලා තිබෙනවා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන්. එහි මුළු භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 1028.62ක ප්‍රමාණයක්. එය 1996.10.31වැනි දින අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කර දැනටමත් ඒ අභය භූමි ප්‍රදේශයට අදාළ මායිම් කණු සිටුවා අවසන් කර තිබෙනවා. ඒ වාගේම, ඉදිරියේදී ජෛව විද්‍යාත්මක වැදගත්කම අනුව මෙම අභය භූමියට එක් කිරීමට යෝජිත අභය භූමි කලාපයක් ද හඳුනාගෙන තිබෙනවා. මෙම යෝජිත ප්‍රදේශයේ සංවර්ධනය වූ ප්‍රදේශය හැර තෙත්බිම් පමණක් අභය භූමි කලාපයට ඇතුළත් කර ගැනීමෙන් තෙත්බිම් වැඩි ප්‍රමාණයකට නෛතිකව ආරක්ෂාව සැලසීම අරමුණු කරගෙන මුතුරාජවෙල අභය භූමි ප්‍රදේශය අන්තර්ජාතික රම්සා තෙත්බිමක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා මේ වනවිටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වසර 25කට පසුව ඉදිරියේදී සම්මත වීමට නියමිත නව පාරිසරික පනත තුළ අපි සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා, තෙත්බිම් ආරක්ෂණය සඳහා මධ්‍යම පරිසර අධිකාරියට හැකියාව ලැබෙන පරිදි. ඒ හරහාත් අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී මේ මුතුරාජවෙල තෙත්බිම් පරිසර පද්ධතිය තවදුරටත් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන්න.

විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මතු කළා, උතුරු, නැඟෙනහිර ඉඩම් ප්‍රශ්නය ගැනත්. ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රදේශයේ තිබෙන ඉඩම් ප්‍රශ්න සම්බන්ධයෙන් සොයන්න දැනටමත් අපි කැබිනට් අනුකමිටුවක් පත් කර තිබෙනවා. ඒ අනුකමිටුව මේ වෙනකොටත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා. ජනතාවට ඒ ඉඩම් සම්බන්ධයෙන් යම්කිසි ගැටලු තිබෙනවා නම් ඒ අනුකමිටුවට එම ගැටලු ඉදිරිපත් කරලා, ඒවාට අවශ්‍ය කරන නිරාකරණය කර ගැනීම් කර ගන්න පුළුවන්. ඒ අතරේම උතුරු, නැඟෙනහිර ප්‍රදේශවලට අයත් පරිසර පද්ධතීන් ආරක්ෂා කර ගැනීමටත් පරිසර අමාත්‍යාංශය හැටියට අපි මැදිහත් වෙමින් ඉන්නවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.59ට, අද දින සභා සම්මතිය අනුව, 2026 පෙබරවාරි 05වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.59க்கு, பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2026 பெப்ருவரி 05, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5. 59 p.m. until 9.30 a.m. on Thursday, 05th February, 2026, pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා කොළඹ 5 කිරුළපන මාවතේ
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත කළ හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை கொழும்பு 5, கிருலப்பனை மாவத்தையிலுள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
Kirulapone Avenue, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.